# ගෝඨාභය

## රට හදන සෞභාග්‍යයේ දැක්ම



ඔබට රටක් - රටට හෙටක්

# රට නඟන පෙර දැක්ම



**"ඔබ ඔබේ යුතුකම ඉටුකරන්න, මම මගේ යුතුකම ඉටුකර සුරක්ෂිත රටක් සහ සෞභාග්‍යමත් දේශයක් ගොඩනගන්නෙමි."**

**ගෞරවණීය ස්වාමීන්වහන්ස, ගෞරවණීය පූජකතුමනි, සියලු දෙමව්පියනි, දූ දරුවනි, හිත මිතුරනි,**

කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබන අවධියේ සිට ම මාගේ කැමැත්ත වූයේ ශ්‍රී ලංකා යුද හමුදාවට බැඳී මව්රට වෙනුවෙන් සේවය කිරීමට ය. දේශපාලන පවුලක උපත ලද සාමාජිකයෙකු වුවත්, ජනාධිපතිවරයෙකු වීමට තබා දේශපාලනඥයෙකු වීමටවත් කිසිදු විටෙක වුවමනාවක් මා තුළ තිබුණේ නැත. මාගේ වැඩිමල් සහෝදරයන් වූ චමල් රාජපක්ෂ සහ මහින්ද රාජපක්ෂ මෙන් ම, බාල සහෝදරයා වන බැසිල් රාජපක්ෂ ද දිගු කලෙක සිට මෙරට සක්‍රීය දේශපාලනයේ යෙදී සිටින්නන් ය. 2005 ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙරට ජනාධිපති ධූරයට පත්වීමෙන් පසු, එතුමා මගෙන් ඉල්ලා සිටියේ ආරක්ෂක ලේකම් ධූරය භාර ගන්නා ලෙස ය. ඒ වන විට අප මාතෘභූමිය බෙදී වෙන් ව යාමේ කඩඉම කරා පැමිණ තිබුණි. එම ඉරණමෙන් රට ගලවා ගැනීමට මා තුළ වූ බලවත් වුවමනාව නිසා මට ජනාධිපතිතුමාගේ ඉල්ලීමට එකඟ වීමට සිදු විය. එමඟින්, රටට ස්ථිරසාර සාමය රැගෙන ඒමට හැකි විය. අනතුරුව උදා වූ සමයේ දී රට නාගරික සංවර්ධනයේ නව මාවතකට අවතීර්ණ කරවීමටත් මට අවස්ථාව උදා විය. මෙහි ලා මට පැවසීමට අවශ්‍ය ව ඇත්තේ දේශපාලනඥයෙකු වීමේ හෝ ජනාධිපති ධූරය හිමිකර ගැනීමේ අරමුණු සහිත ගමනක මා නොපැමිණි බව ය.

2015 ජනාධිපතිවරණයෙන් පසුව ද මා තුළ එවැනි උනන්දුවක් තිබුණේ නැත. එහෙත් වත්මන් ආණ්ඩුව මහින්ද රාජපක්ෂ මැතිතුමාට නැවත ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට නීතිමය බාධා පැමිණවීම නිසා රට අඳුරට ඇදගෙන යන මේ භයංකර ගමන ගැන බියට පත් වූ බහුතර ජනතාව 2019 ජනාධිපතිවරණයේ අපේක්ෂකයා ලෙස මා පත් කර ගන්නා මෙන් ඉල්ලා සිටියහ. ස්වාමීන්වහන්සේලා, අන්‍යාගමික පූජකතුමන්ලා, සිය ගණනක් සිවිල් සංවිධාන සමඟ සියලු ශ්‍රී ලාංකික ජනතාව ඔවුන්ගේ අපේක්ෂකයා ලෙස මා පත් කිරීමට මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් එක හඬින් ඉල්ලා සිටියහ. එම ඉල්ලීමට සවන් දෙමින් මහින්ද රාජපක්ෂ මැතිතුමා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, ඒකාබද්ධ විපක්ෂයේ ද වෙනත් දේශපාලන පක්ෂ හා දේශපාලන බලවේග රැසකගේ ද තීරණය මත මා ඔබේ ජනාධිපතිවරණ අපේක්ෂකයා ලෙස පත් කරනු ලැබුවේය. ඒ පිළිබඳව පළමු ව ඔබ සැමට මම මාගේ ගෞරවය හා ආදරය පුද කරමි.

2019 ජනාධිපතිවරණයේ දී ඔබ මට පවරන්නේ බරපතළ අභියෝගාත්මක වගකීමකි.

මාගේ මුල් වගකීම වනුයේ යළිත් බරපතළ ත්‍රස්තවාදී උවදුරකට මුහුණ දී ඇති අපගේ මාතෘභූමිය ඉන් මුදවාගෙන කිසිදු අන්තවාදී ත්‍රස්තවාදයකට හිස එසවීමට ඉඩ නොලැබෙන පරිදි ජාතික ආරක්ෂාව සහතික කිරීම ය. එහිදී සිංහල, දෙමළ හා මුස්ලිම් ආදී සෑම ජන කොට්ඨාසයකට ම එකම රටක් එකම නීතියක් යටතේ සමඟි සම්පන්නව, ගෞරවණීය කොටස්කරුවන් ලෙස ජීවත්වීමට ඉඩ සැලසිය යුතු ය. එමෙන් ම නීතියේ ආධිපත්‍යය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අප විසින් බල ගැන්විය යුතුව ඇත. සියලු රටවැසියන් නීතිය හමුවේ සමානයන් විය යුතු ය. අන් සියලු දේට වඩා ඔබ මා වෙතින් අපේක්ෂා කරනුයේ එය බව මට පසක් වී ඇත. ජාතික ආරක්ෂාව සහතික කළ පසු රටක ආර්ථිකය පුබුදුවාලීම අසීරු අභියෝගයක් නොවේ.

දෙවනුව අපගේ රමණීය දිවයිනේ ජීවත්වන සියලු තරුණ දූ පුතුන් හට ගෞරවණීය ලෙස ජීවත් විය හැකිවන පරිදි ශක්තිමත් තිරසර ආර්ථිකයක් බිහි කළ යුතු ය. සැමට තමන්ගේ දක්ෂතාවයෙන් උපරිම ඵල නෙළාගන්නට හැකි වන රැකියාවක් තිබිය යුතු ය. අපගේ වගකීම තෘප්තිමත් රටවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක් සහ ගුණගරුක සමාජයක් බිහි කිරීම ය. ලොවපුරා සිදුවෙමින් පවතින පාරිසරික විනාශයේ ප්‍රතිවිපාක ලෙස නියඟයෙන් හා ගංවතුරෙන් එකවිට බැට කන ජාතියක් බවට අප පත් වී ඇති බැවින් මේ සුන්දර දිවයින යළිත් හරිත වර්ණයෙන් බබළන අනාගත ලෝකයේ තිරසර සංවර්ධනයේ පරමාදර්ශය බවට පත් කිරීමේ වගකීම ද අපට පැවරී තිබේ. මේ භූමිය මත සාමය නැමති බීජය යළි පැළ නොවනු ඇතැයි සිතූ යුගයක අපි ඒ සාමය නැමති පැළය මේ භූමිය මත රෝපණය කළෙමු. එපරිද්දෙන් ම සෞභාග්‍යවත්, සුන්දර ශ්‍රී ලංකාවක් අප මේ ලක් භූමිය තුළ යළි රෝපණය කර ඔබට පිරිනමන්නෙමු.

අපට අවශ්‍ය ව ඇත්තේ රටේ ඉදිරි ගමන සඳහා අවශ්‍ය නිවැරදි දැක්මක් හා අභීත නායකත්වයකි. රට හමුවේ ඇති අභියෝග ජය ගැනීමේ භාරදූර වගකීම මා වෙත පැවරීම ගැන ඔබ සැමට ස්තූතිවන්ත වෙමි. ඔබගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම සඳහා කීර්තිමත් රාජ්‍ය නායකයකු වන මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමීප දායකත්වය ද අප ලද ඉමහත් භාග්‍යයකි. ඔබගේ ප්‍රාර්ථනාවන් ඉටු කිරීම සඳහා මම මාගේ උපරිමයෙන් කටයුතු කරන්නට සහතික වෙමි. ඔබ සැම ඉල්ලා සිටින සෞභාග්‍යවත් ශ්‍රී ලංකාව නිර්මාණය කිරීමට අපට හැකයාව ඇති බව මා දැඩි ලෙස විශ්වාස කරමි.

එම නිසා ඔබ ඉල්ලන රට බිහි කිරීමට මා සමඟ අත්වැල් බැඳ ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

මාතෘ භූමියට ජයවේවා !!!
ඔබ සැමට තෙරුවන් සරණයි !!!

මෙයට,
ඔබේ සේවයට කැප වූ

ගෝඨාභය රාජපක්ෂ

# පසුබිම් කතාව

**අද වන විට ලොව සියලු රජයයන්ගේ ප්‍රධාන වගකීම වී ඇත්තේ දුප්පත්කම හා ඇති නැති පරතරය නැති කිරීම, වසවිස නැති ගොවිතැන සුලභ කර නිරෝගී ජනතාවක් බිහි කිරීම, සැමට හොඳ අධ්‍යාපනයක් ලබාදීම, පිරිසිදු වතුර හා පිරිසිදු බලශක්තිය සෑම දෙනාට ම ලබාදීම, තරුණයන්ට හරිත කර්මාන්ත හරහා හරිත රැකියා ලබා දීම, මිනිස් වාසයට සුදුසු හරිත නගර ඉදිකිරීම, සකසුරුවම්කමට හුරු ජනතාවක් බිහි කිරීම, කාන්තාවන්ට සාධාරණ ඉඩක් ලබාදීම, දේශගුණික විපර්යාසය හා සාගර දූෂණය වැළැක්වීම, ජෛව විවිධත්වය රැක ගැනීම හා සාමය රජයන සමාජයක් බිහි කිරීම ආදී එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 17 සපුරා ගැනීම ය.**

ශ්‍රී ලංකාව සම්මත ආර්ථික දර්ශක අනුව දුප්පත් රටක් ලෙස හැඳින්වුවත් මානව සංවර්ධන දර්ශක අතින් දියුණු ලෝකය හා සම මට්ටමක සිටින රටකි. එහෙත් අවාසනාවකට මෙන් පසුගිය වසර කිහිපය තුළ දී ලෝක ප්‍රජාව හමුවේ ශ්‍රී ලංකාවට දරුණු පසුබෑමකට ලක්වීමට සිදු විය. එම කාලය තුළ අනෙක් බොහෝ රටවල් අප පසුකර ඉදිරියට ගොස් ඇත. දකුණු ආසියාවේ රටවල් අතර වාර්ෂික ආර්ථික වර්ධනය අතින් අප සිටින්නේ ත්‍රස්තවාදයෙන් බැට කන ඇෆ්ගනිස්ථානයටත් පහළින් ය. එම නිසා ලෝකයේ සෙසු රටවල් සමග ඉදිරියට යාම තව දුරටත් ප්‍රමාද කිරීම අපට කළ නොහැකි ය.

ලෝකවාසීන්ට පසුගිය කාලයේ දී මුහුණ දීමට සිදු වූ අභියෝග ජය ගැනීම උදෙසා මුළු මහත් ලෝකය ම දැන් අලුත් මාවතකට පැමිණ ඇත. ආගමික අන්තවාදය නිසා ලොව පුරා ත්‍රස්තවාදය නොසිතූ විරූ ආකාරයෙන් ව්‍යාප්ත වී නවීන අවි ආයුධවලින් මුළු මහත් ශිෂ්ටාචාරය ම විනාශ වීමේ අවදානමක් මතු ව තිබේ. සිදුවෙමින් පවතින මහා ජෛව විවිධත්ව විනාශය නිසා මිනිසාට ජීවත්වීමට නොහැකි පරිසරයක් නිර්මාණය වෙමින් පවතී. මහා පරිමාණයෙන් පොසිල ඉන්ධන භාවිතය නිසා අද වන විට වායුගෝලයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශකයකින් ඉහළ ගොස් ඇත. දේශගුණික විපර්යාසයන් නිසා නියඟය, ගංවතුර, වසංගත රෝග, වගා විනාශය ආදී ස්වාභාවික උවදුරුවලට ලක්ෂ ගණන් ජනතාව ගොදුරු වෙමින් ඇත. අනිසි ආර්ථික තරගය හා වාණිජ අභිමතාර්ථ නිසා සමාජ සාරධර්ම බිඳ වැටී ජනතාව ආධ්‍යාත්මික ව පිරිහීම නිසා වංචාව, දූෂණය, රැවටිල්ල හා ම්ලේච්ඡත්වය රජයන සමාජයක් බිහිවෙමින් තිබෙන බව පැහැදිලි ය. එසේ හෙයින් එකී අභියෝග ජය ගැනීම උදෙසා ලොව පුරා 'තිරසාර විප්ලවයක්' ඇරඹී තිබේ.

එම නිසා අද සියලු ලෝකවාසීන්ගේ අවශ්‍යතාව වනුයේ කාර්මික විප්ලවයෙන් ලැබුණු ප්‍රතිලාභ රැකගෙන, තොරතුරු තාක්ෂණය උපරිම ලෙස භාවිතා කරමින්, තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ය. ලොව සියලු රජයයන්ගේ ප්‍රධාන වගකීම වී ඇත්තේ දුප්පත්කම හා ඇති නැති පරතරය නැති කිරීම, වසවිස නැති ගොවිතැන සුලභ කර නිරෝගී ජනතාවක් බිහි කිරීම, සැමට හොඳ අධ්‍යාපනයක් ලබාදීම, පිරිසිදු වතුර හා පිරිසිදු බලශක්තිය සෑම දෙනාට ම ලබාදීම, තරුණයන්ට හරිත කර්මාන්ත හරහා හරිත රැකියා ලබා දීම, මිනිස් වාසයට සුදුසු හරිත නගර ඉදිකිරීම, සකසුරුවම්කමට හුරු ජනතාවක් බිහි කිරීම, කාන්තාවන්ට සාධාරණ ඉඩක් ලබාදීම, දේශගුණික විපර්යාසය හා සාගර දූෂණය වැළැක්වීම, ජෛව විවිධත්වය රැක ගැනීම හා සාමය රජයන සමාජයක් බිහි කිරීම ආදී එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 17 සපුරා ගැනීම ය. එම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පොදු ජන සහභාගීත්වයෙන් යුත් පැහැදිලි ප්‍රතිපත්තියක් සහ වැඩ සැලසුමක් අප සකස් කර ඇත.

'ඔබ ඉල්ලන රට' නම් වූ ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කරනු ලැබුයේ වසරකට අධික කාලයක් පුරා මේ රටේ ගම් 25,000ක දී පවත්වනු ලැබූ 'ගම සමග පිළිසඳරක්' වැඩසටහන්වලින් ලබාගත් ජනතාවගේ යෝජනා අතරින් ය. ඒ අනුව රටේ සෑම ගමකට ම අවශ්‍ය නිවාස සංඛ්‍යාව, විදුලිය, ජලය හා පිවිසීමේ මාර්ග, අළුත්වැඩියා කළ යුතු වැව් අමුණු සහ ඇළ මාර්ග ප්‍රමාණය, අලුතින් ආරම්භ කළ යුතු ව්‍යාපෘති සංඛ්‍යාව හඳුනාගෙන ඇත. ඒ අනුව අපේ ඉදිරි අයවැය සැලසුම් සකස් වන්නේ එම අවශ්‍යතා පාදකව ය.

එම ජනතා අදහස්වලට අමතරව, විවිධ මාර්ග ඔස්සේ අප වෙත ඉදිරිපත් කළ විවිධ පුද්ගල, දේශීය හා ජාත්‍යන්තර සංවිධාන ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කරගෙන මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කරන ලද්දේ විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරු, එකී ක්ෂේත්‍රවලට අයත් විවිධ විද්වතුන්, වෘත්තීයවේදීන්, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන්, නීතිඥයන්, ඉංජිනේරුවන්, ව්‍යාපාරිකයන්, කර්මාන්තකරුවන්, විවිධ දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති සහ විවිධ සිවිල් සංවිධාන නියෝජිතයන්, තරුණයන් සහ කාන්තාවන් ආදී 540 දෙනෙකුගෙන් සමන්විත ක්ෂේත්‍ර 28ක් ආවරණය වන විශේෂඥ කමිටු මගින් ය. විශේෂයෙන් ම ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ මුළු රටම ආවරණය වන පරිදි සම්මන්ත්‍රණ, සාකච්ඡා හා වැඩමුළු පවත්වමින් මහජනතාවගෙන් එකතු කර ගත් තොරතුරු මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම සඳහා උපකාරී විය. ඊට අමතරව වියත්මග සංවිධානය විසින් ස්ථාපනය කළ කමිටු ඒ හා සමාන උපදේශක කමිටු 27ක් මගින් වසර තුනක පමණ කාලයක් මුළුල්ලේ සකස් කළ ක්‍රියාකාරී සැලසුම් යෝජනා ද මෙහි ඇතුළත් වේ.

මෙම ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාව සතු ස්වාභාවික සම්පත්, ජෛව විවිධත්වයෙන්, ඛනිජ සම්පත්වලින් හා පුනර්ජනනීය බලශක්තියෙන් උපරිම ඵල නෙළා ගැනීමට හැකි වනු ඇත. එමගින් ශ්‍රී ලංකාවේ උගත් බුද්ධිමත් මානව සම්පත නිසි ලෙස කළමනාකරණය කර ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධන යුගයේ පෙරගමන්කරුවෙකු බවට පත් කිරීම අපගේ අභිලාෂය වේ. සහජීවනයේ මාවත විවර කරදෙන, අති ධාවනකාරී තරගය වෙනුවට ආධ්‍යාත්මික සංසිඳීම මුල් කරගත් ජීවන ක්‍රමයකට මග පෙන්වන, බෞද්ධ දර්ශනයෙන් හා සෙසු ආගම්වලින් පෝෂණය වූ නිවැරදි දැක්මක් සහ අභීත නායකත්වයක් සහිතව එකී ගමන යාම උදෙසා අනගි අවස්ථාවක් ශ්‍රී ලාංකේය ජනතාවට උදා කර දෙන්නෙමු.

# දැනට තියෙන රට

2005 වසරේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාර ගන්නා විට ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය (GDP) ඇ.ඩො.බි.24.7ක් සහ ඒක පුද්ගල ආදායම ඇ.ඩො.1,242ක් ලෙස සටහන් විය. 2006 සිට 2014 දක්වා වසර 9 තුළ දී ආර්ථිකයේ සීඝ්‍ර වර්ධනය නිසා දළ දේශීය නිෂ්පාදනය ඇ.ඩො.බි.79.4 දක්වා 221%කින් වර්ධනය විය. 2014 දී ඒක පුද්ගල ආදායම සාමාන්‍ය වශයෙන් වසරකට ඇ.ඩො. 287කින් වැඩි වී ඇ.ඩො. 3,821 දක්වා ඉහළ ගොස් තිබුණි. 2015 සිට 2018 දක්වා කාලය තුළ, ඒක පුද්ගල ආදායම ඉහළ යන ලද්දේ ඇ.ඩො.4,102 තෙක් පමණි. එනම්, වසර 4ටම, 7% කින් ඇ.ඩො.281 ක් පමණි.

රටේ මහජනතාව සහ ව්‍යාපාරිකයින්. 2014 දී රජයට ගෙවූ සමස්ත බදු හා සන්සන්දනය කරන විට, 2019 දී ඒ වාගේ දෙගුණයක බදු ගෙවීමට නියමිත ය. 2006 දී රාජ්‍ය ණය රු.බි. 2,222 ක් විය. එය, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණය ප්‍රමාණය 91% ක ඉතා ඉහළ අගයක් විය. 2014 අග දක්වා අවුරුදු 9ක කාලය තුළ දී රාජ්‍ය ණය රු.බි. 5,169 කින් වැඩි වී රු.බි. 7,391 බවට පත් විය.  එහෙත්, එම කාලය තුළ රටේ දළ දේශීය නිෂ්පාදිතය ඇ.ඩො.බි. 24 සිට 79 දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය වූ නිසා ද.දේ.නි.ට සාපේක්ෂව, රාජ්‍ය ණය ප්‍රමාණය 71% දක්වා අඩු විය. 2018 අගවන විට, මුළු ණය ප්‍රමාණය රු.බි.13,182 දක්වා වැඩි වී ඇති බව මහ බැංකුව පැවසූ අතර, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව, ණය ප්‍රමාණය 91% දක්වා ඉතා භයානක මට්ටමකට වැඩි වී ඇත. 2014 අග සිට 2018  අග දක්වා විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො.බි. 23.7 සිට 32.6 දක්වා 38% කින් වැඩි කර ගත් මේ රජය විශාල ණය අර්බුදයකට ශ්‍රී ලංකාව ගොදුරු කොට අවසන් ය.

2014 අග වන විට, මාස තුනේ භාණ්ඩාගාර බිල්පත්වල සිට අවුරුදු තිහේ භාණ්ඩාගාර බැඳුම්කර දක්වා, සුරැකුම්පත්වල පොලී අනුපාතයන් තනි ඉලක්කම්ව පැවති නිසා, ආර්ථිකයේ වර්ධනයට විශාල රුකුලක් සහ ශක්තියක් ලැබුණි. එහෙත්, 2018 වන විට බැඳුම්කර වංචාවේ අයහපත් ප්‍රතිවිපාක සහ අනිකුත් අනුවණ ප්‍රතිපත්ති නිසා, රාජ්‍ය සුරකුම්පත්වල පොලී අනුපාතයන් දැවැන්ත ලෙස වැඩි විය. ආර්ථිකයේ අදක්ෂ පරිපාලනය සහ වංචනික ලෙස පොලී අනුපාතය වැඩි කිරීම නිසා 2015 සිට අති විශාල පොලී පිරිවැයක් දැරීමට අපට සිදු විය. මෙලෙස දරන්නට සිදු වී ඇති වැඩි පොලී පිරිවැය ඇ.ඩො.මි.834.6 හෝ රු.බි.151.1 කි. එය කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයක් (රු.බි.48) සහ මෙගා වොට් 900ක නොරොච්චෝලේ තාප බලාගාරයක් (රු.බි.103) ඉදිකිරී මට හැකි වන මුදල් ප්‍රමාණයකි.

2015 සිට මේ දක්වා අවුරුදු 4ක කාලයක් තුළ දී රැකියා අවස්ථා 409,000ක් අහිමි කොට ඇත. 2014 දී ආසියාවේ තිරසාරම කොටස් වෙළඳපොළ ලෙස වාර්තා වූ කොළඹ කොටස් වෙළඳපොළ, 2006 සිට 2014 දක්වා, ඇ.ඩො.බි. 5.7 සිට ඇ.ඩො.බි. 23.7 දක්වා 4 ගුණයකින් පමණ වර්ධනය විය. 2015 සිට කොටස් වෙළඳපොළ දැවැන්ත ලෙස කඩා වැටී, අද වන විට, එහි ප්‍රාග්ධනය ඇ.ඩො.බි. 15.3 අගයක් දක්වා අඩු වී ඇත. එපමණක් නොව, දිනෙන් දිනම, තව දුරටත් පහත වැටීමක් පෙනෙන්නට ඇත. එම තත්ත්වය වෙනස් කිරීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගන්නා බවක් ද නොපෙනේ.

2005 දී, තිබූ විදේශීය සංචිත ප්‍රමාණය ඇ.ඩො.බි. 2.7ක් පමණි. 2014 අවසානය වන විට, එම සංචිත ඇ.ඩො.බි. 8.2 දක්වා ඉහළ නංවා තිබුණි. 2015 සිට විදේශ සංචිත ශීඝ්‍රයෙන් කඩා වැටුණු අතර 2018 අවසානය වන විට ඇ.ඩො.බි. 6.9 දක්වා අඩු විය. 2019 පෙබරවාරි 28 දින ශ්‍රී ලංකාව සතුව තිබූ විදේශ සංචිත ප්‍රමාණය ඇ.ඩො.බි. 6.0 දක්වා පහත බැස තිබූ අතර, එම අගය 2010 දෙසැම්බර් 31 දින තිබූ ඇ.ඩො.බි. 7.2 අගයටත් වඩා බෙහෙවින් අඩුය. 2019 දී අවම වශයෙන් ඇ.ඩො.බි.

**2018 - ඇ.ඩො.බි. 32.6**
**2014 - ඇ.ඩො.බි. 23.7**

**↑ 38%**
**විදේශ ණය**

13.5 ක් වත් ශ්‍රී ලංකාව සතුව තිබිය යුතු නිසා, අද වන විට ඇ.ඩො.බි. 7.5 පමණ දැවැන්ත සංචිත හිඟයක් පවතී.

මහ බැංකුවේ බැඳුම්කර වංචාව නිසා පොලී අනුපාතය ඉහළ යෑම හරහා සිදු වූ පාඩුව රු.බි. 145කි. සේවක අර්ථසාධක අරමුදලේ පාඩුව රු.බි. 20 කි. රුපියලේ අගය දැවැන්ත ලෙස කඩා වැටීම ඔස්සේ රටේ හෝ රාජ්‍ය සම්පත්වලට කිසිදු භෞතික අගයක් එකතු කිරීමක් නොමැතිව, රාජ්‍ය ණය ප්‍රමාණය වැඩි වූ නිසා, විදින්නට සිදු වූ පාඩුව රු.බි. 1,760 කි. විදේශ ණය ගෙවීමේ දී යෙදීමට අවශ්‍ය වැඩිපුර මුදල රු.බි. 280 කි. ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමාගම, ඇණවුම් කරන ලද නව අහස් යානා කීපයක් ම, පදනම් රහිතව අත්හිටුවීම සඳහා ගෙවන්නට සිදු වූ වන්දිය රු.බි. 17 කි. කොළඹ "පෝර්ට් සිටි" ව්‍යාපෘතිය පදනම් රහිතව අත්හිටුවීම නිසා, චීන සමාගමට වන්දියක් වශයෙන් ගොඩ කරන භූමියෙන් දෙන්නට සිදු වූ වැඩිපුර හෙක්ටයාර 5ක වටිනාකම රු.බි. 23 කි. ඉහත කී පාඩු, අලාභ සහ වන්දි ඔස්සේ වර්තමාන රජයේ පළමුවැනි වසර 4ක කාලය තුළ දී පමණකි. රටට සිදු වී ඇති පාඩුව රු.බි. 1,971.1 කි.

රටේ සම්පත් කුණු කොල්ලයට විකිණීමේ වර්තමාන ප්‍රතිපත්තිය ඔස්සේ රටේ තිබෙන සීමිත ඉඩම් විදේශිකයන්ට කිසිදු බාධාවකින් තොරව මිලදී ගැනීමට හැකි විය. රටේ ජනතාවට සහ මතු පරම්පරාවලට අයිති උපායමාර්ගික සම්පත් වන හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ, වෙරළ තීරු, අහස් අවකාශය, මහා පරිමාණයේ ඉඩම්, රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය බැංකු කුණු කොල්ලයට විකිණීමේ ප්‍රතිපත්තිය දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

## ඔබ ඉල්ලන රට

**එළදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, විනය ගරුක සමාජයක් සහ සෞභාග්‍යවත් දේශයක් ...**

මේ සාරවත් මව්බිම මත වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් ආදී සියලු ජන කොටස් අද ජීවත් වන්නේ ආසියාවේ ආශ්චර්යය ලෙස දියුණු වෙමින් පැවති රට සෘණ ආර්ථිකයක් කරා ගමන් කරාවිදැයි යන පසුතැවිල්ලෙන් සහ නිදහසේ ගත් හුස්ම කවර නම් මොහොතක ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයකින් අවසන් වේද යන බියෙනි. දූෂණයෙන් සහ අකාර්යක්ෂමතාවයෙන් පිරි අසාර්ථක රාජ්‍යයක් කරා රට ගෙන යෑම පිළිබඳ පිළිකුලක් ද ජනතාව තුළ ඇත. එම අවිචාරවත් යුගය නිමාකර සෞභාග්‍යවත් දේශයක් උදාකිරීමේ සුභ මොහොතට අප ළඟා වෙමින් සිටී. එළදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක, සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යවත් දේශයක් යන චතුර්විධ අරමුණු ජය ගැනීම සඳහා දස ප්‍රතිපදාවන් ඔස්සේ ගමන් කළ යුතු වැඩපිළිවෙළක් දේශපාලනඥයින්, විද්වතුන් සහ වෘත්තීයවේදීන්ගේ ඒකාග්‍රතාව ඇතිව සකස් කර තිබේ. ඉහළ ම මහජන සහභාගිත්වයක් සහිත, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයක් මගින් එහි සශ්‍රීක ප්‍රතිඵල ඔබට උරුම කර දෙන සමෘද්ධිමත් අනාගතයක් උදා කිරීමට අප ප්‍රතිඥා දෙන්නෙමු.

# පටුන


**රට නඟන පෙර දැක්ම** i

**පසුබිම් කතාව** ii

**දැනට තියෙන රට** iii

**ඔබ ඉල්ලන රට** iii

එළදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, විනය ගරුක සමාජයක් සහ සෞභාග්‍යවත් දේශයක් ... iii

## පළමු කොටස

**දස වැදෑරුම් ප්‍රතිපත්ති** 02

## දෙවන කොටස

**දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක්** 06

**කාර්යක්ෂම පාලනයක්** 06

**දූෂණය පරදවන රටක්** 07

**රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ප්‍රතිපත්තිය** 08

**ජාතික සමගියට මග කියන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක්** 09

## තෙවන කොටස

**සුරක්ෂිත රටක්** 12

**ජාතික ආරක්ෂාවට මුල් තැන** 12

අප්‍රේල් 21 සිද්ධිය 13

**මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් වන රටක්** 13

**ආරක්ෂක සේවා : සේවයට ආරක්ෂාවක්** 13

තෘප්තිමත් පොලිස් සේවයක් සඳහා 14

සිවිල් ආරක්ෂක බලකාය 15

අප වෙනුවෙන් කැප වූ රණවිරු ඔබ වෙනුවෙන් 15

**මිත්‍රශීලී සහ නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක්** 15

## සිව්වන කොටස

**එළදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්** 18

**මානව සම්පත් සංවර්ධනයේ නව දිශානතිය** 20

ප්‍රඥාසම්පන්න පුරවැසියෙක් : දැනුමෙන් පිරිපුන් සමාජයක් 20

මව් තුරුලෙන් ගුරුමව් සෙවණට 20

පාසල් අධ්‍යාපනයේ නවෝදය 20

විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් 21

විශ්වවිද්‍යාල සහ උසස් වෘත්තීය අධ්‍යාපනය 21

වෘත්තීය තාක්ෂණවේදීන් බිහිකරන උසස් අධ්‍යාපන ක්‍රමවේදයක් 22

**නිරෝගීකමට මුල් තැන** 23

"සුව දිවිමඟ" වැඩසටන 23

සෞඛ්‍ය සේවා පහසුකම් සංවර්ධන වැඩසටහන 23

දේශීය සහ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය 25

**ජව සම්පන්න තාරුණ්‍යය ය** 25

ජව සම්පන්න තාරුණ්‍යයට ක්‍රීඩාවේ සවිබලය 26

**නැණබල සහිත ළමා පරපුරක්** 26

**සමාජ ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක්** 27

**විශේෂ හැකියාවන් සහ ආබාධ සහිත පුද්ගලයින්** 27

**ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක්** 28

**'රට වෙනුවෙන් වැඩ' සංස්කෘතියක්** 28

මහජන හිතෛෂී රාජ්‍ය සේවයක් වෙනුවෙන් 28

විශ්‍රාමික ප්‍රජාව 29

සංස්ථා, අර්ධ රාජ්‍ය ආයතන සහ බැංකු 29

පෞද්ගලික අංශය 29

විදේශ රැකියා බළකාය 30

පෞද්ගලික ආරක්ෂක සේවා 31

**සෑම පවුලකට ම සුවපහසු නිවාසයක්** 31

## පස්වන කොටස

**ජනතා කේන්ද්‍රීය ආර්ථිකය** 34

**ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්** 36

2020 -2025 සාර්ව ආර්ථික ඉලක්ක 36

**සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව** 36

**කඩිනම් සහන සැලැස්ම** 36

බදු ප්‍රතිපත්තිය 36

පොදු ජන ජීවන සහන 37

නව බැංකු ක්‍රමයක් 37

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ 38

ඒකාබද්ධ සංවර්ධන දර්ශක ප්‍රවේශය 38

**තාක්ෂණය හා මුසුවන අපේ ගොවිතැන** 38

පොහොර භාවිතයේ නව පෙරළිය 39

බීජ සහ පැළ නිෂ්පාදනය 39

සැකසුම්කරණය හා ගබඩා කිරීම 39

අලෙවිය සහ ප්‍රවාහනය 40

කෘෂි නවෝත්පාදන පර්යේෂණ යොමුවක් 40

අලුත් සහල් මංගල්‍යය 40

අපනයන භෝග වගාව 41

තේ වගාව 41

රබර් වගාව 41

පොල් වගාව 41

අනෙකුත් අපනයන භෝග 42

කුරුඳු වගාව 42

ගම්මිරිස් 42

**ධීවර කර්මාන්තයට සවිබල** 42

**කිරෙන් සපිරෙන රටක්** 43

**මස් සහ බිත්තර අපනයන කර්මාන්තයක් ලෙස** 43

**කාර්මීකරණයෙන් ඔබ්බට** 44

**සංචාරක කර්මාන්තය** 45

**ඇඟලුම් කර්මාන්තය** 46

ඉදිකිරීම් කර්මාන්තය 46
සීනි නිෂ්පාදන කර්මාන්තය 47
සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත 47
සක්‍රීය සමුපකාර ව්‍යාපාරයක් 47

**හයවන කොටස**

**තාක්ෂණය මත පදනම්වන සමාජයක් 50**
තාක්ෂණය මත පදනම්වන සමාජයක් 50
ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් 50
ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩු ක්‍රමයක් 50
ඩිජිටල්කරණය වූ ලංකාවක් 51
තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් 51

**හත්වැනි කොටස**

**භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය 54**
භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය 56
A9 සමඟ C9 : සී හැඩයේ ආර්ථික කොරිඩෝ නමයක් 56
නාගරික ප්‍රතිව්‍යුහගතකරණය 56
සිව්මහ වානිජ නගර 56
ජාතික නගර (National Cities) 56
සහසම්බන්ධිත නගර (Connecting Cities) 56
පොකුරු නගර (Cluster Cities) 56
අලුත් කොළඹ - වෙළෙඳ සහ මූල්‍ය පුරවරය 56
සුව පහසු ගමනක් - පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් 57
සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක් 57
මාර්ගස්ථ ප්‍රවාහන සේවා 57
දුම්රිය සේවා 58
වරාය සහ ගුවන් සේවා 58
කොළඹ වරාය 58
හම්බන්තොට වරාය 58
ගුවන්තොටුපොළ සංවර්ධනය 58
පුනර්ජනනීය බලශක්තිය පෙරමුණට 59
පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට මාරුවීම 59
ජල සම්පත 60
ආපදා කළමනාකරණය 60

**අටවන කොටස**

**තිරසාර පරිසර ප්‍රතිපත්තියක් 64**
තිරසාර පරිසර ප්‍රතිපත්තියක් 65
භූමිය 65
කර්මාන්ත 65
කසල කළමනාකරණය 65
වායු ගෝලය 66
ජෛව විවිධත්වය 66
සමුද්‍රීය සම්පත් 66
ජනාවාස හා නගර 66
පාරිසරික අධ්‍යාපනය 67

**නමවන කොටස**

**ගුණගරුක විනයගරුක නීතිගරුක සමාජයක් 70**
ගුණගරුක විනයගරුක සාධාරණ සමාජයක් 71
ආගම දහමට ප්‍රමුඛස්ථානය 71
නීතිය, සමාජ සාධාරණත්වය උදෙසා 71
පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් 72
ඉතිහාසය, පුරා විද්‍යාව සහ ජාතික උරුමයන් 72
සංස්කෘතිය, සාහිත්‍යය සහ කලාව 73
සාහිත්‍ය ක්ෂේත්‍රය 73
වේදිකා නාට්‍ය ක්ෂේත්‍රය 73
සිනමා ක්ෂේත්‍රය 73
සංගීත ක්ෂේත්‍රය 74
නර්තන ක්ෂේත්‍රය 74
චිත්‍ර හා මූර්ති නිර්මාණ ක්ෂේත්‍රය 74
ශාන්තිකර්මවේදීන් 74
සමාජ ආරක්ෂණය සහ සුභසාධනය 74
අඩු ආදායම්ලාභීන් වැඩි ආදායම්ලාභීන්
බවට පත්කිරීමේ වැඩසටහන 74
සමාජ ආරක්ෂණය 75
අපරාධ පාලනය 75
මාර්ග අනතුරු පාලනය 75
සතා සීපාවාට ද සෙනෙහස 75

**දහවන කොටස**

**ගම සමඟ පිළිසඳර 78**
ගම සමඟ පිළිසඳර 78
ජනමූල මණ්ඩලය සහ ජනමූල මධ්‍යස්ථානය 78
ගැමි ලියට රටේ සවිය 78
ප්‍රාදේශීය සංවර්ධනය 79
දමිළ මුස්ලිම් සහෝදරත්වය 79
වතු ආශ්‍රිත ප්‍රජාව 80

**සටහන් 81**




දස වැදෑරුම්
ප්‍රතිපත්ති

පළමු කොටස

# දස වැදෑරුම් ප්‍රතිපත්ති

***එලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක, සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යවත් දේශයක් යන චතුර්විධ අරමුණු ජය ගැනීම සඳහා දස ප්‍රතිපදාවන් ඔස්සේ ගමන් කළ යුතු වැඩපිළිවෙළක් දේශපාලනඥයින්, විද්වතුන් සහ වෘත්තීයවේදීන්ගේ එකඟතාව ඇතිව සකස් කර තිබේ. ඉහළ ම මහජන සහභාගිත්වයක් සහිත, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයක් මඟින් එහි සශ්‍රීක ප්‍රතිඵල ඔබට උරුම කර දෙන සමෘද්ධිමත් අනාගතයක් උදා කිරීමට අප ප්‍රතිඥා දෙන්නෙමු.***

**දස ප්‍රතිපදා**

1. ජාතික ආරක්ෂාවට මුල් තැන
2. මිත්‍රශීලී සහ නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක්
3. පිරිසිදු රාජ්‍ය පාලනයක්
4. ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්
5. එලදායී පුරවැසියෙක් - සශ්‍රීක මානව සම්පතක්
6. ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්
7. තාක්ෂණය මත පදනම් වන සමාජයක්
8. භෞතික සම්පත් සංවර්ධනය
9. තිරසාර පරිසර කළමනාකරණය
10. විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක්

**ජාතික ආරක්ෂාවට මුල් තැන**

ජාතික ආරක්ෂාව බිඳවැටී ඇති රටක, අන් සියල්ල ඊට සාපේක්ෂ ව බිඳවැටීම සහ එමඟින් ජාතික රාජ්‍යය අහිමිවීම දක්වා වන අර්බුදකාරී වාතාවරණයක් ගොඩනැඟීමට ඇති හැකියාව අප සමකාලීන ජාත්‍යන්තර උදාහරණ ඇසුරෙන් අවබෝධ කරගෙන ඇත. කවර රාජ්‍යයක හෝ පැවැත්ම රඳා පවතින්නේ ජාතික ආරක්ෂාව කෙරෙහි තබන ඉහළ අවධානයට සාපේක්ෂව ය. එබැවින් අපගේ පාලනයක් යටතේ ප්‍රජාතන්ත්‍රවාදී මහජන අවකාශයන් අහුරාලීමෙන් තොර ව ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරනු පිණිස අවශ්‍ය නවීන ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට කටයුතු කෙරේ.

### 1. ජාතික ආරක්ෂාවට මුල් තැන

ජාතික ආරක්ෂාව බිඳවැටී ඇති රටක, අන් සියල්ල ඊට සාපේක්ෂ ව බිඳවැටීම සහ එමඟින් ජාතික රාජ්‍යය අහිමිවීම දක්වා වන අර්බුදකාරී වාතාවරණයක් ගොඩනැඟීමට ඇති හැකියාව අප සමකාලීන ජාත්‍යන්තර උදාහරණ ඇසුරෙන් අවබෝධ කරගෙන ඇත. කවර රාජ්‍යයක හෝ පැවැත්ම රඳා පවතින්නේ ජාතික ආරක්ෂාව කෙරෙහි තබන ඉහළ අවධානයට සාපේක්ෂව ය. එබැවින් අපගේ පාලනයක් යටතේ ප්‍රජාතන්ත්‍රවාදී මහජන අවකාශයන් අහුරාලීමෙන් තොර ව ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරනු පිණිස අවශ්‍ය නවීන ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට කටයුතු කෙරේ.

### 2. මිත්‍රශීලී සහ නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක්

ශ්‍රී ලාංකේය අභිමානය ලෝකය ඉදිරියේ ඉහළින් ඔසවා තැබීම අපේ විදේශ ප්‍රතිපත්තියේ පදනම වේ. රටේ ස්වෛරීත්වය හා ස්වාධීනත්වය කිසිම කොන්දේසියක් මත පාවා නොදෙන, භූමිය හෝ රාජ්‍ය ව්‍යවසායයන් විදේශයන් අතට පත් නොකරන සහ රටට අහිතකර ගිවිසුම් අත්සන් නොතබන ප්‍රතිපත්තිය අප ආරක්ෂා කරන්නෙමු. ඒ වෙනුවට අප ලොව සියලු රටවල් සමාන මිතුරන් සේ සලකා ක්‍රියා කරන ‘සමමිත්‍ර විදේශ ප්‍රතිපත්තියක්’ අනුගමනය කරන්නට කැප වෙමු.

### 3. පිරිසිදු රාජ්‍ය පාලනයක්

අද දවසේ රටේ ජනතාව හඬ නඟා අපෙන් ඉල්ලා සිටින ප්‍රධානතම ඉල්ලීම නම් ජනතා අපේක්ෂා ඉටු කරන රාජ්‍ය පාලනයක් බිහි කිරීම ය. ඒ යටතේ පාරදෘශ්‍ය ප්‍රතිපත්ති රාමුවක් යටතේ මහජන නියෝජිතයන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ පිරිසිදු කැප කිරීම සහතික කරන දූෂණයෙන් තොර රාජ්‍ය පාලනයක් අප ස්ථාපනය කරන්නෙමු.

### 4. ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්

දේශපාලන පක්ෂවල සහ ඒවායේ නායකයින්ගේ උවමනා එපාකම් සහ පෞද්ගලික අභිලාශයන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව භාවිතා කළ යුගය අවසන් කර අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කර තිබෙන ව්‍යාකූලත්වය පිටුදකිමින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය ප්‍රමුඛත්වයේ තබා ක්‍රියාත්මක කරන නව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් අප නොපමාව ඉදිරිපත් කරන්නෙමු.

### 5. එලදායී පුරවැසියෙක් - සශ්‍රීක මානව සම්පතක්

රටක සමෘද්ධිය රඳා පවතින්නේ එහි වාසය කරන පුරවැසියන්ගේ දැනුම, හැකියාව සහ කාර්යශූරත්වය මත ය. එහෙත් යුගයෙන් යුගය ලෝකය තුළ නිර්මාණය වන අලුත් ප්‍රවණතා, මහා ඉදිරි පිම් සමඟ අප ද ඊට අනුකූල ව ගමන් කිරීමට නම් නවෝත්පාදනය පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධනය කළ යුතු යග ඒ සඳහා නිරෝගී, දැනුමෙන් සවිමත්, එලදායී පුරවැසියෙක් ගොඩනැගීමේ වගකීම අප බාර ගන්නෙමු.

### 6. ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්

අප විසින් ගොඩනැගූ පොදු ජනතාවට බරක්නොවූ දේශීය ව්‍යාපාරිකයා ශක්තිමත් කළ ආර්ථිකය කඩා විනාශ කිරීමේ වගකීම සම්පූර්ණයෙන්ම වත්මන රජය විසින් භාර ගත යුතු ය. දේශීය ව්‍යාපාරියා ගොඩගැනීම සඳහා අවශ්‍ය වන්නේ වේගයෙන් වැඩකරන රටකි. ඒ සඳහා වන නිශ්චිත ඉලක්කයක් සහිත සංවර්ධන ව්‍යාපෘති රජය සතු විය යුතු ය. එම වැඩ පිළිවෙළ දැනටමත් අපි සකස් කර අවසන් ය.  එහෙත් ඒ සඳහා පළමුව දේශීය ව්‍යාපාරිකයන් මුහුණ දී ඇති අර්බුදයෙන් ඔවුන් ගොඩගත යුතු ය. ඒ සඳහා  ඔවුනට අවශ්‍ය සියලු පහසුකම් මුල් වසර කීපය තුළ දීම ලබා දෙනු ඇත. සෑම පුරවැසියෙකුටම නිශ්චිත ආර්ථික ස්ථාවරත්වයක්, දියුණුවීමේ සමාන අවස්ථා සහ ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අයිතිය ස්ථාවර කිරීම සඳහා අපගේ ජනතා කේන්ද්‍රීය ආර්ථික සංකල්පය මත අපි නිබඳවම පෙනී සිටින්නෙමු. ඒ සඳහා වන කඩිනම් ජීවන වැඩසටහනට අමතරව අපේ අරමුණ ධනපතීන් ට වඩා පොදු ජනතාව නඟා සිටුවීමය අප ඒ සඳහා සූදානම් ය.

### 7. තාක්ෂණය මත පදනම් වන සමාජයක්

නවීන තාක්ෂණය සහ ගෝලීය ප්‍රවණතාවන් වැළඳගන්නා තරුණ සිතුම්පැතුම්වලට සමපාත වන හා නවෝත්පාදනයන්ට ප්‍රමුඛත්වය ලැබෙන සංවර්ධනයේ නව මානයන් කරා යා හැකි තාක්ෂණීකරණ සැලසුමක් අද රටට අවශ්‍ය ය. අපට සංවර්ධනයේ ඉහළ ම හිණි පෙත්තට ළඟාවීමට නම් නූතන තාක්ෂණික දැනුම සහ භාවිතය නොපමා ව අත්පත් කර ගැනීමට අවශ්‍ය යග අපේ කේන්ද්‍රීය අවධානය යොමු කර තිබෙන්නේ දැනුමෙන් සහ කුසලතාවෙන් පරිපූර්ණ අනාගත පරපුරක් නිර්මාණය කර ගැනීම සඳහා ය.

### 8. භෞතික සම්පත් සංවර්ධනය

අපේ රට ඉහළ ම සංවර්ධන ඉසව්ව කරා ගෙන යාම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන ම ක්ෂේත්‍රය වන්නේ අපේ භෞතික සම්පත් වඩා ඵලදායී ලෙස පරිභෝජනය කිරීම ය. රටේ සුළු ප්‍රදේශයක් සීමාව ඉක්මවා පරිභෝජනය කරන අතර විශාල ප්‍රදේශයක් ඌන පරිභෝජනයෙන් යුක්ත යග එම නිසා පහසුකම් සහ ආර්ථික අවස්ථා රට පුරා ම ව්‍යාප්ත කරමින් රටේ ඕනෑ ම ස්ථානයක් නවීන මානව ජනාවාසයකට සුදුසු ස්ථානයක් බවට පත් කිරීම අපට පැවරී තිබෙන අභියෝගයකි. එම අභියෝගය භාර ගැනීමට අප සූදානම් ය.

### 9. තිරසාර පරිසර කළමනාකරණය

ගහකොළ, ඇළදොළ සහ සතා සීපාවා මුල් කරගත් පරිසරය බැඳී ඇත්තේ අපගේ සුසුමත් සමඟ ය. එබැවින් අනාගත පරම්පරාව වෙනුවෙන් අප පරිසරය තිරසාර ලෙස ආරක්ෂා කරගත යුතු ය. අලුත් වන වගා සංග්‍රාමයක් මෙන් ම සියලු වනාන්තර ආරක්ෂා කිරීමට අප කටයුතු කළ යුතු ය. යල්පිනූ නීති රාමුව වෙනස් කර සියලු පරිසර අවභාවිතයන් නිමා කිරීම සඳහා අවශ්‍ය නීති රාමුවක් ස්ථාපනය කළ යුතු ය. සියලු ගංගා, ඇළදොළ පිරිසිදු කිරීමේ වැඩසටනක් සමඟ පුරවැසියන්ට ජලය සඳහා ඇති ශුද්ධ වූ අයිතිය ආරක්ෂා කිරීම අප සතු වගකීමක් වේ.

සෞභාග්‍යවත් දේශයක් කරා පහසුවෙන් ළඟාවීමට බාධාවක් ව පවතින සහ රාජ්‍ය යන්ත්‍රය අකර්මණ්‍ය කර ඇති යල්පැන ගිය නීති රෙගුලාසි, ආයතනික සහ පරිපාලන ව්‍යවස්ථා සියල්ල නැවත සලකා බලා අවශ්‍ය ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ‘නීති ප්‍රතිසංස්කරණ සභාවක්’ ස්ථාපනය කෙරෙනු ඇත.

### 10. විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක්

සමාජයට සාධාරණය ඉටු කරන නීතියේ ආධිපත්‍යයට ගරුකරන පුරවැසියෙකු නිර්මාණය කර නීතිගරුක රටක් සහ තිරසාර සමාජයක් ගොඩනැගීම අපේ බලාපොරොත්තුව සහ අධිෂ්ඨානය වේ. ඒ ව්‍යායාමයේ දී ආබාධිත සහ විශේෂ හැකියාවන් සහිත ප්‍රජාවට සහ තරුණ තරුණියන්ට ද ප්‍රධාන සමාජ ආර්ථික ධාරාවෙන් බැහැර ව හුදෙකලා වීමට ඉඩ තබන්නේ නැත. ඔවුන්ට ද අභිමානයෙන් යුතු ව නැඟී සිටීමට, සිය ජීවන අභිවෘද්ධිය උදාකර ගැනීමට අවශ්‍ය පහසුකම් සහිත පරිසරයක් නිර්මාණය කෙරෙනු ඇත.





# දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක්

# දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක්

- ***දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක්***
- ***දූෂණය පරදවන රටක්***
- ***රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ප්‍රතිපත්තිය***
- ***ජාතික සමගියට මග කියන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක්***

### කාර්යක්ෂම පාලනයක්

ආසියාවේ ආශ්චර්යමත් ම රටක් ලෙස අප ගොඩනැගූ ශ්‍රී ලංකාව පසුගිය අවුරුදු හතරහමාර තුළ දකුණු ආසියාවේ අඩුම ආර්ථික සංවර්ධන වේගය ඇති රට බවට පත් වී ඇත්තේ මෙම ආණ්ඩුවේ අදූරදර්ශී සහ අකාර්යක්ෂ ම පාලනය නිසාය. එම කඩාවැටීමට ප්‍රධාන ම හේතුව වී ඇති රාජ්‍ය යන්ත්‍රණය ඵලදායී කාර්යක්ෂම රාජ්‍ය යන්ත්‍රණයක් බවට පත් කිරීම සඳහා අපි කැප වන්නෙමු.

### රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ප්‍රතිපත්තිය

රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ශක්තිමත් පෞද්ගලික අංශයක් මෙන් ම ශක්තිමත් රාජ්‍ය අංශයක් ද පැවතීම අවශ්‍ය වේ. අප රාජ්‍ය ව්‍යවසායයන් කිසිසේත් පෞද්ගලීකරණයට ලක් කරන්නේ නැත. ඒ වෙනුවට සෑම රාජ්‍ය ව්‍යවසායක් ම ඵලදායී සහ කාර්යක්ෂම ආයතන බවට පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

### දූෂණය පරදවන රටක්

දීර්ඝ කාලයක් තිස්සේ ජනතාව ඉහළ ප්‍රමුඛත්වයකින් ඉල්ලා සිටින වංචා දූෂණ රටින් තුරන් කිරීමට කිසිදු චකිතයකින් තොරව අප කැප වන බව සපථ කොට ප්‍රකාශ කරන අතර වංචා දූෂණයෙන් තොර දේශපාලඥයෙකු පමණක් නොව පුරවැසියෙකු ද බිහිකර ගැනීමට අප කටයුතු කරන්නෙමු.

### ජාතික සමගියට මග කියන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක්

ලෝක බලවතුන්ගේ සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල අභිලාෂයන් වෙනුවට ජනතාවගේ අභිලාෂයන් මත නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට අප කටයුතු කරන්නෙමු. මහජනතාවගේ මෙන් ම විවිධ දේශපාලන සහ බහුජන සංවිධානවල යෝජනා ලබා ගෙන නව ව්‍යවස්ථාව බිහි කිරීම සඳහා පාර්ලිමේන්තුවේ සියලු ම පක්ෂ නියෝජනය කරන තේරීම් කාරක සභාවක් පත් කිරීමට කටයුතු යොදනු ලැබේ.

### කාර්යක්ෂම පාලනයක්

ආසියාවේ ආශ්චර්යමත් ම රටක් ලෙස අප ගොඩනැගූ ශ්‍රී ලංකාව පසුගිය අවුරුදු හතරහමාර තුළ දකුණු ආසියාවේ අඩුම ආර්ථික සංවර්ධන වේගය ඇති රට බවට පත් වී ඇත්තේ මෙම ආණ්ඩුවේ අදූරදර්ශී සහ අකාර්යක්ෂ ම පාලනය නිසාය. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය අංශය, දේශීය ව්‍යාපාරිකයා, නිෂ්පාදකයා සහ ගොවියා ඇතුළු සමස්ත පද්ධතියම බරපතල පරිහානියකට ලක්ව ඇත. එම කඩාවැටීමට ප්‍රධාන ම හේතුව වී ඇති රාජ්‍ය යන්ත්‍රණය ඵලදායී කාර්යක්ෂම රාජ්‍ය යන්ත්‍රණයක් බවට පත් කිරීම සඳහා අපි කැප වන්නෙමු.

- අනාගතයේ දී අපේක්ෂා කරන සෞභාග්‍යවත් දේශයක් ගොඩනැගීම සඳහා කැපවෙන කාර්ය ශූර අමාත්‍ය මණ්ඩලයක අවශ්‍යතාව මතු වී ඇත. ඒ අනුව මෙම ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික සහ යථාර්ථවාදීව අනාගත කැබිනට් මණ්ඩලයේ සංයුතිය තීරණය කරන අතර ඒ ඒ අමාත්‍යාංශ සඳහා අදාළ වගකීම දැරිය හැකි සුදුසු ම මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනේ.
- අමාත්‍යාංශවල කාර්යභාරය ක්‍රියාවට නැංවිය යුත්තේ අමාත්‍යවරයාගේ උපදෙස් අනුව අමාත්‍යාංශ ලේකම්වරයා ප්‍රමුඛ රාජ්‍ය නිලධාරී ව්‍යුහය මඟින් ය. එම නිසා සෑම අමාත්‍යාංශයක ම ලේකම්වරයා ලෙස පත් කරනු ලබන්නේ මනා පරිපාලන හැකියාවන් සහ අත්දැකීම් සහිත 'ක්‍රියාශීලි' අපේක්ෂිත අරමුණු හඹා යා හැකි නිර්මාණශීලී රාජ්‍ය නිලධාරීන් හා විද්වත් වෘත්තිකයන් ය.
- එම නිලධාරීන්ට සහ ඉදිරියේ දී එම තනතුරුවලට පත්වීමට සුදුසුකම් ඇති දෙවන පෙළ නිලධාරීන්ට ද අවශ්‍ය අතිරේක විෂය දැනුමට සහ විශේෂ කළමනාකරණ පුහුණුව නිරන්තර ව යාවත්කාලීන කර ගැනීමට සෑම දෙනෙකුටම සමාන අවස්ථාව සැලසෙන පරිදි දෙස් විදෙස් පුහුණුවලට යොමු කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ඇති කරනු ලැබේ.
- සියලු ම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සංස්ථා සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස නායකත්ව හැකියාවෙන් යුත, විෂය පිළිබඳ මනා දැනුමක් ඇති, සුදුසුකම් හා අත්දැකීම්වලින් පරිපූර්ණ සහ ක්‍රියාශීලී පිරිසක් පත් කරන

නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ. නවීන සමාජයීය අවශ්‍යතාවලට ගෝචර වන පරිදි අදාළ සේවා කාර්යක්ෂම කිරීම සඳහා තාක්ෂණ විශේෂඥයන් (Technocrats) අනුයුක්ත කෙරෙනු ඇත.

- දැනට පවතින එකිනෙකට නොගැළපෙන සහ ප්‍රායෝගික නොවන රාජ්‍ය පරිපාලන සහ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ, ප්‍රතිශෝධනය කොට කාර්යක්ෂම ජනතා සේවයකට ඉඩ සැලසෙන පරිදි යාවත්කාලීන කිරීමට අවශ්‍ය අනිකුත් චක්‍ර ලේඛ හඳුන්වා දෙනු ලැබේ.

- දැනට පවතින "ජාතික ආර්ථික සභාව" සහ "උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ඒජන්සිය" අහෝසි කර ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රම සම්පාදනය, රාජ්‍ය ආයෝජන වෙන් කිරීම. ජාතික සංවර්ධන සැලසුම්කරණය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ව්‍යාපෘති විශ්ලේෂණය සහ කළමනාකරණය යන කේන්ද්‍රීය අංශ විනිවිද භාවයකින් යුතු ව සහ රජයේ උපාය මාර්ගික දිශානතීන්ට අනුව සිදුකිරීම සඳහා ජනාධිපතිවරයා යටතේ පවතින 'ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රම සම්පාදන කොමිෂන් සභාවක්' අවශ්‍ය බලතල සහිත ව ස්ථාපනය කෙරේ.

- ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ජනතාවගේ සහභාගිත්වය ලබාගත් පරිදි ම ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කිරීමේදීත් ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කෙරෙනු ඇත. ඒ යටතේ නිලධාරීන්ට, වෘත්තීයවේදීන්ට, අත්දැකීම්වලින් පරිපූර්ණ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සහ වෙනත් අභිලාෂී පාර්ශවකරුවන්ට සහභාගිවීමට අවස්ථාව ලැබේ.

- වර්ෂ 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එහි සාමාජික රටවල එකඟතාව ඇතිව ප්‍රකාශයට පත් කරන ලද "තිරසාර සංවර්ධන ඉලක්ක" වසර 2030 වන විට ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය පරිදි අමාත්‍යාංශ මණ්ඩල ව්‍යුහ සකස් කෙරෙනු ඇත.

- අපගේ රජයේ අප විසින් අත්පත් කරගත යුතු සහශ්‍රක ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

- සෞභාග්‍යවත් රාජ්‍යයක් ගොඩනැගීම යනු සියලු දෙනා සතුටින් ජීවත්වන රටක් නිර්මාණය කිරීම ය. ඉදිරි දශකය තුළ අපේ රට ලෝක සන්තුෂ්ටි දර්ශකයේ (World Happiness Index) ඉදිරියෙන් ම සිටින රටක් බවට පත්කිරීම අපගේ අභිලාෂය වේ.

- රාජ්‍ය වියදම් සහ ආයෝජන සඳහා ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ආමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ නිලධාරී කණ්ඩායමක නිරීක්ෂණයට ලක් කර එහි නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

- වසර තුනක කාලයකට රාජ්‍ය අංශයට (මැති ඇමතිවරුන් ද ඇතුළුව) වාහන හා කාර්යාල මිලදී ගැනීම, කුලියට ගැනීම නවතනු ලැබේ.

## දූෂණය පරදවන රටක්

නිදහසින් පසු සෑම ආණ්ඩුවකටම පාහේ දූෂණ චෝදනා එල්ල වී තිබූ නමුත් යහපාලන නමින් බලයට පැමිණි පවතින රජය තරම් වංචාවේ දූෂණයේ යෙදුණු තවත් කිසිදු රජයක් නොවීය. රාජපක්ෂ දේශපාලන නිමා කිරීම සඳහා පසුගිය වසර හතර හමාරක කාලයක් මුළුල්ලේ දේශපාලන වෛරයෙන් මත්ව නැටූ නාඩගමෙන් මෙම රජය ජනතාවට ඔප්පු කර පෙන් වූයේ අපේ නිදොස් බව පමණි. ඒ ගැන අප ඔවුන්ට ස්තුතිවන්ත වන නමුත් මෙම රජය මහ බැංකු කොල්ලයේ සිට සංස්කෘතික අරමුදල කොල්ලකෑම දක්වා සිදුකළ සියලු දූෂණ වංචාවන්ට එරෙහිව නඩු පවරා නීතිමය දඬුවම් ලබා දෙනවා මෙන්ම එලෙස උපයාගත් සියලු ධනය අපි නැවත අයකර ගන්නෙමු. අපි යෝජනා කරන ජනතා කේන්ද්‍රීය ආර්ථිකය යටතේ වැය කිරීමට අපේක්ෂිත මුදල් වලින් කොටසක් රාජ්‍ය අංශයේ දූෂණය වැළැක්වීම හරහා උපයා ගන්නෙමු. අපගේ ප්‍රමුඛතාව වර්තමානය සඳහා පමණක් නොවේ. අනාගත අපගේ රජයක් යටතේ ද කිසිදු වංචා දූෂණයකට ඉඩ නොතබන්නෙමු. ඒ අනුව දීර්ඝ කාලයක් තිස්සේ ජනතාව ඉහළ ප්‍රමුඛත්වයකින් ඉල්ලා සිටින වංචා දූෂණ රටින් තුරන් කිරීමට කිසිදු චකිතයකින් තොරව අප කැප වන බව සපථ කොට ප්‍රකාශ කරන අතර වංචා දූෂණයෙන් තොර දේශපාලඥයෙකු පමණක් නොව පුරවැසියෙකු ද බිහිකර ගැනීමට අප කටයුතු කරන්නෙමු.

- මහබැංකු මංකොල්ලය ඇතුළු පසුගිය කාලය තුළ සිදු කළ මහාපරිමාණ වංචා හා දූෂණ 20 ඇතුළු අපරාධයන්ට සම්බන්ධ සියලු වැරදිකරුවන්ට නොපමා ව දඬුවම් කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක ලැබේ.

- වංචා සහ දූෂණවලට සම්බන්ධ අප පක්ෂයේ ඕනෑම තලයක මහජන නියෝජිතයන් හෝ ඉහළ නිලධාරීන් වහාම පක්ෂයෙන් ඉවත් කරන අතර කිසිදු බලපෑමකින් තොරව නීතිය ක්‍රියාවේ යෙදවීමට සහය ලබා දෙනු ඇත. ඒ සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කරනු ලැබේ.

- පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය නීත්‍යනුකූල ව පිහිටුවා මහජනතාවට ද පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථා ව සලසා දෙන අතර පාට පක්ෂ නොසලකා සියලු දූෂණ හා වංචාවලට වැටබඳින 'මූල්‍ය අපරාධ යුක්ති විනිශ්චය අධිකරණයක්' පිහිටුවනු ලැබේ.

- මිලදී ගැනීම්වල ද, අනුමැතියන් දීමේ ද, බදු තීරණය කිරීමේ ද, ලංසු ක්‍රමයට කොන්ත්‍රාත්කරුවන් තීරණය කිරීමේ දී වැනි තවත් ක්‍රියාවන් බොහොමයක දී අවසාන තීන්දුව ගන්නට පුද්ගලයෙක් අවශ්‍ය නැත. මේ සියල්ල තාක්ෂණය භාවිතයෙන් කළ හැකි වේ.

- ඒ නිසා අද බොහෝ රටවල් දූෂණය පිටු දැකීමට තාක්ෂණය විසඳුම ලෙස යොදා ගෙන ඇත. අපටත් පහසුවෙන් ම මෙය හඳුන්වා දෙන්නට පුළුවන. ඒ වගේම අපි බලාපෙරොත්තු වනුයේ ජාතික ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් සකස් කොට එය අකුරටම ක්‍රියාත්මක කිරීම සඳහා ය. අපගේ දැක්ම යථාර්ථයක් බවට පත්කර ගැනීම සඳහා රාජ්‍ය සම්පත් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කෙරෙන, ජනතාවට වගකියන, නැවුම් රාජ්‍ය පාලනයක් අප නිර්මාණය කෙරේ.

# දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක්

- ඊ තාක්ෂණික භාවිතයන් මූලික කරගත් ක්‍රමවේදයන් ඔස්සේ දූෂණ මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර ප්‍රධාන රාජ්‍ය ආයතන තුළ සිදුවන හෝ සිදුවීමට යන වංචා සහ දූෂිත ගනුදෙනු පිළිබඳව නිර්ණාමිකව පැමිණිලි කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීමට අවශ්‍ය නීති සම්පාදනය කෙරෙනු ඇත.

- අල්ලස් සහ දූෂණයෙන් තොරව රාජ්‍ය සේවය පවත්වාගෙන යාම හා පෞද්ගලික අංශය ඊට අනුරූප සිය කටයුතු මෙහෙයවීමෙන් ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අල්ලස් හෝ දූෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පුළුල් ආයතනික හා නීතිමය ව්‍යුහයක් තුළ ශක්තිමත් කරනු ලැබේ.

### රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ප්‍රතිපත්තිය

රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ශක්තිමත් පෞද්ගලික අංශයක් මෙන් ම ශක්තිමත් රාජ්‍ය අංශයක් ද පැවතීම අවශ්‍ය වේ. අපේ රාජ්‍ය ව්‍යවසායයන් කිසිසේත් පෞද්ගලීකරණයට ලක් කරන්නේ නැත. ඒ වෙනුවට සෑම රාජ්‍ය ව්‍යවසායක් ම ඵලදායී සහ කාර්යක්ෂම ආයතන බවට පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

- කිසිදු රාජ්‍ය ව්‍යවසායක් දිගින් දිගට ම රාජ්‍ය අය - වැයට බරක් නොවන ආයතන වශයෙන් පවත්වාගෙන යාමට නිශ්චිත සහ විධිමත් වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.

  ඒ යටතේ,

  - රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරුන් සහ අධ්‍යක්ෂක මණ්ඩල තම පාලනය යටතේ ඇති ආයතනවල ලාභදායීත්වය සහ මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර ඔවුන්ගේ කාර්යසාධනය වාර්ෂික ව ඇගයීමට ලක් කෙරෙනු ඇත.

  - එම ආයතනවල වංචා සහ දූෂණ සම්පූර්ණයෙන් ම තුරන් කිරීමේ වගකීම සභාපතිවරයාට සහ අධ්‍යක්ෂක මණ්ඩලයට පැවරේ.

  - රාජ්‍ය ව්‍යවසායන් කළමනාකරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් තෝරා ගැනීමේ දී දේශපාලන හිතවත්කම් මත නොව අදාළ වගකීම් දැරීමට ඇති සුදුසුකම් මත එම තෝරාගැනීම් සිදු කෙරේ.

  - රාජ්‍ය බැංකු, ප්‍රධාන දෙපාර්තමේන්තු සහ සංස්ථා සඳහා ව්‍යවහාරික විගණන සිදු කර විනිවිද භාවයෙන් යුත් ආදායම් හා වියදම් පිළිබඳ කළමනාකරණ ක්‍රමවේදයක් ඇති කරන අතර නියමිත ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුව වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමේ වගකීම පැහැර හරින අධ්‍යක්ෂ මණ්ඩල වෙනස් කිරීමට කටයුතු කෙරේ.

- රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය තහනම් කිරීම සඳහා නීතිමය රාමුවක් හඳුන්වා දීම සහ පෞද්ගලීකරණය කර ඇති රජයේ කොටස් නියෝජනය කිරීමේ දී රාජ්‍ය ප්‍රතිපත්ති අනුකූල කිරීමේ කොන්දේසි නීතිගත කිරීමට කටයුතු කෙරේ.

- ජාතික ව්‍යවසායන් ලෙස ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, වරාය හා ගුවන් තොටුපළ, ශ්‍රී ලංකන් ගුවන් සේවය, විදුලිබල මණ්ඩලය ඛණිජතෙල් සංස්ථාව, ජලසම්පාදන මණ්ඩලය, ලංකා ගමනාගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය මුළුමනින්ම වෘත්තීය කළමනාකරණයකට ලක් කරනු ලැබේ.

- ජාතික ව්‍යවසාය අධිකාරියක් (National Enterprises Authority) ඇති කිරීම මගින් මෙම ව්‍යවසායන් ලාබදායී ව්‍යාපාර ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය වාණිජමය පරිසරයක් ඇති කරනු ලැබේ.

- දැනට පවතින නිශ්චිත හා කාලීන අවශ්‍යතාවක් නොමැති එක හා සමාන කාර්යයන් ඉටු කරන රාජ්‍ය ව්‍යවසායයන් වැඩි ඵලදායීතාවක් සහ කාර්යක්ෂමතාවක් අත්පත් කර ගැනීම සඳහා ඒකාබද්ධ කිරීමට බලාපොරොත්තු වේ.

- ග්‍රාමීය සංවර්ධන, කෘෂිකර්ම, සංචාරක, වැවිලි කර්මාන්ත, පර්යේෂණ, ඉදිකිරීම් සහ අපනයන වැනි ක්ෂේත්‍රවල ඇති විවිධ රාජ්‍ය ආයතන කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එක් එක් ක්ෂේත්‍ර ඉලක්ක කර ගත් ඒකාබද්ධ යාන්ත්‍රණ ව්‍යුහයක් ඇති කරනු ලැබේ.

- රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා පිළියෙල කිරීම විධිමත් කළ යුතු අතර ඒ ඒ ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳ ආයතන කාර්ය සාධනය ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කරනු ලැබේ. ඒ අතරින් රජයට මූලෝපායික ව වැදගත් යැයි මහා භාණ්ඩාගාරය විසින් හඳුනාගනු ලැබ ඇති ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

- මහා පරිමාණ වාණිජමය රාජ්‍ය ව්‍යවසාය පරිපාලනයට දක්ෂ පළපුරුදු කළමනාකරුවන් බඳවාගැනීමේ දී වෙළෙඳපොළට සරිලන වැටුපක් ගෙවීමට හැකිවන ආකාරයට දැනට පවත්නා ආයතනික නීති සංශෝධනය කෙරෙනු ඇත. එසේ බඳවා ගන්නා කළමනාකරුවන්ගේ වගකීම් නිවැරදි ව ඉටු කරන්නේ ද යන්න සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට පසුවිපරම් ක්‍රමවේදයක් ස්ථාපනය කෙරේ.

- තරගකාරී ව්‍යාපාරික ක්ෂේත්‍රවල වාණිජ කටයුතුවල යෙදී සිටින රාජ්‍ය ව්‍යවසායන් ඒ ඒ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වන පෞද්ගලික ව්‍යවසායයන් සමඟ තරග කිරීමේ දී රාජ්‍ය ව්‍යවසායකයන්ට විශේෂ රාජ්‍ය අනුග්‍රහයක් ලබා දීම මගින් වෙළෙඳපොළ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට බාධා නොකිරීමට කටයුතු සම්පාදනය කෙරේ.

- රාජ්‍ය ව්‍යවසායවලට දේශපාලන මැදිහත්වීම් සඳහා ඇති ඉඩකඩ දුරුකිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කෙරෙනු ඇත.

## ජාතික සමගියට මග කියන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක්

- වත්මන් ව්‍යවස්ථාව පිළිබඳ සමාජයේ ඇත්තේ ප්‍රබල විවේචනයකි. එහි අඩුපාඩු දුරු කිරීමට ගෙනා 19වන සංශෝධනයෙන් සිදු වූයේ ප්‍රශ්න නැති කිරීමට ගොස් නැති ප්‍රශ්න ඇති කිරීමකි. එබැවින් ලෝක බලවතුන්ගේ සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල අභිලාෂයන් වෙනුවට ජනතාවගේ අභිලාෂයන් මත නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට අප කටයුතු කරන්නෙමු. මහජනතාවගේ මෙන් ම විවිධ දේශපාලන සහ බහුජන සංවිධානවල යෝජනා ලබා ගෙන නව ව්‍යවස්ථාව බිහි කිරීම සඳහා පාර්ලිමේන්තුවේ සියලු ම පක්ෂ නියෝජනය කරන තේරීම් කාරක සභාවක් පත් කිරීමට කටයුතු යොදනු ලැබේ.

- විධායක ජනාධිපති ක්‍රමය, මිශ්‍ර මැතිවරණ ක්‍රමය, පළාත් සභා ක්‍රමය, නීතියේ ආධිපත්‍ය සවිමත් කිරීම වැනි ක්ෂේත්‍ර සියල්ල ම ව්‍යවස්ථා සම්පාදනයේ දී අවධානය යොමු කෙරේ.

- ඒකීය රාජ්‍යය, බුදු දහමට ලැබෙන ප්‍රමුඛස්ථානය, ආගමික නිදහස ඇතුළු මූලික මිනිස් අයිතිවාසිකම් එකී ව්‍යවස්ථාවේ අනුල්ලංඝනීය ලක්ෂණයන් වේ.

- ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් අතර මතු වන අවිශ්වාසයන් දරුණු ගැටුම් දක්වා වර්ධනය වීම වැළැක්වීම සඳහා ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වෙන සර්ව අගමික උපදේශන සභාවක් පත් කරනු ලැබේ. එමෙන් ම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සර්ව ආගමික සභාවක් බිහිකර ආගමික කණ්ඩායම් අතර මතුවන ගැටළු සාකච්ඡාවෙන් සම්මුතියට එළැඹීම හරහා විසඳා ගැනීමේ යාන්ත්‍රණයක් බිහි කරනු ලැබේ.

- ආයුධ සමඟ භාර වූ කොටි සාමාජිකයින් 13,784කට සමාව දී පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීමට අප පියවර ගත්තත් යුද සමයේ දී විවිධ චෝදනාවන්ට ලක් වුණු හමුදා සාමාජිකයින් පිළිබඳ එවැනි පියවරක් ගත්තේ නැත. යුද්ධය සම්බන්ධව විවිධ චෝදනා ලැබී සිටින සහ දඬුවම් විඳින හමුදා සාමාෂිකයින් මෙන් ම එල්ටීටීඊ සාමාජිකයින් ද ක්‍රමානුකූලව පුනරුත්ථාපනය කර නිදහස් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට කටයුතු කරනු ලැබේ.

- ත්‍රස්තවාදී චෝදනා යටතේ අත්අඩංගුවට ගෙන දිගු කලක් රඳවා ගෙන සිටින සියලු ම දෙනා මාස තුනක් ඇතුළත නඩු පැවරීමට හෝ නිදහස් කිරීමට කටයුතු සම්පාදනය කෙරේ.

- ජනවර්ග අතර සැකය වර්ධනය කරන ප්‍රධාන සාධකයක් ලෙස ඉඩම් ප්‍රශ්නය හඳුනා ගැනෙන අතර එම ඉඩම් සම්පත දකින්නේ අතීතයෙන් අපට උරුම වුණු දායාදයකට වඩා අනාගතයෙන් ලබාගත් ණයක් ලෙසය. එබැවින් ඉඩම් පරිහරණය මනා සැලසුමකින් කළ යුතු වේ. ඒ සඳහා පාරම්පරික සහ පුරා විද්‍යාත්මක වැදගත්කම, ඛනිජ සම්පත් පිහිටීම, නාගරීකරණය, යටිතල පහසුකම් සංවර්ධනය, අනාගත අවශ්‍යතා යන සාධක පදනම් කරගෙන ඉඩම් පරිහරණ සැලැස්මක් ජාතික, පළාත්, දිසා සහ ප්‍රාදේශීය මට්ටමෙන් පිළියෙල කිරීම සඳහා ජාතික ඉඩම් කොමිසමක් ඇති කරනු ලැබේ.

- ජනවර්ග අතර සැකයට ප්‍රධාන හේතුව වී ඇත්තේ සන්නිවේදන නොහැකියාව නිසා ඇතිවුණු අනවබෝධය ය. එබැවින් සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගන්නා දරුවන්ට දෙමළ භාෂාව ද දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා දරුවන්ට සිංහල භාෂාව ද ඉගැන්වීමට අවශ්‍ය සියළුම පහසුකම් සපසා එකී භාෂාවන් ඉගෙන ගැනීම අනිවාර්ය කෙරේ.

- ඇතැම් මහජන නියෝජිතයන්ගේ සහ ඔවුන්ගේ අනුගාමිකයන්ගේ අවිනීත හැසිරීම් දේශපාලකයා පිළිබඳ දැවැන්ත කළු චිත්‍රයක් ඔබේ මනසේ ඇඳී ඇති බව නොරහසකි. එසේ අවනීතව හැසිරෙන මහජන නියෝජිතයින්ට රටේ නීතයට අනුව කටයුතු කරනු ඇත.

- මැතිවරණය සඳහා දැවැන්ත මුදලක් වියදම් කිරීමේ සංස්කෘතිය හේතුවෙන් දේශපාලකයින් සහ ජාවාරම්කරුවන් අතර අනිසි බැඳියාවක් ගොඩනැගෙනවා වගේම ජාවාරම්කරුවන් දේශපාලනයට පැමිණීමේ ප්‍රවණතාවක් ඇති බව සත්‍යයකි. එබැවින් දේශපාලකයින්ට මැතිවරණයක දී වියදම් කළ හැකි උපරිම මුදල තීරණය කිරීමටත් එකී උපරිමය ඉක්මවා කටයුතු කරනවාදැයි අධීක්ෂණය කිරීමටත් මැතිවරණ කොමිසමට බලය පැවරෙන නීති සම්පාදනය කරනු ලැබේ.

- ජනාධිපතිවරණයෙන් පසු නොපමා ව පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය ජනමතය ද මෙම ජනාධිපතිවරණයේ දී අප ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.





# සුරක්ෂිත රටක්

## තෙවන කොටස

# සුරක්ෂිත රටක්

### ජාතික ආරක්ෂාවට මුල් තැන

ජාතික ආරක්ෂාව රටක සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයකි. රටක සාමය සහ සුරක්ෂිත බව නැතිනම් මානව නිදහස අහිමි වන නිසා එය එදිනෙදා ජීවිතයේ පටන් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ කටයුතු දක්වා බලපැවැත්වේ. දේශීය සහ විදේශීය ආයෝජකයන් දිනා ගැනීමට නම් රටේ ආරක්ෂාව පිළිබඳව ඔවුනට ස්ථිර විශ්වාසයක් තිබිය යුතු ය. රටක ජාතික ආරක්ෂාව බිඳවැටුණ විට රටේ ආර්ථිකයත් බිඳවැටෙන බව අප අත්දැකීමෙන් දනිමි. එවැනි රටක ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අසීරු වේ. ඒ නිසා ජාතික ආරක්ෂාව අප ආණ්ඩුවේ පළමු වගකීම බවට පත් වේ.

### අප්‍රේල් 21 සිද්ධිය

ත්‍රස්තවාදය පරාජයට පත් කිරීමෙන් වසර 10ක් ඇතුළත යළිත් එවන් වූ බිහිසුණු ත්‍රස්තවාදයකට රට ගොදුරු වීමේ ප්‍රධාන හේතුව ආරක්ෂක ක්ෂේත්‍රයේ සිදුවූ බරපතළ කඩා වැටීම ය. අනෙක් හේතුව නම් ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන දේශපාලන හා සමාජ පසුබිමක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැගී තිබීම ය. එබැවින් අන්තවාදය පෝෂණය කරනු ලබන සියලු ම මාර්ග සහ ක්‍රියාකාරකම් අහුරාලීමට අවශ්‍ය නිශ්චිත පියවර ගැනීමට අප පසුබට වන්නේ නැත.

### ආරක්ෂක සේවා : සේවයට ආරක්ෂාවක්

රට ත්‍රස්තවාදයෙන් මුදාගෙන රටේ ඒකීයභාවය සහ ජාතික ආරක්ෂව සහතික කිරීම සඳහා අභීතව ක්‍රියා කළ අපේ ත්‍රිවිධ හමුදාව ලෝකයේ සිටින විනයගරුක අභීත හමුදාවකි. පසුගිය වසර කීපය තුළ එම හමුදාවන්ගේ සහ නිලධාරීන්ගේ කීර්තියට අගෞරව වන බොහෝ දේ සිදු විය. අප නැවතත් ආරක්ෂක හමුදාවන්ගේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක බලකායේ ගෞරවය ආරක්ෂා කිරීමට පියවර ගන්නෙමු.

### මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් වන රටක්

මත්ද්‍රව්‍ය භාවිතය ආර්ථික පරිහානිය සමඟ බැඳුණු සමාජ පරිහානියේ ද කැඩපතකි. වර්තමානයේ මත්ද්‍රව්‍ය භාවිතය, විශේෂයෙන් පාසල් දරුවන් අතර පවා පැතිර යන වසංගතයක් බවට පත් වී ඇත. එහි ඇති භයානක ම අනතුර නම් ඒවා දරුවන් පහසුවෙන් පොළඹවා ගත හැකි ආකාරයට විවිධ ස්වරූපයෙන් වෙළෙඳපොළට පැමිණීම ය. එම නිසා මත් උවදුරෙන් රට නිදහස් කර ගැනීම සඳහා අප නොපසුබටව කටයුතු කරන්නෙමු.

### මිත්‍රශීලී සහ අදීන ජාත්‍යන්තර සම්බන්ධතා

රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවල දී හෝ ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනුවල දී කිසිදු විදේශ රටක් හමුවේ දණින් නොවැටෙන, සැම විට ම රටේ ස්වෛරීත්වය ආරක්ෂා කරන, ඕනෑ ම රටක් සමඟ සම තත්ත්වයෙන් ගනුදෙනු කරන, දේශීය අභිමානය සුරකින ගෞරවාන්විත පාලනයක් අප යළිත් ස්ථාපිත කරන්නෙමු.

### ජාතික ආරක්ෂාවට මුල් තැන

ජාතික ආරක්ෂාව රටක සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයකි. රටක සාමය සහ සුරක්ෂිත බව නැතිනම් මානව නිදහස අහිමි වන නිසා එය එදිනෙදා ජීවිතයේ පටන් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ කටයුතු දක්වා බලපැවැත්වේ. දේශීය සහ විදේශීය ආයෝජකයන් දිනා ගැනීමට නම් රටේ ආරක්ෂාව පිළිබඳව ඔවුනට ස්ථිර විශ්වාසයක් තිබිය යුතු ය. රටක ජාතික ආරක්ෂාව බිඳවැටුණ විට රටේ ආර්ථිකයත් බිඳවැටෙන බව අප අත්දැකීමෙන් දනිමි. එවැනි රටක ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අසීරු වේ. ඒ නිසා ජාතික ආරක්ෂාව අප ආණ්ඩුවේ පළමු වගකීම බවට පත් වේ.

- ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස පවත්වාගෙන යන අතර ඊට එරෙහි ව කටයුතු කිරීමට කිසිවෙකුට හෝ ඉඩ තබන්නේ නැත.
- මේ භූමිය මත ජනවාර්ගික, ආගමික හෝ වෙනත් කවර ආකාරයකවත් ත්‍රස්තවාදයකට ඉඩ තබන්නේ නැති අතර සෑම පුරවැසියෙකුට ම බියෙන් සහ සැකෙන් තොර ව ජීවත්වීම සඳහා ඇති අයිතිය සම්පූර්ණයෙන් ම ආරක්ෂා කෙරේ.
- ඒ සඳහා එදා තිබුණු ජාතික ආරක්ෂක බුද්ධි යාන්ත්‍රණය නැවත සක්‍රීය කර දක්ෂ නිලධාරීන්ට නැවතත් මෙම වගකීම් භාර දෙනු ලැබේ. ත්‍රිවිධ හමුදාව හා පොලීසිය සතු බුද්ධි සේවා අංශ සියල්ල ජාතික ආරක්ෂාව පිළිබඳව වගකියන, බලතල සහිත බුද්ධි අංශ ප්‍රධානියෙකු යටතට ගෙන, අදාළ අංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කරනු ලැබේ.
- විදේශ බුද්ධි සේවා සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම, අපේ ආරක්ෂක නිලධාරීන්ට අවශ්‍ය දේශීය හා විදේශීය පුහුණුව ලබාදීම වාගේ ම ඔවුන්ගේ සේවා කටයුතු සාර්ථක ව ඉටු කිරීම සඳහා නවීන තාක්ෂණයේ සහාය ලබා දෙනු ලැබේ.

- වර්ෂ 2015 සිට පසුගිය කාලය පුරා ම ඇති කරන ලද විවිධ පීඩාවන් නිසා බිඳ වැටුණ ආරක්ෂක හමුදාවල හා පොලිස් නිලධාරීන්ගේ මානසිකත්වය සහ අභිමානය නැවත නඟා සිටුවීම සඳහාත් දේශපාලන බලපෑමෙන් තොර ව සිය රාජකාරි කරගෙන යාම සඳහාත් අවශ්‍ය නීතිමය රැකවරණය ඔවුන්ට ලබා දෙනු ඇත.
- රටේ හමුදාමය ආරක්ෂාව මෙන් ම රාජතාන්ත්‍රික ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව ද සහතික කරන අතර අපරාධ, මත්ද්‍රව්‍ය, මුදල් විශුද්ධිකරණය සහ දූෂණයෙන් රට මුදවා තබා ගැනීමට අවශ්‍ය සියලු කාර්යයන් ඉටු කෙරේ.
- රටේ සියලු ම පුරවැසියන්ටල විශේෂයෙන් ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය සැම විට ම පවත්වාගෙන යනු ඇත.
- දෙස් විදෙස් ආයෝජකයන්ට ඔවුන්ගේ ව්‍යාපාරවලට අල්ලස්, කප්පන් ගෙවීමෙන් තොර ව, තර්ජනවලින් මිදී සැක බිය රහිතව තම ආර්ථික කාර්යයන් කරගෙන යාමට අවශ්‍ය පරිසරය නොපමා ව සකස් කර දෙනු ලැබේ.

### අප්‍රේල් 21 සිද්ධිය

ලොව පුරා විවිධ මුහුණුවරින් ව්‍යාප්ත වෙමින් පවතින ඉස්ලාම් රාජ්‍ය ත්‍රස්තවාදය දැන් දැන් මහා පරිමාණ මට්ටමින් ශ්‍රී ලංකාව තුළට ද කඩා වැද ඇති බව අප්‍රේල් 21 දා සිදු වුණු බරපතළ ත්‍රස්ත ප්‍රහාරය නිසා පැහැදිලි වේ. ත්‍රස්තවාදය පරාජයට පත් කිරීමෙන් වසර 10ක් ඇතුළත යළිත් එවන් වූ බිහිසුණු ත්‍රස්තවාදයකට රට ගොදුරු වීමේ ප්‍රධාන හේතුව ආරක්ෂක ක්ෂේත්‍රයේ සිදුවූ බරපතළ කඩා වැටීම ය. අනෙක් හේතුව නම් ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන දේශපාලන හා සමාජ පසුබිමක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟී තිබීම ය. එබැවින් අන්තවාදය පෝෂණය කරනු ලබන සියලු ම මාර්ග සහ ක්‍රියාකාරකම් අහුරාලීමට අවශ්‍ය නිශ්චිත පියවර ගැනීමට අප පසුබට වන්නේ නැත.

- මෙම සිද්ධියට සම්බන්ධ සියලු නීති උල්ලඝනය කර ඇත සැබෑ අපරාධකරුවන්, හවුල්කාරවන්, අනුබල දුන් සහ වගකීම් පැහැර හළ සියලු දෙනා ම රටට හෙළිදරව් කිරීමට සහ නොපමා ව දඬුවම් ලබා දීම සඳහා පූර්ණ බලතල සහිත ස්වාධීන කොමිෂන් සභාවක් පත් කරන අතර එම කොමිෂමේ යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ.
- එම ප්‍රහාරය නිසා ආපදාවට ලක් වූවන්ගෙන් ශ්‍රී ලංකාව තුළ ප්‍රතිකාර කළ නොහැකි අයට රජයේ පූර්ණ අනුග්‍රහයෙන් විදේශ ප්‍රතිකාර ලබා දීමට කටයුතු කරනු ලැබේ.
- සදාකාලික අකර්මණ්‍යතාවයට පත් වූවන් දීර්ඝ කාලීනව රැකබලා ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කෙරෙනු ඇත.
- එම ප්‍රහාරය නිසා දෙමව්පියන් අහිමි වූ දරුවන් රැකබලා ගැනීමට ඉදිරිපත් වී සිටින ඔවුන්ගේ ඥාතීන්ට මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කෙරේ.
- එම සිද්ධිය නිසා මියගිය පුද්ගලයන්ට සහ පවුල්වලට මෙතෙක් ගෙවා නොමැති වන්දි මාස දෙකක් තුළ ලබා දීමට කටයුතු සම්පාදනය කෙරේ.

### මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් වන රටක්

මත්ද්‍රව්‍ය භාවිතය ආර්ථික පරිහානිය සමඟ බැඳුණු සමාජ පරිහානියේ ද කැඩපතකි. වර්තමානයේ මත්ද්‍රව්‍ය භාවිතය, විශේෂයෙන් පාසල් දරුවන් අතර පවා පැතිර යන වසංගතයක් බවට පත් වී ඇත. එහි ඇති භායානක ම අනතුර නම් ඒවා දරුවන් පහසුවෙන් පොළඹවා ගත හැකි ආකාරයට විවිධ ස්වරූපයෙන් වෙළෙඳපොළට පැමිණීම ය. එම නිසා මත් උවදුරෙන් රට නිදහස් කර ගැනීම සඳහා අප නොපසුබටව කටයුතු කරන්නෙමු.

- වරාය හා ගුවන් තොටුපළවලින් මත්ද්‍රව්‍ය මෙරටට ඇතුළුවීම වැළැක්වීම සඳහා රේගු නිලධාරීන්ට අවශ්‍ය මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ නවීන තාක්ෂණික උපකරණ ලබා දේ.
- මත් උවදුර පාලනය සඳහා පොලීසියේ, ආරක්ෂක හමුදාවල මෙන් ම ජනතා සහභාගිත්වය ද සහිත කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.
- මත්ද්‍රව්‍ය උවදුරට පහසුවෙන් ගොදුරු කරගත හැකි දරුවන් ඉන් මුදා ගැනීම සඳහා පාසල් පද්ධතිය, ගුරුවරුන්ගෙන් සහ දෙමව්පියන්ගෙන් ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කෙරේ.
- මත්ද්‍රව්‍ය හෝ එවැනි විවිධ මත් ආදේශක වෙත දරුවන් පොළඹවන, විශේෂයෙන් ම පාසල් අවට ඒවා අලෙවි කරන, පුද්ගලයින් සහ කුඩා කඩ, ඖෂධ අලෙවිසැල් සහ ජංගම වෙළෙන්දන් නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් කිරීමේ ක්‍රමවේදයක් සකස් කෙරේ.
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සම්පූර්ණයෙන් ම එයින් මුදවා ගැනීම සඳහා අවශ්‍ය 'ජාතික පුනරුත්ථාපන වැඩසටහනක්' ආරම්භ කරනු ඇත. ඒ යටතේ අති නවීන ප්‍රතිකාර සහ විශෝධන ක්‍රමවලින් සමන්විත ජාතික මත් නිවාරණ මධ්‍යස්ථාන 4ක් මුළු රටම ආවරණය වන ලෙස ආරම්භ කෙරේ.

### ආරක්ෂක සේවා : සේවයට ආරක්ෂාවක්

රට ත්‍රස්තවාදයෙන් මුදාගෙන රටේ ඒකීයභාවය සහ ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා අභීතව ක්‍රියා කළ අපේ ත්‍රිවිධ හමුදාව ලෝකයේ සිටින විනයගරුක අභීත හමුදාවකි. පසුගිය වසර කීපය තුළ එම හමුදාවන්ගේ සහ නිලධාරීන්ගේ කීර්තියට අගෞරව වන බොහෝ දේ සිදු විය. අප නැවතත් ආරක්ෂක හමුදාවන්ගේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක බලකායේ ගෞරවය ආරක්ෂා කිරීමට පියවර ගන්නෙමු.

- අභූත හේතු මත නිසි ආකාරයේ චෝදනාවක් පවා රහිතව දේශපාලන පළිගැනීම සඳහා බන්ධනාගාර භාරයේ රඳවා සිටින සියලු ආරක්ෂක පොලිස් හෝ සිවිල් ආරක්ෂක බලකා සෙබලුන් හා නිලධාරීන් වහාම නිදහස් කිරීම සඳහා අවශ්‍ය පියවර වහාම ගනු ලැබේ.
- ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක බලකායේ දැනට පවතින වැටුප්, දීමනා, උසස්වීම් මෙන් ම විශ්‍රාම වැටුප් පිළිබඳව ඇති සියලු ම ගැටලු නොපමා ව විසඳීමට කටයුතු කෙරේ.
- ක්‍රියාන්විත සේවයේ නියුතුව සිටි 2009 වර්ෂයට පෙර සේවයට බැඳුණු සියලු නිලයන්ගේ ප්‍රමාද වී ඇති උසස්වීම් නියමිත දිනට හිමිවන පරිදි ලබා දීම සඳහා නොපමා ව කටයුතු කෙරේ.

# සුරක්ෂිත රටක්

- ත්‍රිවිධ හමුදා භටයින්ගේ නේවාසිකාගාර පහසුකම් සම්බන්ධයෙන් ඇති සියලු ගැටලු සොයා බලා අවශ්‍ය සියලු පහසුකම් ලබා දීමට කටයුතු කෙරේ.
- විශ්‍රාමිකයන් ඇතුළුව සියලු ම සන්නද්ධ හමුදා සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ලබා දෙන වෛද්‍ය පහසුකම් තව දුරටත් වැඩි කෙරෙනු ඇත.
- ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවල සේවය කිරීමේ අවස්ථා වැඩි කර ගැනීම සඳහා කටයුතු කරන අතර ඒ සඳහා විනිවිදභාවයෙන් යුතු තෝරා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කෙරේ.
- සේවයේ යෙදෙන සහ ආබාධිත හමුදා සාමාජිකයින්ටත් මියගිය රණවිරුවන්ගේ බිරිඳ හෝ දරුවන් ද ඇතුළත් වන පරිදි නිවාස ඉදිකිරීම හෝ මිල දී ගැනීම සඳහා රජයේ බැංකු හරහා නව සහන ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත.
- දැනට පවතින ආයතනික ණය ක්‍රම නැවත සලකා බලන අතර බාධාවකින් තොර ව ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කෙරේ.
- ක්‍රියාන්විත සේවයේ යෙදී සිටි රණවිරුවන් වෙත යෝජිත පදක්කම් හා වර්ණ කඩිනමින් ලබා දීමත් සියලු නිලයන් වෙත හිමි විය යුතු දැනට කප්පාදු කර ඇති විදේශ පුහුණුවීම් නැවත් ලබා දීමට කටයුතු සම්පාදනය කෙරේ.

### තෘප්තිමත් පොලිස් සේවයක් සඳහා

තිස් වසරක් පුරා පැවති යුද්ධය නිමා කිරීමේ දී පොලිසිය විසින් ඉටු කළ විරෝධාර කැපවීම අපි කිසි සේත් අඩුවෙන් තක්සේරු කරන්නේ නැත. මානුෂීය මෙහෙයුමේ දී ආබාධිත වූ පොලිස් රණවිරුවන් 1567 දෙනා සහ රට වෙනුවෙන් තම ජීවිත පරිත්‍යාග කළ පොලිස් රණවිරුවන් 2594 සහ අදත් පීඩා විඳින ඔවුන්ගේ පවුල් මේ මොහොතේ දී අදත් සිහිපත් කරන්නේ හද පිරී ගෞරවයෙනි. අප කිසිදා ඔවුන් අමතක කරන්නේ හෝ අඩු සැලකිලි දක්වන්නේ නැත. ඉදිරියේ දී අප ගොඩනඟන සාමකාමී සමාජය තුළ වැඩි වගකීමක් පැවරෙන්නේ පොලීසියට ය. එබැවින් අපගේ ඉදිරි රජය යටතේ ත්‍රිවිධ හමුදාවන්ට අදාළ වරප්‍රසාදවලට හිමිකම් කියන, නීතිය අකුරටම ඉටු කිරීම සඳහා දේශපාලනඥයින්ට නොනැමෙන, ගෞරවාන්විත සහ ජනතා මිත්‍ර පොලිස් සේවයක් නිර්මාණය කිරීම පිණිස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගැනේ.

- පොලිස් සේවයේ දැනට පවතින සියලු වැටුප් විෂමතා ඉවත් කිරීමට පියවර ගන්නා අතර ප්‍රමාණවත් වැටුප් වර්ධක ක්‍රමයක් හඳුන්වා දේ.
- පොලිස් සේවයේ යෙදී සිටින සියලු ම පොලිස් නිලධාරීන් හා කාන්තා පොලිස් නිලධාරීනියනට උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදය ස්ථිරවම සංශෝධනය කෙරේ. ඒ යටතේ එක් තනතුරක සිට තවත් තනතුරකට උසස්වීමට ගත කළ යුතු කාලය අඩු කිරීම, අවශ්‍ය සුදුසුකම්, සේවා කාලය සහ සේවා විශිෂ්ටතා මත දේශපාලන හෝ වෙනත් බලපෑම්වලින් තොර ව දැනට ඇති සියලු බාධා ඉවත් කර සුදුසුකම් සපුරන්නෙකුට කොස්තාපල් තනතුරේ සිට ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දක්වා ඉහළට යා හැකි ක්‍රමවත් උසස්වීමේ ක්‍රියාවලියක සකස් කෙරෙනු ඇත.
- සේවයේ යෙදෙන කාන්තා පොලිස් නිලධාරීනියන් ඇතුළු සියලු ම පොලිස් නිලධාරීන්ට අවශ්‍ය නිපුණතාව සහ දැනුම ලබා ගැනීම සඳහා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වැනි පොලිස් විශ්වවිද්‍යාලයක් නොපමාව ආරම්භ කෙරෙනු ඇත.
- පොලිස් නිලධාරීන් මුහුණ දෙන රාජකාරී දුෂ්කරතා අවම කර කාර්යක්ෂම පොලිස් සේවයක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය සියලු ම නවීන පහසුකම් සහ ප්‍රමාණවත් වාහන පහසුකම් නොපමා ව ලබා දෙනු ලැබේ. පොලිස් ස්ථානාධිපතිවරු පත් කිරීම, ස්ථාන මාරු වීම් ලබා දීම සහ විදේශ පුහුණු අවස්ථා ආදිය දේශපාලන හිතවත්කම් සහ මැදිහත්වීම්වලින් බැහැරව ලබා දෙන පාරදෘශ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරේ.
- පොලිස් ස්ථානාධිපතිවරු පත් කිරීම, ස්ථාන මාරු වීම් ලබා දීම සහ විදේශ පුහුණු අවස්ථා ආදිය දේශපාලන හිතවත්කම් සහ මැදිහත්වීම්වලින් බැහැර ව ලබා දෙන පාරදෘශ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.
- අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් නොවීම නිසා පොලිස් නිලධාරීන්ට පැය 8 සේවා මුරය ඉක්මවා දීර්ඝ වේලාවක් රාජකාරිය කිරීමට සිදු වීමේ දුෂ්කරතා ව නිමා කිරීම සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කර නොපමාව පොලිස් සේවයේ පවතින පුරප්පාඩු පුරවනු ලැබේ. එමඟින් හැකි සෑම අවස්ථාවක දී ම පැය 8 සේවා මුරය නොඉක්මවා රාජකාරිය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ.
- පොලිස් සේවයේ සියලු නිලයන්ට අවශ්‍ය නේවාසික පහසුකම් අඩුවකින් තොර ව සපයා දීමට අවශ්‍ය පියවර ගන්නා අතර හැකිතාක් නිවසේ සිට රාජකාරියට යාමට හැකි ස්ථානවල සේවයේ අනුයුක්ත කිරීමට පියවර ගනු ලැබේ.
- හමුදාවන්ට ලබා දෙන ආකාරයේ ආහාර දීමනාව ඇතුළු සියලු ම සංයුක්ත දීමනා ඉහළ දමන අතර එම දීමනා වැටුපට එකතු නොකර, එහෙත් වැටුප සමඟ ගෙවීමට කටයුතු කෙරේ.
- පොලිස් පරීක්ෂකවරුන්ට පහළ නිලයන් සඳහා රාජකාරී භාවිතයට සහ පෞද්ගලික පරිහරණයට අවසර ඇති යතුරුපැදියක් ලබා දෙනු ලැබේ.
- පොලිස් රොහලේ දැනට පවතින සියලු ම අඩුපාඩු සම්පූර්ණ කර සියලු පහසුකම්වලින් සමන්විත පොලිස් රෝහලක් බවට පත් කෙරේ.
- සියලු නිලයන් සඳහා දැනට පවතින සුභසාධන වැඩපිළිවෙළවල් අධ්‍යයනය කර සියලු දෙනාට ම වැඩි ප්‍රතිලාභයක් හිමිවන ආකාරයට පොලිස් පවුල් සුභසාධක සංගම් හා පොලිස් සේවා වනිතා ඒකකවල ව්‍යවස්ථා සංශෝධනය කිරීමට කටයුතු සම්පාදනය කරන අතර නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- ජාත්‍යන්තර කීර්තියක් දිනාගෙන ඇති පොලිස් ක්‍රීඩා සහ තූර්යවාදක කණ්ඩායම්වල සියලු අවශ්‍යතා සොයා බලා ඒවා සම්පූර්ණ කිරීම නොපමාව සිදු කරනු ලැබේ.

### සිවිල් ආරක්ෂක බලකාය

- සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පවතින සියලු ම ගැටළු නොපමා ව නිරාකරණය කිරීම සඳහා කටයුතු යෙදේ.
- අත්‍යවශ්‍ය ම අවස්ථාවක දී හැරුණු කොට සිවිල් ආරක්ෂක නිලධාරීන් දීර්ඝ කාලයක් තමන් ජීවත්වන ප්‍රදේශයෙන් බැහැරව සේවයේ යෙදවීම නතර කෙරෙනු ඇත.

### අප වෙනුවෙන් කැප වූ රණවිරු ඔබ වෙනුවෙන්

මියගිය රණවිරුවන් ඔවුන්ගේ ජීවිත කැප කළේ සහ ආබාධ සහිත රණවිරුවන් සාදාකාලික ආබාධ සහිත තත්ත්වයට පත් වී ඇත්තේ තමන් වෙනුවෙන් නොව මේ රට සහ එහි වෙසෙන සිංහල, දමිල, මුස්ලිම්, මැලේ, බර්ගර් යනාදී සියලු පුරවැසියන් වෙනුවෙනි. එම නිසා අපගේ වගකීම වන්නේ ඔවුන් වෙනුවෙන් සැපයිය හැකි සියලු පහසුකම් සපයා දීම ය.

- 2015 වර්ෂයට පෙර එක් කොටසක් ලෙස සැලකූ මියගිය සහ ආබාධ සහිත රණවිරුවන් 2015 පසු කොටස් දෙකක් ලෙස සලකා ක්‍රියා කිරීම නිසා ඇති වී තිබෙන වැටුප් විශ්‍රාම වැටුප් විෂමතාවන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.
- පූර්ණ ආබාධ සහිත රණවිරුවන්ට ඔවුන්ගේ ජීවිතාන්තය දක්වාත් ඉන්පසුව ඔවුන්ගේ භාර්යාවන්ට හෝ අවිවාහකනම් මවට හෝ පියාට ඔවුන්ගේ ජීවිත කාලයටත් ඔවුන් අවසන් වරට ලැබූ වැටුපට සමාන විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.
- ආබාධ සහිත රණවිරුවන්ගේ විශ්‍රාම වැටුපෙන් වරින් වර අසාධාරණ ලෙස මුදල් කපා ගැනීම වහාම අත් හිටුවනු ලැබේ.
- අත් පා අහිමි වූ රණවිරුවන් හට සිය කෘත්‍රිම අත් පා සාදවා ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් මිනුම් ලබා දීමට ක්‍රමවේදයක් සකස් කරන අතර වත්මන් රජය මගින් අතහැර දමා ඇති අභිමංසල වැනි ආබාධ සහිත රණවිරුවන්ගේ ශාරීරික හා මානසික ඒකාග්‍රතාව පවත්වා ගැනීම සඳහා පහසුකම් ලබාදුන් ව්‍යුහයන් නැවත සක්‍රිය කර පවත්වා ගෙන යනු ලැබේ.

### මිත්‍රශීලී සහ නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක්

රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවල දී හෝ ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනුවල දී කිසිදු විදේශ රටක් හමුවේ දණින් නොවැටෙන, සැම විට ම රටේ ස්වෛරීත්වය ආරක්ෂා කරන, ඕනෑ ම රටක් සමඟ සම තත්ත්වයෙන් ගනුදෙනු කරන, දේශීය අභිමානය සුරකින ගෞරවාන්විත පාලනයක් අප යළිත් ස්ථාපිත කරන්නෙමු.

- රටේ ආර්ථික වැදගත්කමකින් යුතු අපේ භූමි ප්‍රදේශ හෝ භෞතික සම්පත් කිසි විටෙකත් අන් රටවල් සතු නොකිරීමට කටයුතු යෙදේ.
- රටේ ස්වාධීනත්වය පාවා නොදී, සෑම රටක් සමඟම සමමිතුරු සබඳතා පවත්වා ගැනීම අපේ විදේශ ප්‍රතිපත්තිය වේ.
- ලෝක ආර්ථික කේන්ද්‍රය ආසියාව දෙසට නැඹුරු වෙමින් තිබෙන නිසා අපි ආසියාතික රටවල් සමඟ වෙළඳ හා ආර්ථික සබඳතා ශක්තිමත් කළ යුතුය.
- කලාපීය ආරක්ෂාව සම්බන්ධවයෙන් ඉන්දියාව ඇතුළු සාර්ක් සහ බිම්සෙක් ඉන්දියානු සාගර වෙරළ කලාප රටවල් සහ සංවිධාන සමඟ මනා අවබෝධයකින් කටයුතු කිරීම අපගේ අරමුණ වේ.
- ඇමරිකාව, චීනය, යුරෝපා සංගමය, ජපානය, කැනඩාව, දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව හා රුසියාව වැනි ආර්ථික වශයෙන් දියුණු රටවල ගෝලීය වෙළෙඳපොළ තුළ ඇති වටිනාකම කිසිවිටෙක අවතක්සේරු කරනුයේ නැත.
- මැදපෙරදිග රටවල්, වියට්නාමය, ඉන්දුනීසියාව, මැලේසියාව, කොරියාව, පිලිපීනය හා සිංගප්පූරුව වැනි කලාපීය රටවල් සමඟ සමීප වෙළෙඳ සබඳතා ගොඩ නැංවීමට කටයුතු කෙරේ.
- පසුගිය වසර 5 තුළ අත්සන් කර ඇති ද්වීපාර්ශ්වික සහ බහු පාර්ශ්වික ගිවිසුම් නැවත සමාලෝචනයට ලක් කරන අතර ඒවායේ ඇති රටට අහිතකර කොන්දේසි ඉවත් කිරීම සඳහා අදාළ රටවල් සමඟ සාකච්ඡා කිරීමට කටයුතු යෙදේ. ඉදිරියේ දී රටට අහිතකර කිසිදු ගිවිසුමකට අත්සන් නොකිරීමට අප විසින් පියවර ගැනේ.





# ඵළදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

සිව්වන කොටස

# ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

***අපට ඇති වටිනාම සම්පත වනුයේ මානව සම්පත යි. එම මානව සම්පත සංවර්ධනය කළ හැක්කේ නිරෝගී සහ ඵලදායී පුද්ගලයෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් යන සංකල්පය මත පදනම් වූ දැනුම් කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැඟීමෙන් බව අපේ පිළිගැනීම ය. සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟීමේ මූලික අඩිතාලම වන්නේ ද එය යි. එම නිසා මානව සම්පත සංවර්ධනය කිරීම අපගේ රජයේ මූලික වගකීම යි.***

### ප්‍රඥාසම්පන්න පුරවැසියෙක් : දැනුමෙන් පිරිපුන් සමාජයක්

රටේ අනාගත පරපුර ඵලදායී පුරවැසියන් බවට පත් කිරීමට නම් ඔවුන් නව දැනුමෙන් පෝෂණය කිරීම, ඔවුන්ගේ කුසලතා ඔප්නැංවීම සහ නිපුණතා සංවර්ධනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. තරුණ තරුණියන්ට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතරමං වීමට සිදු නොවන පරිදි පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත. ඒ තුළ තාක්ෂණික අධ්‍යාපන අවස්ථා ප්‍රසාරණය කිරීම මෙන් ම අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තාක්ෂණය භාවිතය පුළුල් කිරීමටත් අප බලාපොරොත්තු වේ.

### මව් තුරුලෙන් ගුරුමව් සෙවණට

පෙර පාසල, දිවාසුරැකුම් මධ්‍යස්ථානය හෝ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය යනුවෙන් හැඳින්වෙන ආයතන පද්ධතිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතාමත් වැදගත් කලාපයක් ලෙස අප හඳුනාගෙන තිබේ.



### නිරෝගීකමට මුල් තැන

මානව ප්‍රාග්ධන සංවර්ධනයේ දී වැදගත්වන අනෙක් ප්‍රධාන කුලුන සෞඛ්‍ය අංශය වේ. නිරෝගී සෞඛ්‍යය හේතුවෙන් කායික, මානසික, සමාජයීය සුවතාව පමණක් නොව අධ්‍යාත්මික සුවතාව ද වර්ධනය වන නිසා නිවැරැදි ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මත පදනම් ව ජාතික සහ ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන තිරසාර සෞඛ්‍ය වැඩපිළිවෙළක් ඇති කරනු ලැබේ.




### ජව සම්පන්න තාරුණ්‍යය ය

සමස්ත ජනගහනයෙන් හතරෙන් එකකට ආසන්න තරුණ ජනගහනය තිරසාර සංවර්ධන ක්‍රියාවලියට විශ්වසනීය සහ තාර්කික පදනමක් සහිත සාඩම්බර හවුල්කාරයින් ලෙස සක්‍රීය ව සම්බන්ධ කරගත යුතු ය. ඒ සඳහා ඔවුන්ගේ අභිලාෂයන් හඳුනාගෙන ඒවා මුදුන්පත් කිරීම සඳහා නිශ්චිත සහ ස්ථිර වැඩපිළිවෙළක් යටතේ විසඳුම් ලබාදීමෙන් තෘප්තිමත් තරුණ පරපුරක් බිහි කිරීම අපේ අභිප්‍රාය වේ.

### සමාජ ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක්

දරුවෙකු ඵලදායී පුරවැසියෙකු කිරීමේ අත්පොත තැබීම සිදුවන්නේ මව අතින් වන අතර පවුලක සතුට රඳා පවතින්නේ ගෘහිණිය මත ය. සමාජයක් විනය ගරුක වන්නේ නිවසේ සිට ම දරුවන්ට නිවැරදි මඟ පෙන්වීම ලබා දුන් විට ය. මේ නිසා අපේ දීර්ඝ කාලීන අරමුණ ඉටුකර ගැනීමට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ. රැකියා වෙළඳපොළ තුළ පමණක් නොව පෞද්ගලික ව්‍යවසායකයන් වශයෙනුත් කාන්තාවන්ගේ දායකත්වය අපේ ආර්ථිකයට ඉතා වැදගත් වේ.

## නැණබල සහිත ළමා පරපුරක්

රටේ අනාගත අස්වැන්න දරු පරපුර යි. රටේ තිරසාර පැවැත්ම, ජාතියේ අනාගතය, මතු අභිමානය රඳා පවතින්නේ දරු පරපුර මත ය. දෑ කුල ගොතින් තොර ව නිරෝගී ශරීර සෞඛ්‍යයකින් සහ මනා වූ පෞරුෂයකින් යුත් අනාගත ශ්‍රී ලාංකිකයෙකු නිර්මාණය කළ හැක්කේ ළමා පරපුරට නිවැරදි ව මඟ පෙන්වීමෙන් පමණ ය. ඒ සඳහා අප මහත් ඕනෑකමින් කරන්නෙමු.



## විශේෂ හැකියාවන් සහ ආබාධ සහිත පුද්ගලයින්

විශේෂ හැකියාවන් සහිත සහ ආබාධ සහිත පුද්ගලයන් අප සලකන්නේ සමාන අයිතිවාසිකම් ඇති පිරිසක් ලෙස ය. ඔවුනට අවශ්‍ය වන්නේ අපගේ අනුකම්පාව නොව සමාන ජීවන අවස්ථා පුළුල් කර දීම ය. ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ.

## ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක්

වැඩිහිටි ජනගහනය ඉහළ යමින් තිබෙන රටක් ලෙස ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ද සංකීර්ණතා රාශියකට මුහුණ දෙමින් ඇත. මෙම දෙටු පුරවැසියන්ගෙන් අතිමහත් බහුතරයකට තමන්ගේ පැවැත්ම සඳහා විශ්‍රාම වැටුපක් හෝ වෙනත් රක්ෂණ ආවරණයක් නැත. වැඩිහිටියන් වැඩිහිටි නිවාසගත කිරීම තවමත් අපේ රටේ සැලකෙන්නේ සමාජ නින්දාවක් ලෙස ය. ඒ කෙසේ වුවත් සියලු ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය රජයේ වගකීමක් ලෙස සලකන අතර ඔවුන් සියලු දෙනාට ම ගෞරවයෙන් යුක්ත ව ජීවත්වීමට අවශ්‍ය වටපිටාවක් ඇති කෙරේ.

## 'රට වෙනුවෙන් වැඩ' සංස්කෘතියක්

රටක ආර්ථිකයේ ගාමක බලවේගය ජාතික ශ්‍රම බළකාය ය. රටක සංවර්ධනය රඳා පවතින්නේ එහි ඵලදායී ක්‍රියාකාරීත්වය මත ය. එම නිසා අප සූදානම් වන සංවර්ධනයේ යෝධ පිම්ම සඳහා අවශ්‍ය පුහුණුල කාර්යශීලී සහ රට වෙනුවෙන් කැපවෙන 'වැඩ කිරීමේ සංස්කෘතියක්' ඇති කළ යුතු ය. අඩුවෙන් වැඩකරන, දුප්පත් ව ජීවත්වන ශ්‍රමිකයෙකු වෙනුවට වැඩියෙන් වැඩ කරන, පොහොසත් ජීවිතයක් ගත කරන ශ්‍රමිකයෙක් නිර්මාණය කිරීම අපගේ වගකීම වේ.

## සෑම පවුලකට ම සුවපහසු නිවාසයක්

සෑම දෙනාට ම නිවසක අවශ්‍යතාව තිබුණත් එම අවශ්‍යතාව තනියම සම්පූර්ණ කරගන්න බැරි බව අප දන්නා අතර අපගේ රජය කාලයේ නිවාස ප්‍රශ්නයෙන් විශාල වශයෙන් පීඩාවට පත් වී සිටි නාගරික අඩු ආදායම්ලාභී ජනතාගේ නිවාස අවශ්‍යතාව විසඳන අතර ම ඔවුනට නව ජීවන ක්‍රමයක් හඳුන්වාදීමට අප ක්‍රියා කළෙමු. අපේ අනාගත රජයක් යටතේ ඒ ආකාරයට ම නාගරික මෙන් ම ග්‍රාමීය ජනතාවගේත් නිවාස අවශ්‍යතාව ඔවුන්ගේ ජීවන මට්ටමත් ඉහළ යන ආකාරයට විසඳිය යුතු ය.



# එළදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

## මානව සම්පත් සංවර්ධනයේ නව දිශානතිය

අපට ඇති වටිනාම සම්පත වනුයේ මානව සම්පත යි. එම මානව සම්පත සංවර්ධනය කළ හැක්කේ නිරෝගී සහ ඵලදායී පුද්ගලයෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් යන සංකල්පය මත පදනම් වූ දැනුම් කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීමෙන් බව අපේ පිළිගැනීම ය. සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමේ මූලික අඩිතාලම වන්නේ ද එය යි. එම නිසා මානව සම්පත සංවර්ධනය කිරීම අපගේ රජයේ මූලික වගකීම යි.

### ප්‍රඥාසම්පන්න පුරවැසියෙක් : දැනුමෙන් පිරිපුන් සමාජයක්

රටේ අනාගත පරපුර ඵලදායී පුරවැසියන් බවට පත් කිරීමට නම් ඔවුන් නව දැනුමෙන් පෝෂණය කිරීම, ඔවුන්ගේ කුසලතා ඔප්නැංවීම සහ නිපුණතා සංවර්ධනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. තරුණ තරුණියන්ට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතරමං වීමට සිදු නොවන පරිදි පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත. ඒ තුළ තාක්ෂණික අධ්‍යාපන අවස්ථා ප්‍රසාරණය කිරීම මෙන් ම අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තාක්ෂණය භාවිතය පුළුල් කිරීමටත් අප බලාපොරොත්තු වේ. ඒ වෙනුවෙන් අධ්‍යාපනයට අදාල සියලු ආයතන එක් අමාත්‍යාංශයක් යටතට පත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

පෙරපාසැල් අධ්‍යාපනයේ සිට උපාධිය දක්වා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව සැකසෙන නිශ්චිත අරමුණක් සහිත තනි විෂය නිර්දේශයක් (Single Curriculum) යටතේ සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇති කෙරේ. ඒ ඔස්සේ සෑම දරුවෙකුටම තම සහජ කුසලතා ඔප්නංවා ගැනීමේ සහ රැකියා වෙළෙඳපොළට ගැළපෙන අධ්‍යාපනයක් වෙත යොමුවීමට ඇති අවස්ථාව පුළුල් කෙරේ.

### මව් තුරුලෙන් ගුරුමව් සෙවණට

පෙර පාසල, දිවාසුරැකුම් මධ්‍යස්ථානය හෝ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය යනුවෙන් හැඳින්වෙන ආයතන පද්ධතිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතාමත් වැදගත් කලාපයක් ලෙස අප හඳුනාගෙන තිබේ. එම ආයතන දරුවන්ට පාසලේ දී ලබාදිය යුතු දැනුම ලබාදෙන තවත් එක් තරගකාරී ස්ථානයක් බවට පත්කිරීම වෙනුවට දරුවන්ට දයාව, කරුණාව, මෛත්‍රිය භුක්ති විඳිය හැකි "පූර්ව අධ්‍යාපන මධ්‍යස්ථාන" බවට පත් කෙරෙනු ඇත.

- සෑම ග්‍රාම සේවා වසමකට ම නියමිත ප්‍රමිතියකින් යුත් එක් පෙර පාසලක් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය සහ දිරි ගැන්වීම් ලබා දී රටේ සෑම දරුවෙකුගේ ම මුල් ළමාවිය සංවර්ධනය සහතික කරනු ලැබේ.
- පෙර පාසල් හෝ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සියල්ල ම නියමිත ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාමට අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කරන අතර එහි අධීක්ෂණය සහ භෞතික පහසුකම් සැපයීම මධ්‍යම රජයේ වගකීම බවට පත් කෙරේ.
- සියලු ම පෙර පාසල් ගුරුවරුන්ට මනෝවිද්‍යාත්මක දැනුම සහිත විධිමත් හා අනිවාර්ය ගුරු පුහුණුවක් රජය මඟින් ලබා දීමට කටයුතු කෙරේ. එම පුහුණුවෙන් පසු සිය පෙරපාසල් ගුරුවර ගුරුවරියන් ස්ථිර වැටුප් ක්‍රමයක පිහිටුවන ඇත.

### පාසල් අධ්‍යාපනයේ නවෝදය

- නිදහස් අධ්‍යාපනය යනු මේ රටේ ජනතාව සතු අයිතියක් බව දැඩි ලෙස පිළිගන්නා අප දැනට ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තව දුරටත් සුරක්ෂිත කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වාර්ෂික ප්‍රතිපාදන වෙනුවෙන් අයවැය ලේඛනයේ අග්‍ර ප්‍රමුඛත්වය පිරිනමනු ලැබේ.
- ග්‍රාමීය පාසල් වැසීයාම වැළැක්වීම සඳහාත් ඒවායේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහාත් ඒවාට තිබිය යුතු නවීන තාක්ෂණය ඇතුළු සියලු ම යටිතල පහසුකම් එක් ප්‍රමිතියක් යටතේ ස්ථාපනය කරන අතර එම පාසල්වලට අවශ්‍ය නියමිත ගුරුවරුන් ප්‍රමාණය ද අතිදුෂ්කර ලෙස හඳුනාගත් පාසැල්වල සේවය කරනු ලබන ගුරුවරුන් සඳහා අමතර දීමනාවක් ද ලබාදීමට කටයුතු කෙරේ.
- ජනප්‍රිය යැයි සම්මත පාසැල්වල මෙන් සියලු භෞතික හා මානව පහසුකම්වලින් සම්පූර්ණ පාසැල් තුන (03) බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පිහිටුව ඒවා ජාතික පාසැල් ලෙස උසස් කෙරෙන අතර ඒ අනුව 353 ක් වූ මෙරට ජාතික පාසැල් සංඛ්‍යාව දහසක් (1,000) දක්වා ඉහළ නංවනු ලැබේ. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි අනෙකුත් පාසැල්වල දරුවන්ට එම පහසුකම් භුක්ති විඳීමට අයිතිය සැලසෙන පොකුරු පාසැල් (Cluster School System) ක්‍රමයක් ද බිහි කිරීමට කටයුතු කෙරේ.
- දැනට ඇති හෝමාගම සහ මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය යන පාසල් දෙකට අමතරව දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකට ම, අවම වශයෙන් "ත්‍රෛභාෂිත, අග්‍රගණ්‍ය සුපිරි ජාතික පාසලක්" බැගින් හිමිවන ද්විතීක ආදර්ශ පාසලක් 20 ක් පළමු වසර දෙක තුළ දී ආරම්භ කරන්නට කටයුතු කරන්නෙමු.
- ප්‍රාථමික පාසල්, "ළමා මිතුරු පාසල්" ලෙස සංවර්ධනය කරන අතර එකේ සිට පහ දක්වා සෑම පන්තියකට ම ගුරුවරු දෙදෙනෙක් යෙදවීමට හැකිවන අයුරින් "ගුරු සහායක සහායිකාවන්" 50,000ක් පාසල් පාදකව, පළමු වසර තුළ දී ම බඳවා ගැනේ.
- විශේෂයෙන් ම දැනට රටේ සිසුන් අතර විශාල ආතතියක් බවට පත් කර ඇති විශ්ව විද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේ ලකුණු ක්‍රමයේ මධ්‍ය අංකනය හෙවත් (Z- Score) ය සඳහා දිස්ත්‍රික්ක පදනම යොදා ගැනුණත් එක් දිස්ත්‍රික්කයක තිබෙන ප්‍රධාන හා ජනප්‍රිය පාසැලට සමාන්තරව දුෂ්කර පැසැල්වල ශිෂ්‍යයන්ට ඒ නිසා ඇතිවන අසාධාරණය ඉවත් කිරීම සඳහා පාසැල් පදනම් වූ නව විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීමට අදහස් කෙරේ.
- නිසි දැනුම, උගත්කම, පුහුණුව සහ අත්දැකීම් මෙන් ම දක්ෂතා ඇති ගුරුවරුන්ට විදුහල්පති ශ්‍රේණියට ඇතුළුවීමේ අවස්ථා පුළුල් කරන අතර රජයේ පාසල්වල සේවය කරන විෂය සම්බන්ධීකරණ, ශ්‍රේණි භාර, අංශ භාර ගුරුවරුන් පමණක්

නොව දක්ෂතා ඇති අනෙක් ගුරුවර ගුරුවරියන්ට ද ඔවුන්ගේ විවිධ දක්ෂතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ සිදු කෙරේ.

- ශ්‍රී ලංකාවේ සමස්ථ ගුරු ප්‍රජාවම උපාධිධාරීන් බවට පත් කිරීම අපගේ විශේෂිත අරමුණ වේ. ඒ සඳහා ගුරු විද්‍යාපීඨ ලෙස පවත්වාගෙන යන පීඨ දහඅට (18) විශ්වවිද්‍යාල පීඨ බවට පත් කෙරේ.
- අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සේවයේ නියුතු ගුරුවරුන්. විදුහල්පතිවරුන් ගුරු උපදේශකවරුන් සහ අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ කැපවීම අගය කරමින් එය වඩාත් අර්ථවත් කිරීම සඳහා සහ ඔවුනට බලපාන බොහෝ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මෙම සියලු සේවාවන් ඒකාබද්ධ කොට සංවෘත සේවාවක් බවට පත් කෙරේ.
- ශිෂ්‍යයන්ට, පාසලට මෙන්ම ගුරුවරුන්ට ද අසාධාරණයක් නොවන පරිදි ජාතික පාසල් සහ පළාත් සභා පාසල් අතර ගුරුවරුන්ට ස්ථාන මාරු ලබාදීම සඳහා අවශ්‍ය නෛතික වෙනස්කම් සිදු කරනු ලැබේ.
- පාසල් ශිෂ්‍යයන්ට සහ ගුරුවරුන්ට නිසි කළමනාකරණයකින් යුත් පාසල් ප්‍රවාහන සේවයක් රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ ව සකස් කරනු ලැබේ.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව දියුණුවක් ගොඩනැගීමට නම් ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර තුනක් සඳහා අවධානය කළ යුතු යැයි අප විශ්වාස කෙරේ. එම ක්ෂේත්‍ර වන්නේ (1) විෂය මාලා සංවර්ධනය (2) ගුරු පුහුණුව (3) පාසැල් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය යන කලාප තුනයි. මෙම ක්ෂේත්‍ර තුන පිළිබඳවම නව දෘෂ්ඨිකෝණයකින් බලන නූතන විද්‍යාත්මක ක්‍රමවේදයක් සකසනු ඇත.

### විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක්

මෙම දැනුම් සියවස තුළ දැනට ක්‍රියාත්මක වන සිසුන්, ගුරුවරුන් සහ දෙමාපියන් මත බර පැටවෙන සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයට තව දුරටත් ඇත්තේ සීමිත ඉදිරි ගමනක් පමණි. ඒ වෙනුවට ලෝකය පුරා දිනපතා නිර්මාණය වන අතිමහත් දැනුම් සම්භාරය වෙත ශිෂ්‍යයාට, ගුරුවරයාට මෙන් ම දෙමව්පියන්ටත් මොහොතකින් පිවිසිය හැකි, හිස බරින් තොර ව සැහැල්ලුවෙන් අධ්‍යාපනය ලැබිය හැකි, නවෝත්පාදනය පදනම් කරගත් දැනුමේ සහ ප්‍රඥාවේ අවකාශයකට අපේ ඊළඟ පරම්පරාව රැගෙන යා යුතු ය.

- පෞද්ගලික අරමුණු කරා පමණක් තරගකාරී ව හඹායන, පොතපතෙහි දැනුමෙන් පමණක් සමන්විත අනාගත පරපුරක් වෙනුවට සැහැල්ලු මනසින් යුත්, උසස් වින්දන හැකියාවෙන් සහ නිරෝගී, ගුණගරුක පරපුරක් බිහිකිරීම පාසල් අධ්‍යාපනයේ අරමුණ විය යුතු ය. ඒ සඳහා ක්‍රීඩා සහ සෞන්දර්ය කටයුතු මෙන් ම විදේශ භාෂා සහ පුස්තකාල පරිහරණය සඳහා ද පාසල් කාල සටහනේ ඉඩකඩ වෙන් කළ හැකි ආකාරයට විෂය නිර්දේශ සහ පැවරුම් අනිවාර්යයෙන් ම සැහැල්ලු කළ යුතු ය.
- සමස්ත පාසල් අධ්‍යාපන ක්‍රමය අවශ්‍ය පරිදි ඩිජිටල්කරණය කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය පුහුණුව, දැනුම සහ යටිතල පහසුකම් පාසල් දරුවන්ට, ගුරුවරුන්ට සහ පාසල්වලට නොපමා ව ලබා දේ.
- සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ඊට සමගාමී ජාත්‍යන්තර විභාග පැවැත්වෙන වයස් සීමාවලට ගැළපෙන පරිදි වෙනස් කර උසස් උපාධියක් ලබා ගැනීමට වැය කරන කාලය අවම කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ගෙන ඒමට කටයුතු කෙරේ.
- දරුවාගේ බුද්ධිය (IQ) විමසන දියුණු විද්‍යාත්මක ක්‍රමවේදයක් 6 වැනි වසරේදී හඳුන්වා දෙන අතර එමගින් දරුවාගේ සහජ කුසලතාව හඳුනාගෙන ඔහුට අදාළ ක්ෂේත්‍රය තුළ උපාධි පාඨමාළා දක්වා ජාත්‍යන්තරට ගමන් කිරීමේ සියලු පහසුකම් ද මාර්ගය ද විවර කර දීම අප පාලනයේ සුවිශේෂී වගකීමකි.
- වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම අපේ රජයේ අරමුණ යි. ඒ සඳහා පාසල් දරුවන්ට කායික මානසික දණ්ඩන දීම සහ විවිධ අපයෝජනයන්ට භාජනය වීම වළක්වා ගැනීම සඳහා පියවර ගැනීමට අවශ්‍ය විධිවිධාන සම්පාදනය කරනු ලැබේ.

### විශ්වවිද්‍යාල සහ උසස් වෘත්තීය අධ්‍යාපනය

තම දරුවන්ට උපාධියක් ලබා දීම සෑම දෙමව්පියෙකුගේ ම අපේක්ෂාව වෙතත් දැනට උසස් පෙළ සමත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාල වරම් ලබන ප්‍රමාණය පිළිබඳ කිසිසේත් සෑහීමකට පත්විය නොහැකි ය. ඒ නිසා බොහෝ දෙමව්පියන්ට සිදු වී තිබෙන්නේ තමන්ට දැරිය නොහැකි බරක් දරාගෙන, විශාල සමාජ ආර්ථික ගැටලු වලට මුහුණ දෙමින් දරුවන්ට උසස් අධ්‍යාපනය ලබාදීම සඳහා විදේශ විශ්වවිද්‍යාලවලට යැවීමය. ඒ නිසා විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලබන සියලු දෙනාට ම උපාධියක් හෝ උපාධියක් දක්වා යාමට අවශ්‍ය වැපිළිවෙළක් සකස් කිරීමට කටයුතු යෙදේ. උපාධිධරයා රැකියාවක් ඉල්ලා පාරට නොබසින, රැකියා වෙළෙඳපොළ උපාධිධාරියා සොයා එන, නූතන ලෝක අවශ්‍යතාවලට අනුගත විය හැකි විනයගරුක, කාර්යශූර උපාධිධාරියෙකු නිර්මාණය කිරීම උසස් අධ්‍යාපනය පිළිබඳ අපේ අපේක්ෂාව ය.

- දැනට රජයේ විශ්වවිද්‍යාල සහ විවිධ උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළු කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවශ්‍ය විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, සහ කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රමාණය සහ අවශ්‍ය කරන අනෙකුත් යටිතල පහසුකම් ඉතා කෙටි කාලයක් තුළ ලබාදීම සඳහා විශාල ආයෝජනයක් කිරීමට කටයුතු යොදනු ඇත.
- සියලු ම විශ්වවිද්‍යාල “සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල” (Smart Learning University) බවට පත්කිරීම සඳහා අවශ්‍ය සියලු තාක්ෂණික පහසුකම් ලබා දේ.
- ඉදිරි දශකය තුළ 21 වන සියවසේ අනාගතය සඳහා වැඩි වැඩියෙන් ඉල්ලා සිටින තාක්ෂණවේදීන් (technocrats) බිහිකිරීම සඳහා සෑම විශ්වවිද්‍යාලයකට ම අනුබද්ධ ව තාක්ෂණ පීඨ ආරම්භ කිරීමට කටයුතු යෙදේ. ඒ සඳහා වැය කරන විශාල ප්‍රාග්ධන ආයෝජනය රටේ අනාගතය සඳහා වන ඉදිරි පිම්ම උදෙසා අත්‍යවශ්‍ය යෙදවුමක් ලෙස අප සලකන්නෙමු.

# එළදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

- ගුවන් සහ නාවික සේවා සඳහා අවශ්‍ය වෘත්තීමය කුසලතාවයන් පුළුල් කිරීම සඳහා ගුවන් සේවා විශ්වවිද්‍යාලයක් (Aviation University of Sri Lanka) සහ නාවික සේවා විශ්ව විද්‍යාලයක් (Nautical University) පිහිටුවීමට කටයුතු කෙරේ.

- විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් ඔවුන්ගේ කැමැත්ත මත රැකියා වෙළෙඳපොළට අවශ්‍ය දැනුම සහ කුසලතාව ලබා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය මත පදනම් ව 21 වන සියවසේ වෙළෙඳපොළට ඇවැසි නූතන පාඨමාලා හැදෑරීමට අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කෙරේ. සිසුන්ට ඒ සඳහා අවශ්‍ය කාලය සහ අරමුදල් සපයා ගත හැකි ආකාරයට අධ්‍යාපන කාලසටහන්වල සුදුසු වෙනස්කම් සිදු කළ යුතු ය.

- නොපමා ව මහපොළ සහ ශිෂ්‍යාධාර ප්‍රමාණවත් ලෙස වැඩි කිරීමට කටයුතු කෙරේ.

- දැනටමත් විශ්වවිද්‍යාල සිසුන්ගෙන් කිසියම් පිරිසක් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සමගාමීව වෙනත් වෘත්තීය සහ ජාත්‍යන්තර ප්‍රමිතිකරණ පාඨමාලා හදාරන අතර විශාල පිරිසකට එම අවශ්‍යතාව ඇතත් මුදල් ගෙවීමට හැකියාව නොමැති නිසා එවැනි අතිරේක සුදුසුකම් සපුරා ගැනීමට යොමුවන්නේ නැත. එවැනි සිසුන් සඳහා රැකියාවක් කරන විට ගෙවීමේ පොළී රහිත විශේෂ ණය ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.

- විශ්වවිද්‍යාල සිසුන් සහ වෙනත් අධ්‍යාපන කටයුතුවල නිරත ව සිටින සිසුන් විශාල සංඛ්‍යාවක් සඳහා සහන මිලට පහසුකම් සහිත නේවාසිකාගාර පද්ධති අදාළ ප්‍රදේශ ආශ්‍රිත ව රජය සහ පෞද්ගලික අංශ එක් ව ගොඩනැගීමට සැලසුම් කරන අතර මෙම නේවාසිකාගාර වලින් ලැබෙන ආදායම ආදායම් බදුවලින් නිදහස් කළ යුතු වේ.

- සාමාන්‍ය පෙළ සහ උසස් පෙළට නර්තනය, සංගීතය, චිත්‍ර සහ මූර්ති වැනි සෞන්දර්යාත්මක විෂයයන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අදාළ ක්ෂේත්‍රයෙන් උසස් ඩිප්ලෝමා පාඨමාළා හැදෑරීම සඳහා පවතින සෞන්දර්ය විශ්වවිද්‍යාලවලට අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතන 10ක් (University College) ආරම්භ කිරීමට කටයුතු යොදනු ලැබේ.

- රැකියා වෙළෙඳපොළට ආකර්ෂණීය වන නිර්මාණශීලී ශ්‍රමිකයෙකු බිහි කිරීම සඳහා සාම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමවලින් බැහැර වෙමින් ස්වයං අධ්‍යාපනය (Self-Learning), මාර්ගෝපදේශිත අධ්‍යාපනය (Guided Learning), සාමූහික අධ්‍යාපන (Group Learning), ව්‍යාපෘති සහ පුහුණු (Project and Training), මත පදනම් වන නිපුණතා පාදක රැකියාභිමුඛ අධ්‍යාපන ක්‍රමවේදයක් සහිත (Job Oriented Higher Education System), නව තාක්ෂණය මත පදනම් වන දුරස්ථ අධ්‍යාපනය ලබා දිය හැකි ලෙස විවෘත විශ්වවිද්‍යාල අධ්‍යාපනය පුළුල් කෙරේ.

- සාගර විශ්වවිද්‍යාලය (Maritime University) ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් සමුද්‍ර කේන්ද්‍රීය විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට කටයුතු යොදනු ලැබේ. සිසුන් අතර විශාල ඉල්ලුමක් ඇති කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පුළුල් කිරීමට වැඩපිළිවෙළක් නොපමා ව ඇති කෙරේ.

- සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වලින් ඉහළට ඔසවා තැබීම සඳහා අවශ්‍ය මාර්ග සිතියම් සකස් කර ක්‍රියාවට නැංවීම සඳහා පූර්ණ අයිතිය, නිදහස සහ පහසුකම් එම විශ්වවිද්‍යාලයවලට ලබා දෙනු ලැබේ.

- දේශීය සහ ගෝලීය රැකියා වෙළෙඳපොළෙහි ඉහළ ඉල්ලුමක් ඇති වෘත්තීය ක්ෂේත්‍ර සඳහා උසස් ඩිප්ලෝමා පාඨමාලා උගන්වන වරලත් ගණකාධිකාරී ආයතනය, ගණක ශිල්පී ආයතනය (AAT) සහ බැංකුකරුවන්ගේ ආයතන ඇගයීමකට ලක්කර නව විෂය පාඨමාලා හඳුන්වා දීම සහ පුහුණු කථිකාචාර්යවරු අනුයුක්ත කිරීම ආදී වෙනස්කම් ඇති කිරීමට කටයුතු යොදනු ලැබේ.

- නවකවදය විශ්වවිද්‍යාල ප්‍රවේශ ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් නොව දෙමව්පියන්ටත් මුළුමහත් සමාජයටත් පීඩාවක් බවට පත් වී ඇත. නවකයන්ට මහත් මානසික භීතිකාවක් මෙන් ම ශාරීරික හා ලිංගික හිරිහැර ලබා දෙන නවකවද සංස්කෘතිය සියලු විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් මුළුමනින් ම තුරන් කෙරේ. ඒ සඳහා ඇවසි බලතල විශ්ව විද්‍යාල පාලක සභාවන්ට ලබාදෙනු ලැබේ.

#### වෘත්තීය තාක්ෂණවේදීන් බිහිකරන උසස් අධ්‍යාපන ක්‍රමවේදයක්

දේශීය සහ ගෝලීය වෙළෙඳපොළේ ඇති ඉල්ලුමට සරිලන පරිදි අනාගත ලෝකයේ මෙහෙයුම්කරුවන් බවට පත්වන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් සහ පිළිගැනීමෙන් යුත් සුහුරු තාක්ෂණවේදීන් (Smart Technocrats) නිර්මාණය කිරීම අපේ ප්‍රමුඛ අවශ්‍යතාවකි. ඒ හරහා නවෝත්පාදන අංශයෙන් ඉහළින් ම සිටින රටක් බවට පත්වීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කළ යුතු ය. ඉහළ වේතන සහ සමාජ ගරුත්වය හිමි සමාජ ජීවිතයක් ගත කරන නව නිපුණතා ශ්‍රම බළකායක් බිහිකිරීම අපගේ අරමුණ වේ.

- සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ සමත් අසමත් සෑමදෙනාට ම තාක්ෂණවේදය සහ උසස් වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා නව වැඩපිළිවෙළක් ආරම්භ කෙරේ.

- දැනට ඇති සියලු ම වෘත්තීය අධ්‍යාපන ආයතන සහ ඒවායේ තත්ත්වය පිළිබඳ ඇගයීමක් පළමු මාස 06 දී සිදු කෙරේ. එකී ඇගයීම් වාර්තාව අනුව සුදුසු ආයතන සම්පූර්ණ නවීකරණයකට ලක් කර තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීමට කටයුතු යොදන අතර නූතනයට ගැළපෙන පරිදි පාඨමාලා නවීකරණය කිරීමට සහ අලුතින් හඳුන්වා දීමට කටයුතු යෙදේ, ආචාර්ය මණ්ඩල, ශිෂ්‍ය කාර්ය මණ්ඩලවල වැටුප් දීමනා සහ අනෙකුත් වරප්‍රසාද විශ්ව විද්‍යාල මට්ටමට ඉහළ දැමීමට කටයුතු යෙදේ.

- රට පුරා විහිදුණු නව “තාක්ෂණික සහ කාර්මික විශ්වවිද්‍යාල විද්‍යායතන” පද්ධතියක් ආරම්භ කිරීමට කටයුතු කෙරේ.

- ජර්මානු කාර්මික ආයතනයේ අනුබද්ධ ආයතන 04ක් මාතර, මන්නාරම, මඩකළපුව සහ බදුල්ලේ ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර දැනට ක්‍රියාත්මක විශ්ව විද්‍යාල විද්‍යාතන ප්‍රමාණය 6 සිට 20 දක්වා වර්ධනය කොට වෘත්තීය තාක්ෂණික විශ්ව විද්‍යාලයට (Univotech) අනුබද්ධ ආයතන බවට පත් කරනු ලැබේ.

- සාමාන්‍ය පෙළ සමත් ඕනෑම දරුවෙකුට උසස් පිළිගැනීමක් ඇති NVQ සහතික අධ්‍යාපනයක් ලබා දෙන අතර දැනට තල 7 කට සැලසුම් කොට ඇති ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) තල 10 දක්වා වර්ධනය කොට තාක්ෂණවේදය ඔස්සේ පශ්චාත් සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීමට ද ඒ සඳහා විදේශ ශිෂ්‍යත්ව පිරිනැමීමට ද අපගේ සැලසුම යි. ඒ සමඟ ම ප්‍රධාන ධාහරාවේ උපාධි පාඨමාලා සහ NVQ උපාධි පාඨමාලා අතර සුදුසුකම් රාමුව නිවැරදිව ගැළපීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අවැසි ව්‍යවස්ථිපිත සම්බන්ධතාවය ද ගොඩනැඟීමට කටයුතු කෙරේ.
- වැඩබිමේ සහ කාර්යාලයේ සිටිය දී ම අපගේ ශ්‍රම බළකායේ අවශ්‍යතා අනුව අන්තර්ජාලගත අධ්‍යාපනය (Online Education). සති අන්ත පාඨමාලා අධ්‍යාපනය (Weekend Education) සහ විවෘත අධ්‍යාපනය (Open learning) වැනි විවිධ ක්‍රමවේද ඔස්සේ නිපුණතා සහ පුහුණුව ලබා දෙනු ඇත,
- ජාතියේ ජීවනාලිය බඳු වූ වෘත්තීය හා තාක්ෂණික ක්ෂේත්‍රවන ඉගෙනුම ලබන සියලුම සිසු දරුවන්ට මහපොළ වැනි ශිෂ්‍යාධාර ක්‍රමයක්, සහනදායී ප්‍රවාහන සේවාවක්, නිලඇඳුම් සහ පරිගණක ලබා දීමට කටයුතු කරනු ඇත.
- විශ්වවිද්‍යාල, වෘත්තීය අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය ප්‍රජාව, තරුණ තරුණියන් සහ ශ්‍රම බළකායේ ඉංග්‍රීසි භාෂා, විදේශ භාෂා සහ ගණිත දැනුම වර්ධනය කිරීමට සහ නව නිපැයුම් සොයන දරුවන්ට විදේශීය ශිෂ්‍යත්ව සහ ව්‍යවසායකු වීම සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහ ලබා දෙනු ලැබේ.
- TVET ක්ෂේත්‍රය තුළ ඇති සියලු ආයතනයන්හි ක්‍රියාකාරකම් සමයෝජනය කොට One TVET සංකල්පය යටතේ විශේෂ පාලන ව්‍යුහයක් ආරම්භ කෙරේ.
- මේ සියලු ක්‍රියාකාරකම් හි අවසාන ප්‍රතිඵලය ලෙස ධූරකාලයේ දෙවන වසර අවසන් වන විට ශ්‍රී ලංකා ශ්‍රම බලකායේ නිපුනතා රහිත (Unskilled Labour) පිරිස 20% දක්වා අඩු කිරීම ද 2025 වසර වන විට එය 10% දක්වා අඩු කිරීමද රජයේ ප්‍රමුඛ අරමුණයි. අපට සංවර්ධන දේශයක් උදාකර ගත හැක්කේ එමගිනි.

## නිරෝගීකමට මුල් තැන

මානව ප්‍රාග්ධන සංවර්ධනයේ දී වැදගත්වන අනෙක් ප්‍රධාන කුලුන සෞඛ්‍ය අංශය වේ. නිරෝගී සෞඛ්‍යය හේතුවෙන් කායික. මානසික. සමාජීය සුවතාව පමණක් නොව අධ්‍යාත්මික සුවතාව ද වර්ධනය වන නිසා නිවැරැදි ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මත පදනම් ව ජාතික සහ ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන තිරසාර සෞඛ්‍ය වැඩපිළිවෙළක් ඇති කරනු ලැබේ. පසුගිය කාලය තුල දේශපාලනික චුවමනා මත සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම් නැවත සමාලෝචනය කර රෝගී සත්කාර සේවයේ ප්‍රගමනයට අවශ්‍ය ලෙස ප්‍රතිව්‍යුහගත කෙරේ.

- රෝග සෑදීමෙන් පසු ප්‍රතිකාර කිරීමේ ප්‍රතිපත්තිය වෙනුවට 'නීරෝගීතාව' මූලික කරගත් ප්‍රතිපත්තියකට මාරුවීම සඳහා කාලය පැමිණ ඇත. එම නිසා ඒ පිළිබඳව රට තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා 'සුව දිවිමඟ' නමින් පුළුල් වැඩසටනක් ආරම්භ කිරීමට කටයුතු යොදනු ඇත.

### "සුව දිවිමඟ" වැඩසටන

- වස විසෙන් තොර නිරෝගී ආහාර වේලක් ලබා ගැනීමට ජනතාවට ඇති අයිතිය සහතික කරන වැඩපිළිවෙළක්
- වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා දායකත්වය සපයන වැඩපිළිවෙළක්.
- ළමා විය, පාසල් විය හා වැඩිහිටි විය ආදී ලෙස ජීවිතයේ සියලුම අවධිවලට නිවැරදි ආහාර පුරුදු හඳුන්වාදීම විධිමත් කරන වැඩපිළිවෙළක්.
- ජනතා සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන අපේ තිරසාර පරිසර ප්‍රතිපත්තිය යටතේ හඳුන්වා දී ඇති වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමෙන් හුස්මට ගන්නා වාතයත්, බීමට ගන්නා ජලයත්, වගා කරන භූමියත්. දූෂණයෙන් තොර ව පවත්වාගෙන යාමෙන් නිරෝගීභාවය ඇතිකිරීමේ වැඩපිළිවෙළක්.
- පිළිකා, හෘද රෝග, වකුගඩු සහ දියවැඩියාව වැනි බෝ නොවන රෝග වළක්වා ගැනීම සහ හඳුනා ගැනීම සඳහා සමස්ත සෞඛ්‍ය සේවය ඒකාබද්ධ ව අවශ්‍ය පියවර ගැනීමේ කඩිනම් ජාතික වැඩපිළිවෙළක්.
- රටේ සියලු ප්‍රතිපත්ති සම්පාදනයේ දී ජනතාවගේ නිරෝගීකම ආරක්ෂා කිරීම සඳහා දායකත්වය සපයන වැඩපිළිවෙළක්.
- සමාජය තුළ ශීඝ්‍ර ව ව්‍යාප්ත වෙමින් යන දුම්පානය සහ මත්පැන් පානය දුරලීම සහ මත්ද්‍රව්‍ය භාවිතය මුලිනුපුටා දැමීමේ ව්‍යාපෘතියක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රඥප්තියට අනුව සැකසීමට කටයුතු කෙරේ.
- කොළඹ සහ ඒ අවට නගර ආශ්‍රිත ව අප විසින් ආරම්භ කරන ලද ජනතා ප්‍රසාදයට හේතු වූ ඇවිදින මංතීරු සහ ව්‍යායාම මධ්‍යස්ථාන රට පුරා නාගරික සංවර්ධන අධිකාරියේ සෘජු අධීක්ෂණය යටතේ ආරම්භ කොට ඒවා පවත්වාගෙනයාම සහ නඩත්තුව පළාත් පාලන ආයතනවලට පවරන අතර ඒ මඟින් ව්‍යායාම කිරීම ජීවන පුරුද්දක් බවට පත් කිරීමට කටයුතු සම්පාදනය කරන වැඩපිළිවෙළක්.
- නීරෝගිකම රැකගැනීම ජීවිතයේ එක් ප්‍රධාන අංගයක් බවට පත් කරන වැඩපිළිවෙළක් මෙම සුවදිවි මඟ වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ.

### සෞඛ්‍ය සේවා පහසුකම් සංවර්ධන වැඩසටහන

- නිදහස් සෞඛ්‍ය සේවය සම්පූර්ණයෙන් ම සුරක්ෂිත කොට වාර්ෂික ව සෞඛ්‍යය සඳහා වෙන් කරන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ නංවා වෙන් කළ සියලු මුදල් රෝගී සේවාවේ යහපතට යෙදවීමට කටයුතු කෙරේ. අපේ රටේ පුරවැසියන් සඳහා නොමිලේ ලබා දෙන සෞඛ්‍ය සේවා පහසුකම් විදේශිකයන්ට නොමිලේ ලබා දීම නතර කෙරේ.
- රටපුරා රෝහල්වල දිනපතා ඇති රෝගීන්ගේ තදබදය සහ පොරොත්තු ලේඛන ආදිය විශාල ගැටලුවක් බවට පත් වී ඇති බැවින් එම තත්ත්වය වෙනස් කර රෝගීන්ට පහසුවෙන් ප්‍රතිකාර ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කෙරේ.

සිව්වන කොටස

# ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

- කොළඹ ජාතික රෝහල හෘද රෝග ඇතුළු හදිසි හා සංකීර්ණ ප්‍රතිකාර සහ සැත්කම් කළ යුතු රෝගීන්ට (සෞඛ්‍ය ප්‍රමුඛතාවය අනුව) ප්‍රමුඛතාව ලබාදෙන උසස් ජාත්‍යන්තර මට්ටමේ රෝහලක් බවට පත් කෙරේ.
- සෑම දිස්ත්‍රික්කයක ම තෝරාගත් රෝහලක් දැනට කොළඹ ජාතික රෝහල මෙන් සියලු වෛද්‍ය ප්‍රතිකාර ශල්‍යාගාර පහසුකම් සහ රසායනාගර පහසුකම්වලින් යුත් අංග සම්පූර්ණ රෝහලක් බවට පත් කෙරේ.
- දිවයින පුරා ඇති අනෙකුත් සෑම රෝහලක් ම අවශ්‍ය වෛද්‍යවරුන්, හෙද කාර්ය මණ්ඩල, රසායනවේදී සහ අනෙකුත් සේවකයන්, බෙහෙත් සහ නවීන රසායනාගාර පහසුකම්වලින් අංග සම්පූර්ණ කිරීමට කටයුතු කෙරේ. සියලු ම බාහිර රෝගී ප්‍රතිකාර සේවා මෙම රෝහල්වලට පවරනු ලැබේ. එම රෝහල් මගින් අදාළ රෝගීන් නියමිත රෝහල් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කෙරේ.
- E- Health සහ Tele Medicine වැනි දියුණු ක්‍රමවේද හරහා පහසුවෙන් තදබදයෙන් තොර ව රෝග විනිශ්චය කිරීමේ සහ ප්‍රතිකාර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- රටට අවශ්‍ය වන වෛද්‍යවරුන් රට තුළ රඳවා ගැනීමටත්, නිවැරැදි ව ස්ථානගත කිරීමටත් අවශ්‍ය පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
- සෞඛ්‍ය සේවාව අප අපේක්ෂා කරන මට්ටමට පැමිණෙන තෙක් දැනට ශල්‍යකර්ම සඳහා ඇති පොරොත්තු ලේඛන අවම කිරීම සඳහා දැඩි සත්කාර ඒකකවල ඇති ඇඳන්, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හිඟය සහ ශල්‍යාගාරවල අඩුපාඩු නොපමා ව සම්පූර්ණ කිරීමට පියවර ගනු ලැබේ.
- රෝහල්වල දැනට ඇති තදබදය අඩු කිරීම සඳහා විවිධ විශේෂඥ වෛද්‍ය උපදෙස් මත රෝගී ප්‍රතිකාර සේවාවන් නවීකරණය කර ක්‍රියාත්මක කෙරේ.
- රෝහල්වල සියලු අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කිරීම් ප්‍රමාදයකින් තොර ව පවත්වාගෙන යාම, නේවාසික රෝගීන් සඳහා අවශ්‍ය ඇඳන් සහ අනෙකුත් පහසුකම් හිඟයකින් තොර ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජනතාවට වගකියන යන්ත්‍රණයක් සකස් කෙරේ.
- සියලු ම රජයේ සහ පෞද්ගලික රෝහල් සහ රසායනාගාර ISO තත්ත්ව සහතික ප්‍රමිතිවලට අනුව පවත්වාගෙන යාම අනිවාර්ය කිරීම මගින් රෝගීන්ට සහ කාර්ය මණ්ඩලටවලට සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් ඇති කෙරේ.
- සියලු රෝහල්, බෙහෙත් ශාලා සහ රසායනාගාර නියාමනය සඳහා 'නියාමන අධිකාරියක්' ස්ථාපනය කර ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් පිළිගත් ප්‍රමිතීන් තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියාමන පරිසරයක් ඇති කෙරේ.
- අත්‍යවශ්‍ය ඖෂධවල අවම ආරක්ෂක තොග මට්ටම් පවත්වා ගැනීම අනිවාර්ය කිරීම මඟින් හිඟයකින් තොර ව ඖෂධ ඇතුළු සියලු භාණ්ඩ රෝහල්වලට සැපයීම සහතික කෙරේ.
- බෝවන රෝග මර්දනයේ දී සෞඛ්‍ය අමාත්‍යංශයට අමතර ව සියලු ම පළාත් පාලන හා ප්‍රාදේශීය පරිපාලන ඒකක සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- තත්ත්වයෙන් බාල ඖෂධ ලංකාවට ආනයනය සම්පූර්ණයෙන් ම තහනම් කිරීම සඳහා පියවර ගනු ලැබේ. ඊට සමගාමී ව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රට තුළ නිෂ්පාදනය කළ හැකි සියලු ම ඖෂධ හා අනෙකුත් සෞඛ්‍ය පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කිරීම ආරම්භ කෙරේ. ඖෂධවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම්වලින් යුත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිති අනුකූල තත්ත්ව පාලන රසායනාගාරයක් පිහිටුවීමට කටයුතු කෙරේ. ඒ මඟින් ඖෂධවල ප්‍රමිතිය ආරක්ෂා කිරීමට ක්‍රියා කෙරේ.
- ප්‍රතිඔක්සිකාරක (Antioxidant) සහ ශාකසාර නිෂ්පාදන (Herbal Products) ආනයනය සඳහා අයකරන බද්ද ඉහළ නංවනු ලැබේ.
- සෞඛ්‍ය අංශයේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය යථාවත් කර වගවීම පිළිබඳ සහතික කිරීම මගින් සිදුවන දූෂණ. අක්‍රමිකතා හා නාස්තිය වැළැක්වීමට කටයුතු කෙරේ.
- කායික සෞඛ්‍ය මෙන් ම මානසික සෞඛ්‍යය ද යහපත් ව පවත්වාගෙන යාම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන නොමිලේ සේවය ලබා ගත හැකි ජංගම දුරකථන සේවාවක් ද සහිත අන්තර්ජාල මනෝ උපදේශන සේවාවක් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ආරම්භ කෙරේ.
- පරිපාලන තනතුරුවලට අමතර ව සෞඛ්‍ය සේවකයන් වෙනුවෙන් සායනික කුසලතා පදනම් කරගෙන සේවාවේ ඉහළට යා හැකි ක්‍රමවේදයක් ඇති කෙරේ.
- හෙදි පුහුණු පාසල්වල තත්ත්වය උපාධියක් දක්වා උසස් කිරීමට කටයුතු කෙරේ.
- ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන්, හෙදියන් හා නිලධාරීන්ට නව තාක්ෂණික උපකරණ හා පහසුකම් ලබා දීම මගින් වඩාත් පහසුවෙන් සේවාව සැපයීමට හැකි වාතාවරණයක් සකස් කෙරේ.
- 'සෞඛ්‍ය පර්යේෂණ' පුහුණු හා නව නිපැයුම් රජය මගින් දිරිමත් කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කෙරේ.
- 'සෞඛ්‍ය කේන්ද්‍රීය සංචාරක කර්මාන්තය' (Health Tourism) ඉහළ නැංවීම මගින් රටට ආදායමක් ඉපයීමට සෞඛ්‍ය සේවය එක්කර ගැනීමට කටයුතු කෙරේ.
- පශ්චාත් උපාධි අවස්ථා වැඩි කරමින් වෛද්‍යවරුන්ගේ වටිනාකම ජාත්‍යන්තර ව ඉහළම මට්ටමකට ගෙනගොස් රටට අභිමානවත් ලෙස මුල්‍ය ඉපයීම කළ හැකි 'දැනුම මූලික ආර්ථික' (Knowledge Economy) වැඩපළිවෙළක් ඇරඹීමට කටයුතු කෙරේ.
- වෛද්‍ය වෘත්තියට හා වෛද්‍ය අධ්‍යාපනයට ඇති ජාත්‍යන්තර පිළිගැනීම ආරක්ෂා කර ගනිමින් දේශපාලන අතපෙවීම්වලින් තොර නිවහල් සෞඛ්‍ය සේවයක් ඇති කිරීමේ වැඩපිළිවෙළක් බිහි කෙරේ.

- සෞඛ්‍ය පරිපාලන ව්‍යුහය තුළ වගකීම හා වගවීම සහතික කර පාරදෘශ්‍යභාවය හා ඵලදායිතාව ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
- සෞඛ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රමසම්පාදන පර්යේෂණ හා විගණන දත්ත මත පදනම්ව රෝගී සත්කාර සේවයේ උන්නතිය වෙනුවෙන් යෝග්‍ය ක්‍රමවේදයක් සකස් කෙරේ.
- පසුගිය කාලය තුල දේශපාලනික වුවමනා මත සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම් නැවත සමාලෝචනය කර රෝගී සත්කාර සේවයේ ප්‍රගමනයට අවශ්‍ය ලෙස ප්‍රතිව්‍යුහගත කෙරේ.

### දේශීය සහ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය

දේශීය සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය බටහිර වෛද්‍ය ක්‍රමය අපට හිමි වීමට පෙර විරාත් කාලයක් තිස්සේ පැවත එන්නක්. එය හුදෙක් ප්‍රතිකාර ක්‍රමයක් පමණක් නොව දේශීය සංස්කෘතියේ ද එක් වැදගත් සංරචකයක් ලෙස අප පිළිගනු ලැබේ. ප්‍රගතිශීලී සමාජ දේහයේ ද බලවත් කොටසක්. එම නිසා මෙම ක්ෂේත්‍රයට සැමවිට ම අපේ ගෞරවය හිමි විය. එසේ වෙතත් විවිධ හේතූන් නිසා දේශීය සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රම යම්කිසි පසුබෑමකට ලක් වූ බව අප තේරුම් ගත යුතු යග එබැවින් වඩාත් විද්‍යාත්මක, නූතන භාවිතයන් ඔස්සේ දේශීය ආයුර්වේද ක්‍රම ශක්තිමත් කොට රට තුළ පමණක් නොව ගෝලීය සමාජය තුළ ද ඔවුනට හිමි ස්ථානය හා වැදගත්කම ලබා දීමට අප පෙනී සිටින්නෙමු.

- ජාතික දේශීය වෛද්‍ය සභාවක් සහ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවක් ලියාපදිංචි කිරීමට කටයුතු කෙරේ.
- සෞඛ්‍ය ය අමාත්‍යාංශයට වෙන් කරන ප්‍රතිපාදනවලින් දැනට දේශීය වෛද්‍ය අංශයට වෙන්වන වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
- දේශීය වෛද්‍ය ක්‍රම දියුණු කිරීම හරහා රෝග ඇතිවීම වළක්වා ගැනීම සඳහා විශාල සේවයක් සපයා ගත හැකි ය. එම අංශය දියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙනු ලැබේ.
- ප්‍රාදේශීය ආයුර්වේද රෝහල්වල තත්ත්වය නැවත අධීක්ෂණය කර ඒවායේ තත්ත්වය උසස් කිරීම සඳහා අවශ්‍ය පියවර නොපමා ව ගනු ලැබේ.
- දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරි ගන්වන අතර ඒවා ලියාපදිංචි කිරීම සහ නියාමනය සඳහා යාන්ත්‍රණයක් සකස් කෙරේ.
- දේශීය ආයුර්වේද ඖෂධ සංග්‍රහය (Aurwadha Pharmacopoeia) යාවත්කාලීන කිරීමට පියවර ගනු ලැබේ.
- ආයුර්වේද, සිද්ධ, යුනානි, දේශීය පාරම්පාරික සහ හෝමියෝපති ඇතුළු ප්‍රතිකාර ක්‍රමවලට ඇති සංචාරකයන්ගේ ඉල්ලුම සපුරාලීම අවශ්‍ය වැඩපිළිවෙළක් ආරම්භ කිරීම සංචාරක කර්මාන්ත අමාත්‍යාංශයට පවරනු ලැබේ.
- ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් ඇති සියලු ම ඔසු පැළෑටි දේශීය ව වගා කිරීම සඳහා දේශීය වෛද්‍යවරුන් සහ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ හවුල්කරුවන්ගේ සහභාගිත්වයෙන් ඔසු උයන් වගා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ.
- රූපලාවණ්‍ය ආලේපන ආදිය සඳහා දේශීය සහ විදේශීය වෙළෙඳපොළේ ඇති ඉල්ලුම තේරුම් ගෙන ජාත්‍යන්තර මට්ටමින් එම නිෂ්පාදනවල යෙදිය හැකි අයට නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් රජය මඟින් සපයනු ලැබේ.
- දේශීය වෙද මහත්වරුන්, දේශීය වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමේ දී ඇති වී තිබෙන ගැටලුව නිරාකරණය කිරීම සඳහා නව ක්‍රමවේදයක් කඩිනමින් ක්‍රියාත්මක කෙරේ.
- කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ දේශීය වෛද්‍ය ආයතනය පූර්ණ ආයුර්වේද විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමටත් පළාත් මට්ටමින් දේශීය වෛද්‍ය අධ්‍යාපනය දියුණු කිරීමටත් අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ.

### ජව සම්පන්න තාරුණ්‍යය ය

සමස්ත ජනගහනයෙන් හතරෙන් එකකට ආසන්න තරුණ ජනගහනය තිරසාර සංවර්ධන ක්‍රියාවලියට විශ්වසනීය සහ තාර්කික පදනමක් සහිත සාඩම්බර හවුල්කාරයින් ලෙස සක්‍රීය ව සම්බන්ධ කරගත යුතු ය. ඒ සඳහා ඔවුන්ගේ අභිලාෂයන් හඳුනාගෙන ඒවා මුදුන්පත් කිරීම සඳහා නිශ්චිත සහ ස්ථිර වැඩපිළිවෙළක් යටතේ විසඳුම් ලබාදීමෙන් තෘප්තිමත් තරුණ පරපුරක් බිහි කිරීම අපේ අභිප්‍රාය වේ.

- දේශපාලන තීන්දු තීරණ ගැනීමේ දී සහ රාජ්‍ය පාලනයේ දී තාරුණ්‍යයේ දායකත්වය ඉහළ නැංවිය යුතු යි. ඒ සඳහාපළාත් පාලන මැතිවරණ නාමයෝජනාවලින් 25% සහ පළාත් සභා සහ පාර්ලිමේන්තු මැතිවරණවල දී සාපේක්ෂ ව තරුණ නියෝජනය ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
- ආර්ථික යන්ත්‍රණයේ සුක්කානම හැසිරවීමේ වගකීම තරුණ ව්‍යවසායකයන් විසින් දරනු ලබන අනාගතයක් බිහි කිරීම සඳහා සියලු ආර්ථික ක්ෂේත්‍ර තුළ තරුණ ව්‍යවසායකයන්ට උපරීම අවස්ථාව සහ අවශ්‍ය සියලු දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.
  - ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම, ව්‍යාපාරික ගැටලු නිරාකරණය කර ගන්නා ආකාරය සහ වෙළෙඳපොළ අවස්ථා හඳුනා ගැනීම සහ පුළුල්කර ගැනීම පිළිබඳව අවශ්‍ය දැනුම දියුණු කර ගැනීම සඳහා 'තරුණ ව්‍යාපාරික මාර්ගෝපදේශක මධ්‍යස්ථාන ක්‍රමයක්' තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ ආරම්භ කෙරේ.
  - නවෝත්පාදන ව්‍යාපාර, නිෂ්පාදන සහ සේවාවන් සොයා ගැනීම් සඳහා තරුණයන් දිරි ගන්වන අතර ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ලබාදීමට පියවර ගනු ලැබේ.

# ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

- තරුණ ව්‍යවසායකයින් මුහුණපාන ප්‍රධාන ගැටලුව වන්නේ ව්‍යාපාර සඳහා අවශ්‍ය ආයෝජන අඩුකම යග ඊට පිළියමක් ලෙස 'ජාතික තරුණ අරමුදලක්' (National Youth Fund) ආරම්භ කෙරේ. ඒ සඳහා ආරම්භක මුදලක් වශයෙන් රුපියල් මිලියන 1,000 ක් මහා භාණ්ඩාගාරයෙන් ලබාදීමට බලාපොරොත්තු වෙනවාග අරමුදල ප්‍රවර්ධනය කර ගැනීම සඳහා 'තරුණ සංවර්ධන ලොතරැයියක්' ආරම්භ කිරීමට එම අරමුදලට අවසර දෙනු ලැබේ.
- තරුණ අරමුදල හරහා තරුණ ව්‍යවසායකයින්ට අවශ්‍ය ආයෝජන ලබාදීම සඳහාසරල ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ හෝ විදේශීය රැකියා අවස්ථාව සඳහා ගැළපෙන ශ්‍රී ලාංකේය තරුණයන් නිවැරදි ව හඳුනාගැනීම පහසු කිරීම පිණිස 'තරුණ මානව සම්පත් දත්ත බැංකුවක්' (Youth Human Resource Data Bank) ආරම්භ කෙරේ. ඕනෑ ම තරුණයෙකුට අන්තර්ජාල පහසුකම් හරහා තම අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් හා නිපුණතා ඇතුළත් ජීව දත්ත සටහනක් (Curriculum Vitae) මෙම බැංකුවේ තැන්පත් කිරීමට අවස්ථාව සැලසේ. එය කාලානුරූප ව යාවත්කාලීන කිරීමේ අවස්ථාව ද ලබා දෙනු ලැබේ.
- රාජ්‍ය සේවයේ පහළ ම ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ දී සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම අනිවාර්ය සුදුසුකමක් කොට නොසැලකීමට අවශ්‍ය සංශෝධන සිදුකරනවා.
- තරුණයින් සඳහාස්මාට් ජංගම දුරකථනයක්, ටැබ් එකක් හෝ ලැප්ටොප් පරිගණකයක් පහසු ගෙවීමේ ක්‍රමයට ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- වෘත්තීය උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා රැකියාවක් කරන කාලයේ දී ගෙවීමට හැකි ආකාරයේ රුපියල් මිලියනය දක්වා මුදලක් පොලී රහිත ණයක් වශයෙන් ලබා දෙනු ලැබේ.

### ජව සම්පන්න තාරුණ්‍යයට ක්‍රීඩාවේ සවිබලය

ක්‍රීඩාව යනු තරුණ පරපුරේ භාෂාව වන අතර ක්‍රීඩාව තරුණ්‍යය අවදි කරන්නට හේතු වේ. ජව සම්පන්න, නිරෝගීමත් සහ විනය ගරුක සමාජයක් බිහි කිරීම සඳහා ක්‍රීඩාශීලී ජීවන රටාවකින් යුත් පරපුරක් නිර්මාණය කිරීම අපේ අපේක්ෂාව ය.

- පාසල් මට්ටමේ සිට ක්‍රීඩාශීලීත්වය හුරු කිරීම සඳහා සතියට දින දෙකක් උදෑසන කාලපරිච්ඡේදය ශාරීරික ව්‍යායාම සඳහා වෙන් කෙරේ.
- දිවයින පුරා ම පාසල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිට ම තෝරාගෙන ඔවුනට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් නොපමා ව ආරම්භ කෙරේ.
- ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් (Sports University) ආරම්භ කෙරේ.
  - එම විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ව ක්‍රීඩා විශ්වවිද්‍යාල විද්‍යායතන (Sports University Colleges) නවයක් එක පළාතට එක බැගින් ආරම්භ කිරීමට කටයුතු කෙරේ.
  - දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් විවිධ ක්‍රීඩාවලට කුසලතා දක්වන සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළට පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඩිප්ලෝමා පාඨමාලා සඳහාඇතුළත් කරගනු ලැබේ.
  - එම ඩිප්ලෝමාධාරීන්ට, ජාතික මට්ටමේ සහ ජාත්‍යන්තර මට්ටමේ කුසලතා දක්වන, උසස්පෙළ සමතුන් ක්‍රීඩා විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබේ.
- පළාතේ අනෙකුත් ක්‍රීඩකයන්ට ද භාවිත කිරීමට හැකිවන පරිදි ක්‍රීඩා විද්‍යායතන ආශ්‍රිත ව ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණ 09 ක් පිහිටුවනු ලැබේ.
- ක්‍රීඩා උපදේශකයන්, පුහුණුකරුවන් සහ භෞත චිකිත්සකයින් වැනි ක්‍රීඩාවේ දියුණුවට අවශ්‍ය සම්පත්දායකයන් බිහිකිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- වෘත්තීය ක්‍රීඩකයන්ට දේශීය සහ විදේශීය අධ්‍යාපනය සහ පුහුණුව ලබාගැනීම සඳහා ආධාර ක්‍රමයක් හඳුන්වාදෙන අතර ජාත්‍යන්තර තලයේ ක්‍රීඩකයන්ට විදේශීය පුහුණුකරුවන්ගේ සේවය ලබාදීමටත් කටයුතු කෙරේ.
- ආනයනික ක්‍රීඩා භාණ්ඩ, තාක්ෂණික මෙවලම් සහ පෝෂ්‍යජනක ආහාර සඳහා තීරුබදු සහන ලබා දෙනු ලැබේ.
- ජාත්‍යන්තර ක්‍රීඩා තරග වැඩසටහන් රට තුළ පැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ රාජ්‍ය අනුග්‍රහය දක්වනු ලැබේ.

### නැණබල සහිත ළමා පරපුරක්

රටේ අනාගත අස්වැන්න දරු පරපුර යි. රටේ තිරසාර පැවැත්ම, ජාතියේ අනාගතය, මතු අභිමානය රඳා පවතින්නේ දරු පරපුර මත ය. දෑ කුල ගොතින් තොර ව නිරෝගී ශරීර සෞඛ්‍යයකින් සහ මනා වූ පෞරුෂයකින් යුත් අනාගත ශ්‍රී ලාංකිකයෙකු නිර්මාණය කළ හැක්කේ ළමා පරපුරට නිවැරදි ව මඟ පෙන්වීමෙන් පමණ ය. ඒ සඳහා අප මහත් ඕනෑකමින් කරන්නෙමු.

- රටේ සියලු දරුවන්ට ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුව හිමිවිය යුතු වරප්‍රසාද හා අයිතිවාසිකම්වලට ඇති හිමිකම් සහතික කෙරේ.
- මේ රටෙහි වෙසෙන සියලු ම දරුවෙන්ගේ මන්ද පෝෂණය ඉදිරි වසර 05 තුළ නිමා කිරීම විශේෂ ළමා පෝෂණය වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබේ. එවැනි දරුවන් සඳහා අවශ්‍ය ත්‍රිපෝෂ ප්‍රමාණය වෛද්‍යවරුන්ගේ නිර්දේශය අනුව අඛණ්ඩව ලබා දීමට කටයුතු කෙරේ.
- ළමා දරිද්‍රතාව නිමා කිරීම සඳහා එවැනි දරුවන් සිටින සෑම පවුලකටම දිවිනැගුම වැඩසටහන හරහා ළමා පෝෂණ දීමනාවක් ගෙවීමට කටයුතු කරන අතර සෑම දරුවෙකුට ම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සියලු අවකාශ විවෘත කෙරේ.
- දරුවන් කායික දණ්ඩනයට, මානසික පීඩනයට, ලිංගික සහ වෙනත් ආකාරයේ අපයෝජනයට. නීති විරෝධී වාණිජ කටයුතු සඳහා ළමයින් යොදා ගැනීමට (Child Trafficking), ළමා ශ්‍රමිකයින් ලෙස භාවිත කිරීමට සහ නොසලකා හැරීමට බඳුන්වීම මුළුමනින් ම තුරන් කිරීම සඳහා අවශ්‍ය

වැඩපිළිවෙළක් අධිකරණ අමාත්‍යාංශය, ළමා සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය සහ ඊට අදාළ සියලු ආයතන එක් ව සකස් කර ක්‍රියාවට නංවනු ලැබේ.

- පෙර පාසල්, දිවාසුරැකුම් මධ්‍යස්ථාන සහ පාසල්වල දී දරුවන් කිසිදු ආකාරයේ වෙනස්කමකට භාජනය කිරීම, කායික දණ්ඩනයකට හෝ ලිංගික අපයෝජනයන්ට ලක් කිරීම මුළුමනින් ම වැළැක්වීම සඳහා පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- දිගින් දිගට ම පමා වෙමින් ඇති දරුවන් සම්බන්ධ සියලු නඩු විසඳීම සඳහා සෑම දිස්ත්‍රික් අධිකරණයක ම කොටසක් වෙන් කෙරේ.
- කවර හේතුවක් නිසා හෝ ළදරුවන් මහමඟ දමා යාම, මරා දැමීම වැළැක්වීමට පියවර ගන්නා අතර දරුවන්, දරුකමට හදාවඩා ගැනීම සඳහා ඇති සංකීර්ණ ක්‍රමවේදය සරල කෙරේ.
- සියලු ම ළමා නිවාසගත දරුවන්ට 'කැපකාර පවුල' හඳුන්වාදීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කෙරේ.

## සමාජ ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක්

දරුවෙකු ඵලදායී පුරවැසියෙකු කිරීමේ අත්පොත තැබීම සිදුවන්නේ මව අතින් වන අතර පවුලක සතුට රඳා පවතින්නේ ගෘහිණිය මත ය. සමාජයක් විනය ගරුක වන්නේ නිවසේ සිට ම දරුවන්ට නිවැරදි මඟ පෙන්වීම ලබා දුන් විට ය. මේ නිසා අපේ දීර්ඝ කාලීන අරමුණ ඉටුකර ගැනීමට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ. රැකියා වෙළඳපොළ තුළ පමණක් නොව පෞද්ගලික ව්‍යවසායකයන් වශයෙනුත් කාන්තාවන්ගේ දායකත්වය අපේ ආර්ථිකයට ඉතා වැදගත වේ. වෙනත් කලාපීය රටවලට සාපේක්ෂ ව දැනටමත් අපේ රටේ උගත් කාන්තා පරපුරක් ඇත. උගත් මව ජාතියට සම්පතකි. අනාගත අභියෝගවලට මුහුණ දීමේදීත් දරුවන් අනාගතය සඳහා සූදානම් කිරීමේදීත් ඇයගේ උගත්කම පහසුවක් වනු ඇත.

- කාන්තාවන් විවාහ වී දරුවන් බිහිකිරීම සහ රැකබලා ගැනීමට කාලය වැය කිරීමට සිදුවීම නිසා වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීමට කාන්තාවන්ට ලැබෙන අවස්ථාව අඩු ය. එම නිසා කුඩා දරුවන් ඇති කාන්තාවන් රැකියාව කරන කාලය තුළ ඔවුන්ගේ දරුවන් රැක බලාගැනීමේ පහසුකම් අප රටපුරා ප්‍රචලිත කළ යුතු අතර එවැනි මධ්‍යස්ථාන විධිමත් නියාමනයකට යටත් ව ඉතා ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යාමට කටයුතු කෙරේ.
- වැඩෙන දරුවෙකුට මවකගේ සෙනෙහස රැකවරණය අත්‍යවශ්‍ය ය. ඒ නිසා තරුණ මව්වරුන්ට තම දරුවන් රැකබලා ගැනීම සඳහා තාවකාලික ව රැකියාවෙන් ඉවත් වීමට සහ යළි රැකියාවකට එකතුවීමට ක්‍රමවේදයක් සකස් කෙරේ.
- එමෙන් ම ලෝකයේ ඉහළ ම ඉල්ලුමක් ඇත. වැඩි වැටුපක් ලබාගත හැකි හෙද සේවය වැනි අංශ සඳහා කාන්තාවන් පුහුණු කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් අප ආරම්භ කෙරේ.
- රැකියාවකට යනවා වෙනුවට ගෘහස්ථ ව්‍යවසායයන් හරහා ආදායම් ඉපයීමට ග්‍රාමීය කාන්තාවන්ට විවිධ ව්‍යවසායයන්ට යොමු වීමට ඇති අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා අඩු පොලී ණය පහසුකම් සලසා දීම. අවශ්‍ය කරන ව්‍යාපාරික පුහුණුව ලබාදීම හා වෙළෙඳපොළ සම්බන්ධීකරණයට නිසි උපදෙස් ලබාදීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගන්නට කටයුතු කෙරේ.
- අද අපේ රටේ කාන්තා හිංසනය හා ළමා අපචාර බෙහෙවින් වැඩි වී ඇත. පොදු ප්‍රවාහන සේවාවල කන්තාවකට නිදහසේ ගමන් කළ නොහැකි තරමට සදාචාරය පිරිහී ඇති බව පෙනෙන්නට තිබෙන කරුණකි. මේ තත්ත්වය පාලනය කොට කාන්තාවගේ ගෞරවය සුරකින, විනය ගරුක, ගුණ ගරුක, සදාචාර සම්පන්න සමාජය අප යළි ගොඩනැංවීමට කටයුතු කළ යුතු ය.
- කාන්තාව සමාන අයිතිවාසිකම් ඇති තැනැත්තියක ලෙස නොසලකා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට විරුද්ධ ව ද නොපමා ව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වෙන ම ඒකකයක් පොලිස් කොමිසම තුළ පිහිටුවීමට කටයුතු කෙරේ.
- කාන්තාවක් කිසියම් කරදරයකට මුහුණපාන ඕනෑ ම අවස්ථාවක තම ජංගම දුරකථනය මගින් කඩිනමින් ළඟම ඇති පොලිස්ථානයට එම තොරතුර දන්වා යැවිය හැකි දුරකථන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- යම් කාන්තාවකට කිසියම් ගැටලුවක්, මානසික ව්‍යාකූලත්වයක්, චිත්ත පීඩාවක, පීඩනයක් ඇති වූ අවස්ථාවක ඒ ගැන කියා හිත සැහැල්ලු කර ගැනීමට හෝ අවශ්‍ය උපදේශනය ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග වෙත යොමු කිරීමට ජංගම දුරකථනය මගින් දවසේ ඕනෑ ම අවස්ථාවක සම්බන්ධ විය හැකි උපදේශන සේවාවක් ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ආරම්භ කෙරේ.

## විශේෂ හැකියාවන් සහ ආබාධ සහිත පුද්ගලයින්

විශේෂ හැකියාවන් සහිත සහ ආබාධ සහිත පුද්ගලයන් අප සලකන්නේ සමාන අයිතිවාසිකම් ඇති පිරිසක් ලෙස ය. ඔවුනට අවශ්‍ය වන්නේ අපගේ අනුකම්පාව නොව සමාන ජීවන අවස්ථා පුළුල් කර දීම ය. ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ.

- එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ද නීතිමය ලෙස පිළිගැනීමට අවශ්‍ය පියවර ගැනේ.
- ආබාධ සහිත පුද්ගලයන්ට පාසල් සහ විශ්වවිද්‍යාලවල අධ්‍යාපන ලැබීමේ දී සහ පොදු විභාග ප්‍රශ්න පත්‍රවලට මුහුණ දීමේ දී සිදුවන දුෂ්කරතා ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- ශ්‍රවණාබාධිතයින් භාවිත කරන සංඥා පිළිබඳ භාෂා පරිවර්තකයින්ගේ සංඛ්‍යාව කිසිසේත් ප්‍රමාණවත් නොවන නිසා විධිමත් ලෙස සංඥා භාෂා පරිවර්තකයින් පුහුණු කිරීමේ පුළුල් වැඩසටහනක් ආරම්භ කෙරේ.
- සන්නිවේදන පහසුකම් ඇති කිරීමට ඇමතුම් මධ්‍යස්ථාන (call center) ආරම්භ කරන අතර විද්‍යුත් භාෂා ක්‍රම යොදා ගැනීම සහ ඒ සඳහා ජංගම දුරකථන ඇප් එකක් හඳුන්වා දෙනු ලැබේ.

සිව්වන කොටස

# ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

- දැනට සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ඇති ආබාධ සහිත පුද්ගලයින්ගේ වගකීම එම තැනැත්තන්ගේ ද සහභාගිත්වයෙන් යුත් සුදුසු අධිකාරියක් යටතට පවරනු ලැබේ.
- ආබාධ සහිත ප්‍රජාව සඳහා නව ලොවට ගැළපෙන පාඨමාලා හඳුන්වා දීමට කටයුතු කරන අතර පළාත් සභා හා පෞද්ගලික අංශයේ රැකියා ලබාදීම සඳහා පවතින චක්‍රලේඛ නිසි ආකාරයට ක්‍රියාත්මක කෙරේ.
- ආබාධ සහිත පුද්ගලයින්ට රසවින්දනය කළ හැකි ලෙස සම්පාදනය කරනු ලබන සිනමා හා නාට්‍ය නිර්මාණ සඳහා විශේෂ බදු සහන පැකේජයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධන කටයුතු සඳහා විදේශ ආධාර හා ප්‍රදානයන් පිරිනැමීමේ දී අයකරනු ලබන බදු අහෝසි කෙරේ.
- අවම වශයෙන් සිය ප්‍රවෘත්ති විකාශනවල දී හෝ හස්ත සංඥා භාවිතය යොදා ගැනීම සියලු රූපවාහිනී මාධ්‍ය ආයතනවලට අනිවාර්ය කෙරේ.

### ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක්

වැඩිහිටි ජනගහනය ඉහළ යමින් තිබෙන රටක් ලෙස ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ද සංකීර්ණතා රාශියකට මුහුණ දෙමින් ඇත. දරුවන් අධ්‍යාපනය හෝ රැකියා සඳහා විදේශගත වීම, දුර බැහැර නාගරික ප්‍රදේශවල රැකියාවල යෙදීම, දෙමව්පියන් ගමෙන් පිටත යාමට හෝ නාගරික පරිසරයක ජීවත්වීමට අකමැති වීම, දුප්පත් පවුල්වල දරුවන්ට රෝගී හෝ සදාකාලික එක්තැන් වූ දෙමව්පියන් රැකබලා ගැනීමට ඇති නොහැකියාව වැනි කරුණු නිසා මේ සංකීර්ණතාව බලවත් සමාජ ගැටලුවක් බවට පත්වෙමින් ඇත. මෙම දෙවු පුරවැසියන්ගෙන් අතිමහත් බහුතරයකට තමන්ගේ පැවැත්ම සඳහා විශ්‍රාම වැටුපක් හෝ වෙනත් රක්ෂණ ආවරණයක් නැත. වැඩිහිටියන් වැඩිහිටි නිවාසගත කිරීම තවමත් අපේ රටේ සැලකෙන්නේ සමාජ නින්දාවක් ලෙස ය. ඒ කෙසේ වුවත් සියලු ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රැකවරණය රජයේ වගකීමක් ලෙස සලකන අතර ඔවුන් සියලු දෙනාට ම ගෞරවයෙන් යුක්ත ව ජීවත්වීමට අවශ්‍ය වටපිටාවක් ඇති කෙරේ.

- වැඩිහිටියන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය නැවත අධීක්ෂණය කොට ක්‍රියාවට නැංවීම සඳහා පියවර ගනු ලැබේ.
- වියපත්භාවයේ අභියෝග ජයගැනීම සඳහා සකස්කොට ඇති පස් අවුරුදු සැලැස්ම විධිමත්කර වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවට නංවනු ලැබේ.
- හඳුනාගත් සුමට සංවර්ධන ව්‍යාපෘති සහ අනාගත පරම්පරාවට තම ජීවන අත්දැකීම් සහ රටේ ඉතිහාසය පිළිබඳ දැනුම ලබාදෙන වැඩසටහන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දායක කර ගැනීම අරමුණු කර ගනිමින් 'ස්වේච්ඡා සේවා බළකායක්' ආරම්භ කෙරේ.
- නිෂ්පාදන කාර්යයට දායකවීමට කැමති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබද්ධ ව ජීවනෝපාය සංවර්ධන පුහුණුව ලබාදීමටත් ඒ සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය ලබාදීමටත් වෙළෙඳපොළ හඳුන්වා දීමටත් පියවර ගනු ලැබේ.
- දැනට ලබා දෙන රුපියල් 2,000/-ක වැඩිහිටි දීමනාවෙන් කපා හැර ඇති රුපියල් 100/- ද නැවත් එක් කර මෙම දීමනාව රුපියල් 2,500/- දක්වා ඉහළ දැමීමට කටයුතු කෙරේ.
- අවුරුදු 65ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නිර්දේශිත ඖෂධ මිලදී ගැනීමේ දී සහනාධාර ක්‍රමයක් ඇති කෙරේ.
- දෙමව්පියන්ට ආවරණය සැපයෙන නව රක්ෂණාවරණ ක්‍රමයක් දරුවන්ට හඳුන්වා දෙනු ලැබේ.
- සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුට ම සෑම මාස 6කට වරක් එක් සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණයක් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරීමේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරනු ලැබේ.
- වැඩිහිටියන්ගේ පහසුව සහ ආරක්ෂාව සැලසෙන ආකාරයට සියලු ම වැඩිහිටි නිවාස සඳහා නිසි ප්‍රමිතියක් ඇති කරන අතර දැනට පවතින වැඩිහිටි නිවාස එම ප්‍රමිතියට අනුව නවීකරණය කෙරේ.
- වැඩිහිටි නිවාස සඳහා රජය වෙන් කරන මුදල වැඩි කිරීමට කටයුතු කෙරේ.
- පෞද්ගලික අංශයට ව්‍යාපාරයක් ලෙස නිසි ප්‍රමිතියෙන් යුත් වැඩිහිටි නිවාස ආරම්භ කිරීමට රජයේ අනුග්‍රහය ලබා දීමට කටයුතු කෙරේ.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තම තමන්ගේ ආගමට අනුකූල ප්‍රධාන ආගමික සිද්ධස්ථාන (බුද්ධගයාව, වතිකානුව, මක්කම ආදී) වැද පුදා ගැනීම සඳහා අඩු පොලී සහනදායී ණය ලබා දීම සඳහා කටයුතු සම්පාදනය කෙරේ.

### 'රට වෙනුවෙන් වැඩ' සංස්කෘතියක්

රටක ආර්ථිකයේ ගාමක බලවේගය ජාතික ශ්‍රම බළකාය ය. රටක සංවර්ධනය රඳා පවතින්නේ එහි ඵලදායී ක්‍රියාකාරීත්වය මත ය. එම නිසා අප සුදානම් වන සංවර්ධනයේ යෝධ පිම්ම සඳහා අවශ්‍ය පුහුණුළ කාර්යශීලී සහ රට වෙනුවෙන් කැපවෙන 'වැඩ කිරීමේ සංස්කෘතියක්' ඇති කළ යුතු ය. අඩුවෙන් වැඩකරන, දුප්පත් ව ජීවත්වන ශ්‍රමිකයෙකු වෙනුවට වැඩියෙන් වැඩ කරන, පොහොසත් ජීවිතයක් ගත කරන ශ්‍රමිකයෙක් නිර්මාණය කිරීම අපගේ වගකීම වේ.

#### මහජන හිතෛෂී රාජ්‍ය සේවයක් වෙනුවෙන්

- රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා සේවා අවශ්‍යතාවය අනුව භෞතික ව්‍යාප්තිය මත පදනම් ව දිගු කාලීන මානව සම්පත් සැලැස්මක්. සකස් කිරීමට පියවර ගැනේ. ඒ යටතේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවල සේවකයින් බෙදී යා යුතු ආකාරය සහ එම කාර්ය මණ්ඩල ක්‍රියා කළ යුතු ආකාරය එම සැලැස්මකට ඇතුළත් කෙරේ.
- රාජ්‍ය සේවා අඛණ්ඩ ව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා දීර්ඝ කාලීන අනුප්‍රාප්තික සැලැස්මක්. සකස් කෙරේ.
- ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය නව සේවා ආචාර ධර්ම පද්ධතියක්. හඳුන්වා දෙනු ලැබේ.

- රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවකයන්ගේ විශ්‍රාම යාමේ වයස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව තීරණය කරන උපතේ දී ආයු අපේක්ෂණය මත පදනම් ව ක්‍රියාත්මක කරන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට රැකියා අහිමිවන අවස්ථාවක දී නැවත රැකියාවක් සොයා ගන්නා තෙක් මාසික දීමනා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- අර්ථ සාදක අරමුදලේ සාමාජිකත්වය ඇති රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සමස්ත සේවකයන් සඳහා සේවක අර්ධසාධක අරමුදලේ (EPF) සේව්‍ය දායකත්වය 12% සිට 15% දක්වා වැඩි කර සේවක ඉතුරුම් වැඩි කිරීමට කටයුතු කෙරේ.
- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයෙකු රාජකාරි කාලය තුළ මියගිය විට වැන්දඹුවට සේවකයා විශ්‍රාම ලබන තෙක් සේව්‍යයා විසින් වැටුප් ගෙවීම අනිවාර්ය කිරීම සඳහා නව නීති හඳුන්වා දෙනු ලැබේ.
- රාජ්‍ය සේවයේ සේවා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.
- උපාධිධාරී සංවර්ධන නිලධාරීන්, කෘෂි පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරු සහ ඒ සමාන සේවයන් සඳහා නව සේවා ව්‍යවස්ථා හඳුන්වා දෙනු ලැබේ.
- රාජ්‍යල අර්ධ රාජ්‍යල සංස්ථා සහ බැංකු සේවයේ සියලු ම ආයතනවල සද්භාවයෙන් යුක්තව රාජකාරියේ යෙදෙන රාජ්‍ය නිලධාරීන්ට මුක්තිය හිමිවන පරිදි අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇති කෙරේ.
- රාජ්‍ය සේවයේ පවත්නා ශ්‍රේණි සහ වැටුප් විෂමතා කඩිනමින් ඉවත් කිරීම සඳහා වෙනම කොමිසමක් පත් කෙරේ.
- රජයේ සේවකයන්ගේ අහිමි කළ විශ්‍රාම වැටුප් අයිතිය නැවත ලබා දෙනු ලැබේ.
- වැඩිවන ජීවන වියදම් අනුපාතයට ගැළපෙන පරිදි රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- දැනට පෞද්ගලික අංශයේ සේවක ආරවුල් විසඳීම සම්බන්ධයෙන් ඇති බේරුම්කාර ක්‍රියාවලියට සමාන ක්‍රමවේදයක් රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා හඳුන්වා දෙනු ලැබේ.
- පළාත් පාලන සේවය ඇතුළු රාජ්‍ය සේවයේ පහළ ම ශ්‍රේණිවලට අයත් සේවකයන් වෙනුවෙන් සනීපාරක්ෂක දීමනාවක් ලබා දෙනු ලැබේ.

**විශ්‍රාමික ප්‍රජාව**

- රාජ්‍ය ආරක්ෂක අංශ ඇතුළුව සියලුම රාජ්‍ය සේවකයින්ගේ දැනට පවතින විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීමට පියවර ගන්නා අතර ජීවන වියදම් දීමනාව විශ්‍රාමිකයින්ට ද ලබාදීමේ ක්‍රමවේදයක් පිළිබඳව සලකා බලනු ලැබේ.
- නියමිත දිනට දායක මුදල් ගෙවා ඇති වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ලාභීන්ට ප්‍රමාදයකින් තොර ව විශ්‍රාම වැටුප ලබාදීමට කටයුතු කෙරේ.

**සංස්ථා, අර්ධ රාජ්‍ය ආයතන සහ බැංකු**

- රජයේ සේවකයින්ට ගෙවා ඇතිල දැනට අර්ධ රාජ්‍ය අංශයට නොගෙවන රුපියල් 2500/-ක වැටුප් වැඩිවීම මෙම අංශයටත් ලබා දීමට කටයුතු කෙරේ.
- සාප්පු සහ කාර්යාල සේවා පනත සේවක සුභසාධනයට හිතකාමී අයුරින් වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනය කෙරේ.
- සේවක අර්ථ සාධක අරමුදලට අමතර ව විශේෂ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- විශ්‍රාම යමේ දී ලබාදෙන පාරිතෝෂිත දීමනාව සඳහා දැනට අය කරන 24% බද්ධ 15% දක්වා අඩු කෙරේ.
- දැනට මෙම අංශයේ රැකියාවල නියුක්ත සේවකයන්ගේ ආදායම් බදු ප්‍රතිශතය 2014 පැවති ප්‍රමාණයට අඩු කිරීමට කටයුතු සම්පාදනය කෙරේ.
- පැරණි රාජ්‍ය බැංකු සේවකයන් සඳහා ලබා දෙන විශ්‍රාම වැටුප නව සේවකයන්ට ද ලබා දීමට පියවර ගන්නා අතර එම හිමිකම නොමැති අනෙකුත් බැංකුවල සේවකයින්ට ද විශ්‍රාම වැටුප් අයිතිය ලබා දෙනු ලැබේ.
- දැනට ඒ ඒ ආයතන මට්ටමින් වෛද්‍ය රක්ෂණ ක්‍රම නොමැති සියලු සංස්ථා සහ ආයතනවලට අවම වශයෙන් ආරම්භක අවස්ථාවේ දී බරපතළ රෝගාබාධ සඳහා දායකත්ව රක්ෂණ ආවරණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

**පෞද්ගලික අංශය**

- දැනට පෞද්ගලික අංශයේ සේවකයන්ගේ රුපියල් 10.000/- අවම වැටුප රුපියල් 2500/- කින් ඉහළ නංවනු ලැබේ.
- දැනට බලපවත්වන ආයතන සංග්‍රහය සහ ඒ සම්බන්ධ අතුරු ව්‍යවස්ථා කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සහ සේවකයන්ට වැඩි පහසුකම් සැලසෙන පරිදි වසරක් තුළ සංශෝධනය කිරීම සඳහා විද්වත් සමාලෝචන කමිටුවක් පත් කෙරේ.
- වත්මන් ආණ්ඩුව අලුතෙන් ගෙන ඒමට උත්සාහ කරන සියලු අණපනත් සේවක ප්‍රජාවේ සහ වෘත්තීය සමිතිවල එකඟතාව අනුව නැවත සමාලෝචනය කෙරේ. දැනට ක්‍රියාත්මක වන විවිධ සමාජ ආරක්ෂණ ක්‍රම එක් ක්‍රමයක් යටතට ගෙන එම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

# එළදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

- යම් අයෙකු සේවයට එක් වූ දින සිට සතියක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම අනිවාර්ය කෙරේ. එමගින් සේවක අර්ථසාධක අරමුදල් පැහැර හැරීම වළක්වන අතර සේවකයාට හිමි වෘත්තීය අයිතිය සුරක්ෂා කොට සුභසාධන පහසුකම්වල අදාළ කටයුතු පහසු කෙරේ.
- 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත සංශෝධනය කර සේවයින්ට හිමිවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය ඉහළ නංවනු ලැබේ.
- විනය පරීක්ෂණ හෝ වැඩ තහනමට ලක්වන සේවකයින් පිළිබඳව ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ගෙන ඒම සඳහා 1950 අංක 43 දරන කාර්මික ආරවුල් සංශෝධනය කෙරේ.
- සේවක ප්‍රතිලාභ වැඩිවන ආකාරයට සේවක අර්ථසාධක අරමුදලේ ආරක්ෂාව සහතික කරන අතර එම අරමුදල අවභාවිත කළ අය නීතිය ඉදිරියට පමුණුවා එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු යෙදේ.
- සේවක අර්ථසාධක අරමුදලින් ණය ලබා දීම සහ අවුරුදු 55න් පසුව එම පාරිතෝෂික මුදල් ලබාගැනීමේ ක්‍රමවේදය තව දුරටත් පහසුකරමින් අන්තර්ජාලය හරහා තම බැංකු ගිණුමට මුදල් බැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- ඉතා කෙටිකාල සඳහා රැකියාවල යෙදීමල විටින් විට රැකියා මාරු කිරීමල ලිපිනය වෙනස් වීම දැනුම් නොදීමල තොරතුරු අසම්පූර්ණ වීම සහ නොදැනුවත්කම වැනි හේතු මත ප්‍රතිලාභීන්ට නොගෙවා ඇති සියලු අර්ථසාධක අරමුදල් නොපමා ව සොයා බලා ගෙවා දැමීම සඳහා කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- සේවක අර්ථසාධක අරමුදලට අමතර ව එහි මුදල් බැර නොවන දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- නිදහස් වෙළෙඳ කලාපවල සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය පෝෂණ හා අනෙකුත් සුභ සාධන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සැපිරීම සඳහා සේවක සුභ සාධන සමිති, කර්මාන්ත ශාලා හිමියන් සහ ආයෝජන මණ්ඩලය ඒකාබද්ධ යන්ත්‍රණයක් සකස් කරනු ලැබේ.
- වාර්ෂිකව ලබාදෙන රැකියා ප්‍රමාණය. සේවක වැටුප් සහ වරප්‍රසාද සේවකයන්ගේ රැකියා වෘත්තිය ආදී නිර්ණායක මත පදනම්ව පෞද්ගලික අංශයේ ආයතන ඇගයීමට ‘ලක් ව්‍යවසායක හරසර’ නමින් රාජ්‍ය සම්මාන උළෙලක් වාර්ෂිකව පවත්වනු ලැබේ.

**විදේශ රැකියා බළකාය**

විදෙස්ගත ශ්‍රමිකයන් අපේ රටේ ආර්ථිකයට ඉතා වැදගත් සේවාවක් ඉටු කරන අතර ලංකාවට විශාලතම විදේශ විනිමයක් ගෙන එන පිරිසකි. 2018 දී විදේශ ශ්‍රමිකයන්ගෙන් රටට ලැබුණ ආදායම රටේ දළ ජාතික ආදායමෙන් 8% ක් පමණ විය. එම නිසා විදේශගත ශ්‍රමිකයන්ගේ දායකත්වය අප ඉතාමත් අගය කොට සලකන්නෙමු. ඒ වාගේ ම විදෙස්ගත ශ්‍රමිකයන් මෙන් ම විදේශ රටවල පදිංචිව සිටින ශ්‍රී ලංකිකයන් පිළිබඳව මීට වඩා අවධානයක් අනාගත රජය විසින් යොමු කරනු ලැබේ.

- විදෙස්ගත ශ්‍රමිකයින් මෙන් ම විදේශ රටවල පදිංචි ශ්‍රී ලාංකිකයන් උපයන විදේශ විනිමය ඉපයීම් ආදායම් බදුවලින් නිදහස් කරන අතර එම මුදල් බැංකුවල විදේශ මුදල් ඉතුරුම් ලෙස තබා ගැනීමේ දී, අයකරන බදු සම්පූර්ණයෙන් ම ඉවත් කෙරේ.
- විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට තමන් උපයන විදේශ විනිමය එළදායී ලෙස ලංකාව තුළ ආයෝජනය කිරීමට බදු සහන ඇතුළු විශේෂ පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ.
- විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා බදු නිදහස් ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ ව්‍යාපෘති ණය මුදලක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- වසරකට ඩොලර් 50,000/- බැගින් වසර 10ක් ශ්‍රී ලංකාවට විදේශ විනිමය අඛණ්ඩ ව එවන විදේශගත ශ්‍රමිකයින් හෝ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට තීරුබදු රහිත වාහන බලපත්‍රයක් ලබා දෙනු ලැබේ.
- වසර 06කට වඩා වැඩි කාලයක් විදේශගත ව සේවය කරන්නන්ට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- මැදපෙරදිග කලාපයට යවන නුපුහුණු කාන්තා ශ්‍රමිකයන් වෙනුවට පුහුණු ශ්‍රමිකයින් යැවීමේ වැඩපිළිවෙළක් සකස් කෙරේ.
- දැනට මැදපෙරදිග කලාපයේ සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා එම රටවල පිහිටා ඇති අපේ තානාපති කාර්යාලවලට වැඩි වගකීමක් පවරනු ලැබේ.
- විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ලැබේ.
- විදේශ රටවල සේවය කිරීමේ දී සදාකාලික ආබාධවලට ලක්වන පුද්ගලයින්ට නොමිලේ නිවසක් තනා දීම හෝ ඊට සමාන ඔවුන් කැමති ප්‍රතිලාභයක් ලබාදීමේ ක්‍රමවේදයක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා හඳුන්වා දෙනු ලැබේ.
- විදේශ රටවල සේවය කරන සහ විදේශ රටවල පදිංචි ශ්‍රී ලාංකිකයන්ට නව නිවාස සංකීර්ණවලින් ජීවත්වීමට අවශ්‍ය සියලු පහසුකම් සහිත නිවාස පහසු ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීමට මේ අවස්ථාව සලසා දෙනු ලැබේ.

**පෞද්ගලික ආරක්ෂක සේවා**

- ආරක්ෂක සේවා මුරයකට උපරිම සහතික ගෙවීමක් සහ රාත්‍රී මුර සේවයට විශේෂ දීමනාවක් ගෙවීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- සෑම පෞද්ගලික ආරක්ෂක භටයෙකුට ම ඉහළ රක්ෂණ ආවරණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- විදේශ රටවල පෞද්ගලික ආරක්ෂක සේවය සඳහා යොමු කිරීමට අවශ්‍ය මනා පුහුණුවක් ලබාදීමට පියවර ගනු ලැබේ.
- ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පෞද්ගලික ආරක්ෂ සේවය සම්බන්ධයෙන් කටයුතු කරන ඒකකයක් පිහිටුවනු ලැබේ.

## සෑම පවුලකට ම සුවපහසු නිවාසයක්

සෑම දෙනාට ම නිවසක අවශ්‍යතාව තිබුණත් එම අවශ්‍යතාව තනියම සම්පූර්ණ කරගන්න බැරි බව අප දන්නා අතර අපගේ රජය කාලයේ නිවාස ප්‍රශ්නයෙන් විශාල වශයෙන් පීඩාවට පත් වී සිටි නාගරික අඩු ආදායම්ලාභී ජනතාගේ නිවාස අවශ්‍යතාව විසඳන අතර ම ඔවුනට නව ජීවන ක්‍රමයක් හඳුන්වාදීමට අප ක්‍රියා කළෙමු. අපේ අනාගත රජයක් යටතේ ඒ ආකාරයට ම නාගරික මෙන් ම ග්‍රාමීය ජනතාවගේත් නිවාස අවශ්‍යතාව ඔවුන්ගේ ජීවන මට්ටමත් ඉහළ යන ආකාරයට විසඳිය යුතු ය.

- නිවාස ඌනතාව ඇති සියලු දෙනාට ම තම අවශ්‍යතාවට ගැළපෙන සහ ආදායමට සරිලන නිවසක් රජයේ සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් ඉදිකරන සියලු පහසුකම් සහිත නිවාස සංකීර්ණවලින් පහසු ගෙවීමේ ක්‍රමයට ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කෙරේ.
- මධ්‍යම පාන්තිකයින්ගේ ආදායමට ගැළපෙන මහල් නිවාස පහසු මිලට අත්කර දීම සඳහා නිවාස ඉදිකිරීම් කර්මාන්තකරුවන්ට අවශ්‍ය ඉඩම් දීර්ඝ කාලීන බදු පදනමක් යටතේ සහන මිලකට ලබාදීම හා වෙනත් ආයෝජන දිරි ගැන්වීමේ ක්‍රමවේදයක් ඇති කෙරේ.
- තරුණ පවුල්වලට තමන්ගේ ම කියා නාගරික ප්‍රදේශ ආශ්‍රිත ව නිවසක් දීර්ඝ කාලීන පහසු ගෙවීමේ ක්‍රමයකට මිලදී ගැනීමට හැකිවන විශේෂ නිවාස ව්‍යාපෘති රාජ්‍ය සහ පෞද්ගලික මැදිහත්වීමෙන් රට පුරා ක්‍රියාත්මක කෙරේ.
- රජයේ සහ පෞද්ගලික අංශයේ දායකත්වය සහිත ව තාවකාලික නේවාසිකත්වයක් අපේක්ෂා කරන්නන්ට සාධාරණ කුලී පදනම මත ලබාගත හැකි මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- ලංකාව පුරා ඇති සියලු ප්‍රතිසංස්කරණය කළ නොහැකි පැරණි මහල් නිවාස වෙනුවට නව මහල් නිවාස ඉදි කර දෙනු ලැබේ.
- කොළඹ නගරයට පමණක් සීමා නොකොට දිවයින පුරා සියලු නගරවල ඉතා අඩු පහසුකම් යටතේ ජීවත්වන අවතැන් වූ සහ පැල්පත්වාසී ප්‍රජාවට පහසුකම් සහිත නාගරික නිවාස යෝජනා ක්‍රමවලින් නිවාස ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයින්ට පළමු නිවාස ඉදිකිරීමට හෝ මිල දී ගැනීමට ලබා ගන්නා ණය වෙනුවෙන් ගෙවන පොලිය ආදායම් බදු ගෙවීමේ දී වියදමක් ලෙස සැලකීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.
- නිවාස ඉදිකිරීමට භූමිය සීමා සහිත ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශවල සුවපහසු ජන ජීවිතයට අවශ්‍ය සියලු පහසුකම්වලින් යුතු නිවාස සංකීර්ණ ක්‍රමයක් ඇති කෙරේ. එමඟින් කෘෂිකර්මය සඳහා අවශ්‍ය ඉඩම් ආරක්ෂා කරන අතර ම පහසුකම් සහිත ජීවිතයක් සඳහා අවශ්‍ය පරිසරය ද නිර්මාණය කෙරේ.
- දැනට නිවාස අංශයට පමණක් ණය ලබාදෙන බැංකු සහ රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර නිවාස බැංකුවක් පිහිටුවන අතර ඉතා පහසු පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සලසා දෙනු ලැබේ.


RMS



# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

පස්වන කොටස

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

***ආර්ථිකයේ අයිතිය ජනතාවට හිමිවන, ජනතා කේන්ද්‍රීය ජාතික ආර්ථික පිළිවෙතක් කරා ගෙනයාමෙන් රටේ සම්පත් සහ ආර්ථික මර්මස්ථාන විදේශයන් සතු කිරීම වෙනුවට රට තුළ ම ඉතිරි කරමින්, දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කරන, වත්මන් පාලනය යටතේ අපට අහිමි කර ඇති ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් අපට හා අනාගත පරපුරට උරුම කර දීමට අපගේ අරමුණ වේ.***

## 2020-2025 සාර්ව ආර්ථික ඉලක්ක

ගෝලීය තත්ත්වය සහ රටේ සමාජ ආර්ථික ක්ෂේත්‍රයන්ගේ වර්තමාන තත්ත්වය සැකෙවින් අධ්‍යයනය කිරීමෙන් අනතුරු ව එක් එක් අංශවල අනිවාර්යයෙන් ම සිදුකළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් අප විසින් හඳුනාගෙන තිබේ. ඒ අනුව 2020-2025 කාලය තුළ දී ළඟා කර ගැනීමට අපේක්ෂිත සාර්ව ආර්ථික ඉලක්කයන් කිහිපයක් පහත දැක්වේ.

- සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය 6.5% ත් ඉහළට,
- ඇ.ඩො. 6,500 ඉක්මවා යන ඒක පුද්ගල ආදායමක්,
- සේවා වියුක්ති අනුපාතය 4% ට අඩු අගයක්,
- උද්ධමන වේගය 5% කට වඩා අඩු අගයක්,
- අයවැය හිඟය දදේනි. ප්‍රතිශතයක් ලෙස 4% ට වඩා අඩු අගයක්,
- තනි ඉලක්කමේ පොලී අනුපාතය,
- රුපියලේ අගය ස්ථාවර මට්ටමක.



## තාක්ෂණය හා මුසුවන අපේ ගොවිතැන

කුඩා භූමි ප්‍රදේශක, අඩු නිෂ්පාදන පිරිවැයකින්, උසස් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන්, වැඩි ගුණාත්මකභාවයකින් යුතු ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට හැකි සංවර්ධිත කෘෂි ආර්ථිකයක් ගොඩනැඟීම අපේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය වේ.

## බදු ප්‍රතිපත්තිය

රටේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා උර දෙන බදු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. දැනට ක්‍රියාත්මක වන දේශීය ආදායම් පනත වෙනුවට නව බදු පනතක් ගෙන එන අතර නිතර නිතර වෙනස් නොවී වසර කීපයක් අඛණ්ඩ ව පවතින සරල මිත්‍රශීලී නව බදු ක්‍රමයක් ස්ථාපනය කෙරේ.

## ජීවන වියදම

ජීවන වියදම පිළිබඳ බොරු පොරොන්දු දීමට වඩා අප කළ යුත්තේ මේ සම්බන්ධයෙන් පවතින කටුක යථාර්ථය තේරුම් ගැනීම ය. ඉතා ඉක්මනින් බල ගැන්වෙන අපගේ ආර්ථික ප්‍රතිපත්තියේ වාසියත්, විශේෂයෙන් ම බදුබර අඩු කිරීමේ ක්ෂණික ප්‍රතිලාභයත් මඟින් ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීමට කටයුතු කෙරේ.

## අපනයන භෝග වගාව

තේ, රබර්, පොල් කේන්ද්‍ර කරගත් අපනයන භෝගයන් ය. අනාගතයේ දීත් එම අවකාශය දිනා ගැනීම සඳහා වර්තමාන ගෝලීය වෙළෙඳපොළට ගැළපෙන ආකාරයට සහ වෙළෙඳපොළේ ස්ථාවරත්වය සහතික කර ගැනීම සඳහා නව තාක්ෂණය හා මුසු වටිනාකම් එකතු කිරීමේ නව සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ.




## කාර්මීකරණයෙන් ඔබ්බට

අපගේ රජය වරාය හා ගුවන් තොටුපොළවල් සංවර්ධනයට විශේෂ අවධානයක් යොමු කළේ ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපය තුළ ප්‍රධාන සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණ ඇති ව ය. එහෙත් පසුගිය වසර කිහිපය තුළ මේ සඳහා කිසිදු අවධානයක් නොදැක්වීම නිසා ගොඩනැගෙමින් ආ කර්මාන්ත ප්‍රබෝධය මුළුමනින් ම බිඳ වැටී ඇත.

## සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තය ඔස්සේ ඉහළ ම විදේශ විනිමය රට තුළට ගෙන ආ හැකි අපේ රටේ ආර්ථිකයේ වැදගත් කොටසකි. ඒ වාගේ ම පහසුවෙන් දියුණු කළ හැකි ක්ෂේත්‍රයකි. ඒ යටතේ වාර්ෂික ව ඇමරිකානු ඩොලර් බිලියන් 10 ක් ජාතික ආර්ථිකයට එක් කිරීම අපගේ අරමුණ වේ. එම වර්ධනයේ ප්‍රතිලාභ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව ස්වයං රැකියාවක යෙදෙන්නාගේ සිට මහා පරිමාණ ව්‍යාපාරිකයා දක්වා විහිද යා යුතු ය.





## ඇඟලුම් කර්මාන්තය

ඇඟලුම් කර්මාන්තය තවමත් අපේ රටේ සමස්ත අපනයන ප්‍රමාණයෙන් 43% ක් පමණ නියෝජනය කරන, අපනයන ආදායමට ඇමරිකානු ඩොලර් බිලියන 5ක් පමණ වාර්ෂික ව එක් කරන ප්‍රධානතම නිෂ්පාදන කර්මාන්තය වේ. එමෙන් ම රටේ දළ ජාතික නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් සපයන අතර රැකියා සැපයීමේ දී සහ ප්‍රාදේශීය සංවර්ධනයේ දී පුරෝගාමී මෙහෙවරක් ද ඉටු කෙරේ.

## ඉදිකිරීම් කර්මාන්තය

දැනුම, අත්දැකීම් සහ තාක්ෂණ භාවිතය ඇසුරින් ලබාගෙන ඇති පරිණතභාවය නිසා දැනටමත් අප මෙම ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර තලයට ගොස් ඇත. ශ්‍රී ලංකාවට ආවේණික වන්නා වූ පරිසර හිතකාමී මානව හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් ඇසුරින් ජාත්‍යන්තරය ජය ගැනීමට අවශ්‍ය පරිසරය සැකසීම අපගේ අපේක්ෂාව වේ.



පස්වන කොටස

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

## ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්

ආර්ථිකයේ අයිතිය ජනතාවට හිමිවන, ජනතා කේන්ද්‍රීය ජාතික ආර්ථික පිළිවෙතක් කරා ගෙනයාමෙන් රටේ සම්පත් සහ ආර්ථික මර්මස්ථාන විදේශයන් සතු කිරීම වෙනුවට රට තුළ ම ඉතිරි කරමින්, දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කරන, වත්මන් පාලනය යටතේ අපට අහිමි කර ඇති ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් අපට හා අනාගත පරපුරට උරුම කර දීමට අපගේ අරමුණ වේ.

### 2020 -2025 සාර්ව ආර්ථික ඉලක්ක

ගෝලීය තත්ත්වය සහ රටේ සමාජ ආර්ථික ක්ෂේත්‍රයන්ගේ වර්තමාන තත්ත්වය සැකෙවින් අධ්‍යයනය කිරීමෙන් අනතුරු ව එක් එක් අංශවල අනිවාර්යයෙන් ම සිදුකළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් අප විසින් හඳුනාගෙන තිබේ. ඒ අනුව 2020-2025 කාලය තුළ දී ළඟා කර ගැනීමට අපේක්ෂිත සාර්ව ආර්ථික ඉලක්කයන් කිහිපයක් පහත දැක්වේ.

- සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය 6.5% න් ඉහළට,
- ඇ.ඩො. 6,500 ඉක්මවා යන ඒක පුද්ගල ආදායමක්,
- සේවා වියුක්ති අනුපාතය 4% ට අඩු අගයක්,
- උද්ධමන වේගය 5% කට වඩා අඩු අගයක්,
- අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 4% ට වඩා අඩු අගයක්,
- තනි ඉලක්කමේ පොලී අනුපාතය,
- රුපියලේ අගය ස්ථාවර මට්ටමක,

## සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව

- දේශපාලන අරමුණ ඉටුකර ගැනීමට, පුද්ගල ප්‍රතිරූප ප්‍රවර්ධනයට සහ ඒදිනෙදා වියදම් සඳහා පසුගිය වසර 4 තුළ වත්මන් පාලකයන් ලබාගෙන ඇති විදේශ ණය ප්‍රමාණය 1948 දී නිදහස ලැබීමේ සිට 2014 දක්වා අපේ රට ලබාගෙන ඇති විදේශ ණය ප්‍රමාණයට සමාන වේ. මේ ණය උගුල නිසා රටේ සංවර්ධන කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය ණය පමණක් ලබා ගැනීමට මුල් කාලයේ දී අපට සිදුවනු ඇත. දේශීය ආයෝජන දිරි ගැන්වීම, ආනයන වියදම අඩු කිරීම සහ අපනයන ආදායම ඉහළ නැංවීම මගින් මෙම තත්ත්වය පාලනය කිරීමට අප අවශ්‍ය පියවර ගනු ලැබේ.
- දැනට ජාතික ආදායමෙන් 7%කට පමණ වැඩි වී ඇති අයවැය පරතරය 4%කට වඩා ක්‍රමානුකූලව අඩු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වියදම් සහ ප්‍රමුඛතාවයෙන් යුත් රාජ්‍ය ආයෝජන හැර රජයේ සියලු අනවශ්‍ය වියදම් කපා හැරේ.
- වසරකට ඩොලර් බිලියන 10 ඉක්මවා ඇති වෙළඳ හිඟය රටට දරා ගතහැකි මට්ටමකට අඩු කර විදේශ ණය මත රඳා පවතින ආර්ථිකය වෙනුවට දේශීය සම්පත් පදනම් කරගත් අපනයනය හා ආනයන ආදේශන නිෂ්පාදන පුළුල් කෙරේ.
- දේශීය ව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා අයකරන බදු ඒකී නිෂ්පාදන ආනයනය කිරීමට වඩා ඉහළ මට්ටමක පවතී. එම නිසා දේශීය නිෂ්පාදන දිරි ගැන්වීම පිණිස වහා ම අමුද්‍රව්‍ය ආනයන බදු පහළ දැමීමට පියවර ගනු ලැබේ.
- ශ්‍රී ලංකාව තුළ ආනයන ආදේශන කර්මාන්ත හා අපනයන කර්මාන්ත තරගකාරී ලෙස පවත්වාගෙන යා හැකි පරිදි අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සහ තාක්ෂණික උපකරණ සඳහා කිසිදු බද්දක් අය නොකෙරේ.
- රාජ්‍ය මිලදීගැනීම්, ඉදිකිරීම් සහ ආයෝජන අවස්ථා ප්‍රමුඛතා පදනමක් යටතේ දේශීය ව්‍යවසායකයින්ට විවර කර රාජ්‍ය වියදම් අපේ රටේ ව්‍යාපාරිකයන්ට හා කර්මාන්තකරුවන්ට ආදායම් බවට පත් කිරීමට පියවර ගනු ලැබේ.
- දැනට බිඳවැටී ඇති පෞද්ගලික මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ට උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දෙන අතර මහ බැංකුවේ ද්‍රවශීලතා අරමුදල හරහා අවදානම වැඩි මූල්‍ය ආයතන නැවත ස්ථාවර කිරීම සඳහා කටයුතු කෙරේ.
- ඉදිරි දශකය තුළ අපේ අපනයන ආර්ථිකය මුළුමනින් ම පාහේ වටිනාකම් එක් කිරීමේ නිෂ්පාදන දක්වා විතැන් කිරීමට පියවර ගනු ලැබේ.
- කිසිදු විටෙක ආහාර හිඟයක් ඇති නොවීම පිණිස රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කෙරේ.
- සමාජ ව්‍යවසායකයන් යනු විවිධ සමාජ සහ ආර්ථික ගැටලු විසඳීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යාපාර තුළින් ම විසඳුම් ලබා දෙන නව්‍යකරණශීලී ව්‍යවසායකයන් ය. ශ්‍රී ලංකාවේ එවැනි සමාජ ව්‍යවසායකයින් දියුණු කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කර සමාජ ව්‍යවසාය සංවර්ධන කේන්ද්‍රයක් ඇති කිරීමට කටයුතු කෙරේ.

## කඩිනම් සහන සැලැස්ම

වර්තමාන රජයේ අසාර්ථක ආර්ථික කළමනාකරණය නිසා පීඩාවට පත්ව සිටින පොදු ජනතාවට සහ දේශීය ව්‍යාපාරික ප්‍රජාවට එම තත්ත්වයෙන් ඉතා ඉක්මනින් නැවත නැගීසිටීම සඳහා අපගේ රජය බලයට පත් වූ විගස ජීවන වියදම පහළ දැමීමේ සහ අපගේ බදු ප්‍රතිපත්තිය යටතේ විශේෂ සහන සැලස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ.

### බදු ප්‍රතිපත්තිය

දැනට පවතින බදු ක්‍රමය මගින් දේශීය ව්‍යවසායකයා සහ බදු ගෙවන පොදු ජනතාව මුළුමනින් ම අධෛර්යට පත් කර ඇති ආර්ථිකය වෙනුවට රටේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහාත් පොදු ජනතාව සවිබල ගැන්වීම සඳහාත් අවශ්‍ය ආකාරයට අපේ බදු ක්‍රමය සංශෝධනය කරනු ලැබේ.

දැනට ක්‍රියාත්මක වන දේශීය ආදායම් පනත වෙනුවට නව බදු පනතක් ගෙන එන අතර නිතර නිතර වෙනස් නොවී වසර කීපයක් අඛණ්ඩ ව පවතින සරල මිත්‍රශීලී නව බදු ක්‍රමයක් ස්ථාපනය කෙරේ. ඒ යටතේ,

- නිෂ්පාදන ව්‍යාපාර සඳහා අය කරන ආදායම් බද්ද 28% සිට 18% දක්වා අඩු කෙරේ.
- ආර්ථික සේවා ගාස්තු (ESC) හා රඳවාගැනීමේ බදු (WHT) අහෝසි කෙරේ.

- එකතුකල අගයමත බදු (VAT) 15%ක් හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) 2%ක් වෙනුවට 8%ක සරල එකතුකල අගය මත බද්දක් ක්‍රියාත්මක කෙරේ.
- පොලිය මත අය කෙරෙන රඳවාගැනීමේ බදු (WHT) අහෝසි කෙරේ.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශවල රැකියා කරන්නන්ගේ වැටුපට අය කරන උපයනවිට ගෙවීම් බදු (PAYE TAX) අහෝසි කරනු ලැබේ.
- පුද්ගලික ආදායම් බදු වලින් නිදහස්වන ආදායම (Tax Free Threshold Income) ආදායම් ඉහළ දමා බදු අනුපාතය 15% ක උපරිමයකට සීමා කරන අතර ආදායම් බදු ගෙවිය යුතු සියලු දෙනාගෙන් බදු අයකිරීමේ ක්‍රමවේදයක් සකස් කෙරේ.
- කෘෂිකාර්මික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වසර 5කට බදු අය කිරීම අත්හිටුවන අතර හිඟ බදු මුදල් කපා හැරේ.
- බදු ක්‍රමයේ අකාර්යක්ෂමතාවය, අක්‍රමිකතා, දූෂණ මෙන් ම විනිවිදභාවයෙන් තොරවීමට බලපා ඇති අනෙකුත් විවිධ බදු අහෝසි කර ඒ වෙනුවට එක් විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් ක්‍රියාත්මක කෙරේ.
- දේශීය නිෂ්පාදකයන් විසින් නිෂ්පාදන කරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ දිරිගැන්වීම සඳහා අදාළ ආනයනික භාණ්ඩවල බදු ඉහළ දමනු ලැබේ.
- වාහන ලියාපදිංචිය හා වාර්ෂික සේවා ගාස්තු සඳහා අය කරනු ලබන විවිධ බදු හා ගාස්තු අහෝසි කර සරල ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- ආගමික ස්ථාන මත පනවා ඇති විවිධ බදු අහෝසි කරනු ලැබේ.
- සංචාරක හෝටල් සහ සංචාරකයන් සඳහා සේවා සපයන ආයතන සඳහා යොදා ගන්නා ආහාර අමුද්‍රව්‍ය, රෙදිපිළි සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය වැනි දේශීය නිෂ්පාදනවලින් ලබා ගන්නා යෙදවුම්වලින් 60% ඉක්මවන ව්‍යාපාර අපනයන කර්මාන්ත සේ සලකා ශූන්‍ය වැට් (Zero VAT) බදු අනුපාතය ක්‍රියාත්මක කෙරේ.
- දුරකතන සේවා ගාස්තු සහ අන්තර්ජාල පහසුකම් සඳහා අයකරන බදු 50% කින් අඩු කරනු ලැබේ.

- විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා බදු සහන සහිත විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- හඳුනාගත් ක්ෂේත්‍ර කිහිපයක් සඳහා ආයෝජන ප්‍රවර්ධන "බදු විමුක්ති පැකේජයක්" හඳුන්වා දෙනු ලැබේ.
- අන්තර්ජාල පහසුකම්, මෘදුකාංග සහ අනෙකුත් තාක්ෂණික භාවිතයන් ඇසුරින් රටේ බදු අය කරගැනීමේ ක්‍රියාවලිය ඉතා පැහැදිලි සහ පීඩාකාරීත්වයෙන් තොර එකක් බවටත් පත් කෙරේ.

**පොදු ජන ජීවන සහන**

ජීවන වියදම පිළිබඳ බොරු පොරොන්දු දීමට වඩා අප කළ යුත්තේ මේ සම්බන්ධයෙන් පවතින කටුක යථාර්ථය තේරුම් ගැනීම ය. ඉතා ඉක්මනින් බල ගැන්වෙන අපගේ ආර්ථික ප්‍රතිපත්තියේ වාසියත්, විශේෂයෙන් ම බදුබර අඩු කිරීමේ ක්ෂණික ප්‍රතිලාභයත් මගින් ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීමට කටයුතු කෙරේ.

- බදු අඩු කිරීමෙන් අඩුවන අත්‍යාවශ්‍ය බඩුවල මිල අඩුවීම ස්ථාවර ව පවත්වාගෙන යාමට කටයුතු කෙරේ.
- පවතින රජය විසින් අධික මිළට විදුලි මිළදී ගැනීම සඳහා අත්සන් තබා ඇති ගිවිසුම් අහෝසි කර එහි වාසිය පාරිභෝගිකයාට ලබා දෙමින් විදුලි බිලට සහනයක් ලබා දෙන අතර ජල බිල පහළ දැමීමට ද කටයුතු කෙරේ.
- දැනට ක්‍රියාත්මක වන ඉන්ධන මිල සූත්‍රය වහාම අහෝසි කෙරේ.
- විශ්‍රාමික, ජ්‍යෙෂ්ඨ පුරවැසි සහ ළමා ඉතුරු කිරීමේ ගිණුම් මත පනවා ඇති රඳවාගැනීමේ බදු අහෝසි කෙරේ.
- තම තමන්ගේ ජනවාර්ගිකත්වය සහ ආගමිකභාවය මත එළඹෙන ජාතික උත්සව හිතට බරක් නැති ව සැමරීමට සිංහල - හින්දු අලුත් අවුරුද්ද, නත්තල හෝ රාමසාන් උත්සව මාසවලින් එකක දී වාරික සංඛ්‍යාව වෙනස් නොවන පරිදි බැංකු ණය අයකර නොගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.
- විරැකියාව, ආදායම් මාර්ග අහිමි වීම, ලෙඩ රෝග හෝ ආපදාවන්, වන ජීවීන්ගෙන් වන හානිය, නියං හා ගං වතුර පීඩන, දේශගුණික විපර්යාස, මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වීම, ජාතික ආපදා නිසා ජීවිත, නිවාස හා දේපළ අහිමි වීම වැනි විවිධ හේතු නිසා පීඩා විඳින දිළිඳු ජනගහනය එයින් මුදා ගැනීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- දිළිඳු බව තුරන් කිරීම ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළවල් ග්‍රාමීය හා නාගරික ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන විවිධ ආර්ථික ක්ෂේත්‍රයන් ශීඝ්‍රයෙන් දියුණු කිරීම මගින් ජීවනෝපාය මාර්ග බහුල කෙරේ.
- අත්‍යවශ්‍ය පාසැල් සිසුන්ට ඇඳුම්, පාවහන් හා පොත් බෑග් සහන මිලට ලබා ගැනීම සඳහා වවුචර පහසුකම් ලබා දෙන අතර පෝෂ්‍යදායී ආහාර වේලක් සැපයීම මගින් දරුවන්ගේ පෝෂණ තත්ත්වය සමබරව පවත්වා ගැනීමට කටයුතු කෙරේ.

**නව බැංකු ක්‍රමයක්**

වේගවත් ඉදිරි ආර්ථික පිම්මක් පැනීම සඳහා නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා දිරි දෙන ආනයන අපනයන අංශය, ඉදිකිරීම් ක්ෂේත්‍රය, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කෘෂිකර්මය වැනි අංශ දියුණු කිරීම සඳහා අවශ්‍ය සහන පොළී ණය දීර්ඝ කාලීන ගෙවීමේ පදනමක් යටතේ ලබා දිය හැකි නව ක්‍රමවේදයන් සහිත "ජාතික සංවර්ධන බැංකුව" නමින් නව බැංකුවක් ස්ථාපනය කෙරේ.

පස්වන කොටස

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

### ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ

කොළඹ කොටස් වෙළෙඳපොළ යළි නඟා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රමුඛතම සාධකය නම් ආයෝජකයකයන් තුළ විශ්වාසය ගොඩනැගීම ය. ඒ සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙළක් අප සතුව ඇති බව ආයෝජකයන්ට සහතික කෙරේ. ඒ සඳහා ගතයුතු පියවර කිහිපයක් පහත දැක්වේ;

- කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහිකරණය කිරීම (Demutualization),
- අලුත් සමාගම් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා ලිහිල් කිරීම වැනි නව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
- කොටස් වෙළෙඳපොළ පිළිබඳව ආයෝජකයින් සහ මහජනතාව තුළ ඍණාත්මක ආකල්ප දුරු කිරීම සඳහා වඩාත් සදාචාරවත් කොටස් වෙළෙඳපොළ සංස්කෘතියක් බිහි කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසම විසින් සිදු කරනු ලබන නියාමනය වඩාත් ඵලදායී කිරීම සහ කොටස් වෙළෙඳපොළ ආශ්‍රිත ව සිදුවන වංචා සහ දූෂණවලට එරෙහි ව නීතිමය පියවර ගැනීම.
- රාජ්‍ය බැඳුම්කර වෙළෙඳපොළ සම්බන්ධ විධිවිධාන සහ විදේශිකයන්ට රජයේ බැඳුම්කරවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් පනවා ඇති 10% සීමාව පිළිබඳව යළි සලකා බැලීම.
- භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර ප්‍රාථමික වෙළෙඳපොළ කටයුතු තව දුරටත් ප්‍රසාරණය සහ නියාමනය කිරීම වැනි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

### ඒකාබද්ධ සංවර්ධන දර්ශක ප්‍රවේශය

**(Inclusive Development Indicator Approach)**

රටක සංවර්ධනය පිළිබඳ යල් පිනූ ක්‍රමෝපායන් ඇසුරින් අප යම් යම් ප්‍රතිඵල ලබාගෙන තිබුණ ද ඒ සඳහා වැයකර ඇති කාලයට සාපේක්ෂ ව ඒවා කිසිසේත් ම ප්‍රමාණවත් නොවේ. බහුතරයකට ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට නොහැකි වීම, පවුලේ වියදමට සරිලන ආදායම් ඉහළ නොයෑම සහ ආදායම් අසමානතාව දිගින් දිගට ම පැවතීම මඟින් පෙන්නුම් කරන්නේ එම තත්ත්වය ය. එම තත්ත්වය වෙනස් කොට සැමට ප්‍රතිලාභ හිමිවන සංවර්ධනයක් අත්පත් කරදීම සඳහා ඉදිරිගාමී සංවර්ධන ප්‍රවේශයක් ලෙස "ඒකාබද්ධ සංවර්ධන දර්ශක ප්‍රවේශය" (Inclusive Development Indicator Approach) යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

### තාක්ෂණය හා මුසුවන අපේ ගොවිතැන

අපගේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව කෘෂිකර්මාන්තයේ මූලික පදනම වන්නේ ගොවිතැන අත්හැර වෙනත් වෘත්තීන්ට යොමුවීම වෙනුවට වෙනත් වෘත්තීන්හි යෙදෙන්නන් පවා ගොවිතැනට ආකර්ෂණීය වන වෘත්තියක් බවට පත් කිරීම ය. කුඩා භූමි ප්‍රදේශක, අඩු නිෂ්පාදන පිරිවැයකින්, උසස් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන්, වැඩි ගුණාත්මකභාවයකින් යුතු ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට හැකි සංවර්ධිත කෘෂි ආර්ථිකයක් ගොඩනැගීම අපේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය වේ. ඒ සඳහා දැනට ඇති සියලු ප්‍රතිපත්ති සමාලෝචනය කර කන්නයෙන් කන්නයට වෙනස් නොවන නව ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සකස් කරන ලැබේ. එමඟින් රටේ දළ ජාතික නිෂ්පාදිතයට දැනට ලබාදෙන කෘෂිකාර්මික දායකත්වය පහසුවෙන් ම තව කීප ගුණයක් වැඩි කිරීම අපේ ඉලක්කය වේ. එමෙන් ම ඉදිරි දශකය තුළ දේශීය සහ ජාත්‍යන්තර පාරිභෝගිකයාට වසවිසෙන් තොර ශ්‍රී ලාංකික කෘෂි නිෂ්පාදන මිලට ගැනීමේ අවස්ථාව උදා කෙරේ.

- ගොවි විශ්‍රාම වැටුප නැවත ස්ථාපනය කෙරේ.
- වගාවෙහි අවදානම ගොවියා අධෛර්යයට පත් කරවන බැවින් ඉහළ ප්‍රතිලාභ හිමිවන වන ගොවි රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- පසුගිය කාලය තුළ ගොවියා මුහුණ දුන් වගා හානි සඳහා ගෙවන වන්දි මාස හයක් ඇතුළත ගෙවා නිම කෙරේ.
- භාවිතයට ගත හැකි, එහෙත් භාවිතයට නොගන්නා සහ ඌන භාවිත ඉඩම්වල ගැටලු හඳුනාගෙන එම ඉඩම් උපරිම ඵලදායීතාවක් සහිත ව කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතයට ගැනීමේ කඩිනම් ක්‍රමවේදයක් සකස් කෙරේ.
- සාම්ප්‍රදායික වගා ක්‍රමවේදය වෙනුවට සියලු වගා බිම්වල පසෙහි ගුණාත්මක බව, භාවිත කළ යුතු පොහොර, කෘෂි රසායන, පැළ සහ ඇට ප්‍රමාණය මිනුම් කිරී මෙන් ගුණාත්මක සහ ඉහළ පලදාවක් ලබාගත හැකි ය. ඒ සඳහා "පසෙහි සරුබව කළමනාකරණ අන්තර් සම්බන්ධිත තාක්ෂණික ක්‍රවේදයක් (Integrated Soil Fertility Management System) හඳුන්වා දීමට පියවර ගන්නා අතර එම ක්‍රමවේදය වසරක් තුළ කෘෂි නිලධාරීන් මගින් සෑම වගාකරුවකු අතට ම පත් කිරීමට පියවර ගනු ලැබේ.
- අස්වැන්න එකම සමයක දී වෙළෙඳපොළට පැමිණීම නිසා අස්වනු විනාශය, මිල පහළ වැටීම සහ ගොවියා ණයකරුවකු වීම වැනි ප්‍රධාන ගොවි ගැටලු රාශියක් ඇතිවීමෙන් දේශීය ගොවියා බරපතළ දුෂ්කරතාවකට ලක්වීම අප නිතර අත්දකින දෙයක් ය. එම ගැටලුව විසඳීම රට කෘෂි ආර්ථික කලාපවලට බෙදා වගාකිරීමේ නව "කෘෂි අස්වනු කළමනාකණ ක්‍රමවේදයක්" (Agricultural Crop Management System) හඳුන්වා දෙනු ලැබේ.
- සාම්ප්‍රදායෙන් එහා යන අධි තාක්ෂණික කෘෂි කර්මාන්තයක් වෙත යොමුවීම සඳහා ඉහළ අස්වනු ලබාගත හැකි, පරිසර හිතකාමී සහ කාබනික වගාවන් සඳහා හරිතාගාර වගාව (Green House Agriculture), දිය වගාව (Hydroponics Agriculture) දිය-මත්ස්‍ය වගාව (Aquaponics Agriculture) හඳුන්වා දෙනු ලැබේ. මෙම අංශ සඳහා තරුණ කෘෂි ව්‍යවසායකයන් පෙළඹවිය යුතු ය. ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපකරණ ආනයනය සඳහා තීරු බදු සහන සහ වසර දෙකක සහන කාලයක් සහිත අඩු පොලී ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- වර්ෂය පුරා වගා ජලය අඛණ්ඩ ව සැපයීම සඳහා අප ගන්නා ක්‍රියා මාර්ගවලින් උපරිම ප්‍රයෝජනය ලබාගත හැක්කේ ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරී මෙන් ය. ඒ සඳහා "ජල බිංදු ක්‍රමය" (Drip Irrigation) සහ "වතුරමල් ක්‍රමය" (Sprinkler System) වැනි දියුණු තාක්ෂණික ක්‍රමවේද මඟින් ජලය අරපිරිමැස්මෙන් භාවිත කර වැඩි අස්වනු ලැබෙන ක්‍රමවේද

භාවිතයන් සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණික ඥානය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා සෑම ගොවියෙකුට ම ලබා දෙනු ලැබේ.

- එම ක්‍රම සඳහා අවශ්‍ය උපකරණ සහ එම ක්‍රම භාවිතය සඳහා වැයවන ඉන්ධන පිරිවැය අවම කර ගැනීමට සූර්ය බලශක්තියෙන් ක්‍රියා කරන වතුර පොම්ප සහ සූර්ය කෝෂ ආනයනය සියලු බදුවලින් නිදහස් කෙරේ.

- ගොවියා අවිධිමත් ණයකරුවන්ගේ සහ අධික පොලී ක්‍රම සහිත ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ග්‍රහණයට හසුවීම දේශීය ගොවියා වගාවෙන් ඈත් කිරීමට බලපාන ප්‍රධාන ගැටලුවක් බව අප හොඳින් වටහා ගෙන ඇත. ගොවියා මෙම ණය උගුලෙන් මුදවා ගැනීම සඳහා අවම පොලී අනුපාත සරල ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. එම ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සියලු රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවලට අනිවාර්ය කෙරේ.

- සෑම ගොවියකුගේ ම කෘෂි වගාවන් රක්ෂණය කිරීමේ පහසු ක්‍රමවේදයක් සහ නොපමා ව වන්දි ලබාදීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.

- ඉදිරි දස වසර තුළ තරුණ ප්‍රජාව කෘෂි ව්‍යවසායකයන් බවට පත්කිරීම සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම, වගා ක්‍රමවේද පිළිබඳ දැනුම, ස්ථාවර ආදායම් මාර්ග ලබාගත හැකි ක්‍රමවේද, වෙළෙඳපොළ උපාය මාර්ග, පහසු ණය ක්‍රම සහ බදු සහන ලබාදීමට පියවර ගනු ලැබේ.

- අධිතාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් ඉහළ ඵලදායීතාවක් ලබා ගැනීමට වඩාත් සුදුසු වන්නේ මහා පරිමාණ ගොවිපොළ ක්‍රමය ය. එම නිසා ප්‍රාදේශීය මට්ටමින් "සමුපකාර ගොවි නිෂ්පාදන ක්‍රමවේදයක්" හඳුන්වා දෙනු ලැබේ. එවැනි ගොවිපොළ දිරි ගැන්වීම සඳහා තාක්ෂණික ආධාර, යටිතල පහසුකම් සහ ආයෝජන පහසුකම් සපයනු ලැබේ.

- වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං හා කව්පි, ළූණු සහ අල වැනි භෝග නිෂ්පාදනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර එම භාණ්ඩ ආනයනය කිරීම සඳහා වැය වන ඩො.මි.500කට අධික විදේශ විනිමය එම භෝග වවන ගොවීන්ගේ ආදායම බවට පත් කිරීමට කටයුතු කෙරේ.

- කිරි, බිත්තර, පශු සම්පත් මත්ස්‍ය, එළවළු සහ පලතුරු වැනි පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය සඳහා සුවිශේෂී වූ භූගෝලීය පරිසරයක් හා සංස්කෘතියක් පවතින උතුරු ප්‍රදේශවල ගොවියන් නිෂ්පාදනය සඳහා දිරි ගන්වා දැනට ආනයනය සඳහා වැය වන ඇ.ඩො.බිලියනයකට අධික විදේශ විනිමය ගොවියාගේ ආදායමක් බවට පත් කිරීම කටයුතු කෙරේ.

- සත්ත්ව ආහාර ආනයනය සඳහා වැය වන විශාල විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කෙරේ.

**පොහොර භාවිතයේ නව පෙරළිය**

නිරෝගී සහ ඵලදායී පුරවැසියෙක් බිහි කිරීමට නම් රජය විසින් වස විසෙන් තොර ආහාර වේලක් සඳහා ජනතාවට ඇති අයිතිය සහතික කළ යුතු ය. ඒ සඳහා ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය මුළුමනින් ම කාබනික පොහොර භාවිතයට යොමු කළ යුතු අතර ඒ සඳහා කාබනික පොහොර නිෂ්පාදන වේගවත් කළ යුතු ය.

- මුළුමනින් ම බිඳ වැටී ඇති අපේ ගොවියා නැවත නඟා සිටුවීම සඳහා පොහොර සහනාධාර ක්‍රමය වෙනුවට වගාවට අවශ්‍ය පොහොර සහ කාබනික පොහොර නොමිලේ ලබා දීමට කටයුතු කෙරේ. ක්‍රමානුකූල ව ගොවියා පූර්ණ වශයෙන් කාබනික පොහොර භාවිතා කරන වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා දිරි ගන්වනු ලැබේ.

- දිවයින පුරා ඇති පාරම්පරික කෘෂි ගම්මාන කාබනික කෘෂි භෝග නිෂ්පාදනයට යොමු කිරීම සඳහා වගා ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

- කාබනික එළවළු හා පලතුරු පරිභෝජනය ගෘහ මට්ටමෙන් පුළුල් කිරීම සඳහා ගෙවතු ලක්ෂ 20ක් වගා කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

- ඉදිරි වසර කීපය අත්‍යවශ්‍ය ම පොහොර රට තුළ ම නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළක් නොපමා ව ආරම්භ කෙරේ.

- රට තුළ ඇති ස්වාභාවික වනාන්තර සහ තෙත් බිම්වල ජීවත් වන ක්ෂුද්‍ර ජීවීන් ආධාරයෙන් ඉහළ ප්‍රමිතියෙන් යුතු ජෛව පොහොර සහ කාබනික පොහොර නිෂ්පදනය කිරීම සඳහා වැඩපිළිවෙළක් නොපමා ව අරම්භ කෙරේ.

- මනා කසළ කළමනාකරණ ක්‍රමවේදයක් රට තුළ ස්ථාපනය කිරීම මගින් කසළ භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගත ව කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට ස්ථිර වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.

**බීජ සහ පැළ නිෂ්පාදනය**

අපේ ප්‍රතිපත්තිය යටතේ ඉදිරි වසර කිහිපය තුළ ඇතිවන කෘෂිකාර්මික වර්ධනය සඳහා ප්‍රමාණවත් ලෙස බීජ සහ පැළ නිෂ්පාදනය කළ යුතු ය. ඒ සඳහා සියලු විශ්වවිද්‍යාලයවල කෘෂි පීඨ, රජයේ ගොවි පර්යේෂණ ආයතන සහ රජයේ ගොවිපොළවල් මෙන් ම පෞද්ගලික අංශයත් වේගවත්ව ක්‍රියා කළ යුතු වේ.

- "දේශීය බීජ ප්‍රතිපත්තියක්" යටතේ රජයේ තත්ත්ව පාලනය මත සුළු සහ මධ්‍ය පරිමාණ දේශීය ගොවීන් මඟින් නිසි ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ආනයන බීජවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ප්‍රමිති සහතිකයක් නිකුත් කිරීම අනිවාර්ය කෙරේ.

- පටක රෝපණය සහ බද්ධ කිරීමේ ක්‍රමවේදයන් (Tissue Culture and Grafting) මගින් ප්‍රවේණිගත ගුණයෙන් යුත් පැළ සහ ඉහළ ඵලදාවක් සහිත දෙමුහුන් බීජ නිෂ්පාදනය මහා පරිමාණ මට්ටමින් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දීමෙන් පෞද්ගලික අංශය දිරිමත් කෙරේ.

- බීජ සුරක්ෂිතතාව සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ "බීජ බැංකුවක්" ස්ථාපනය කෙරේ.

පස්වන කොටස

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

### සැකසුම්කරණය හා ගබඩා කිරීම

- කෘෂි නිෂ්පාදනවලට අගය එකතු කිරීමේ සහ සැකසීමේ කාර්යයට කුඩා ව්‍යවසායක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර බදුවලින් නිදහස් කෙරේ.
- අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සඳහා රජයේ මැදිහත්වීමෙන් අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ.
- කෘෂි නිෂ්පාදන මූලික ස්වරූපයෙන් සිදු කරන සෘජු අපනයනය වෙනුවට වටිනාකම් එකතු කර අපනයනය කිරීම සඳහා දේශීය ගොවීන්ට සහ නිෂ්පාදකයින්ට මහා පරිමාණ කෘෂි අස්වනු එක්රැස් කිරීමේ සහ සැකසීමේ මධ්‍යස්ථාන ඉදිකිරීමට අවශ්‍ය ස්ථාන හඳුනාගෙන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ.

### අලෙවිය සහ ප්‍රවාහනය

- සෘජු නිෂ්පාදකයා සහ අපනයන සමාගම්, සැකසුම් ආයතන සහ තොග වෙළෙඳ සමාගම් අතර පෙර ගිවිසුම් ක්‍රමය ප්‍රචලිත කෙරේ.
- කෘෂි කාර්මික නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන වෙළෙඳ සන්නාමකරණය (Branding), ඇසුරුම්කරණය සහ නිෂ්පාදන ස්ථාන හඳුනාගැනීමේ සහතික (Geographical Indication Certificate) පදනම් කරගත් "නව නිෂ්පාදන අලෙවිකරණ උපාය මාර්ගික සැලැස්මක්" හඳුන්වා දෙනු ලැබේ.
- දේශීය නිෂ්පාදකයාට මෙන් ම පාරිභෝගිකයාට ද සාධාරණ සහ ස්ථාවර වෙළෙඳපොළ මිල ක්‍රමයක් පවත්වාගෙන යාමටත් හැකිවන පරිදි දේශීය ව නිෂ්පාදනය කළ හැකි කෘෂි නිෂ්පාදන ආනයනය උපරිම වශයෙන් සීමා කෙරේ. වසර 2025 වනවිට එම නිෂ්පාදනවලින් රට ස්වයංපෝෂිත කිරීම අපගේ බලාපොරොත්තුව වේ.
- දේශීය සහ අපනයන වෙළෙඳපොළට ගැළපෙන පරිදි වසවිසෙන් තොර කාබනික කෘෂි නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර මට්ටමේ තත්ත්ව සහතිකයක් ලබාදීමටත්, කෘෂි නිෂ්පාදන ආනයනයේ දී ප්‍රමිති සහතිකයක් අනිවාර්ය කිරීමටත් පියවර ගනු ලැබේ. එහි වගකීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට පවරනු ලබන අතර ඊට ගැළපෙන ආකාරයට එම ආයතනයේ තත්ත්වය සම්පූර්ණයෙන් ම නවීකරණය කෙරේ.
- අස්වනු නෙළීමේදීත්, ප්‍රවාහනයේදීත්, ගොඩබෑමේදීත් සිදුවන අපතේ යාම වළක්වා ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ කර නව වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය භාවිතය පුළුල් කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂිත නව දුම්රිය මැදිරි හඳුන්වා දෙනු ලැබේ. ඊට සාපේක්ෂ ව සහ ගැළපෙන පරිදි දුම්රිය ස්ථාන, ප්‍රවේශ මාර්ග, සහ අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් දියුණු කිරීමටත් කටයුතු කෙරේ.

### කෘෂි නවෝත්පාදන පර්යේෂණ යොමුවක්

- ආවේණික ප්‍රවේණි ගුණයෙන් යුතු සහ ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන, අධි ඵලදා බීජ, පැළ වර්ග හඳුන්වා දීම, නූතන වගා ක්‍රම, තාක්ෂණික උපකරණ සහ යන්ත්‍රසූත්‍ර ආශ්‍රිත නවෝත්පාදන සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ කෘෂි විද්‍යාඥයන්ට, පර්යේෂකයන්ට, විශ්වවිද්‍යාල සහ අදාළ ආයතනවලට අවශ්‍ය පහසුකම් සහ ප්‍රතිපාදන ලබාදීම සඳහා කෘෂි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික අයවැයෙන් නිශ්චිත ප්‍රතිශතයක් වෙන් කෙරේ.
- එමෙන් ම එවැනි නවෝත්පාදන ආශ්‍රිත නිෂ්පාදන දේශීය සන්නාමයක් යටතේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය හෝ විදේශීය ආයෝජකයින් හඳුන්වා දෙනු ලැබේ.
- අහිතකර කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා ජීව කෘෂි රසායන ද්‍රව්‍ය (Bio- Pesticide) ආශ්‍රිත නවෝත්පාදන පර්යේෂණ සහ අඩු වියදම් ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රමවේදය (Low Cost Integrated Pest Management System) සොයා ගැනීම සඳහා වන පර්යේෂණ දිරි ගැන්වීමට රජය සම්පූර්ණ අනුග්‍රහය දක්වනු ලැබේ.
- අදාළ පර්යේෂකයින්ට හෝ ආයතනවලට තම නවෝත්පාදන සොයාගැනීම් සහ පර්යේෂණවල නිර්මාණ අයිතිය සහතික කරන පේටන්ට් බලපත්‍ර (Patent License) ලබාදීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කෙරේ.
- කෘෂි අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා දැනට පිහිටුවා ඇති කෘෂි විද්‍යාල තාක්ෂණයෙන් බලගන්වන අතර ඒවායේ ඉගෙනුම ලබන සහ ඉගැන්වීමේ යෙදෙන සියලු දෙනාට නිසි අවශ්‍ය පහසුකම් ලබාදීමට පියවර ගනු ලැබේ.
- කෘෂි කාර්මික ක්ෂේත්‍රයට අදාළ සියලු ම අන්තර්ජාතික පර්යේෂණ ආයතන සමඟ එක් ව කටයුතු කිරීම සඳහා අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා දියුණු කිරීමට පියවර ගනු ලැබේ.
- කෘෂිකාර්මික පර්යේෂණ සඳහා දායකවන පෞද්ගලික ව්‍යවසායකයන්ට පර්යේෂණ සඳහා වැයවන මුදලට අදාළව බදු සහන ලබා දෙනු ලැබේ.

### අලුත් සහල් මංගල්‍යය

අපේ ගොවියාට වී වගාව ජීවනෝපාය මාර්ගයක් පමණක් නොව සංස්කෘතියකි. වී ගොවිතැන ආදායම් මාර්ගයක් පමණක් නොව ඔවුන්ගේ අභිමානය පිළිබඳ සංකේතයකි. ගොවිතැන ගොවියාගේ හදවතට ම බැඳී ඇත්තේ ඒ නිසා ය. අප එම අභිමානය සුරකිමින් ඊළඟ අලුත් සහල් මංගල්‍යයට රටපුරා සෑම ගොවි ගෙදරක ම අටුකොටු පුරවන්නට අවශ්‍ය කටයුතු සඳහා වැඩ පිළිවෙළක් සකස් කෙරේ.

- දේශීය ගොවියා ආරක්ෂා කරනු පිණිස නාඩු වී කිලෝවක් රු.52/- කටත්, සම්බා කිලෝවක් රු.57/- ටත්, කීරි සම්බා කිලෝවක් රු.63/- ටත් වන සහතික මිලකට මිල දී ගනු ලැබේ.
- ගොවින්ගේ වී අස්වැන්නට සාධාරණ සහ ස්ථාවර මිලක් හිමි විය යුතු ය. ඒ සඳහා වී අලෙවි මණ්ඩලයේ මැදිහත්වීම ඉහළ නැංවීමට සහ ප්‍රමාදයකින් තොර ව වී මිලට ගැනීම සඳහා

අවශ්‍ය ගබඩා සහ ප්‍රවාහන පහසුකම් වර්ධනය කිරීම, කිරුම් මිනුම් සඳහා අවශ්‍ය නූතන ක්‍රමවේද හඳුන්වාදීමට පියවර ගනු ලැබේ.

- වී නිෂ්පාදන අතිරික්තයක් ඉලක්ක කිරීම මෙන් ම පෝෂණ ගුණයෙන් යුත් පාරම්පරික වී සහ සහල් නිෂ්පාදනය වැඩි කිරීමට සහ අපනයනයට දිරි ගන්වනු ලැබේ.
- දේශීය සහල් නිෂ්පාදනය ඉහළ යාමට සාපේක්ෂව ආනයනය කරන තිරිඟු පිටි සඳහා ආදේශකයක් ලෙස ගුණාත්මක තත්ත්වයෙන් යුතු සහල් පිටි නිෂ්පාදනය කෙරේ.
- පසුගිය වසර හතරක කාලය තුළ නියඟය, වගා රෝග සහ ගංවතුර ආදී ආපදාවන් නිසා ගොවීන්ට සිදු වී ඇති අලාභ සඳහා නොපමා ව වන්දි පූර්ණය කෙරේ.
- පුරන් කුඹුරු යළි අස්වැද්දීම සඳහා අවශ්‍ය නව වැඩපිළිවෙළක් හඳුන්වා දෙන අතර ඒ සඳහා අවශ්‍ය අනුග්‍රහය අදාළ අමාත්‍යාංශ හරහා ලබා දෙනු ලැබේ.
- අපේ වාරි ජල සැලසුම මගින් කුඹුරට අවශ්‍ය වාරි ජලය අඛණ්ඩ ව සම්පාදනය කෙරේ.
- ඒ ඒ ප්‍රදේශවලට අවශ්‍ය බීජ වී නිෂ්පාදන සහ වී සහ සහල් ගබඩා කිරීමේ ක්‍රමවේද ප්‍රාදේශීය ගොවි නිෂ්පාදන සමූපකාර ක්‍රමයක් මගින් ලබාදීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

### අපනයන භෝග වගාව

ශ්‍රී ලංකාවේ නාමය ඓතිහාසික ව, කාලයක් පුරා ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉහළින් තබන ලද්දේ තේ, රබර්, පොල් කේන්ද්‍ර කරගත් අපනයන භෝගයන් ය. අනාගතයේ දීත් එම අවකාශය දිනා ගැනීම සඳහා වර්තමාන ගෝලීය වෙළෙඳපොළට ගැළපෙන ආකාරයට සහ වෙළෙඳපොළේ ස්ථාවරත්වය සහතික කර ගැනීම සඳහා නව තාක්ෂණය හා මුසු වටිනාකම් එකතු කිරීමේ නව සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ.

- වර්තමානයේ විශාල වශයෙන් අපනයනය මත බදු අයකිරීම නිසා මෙම වගාකරුවන් සහ ඒ ආශ්‍රිත ව්‍යාපාරවල යෙදුණු සියලු දෙනා මුහුණ පා සිටින බරපතළ ගැටලුවලට විසඳුමක් ලෙස එම භෝග සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දෙන අතර ලබාගෙන ඇති ව්‍යාපාරික ණය සඳහා සහන කාලයක් ලබා දෙනු ලැබේ.
- සුළු සහ මධ්‍ය පරිමාණ අපනයන භෝග වගාකරුවන්ට සහන මිලට පොහොර ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- අපනයන භෝග නැවත වගා කිරීම සඳහා සහන කාලයක් සහිත සහන ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- ජාත්‍යන්තර මට්ටමේ තත්ත්ව පරීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන අතර භූගෝලීය තොරතුරු සහතිකයක් (Geographical Information Certificate) ලබාදීමට කටයුතු කෙරේ.
- තේ, පොල් සහ රබර් වගා කර ඇති ඉඩම් කැබලි කර ජනාවාස බවට පත් කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කෙරේ.

### තේ වගාව

- දේශීය තේවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ.
- දේශීය පිරිසිදු තේ (Pure Ceylon Tea) ශ්‍රී ලංකාවේ අනර්ඝතම නිෂ්පාදනයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කෙරේ.
- මහා පරිමාණ තොග අපනයනය වෙනුවට වටිනාකම් එකතු කළ නිෂ්පාදන ලෙස තේ අපනයනය දිරි ගන්වනු ලැබේ. එමගින් දැනට ලැබෙන ආදායම ඉදිරි දශකය තුළ දෙගුණයක් බවට පත් කිරීමට අපට හැකිවනු ඇත.
- අහිමි ව ඇති ජාත්‍යන්තර තේ වෙළෙඳපොළ නැවත දිනාගැනීම සඳහා පෞද්ගලික අංශයේ සක්‍රීය දායකත්වයෙන් රාජ්‍ය තාන්ත්‍රික ප්‍රවර්ධන වැඩ පිළිවෙළක් දියත් කෙරේ.
- කාබනික තේ වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ රාජ්‍ය අනුග්‍රහයක් ලබා දෙනු ලැබේ.
- වගාවේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාව ඉහළ නැංවීම සහ කාලගුණික වෙනස්කම් යන අභියෝගවලට මුහුණදීම සඳහා ගැළපෙන විසඳුම් ලබාදීම සහ නව තාක්ෂණය හඳුන්වා දෙමින් තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැබෑ දායකත්වයක් සැපයිය හැකි ආකාරයට තේ පර්යේෂණ ආයතනය සංවර්ධනය කෙරේ.

### රබර් වගාව

- ස්වභාවික රබර් වගාව වෙනුවට කෙටි කලෙකින් කිරි ලබාගත හැකි නව ප්‍රභේද හඳුන්වා දී වගාකරුවා ආරක්ෂා කරගත හැකි නව වැඩපිළිවෙළක් සහ නිෂ්පාදනය ඉහළ දැමීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කෙරේ.
- ක්ලෝනීකරණ තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදනය කරන ඉහළ ඵලදායීතාවක් සහිත බද්ධ රබර් පැළ රබර් වගාව සඳහා හඳුන්වා දෙනු ලැබේ.
- වටිනාකම් එකතු කළ නිෂ්පාදන ලෙස රබර් දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළට යැවීම, නිෂ්පාදන සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ භාවිතය ඉහළ නැංවීම හා එහිලා අදාළ වන පර්යේෂණ සිදුකිරීම සඳහා පර්යේෂකයන්, විද්‍යාඥයන්, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික ආයතන දිරි ගන්වනු ලැබේ.
- කුඩා සහ මධ්‍යම පරිමාණ රබර් වතු හිමියන්ගේ සහ නිෂ්පාදකයින්ගේ සමිති ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබේ.

### පොල් වගාව

- පොල් වගාව ආශ්‍රිත ව දිර්ඝ කාලයක් තිස්සේ පවතින මයිටා සහ පොල් කුරුමිණි වසංගතය විසඳීම සඳහා ජෛව තාක්ෂණික විසඳුමක් සොයා ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික ආධාර ලබා ගැනීමට කටයුතු කෙරේ.
- පොල් කැඩීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සහ භාවිතය වර්ධනය කිරීමට ආධාර දෙනු ලැබේ.

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

- වාර්ෂික පොල් වගා අවශ්‍යතාවට ගැළපෙන අධි ඵලදා දෙමුහුන් පොල් පැළ වර්ග හඳුන්වාදීම පොල් පර්යේෂණ ආයතනයට මෙන් ම ඒ සඳහා යොමුවීමට කැමති පෞද්ගලික පර්යේෂණාගාර හිමියන් සඳහාත් අවශ්‍ය පහසුකම් රජය මඟින් සපයනු ලැබේ.
- දැනට පොල් වගාව ව්‍යාප්ත වී නොමැති උතුර, නැගෙනහිර සහ දකුණු පළාත්වලට ගැළපෙන පොල් පැළ හඳුන්වාදීම සඳහා අවශ්‍ය පර්යේෂණ දිරි ගන්වනු ලැබේ.
- පොල් පැළ තවාන් ඇති කිරීම සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ පොල් වගා ව්‍යවසායකයින්ට අවස්ථාව සලසා දෙනු ලැබේ.
- පොල් වතු හිමියන්ගේ ආදායම වැඩි කිරීම සඳහා පොල්වතුවල ගම්මිරිස්, ඉඟුරු, කහ සහ කෝමාරිකා, වැනි අතුරු භෝග වගාව සඳහා අවශ්‍ය දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.
- ගෙවතු පොල්වගාව ව්‍යාප්ත කිරීම සඳහා අධි ඵලදා දෙමුහුන් පොල් පැළ ලබාදීමට පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.

### අනෙකුත් අපනයන භෝග

පසුගිය කාලය පුරා දේශීය අපනයන භෝග ගොවියා මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වන්නේ එම භෝග සීමාවකින් තොර ව ආනයනය කිරීමට සහ ප්‍රති අපනයනයට ඉඩ සැලසීම නිසා ඇති වුණු මිල පහත වැටීම ය. එම නිසා එකී භෝග ආනයන හා ප්‍රති අපනයනය නතර කිරීමට කටයුතු කෙරේ.

### කුරුඳු වගාව

- ජාත්‍යන්තර වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා ඇති විශිෂ්ට කීර්ති නාමය ප්‍රයෝජනයට ගනිමින් තත්ත්වයෙන් උසස් කුරුඳු අපනයනය ඉහළ නැංවීම සඳහා වගාකරුවන්ට අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ.
- කුරුඳු තැලීම සහ සැකසීම සඳහා අවශ්‍ය නූතන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමට කටයුතු කිරීමට නවෝත්පාදන නිෂ්පාදන අධිකාරියේ විශේෂ අවධානය යොමු කරවනු ලැබේ. එවැනි අධිතාක්ෂණික උපකරණ ආනයන බදුවලින් නිදහස් කෙරේ.
- කුරුඳු තැලීම සහ සැකසීම නිසි ගෞරවයක් සහිත රැකියාවක් බවට පත් කිරීම සඳහා පිළිගත් ආයතනයකින් NVQ සහතිකය සඳහාවන ශිල්පීය ශ්‍රේණි පාඨමාලාවක් හඳුන්වා දෙනු ලැබේ.
- අක්කර පහකට අඩු සියලු කුරුඳු වතු හිමියන් සඳහා සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීම සඳහා පිරිවැය සහනයක් ලබා දෙනු ලැබේ.
- කුරුඳු කර්මාන්තය ආශ්‍රිත අගය එකතු කිරීමේ කර්මාන්ත හා අපතේ යන කොටස් පදනම් කරගත් නව නිෂ්පාදන සඳහා ආධාර ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

### ගම්මිරිස්

- ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ගම්මිරිස් නිෂ්පාදනයට අවශ්‍ය තාක්ෂණික දැනුම ගොවියාට ලබාදීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- දේශීය ගම්මිරිස් නිෂ්පාදකයා දැඩි දුෂ්කරතාවට පත් කරමින් සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවට ඇති වෙළෙඳ කීර්තිනාමයට හානි කරමින් සිදුකරන ගම්මිරිස් ආනයනය සහ ප්‍රති අපනයනය සීමා කිරීම සඳහා ගම්මිරිස් ආනයනය මත ඉහළ තීරු බද්දක් පනවනු ලැබේ.
- ගම්මිරිස් සැකසුම්කරණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිෂ්පාදනාගාර උපකරණ සහ තාක්ෂණික භාවිතයන් සඳහා අඩු පොලී සහන ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- කිලිනොච්චිය, මුලතිව්, අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, පුත්තලම, මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල දේශීය වෙළෙඳපොළ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මෙන්ම අපනයනය පදනම් කරගත් කෘෂි අපනයන ගම්මාන ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- විදේශ වෙළෙඳපොළ පදනම් කරගෙන කෝමාරිකා, කහ සහ ඉඟුරු වැනි භෝග වගාව ප්‍රවර්ධනය කිරීමට සහ වටිනාකම් එකතු කිරීමේ නිෂ්පාදන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ සියලු දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.
- අපනයනය පදනම් කරගත් සියලු අපනයන භෝග ප්‍රවර්ධන කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් ප්‍රවර්ධනය, සැකසුම් සහ අගය එකතුකිරීමේ නිෂ්පාදන සහ වෙළෙඳපොළ ප්‍රවර්ධනය සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබේ.

## ධීවර කර්මාන්තයට සවිබල

ඉන්දියානු සාගරයේ වර්ග කිලෝ මීටර් 500,000 ආසන්න මුහුදු කලාපයකට, කිලෝමීටර් 1,700 කට ආසන්න ප්‍රමාණයක පමණ වෙරළ තීරයකට හිමිකම් කියන, විශාල ගංගා සහ ජලාශ රාශියකට හිමිකම් කියන අප ඉතා ඉක්මනින් ධීවර ආර්ථිකයේ ස්වංපෝෂිත තත්ත්වයට පත් විය යුතු ය. ජනතාවගේ පෝෂණය, ආහාර සුරක්ෂිතතාවය, විදේශ විනිමය ඉපයීම, රැකියා සහ ජීවනෝපාය අවස්ථා වර්ධනය කිරීම, දුගීකම තුරන් කිරීම සහ ජාතික හා ග්‍රාමීය ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාදීම පදනම් කරගත් පැහැදිලි හා තිරසාර ධීවර මාර්ග සැලැස්මක් අප දැනටමත් සකස් කර අවසන් ය.

- වෙරළාසන්න මත්ස්‍ය ගහනය සහ කළපු පද්ධතිවල සමතුලිතතාව නිරන්තර අධීක්ෂණයට භාජනය කරමින් හීන වූ මත්ස්‍ය ගහනය ගොඩනැංවීම සහ කළපු පද්ධතිවල පාරිසරික තත්ත්වය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.
- ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ සහ බහුදින ධීවර යාත්‍රා නැවැත්වීමට හැකිවන ආකාරයට දැනට පවතින සියලු ධීවර වරාය නවීකරණය කරන අතර අවශ්‍යතා අනුව අලුතින් ඉදිකිරීමට ද පියවර ගනු ලැබේ.
- ඔළුවිල් වරාය මහා පරිමාණ ධීවර යාත්‍රා මෙහෙයවිය හැකි සියලු පහසුකම් සහිත ප්‍රධාන ධීවර වරායක් බවට පත් කෙරේ.
- බහුදින ධීවර යාත්‍ර සඳහා මුහුදු ජලය භාවිත කරන ශීතකරණ ක්‍රම ප්‍රවර්ධනය සහ ඒ සඳහා සූර්ය බලය භාවිතය දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රමෝපාය සකස් කෙරේ.

- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම සඳහා දේශීය සමාගම් යොමුවීම ප්‍රවර්ධනය සඳහා මසුන් ගැවසෙන කලාප හඳුනාගැනීමට අවශ්‍ය නූතන තාක්ෂණය සහ නවීන මෙහෙයුම් ක්‍රමවේද සහිත වැඩි දියුණු කළ බහුදින ධීවර යාත්‍රා පෙළක් හඳුන්වා දෙනු ලැබේ.

- විශාල ප්‍රමාණයේ බහුදින ධීවර යාත්‍රා ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත කලාපයක් ඉදිකිරීමට කටයුතු කෙරේ.

- ලංකාවේ සියලු ධීවර වරායන්, ජැටි සහ මාළු ගොඩබෑමේ ස්ථාන නූතන සන්නිවේදන පහසුකම්, ශීතාගාර පහසුකම්, ඉන්ධන සැපයීම සහ සනීපාරක්ෂක පහසුකම් ආදියෙන් සමන්විත මධ්‍යස්ථාන බවට පත් කෙරේ.

- මත්ස්‍ය අස්වනු ආරක්ෂිත ව වෙරළට රැගෙන ඒම, ආරක්ෂිත ගොඩබෑම, ප්‍රවාහනය සහ කල්තබා ගැනීමේ ක්‍රමවේද දියුණු කිරීම සඳහා පොලී රහිත ණය මුදලක් ධීවර අමාත්‍යාංශය හරහා ලබාදෙනු ලැබේ.

- ජලජීවී නිෂ්පාදන, මුහුදු ආහාර සහ කාබනික මත්ස්‍ය නිෂ්පාදනය, මුහුදු බෙල්ලන්, මුහුදු කූඩැල්ලන් සහ ඉස්සන් වගාව, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන සහ අභ්‍යන්තර මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා අඩු පොලී ණය, බදු සහන සහ රක්ෂණ ආවරණ, තාක්ෂණය, උපදේශනය සහ වෙළෙඳපොළ සම්බන්ධීකරණ පහසුකම් සලසා දෙනු ලැබේ.

- සැමන් මත්ස්‍ය වගාව දියුණු කිරීම සහ ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් සඳහා අවශ්‍ය ඉඩම්, ආයෝජන සහ තාක්ෂණික පහසුකම් රජයේ මැදිහත්වීමෙන් ලබාදෙනු ලැබේ.

- ධීවර කාන්තාවන් කේන්ද්‍රකර ගත් ධීවර කර්මාන්තය ආශ්‍රිත ගෘහස්ත කර්මාන්ත හඳුන්වාදීමේ වැඩසටහනක් ධීවර නිෂ්පාදන සමුපකාර හරහා ක්‍රියාත්මක කෙරේ.

- උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල අනවසර මසුන් ඇල්ලීම නැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ නාවික හමුදාව සහ වෙරළ ආරක්ෂක බළකාය ශක්තිමත් කරන අතර ඉන්දියානු රජය සමඟ ඒකාබද්ධ නව බේරුම්කාර වැඩසටහනක් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කෙරේ.

- කරදිය සහ මිරිදිය මත්ස්‍ය අභිජනනය වාණිජ මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා ධීවර ප්‍රජා සමිති සහ ධීවර හා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ ව පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

- ධීවර ප්‍රජාව සඳහා වඩාත් ඵලදායී රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.

- ධීවර තරුණයන් ව්‍යවසායකයන් බවට පත්කිරීම සඳහා ඔවුන්ට නූතන තාක්ෂණික ක්‍රමවේද භාවිතය සහ ධීවර කර්මාන්තය පිළිබඳ උසස් වෘත්තීය සහ අධ්‍යාපනික දැනුම ලබාදීමේ වැඩසටහනක් සාගර විශ්වවිද්‍යාලය ආශ්‍රිත ව ක්‍රියාත්මක කෙරේ.

- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය අස්වනු මිලට ගැනීම සහ අලෙවිය සඳහා පුළුල් ආකාරයට ධීවර සංස්ථාව සහ ධීවර ප්‍රජා මූල සංවිධාන යොදා ගනු ලැබේ.

## කිරෙන් සපිරෙන රටක්

ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි අවශ්‍යතාවෙන් තවමත් නිෂ්පාදනය කරනු ලබන්නේ 40% කට වඩා අඩු ප්‍රමාණයකි. ඒ නිසා පෝෂදායක නැවුම් දියර කිරි පානය සඳහාඅපට ඇති අවස්ථාව අහිමි වී තිබෙනවා. ඒ අනුව ඉදිරි දශකය තුළ රටට අවශ්‍ය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට පියවර ගනු ලැබේ.

- රටේ විවිධ ප්‍රදේශවලට ගැළපෙන කිරි ගව ප්‍රභේද හඳුන්වාදීම සඳහා අවශ්‍ය පර්යේෂණ දිරි ගන්වන අතර අඩු ඉඩ ප්‍රමාණයක් තුළ වැඩි ගවයන් සංඛ්‍යාවක් ඇතිකර ගැනීම සඳහා "සිරස් ගවහල් ක්‍රමයක්" හඳුන්වා දෙනු ලැබේ.

- උතුරු පළාතේ කිරි නිෂ්පාදන ක්‍රියාවලිය බලගැන්වීම සඳහා කිරි නිෂ්පාදනාගාරයක්, එකතු කිරීමේ ක්‍රමවේදයක් සහ කිරි ගබඩා කිරීමේ ශීතාගාර ආදී පහසුකම් වර්ධනය කොට ගෘහස්ථ සහ සුළු පරිමාණ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත කිරීමට කටයුතු කෙරේ.

- කිරි ගොවියාට ඉහළ මිලක් ලබාදීම සඳහා කිරිවල ගුණාත්මකභාවය පදනම් කරගත් නව මිල ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

- කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් තෘණ වර්ග වගා කිරීමට අවශ්‍ය පහසුකම් ජාතික පශු සම්පත් මණ්ඩය හරහා ලබාදෙන අතර ගුණාත්මකභාවයෙන් යුත් ගව ආහාර ලබාදීම සඳහා එම ආහාර ගෙන්වීම වෙනුවෙන් බදු සහනයක් ලබාදෙනු ලැබේ.

- මහාපරිමාණ සහ මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ ඇති කිරීම සඳහා ඉදිරිපත් වන දේශීය පෞද්ගලික ව්‍යවසායකයන්ට අවශ්‍ය ඉඩම් සහ ආයෝජන පහසුකම් සපයනු ලැබේ.

- කිරි එකතු කිරීම සහ ගබඩා කිරීම සඳහා ගබඩා කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සූර්ය බලයෙන් ක්‍රියා කරන කුඩා පරිමාණ කිරි ශීත කිරීමේ තාක්ෂණික ක්‍රම හඳුන්වා දෙනු ලැබේ.

- නිවැරදි ආකාරයට සහ නියමිත ප්‍රමාණයට කිරි දොවා ගැනීම සඳහා යාන්ත්‍රික කිරි දෙවීමේ උපකරණ කිරි ගොවියන්ට සහ ගොවි සමුපකාරවලට සහන මිලට සහ පහසු ගෙවීමේ ක්‍රමයට ලබාදීමට කටයුතු කරනු ලැබේ.

## මස් සහ බිත්තර අපනයන කර්මාන්තයක් ලෙස

- කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම හා මහා පරිමාණ නිෂ්පාදකයින් අපනයන වෙළඳපොළට යොමු කිරීම දිරිගන්වනු ලැබේ.

- කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදනය දිරි ගැන්වීමෙන් දේශීය නිපැයුම වැඩි කිරීමට කටයුතු කෙරේ.

පස්වන කොටස

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

- සත්ත්ව ගොවිපළවල් හා නිෂ්පාදන කර්මාන්ත සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් හඳුන්වා දීම සහ නියාමනය සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- ගෘහාශ්‍රිත වස විසෙන් තොර මස් විකිණීමට වෙළඳසැල් ආරම්භ කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබා දෙනු ලැබේ.

## කාර්මීකරණයෙන් ඔබ්බට

අපගේ රජය වරාය හා ගුවන් තොටුපොළවල් සංවර්ධනයට විශේෂ අවධානයක් යොමු කළේ ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපය තුළ ප්‍රධාන සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණ ඇති ව ය. එහෙත් පසුගිය වසර කිහිපය තුළ මේ සඳහා කිසිදු අවධානයක් නොදැක්වීම නිසා ගොඩනැගෙමින් ආ කර්මාන්ත ප්‍රබෝධය මුළුමනින් ම බිඳ වැටී ඇත. එක පැත්තකින් ව්‍යාපෘති නතර වී තිබෙන අතර අනෙක් පැත්තෙන් අවසන් කළ වැඩවලටවත් මුදල් ලැබෙන්නේ නැත. ඒ නිසා පාඩු ලබන ව්‍යාපාර දහස් ගණනක් මේ වසර කිහිපය තුළ වැසී ගිය බව කවුරුත් දන්නා කරුණකි. එවැනි බොහෝ ව්‍යාපාරිකයන්ගේ දේපල බැංකුවලින් වෙන්දේසි කරන බවට පුවත්පත්වල පළ වේ.

ව්‍යාපාරිකයන් ණය බරින් මිරිකී ඇත. පොලී අනුපාතයන් ව්‍යාපාරවලට දරා ගන්න බැරි තරමට වැඩි වී තිබෙන අතර රජය සෑම පැත්තකින් ම ව්‍යාපාරිකයා මත බදු වැඩි කර ඇත. රටේ මුදල් සංසරණය ඉතා දුර්වල තත්ත්වයක ඇති බව පෙනෙන්නට තිබේ. මාස ගණන් පසු වී හෝ තමන් අලෙවි කළ භාණ්ඩයකට හෝ සේවාවකට චෙක්පතක් ලැබුණු විට ඒ ගැනත් විශ්වාසයක් තියන්න බැරි තත්ත්වයක් මේ වන විට උද්ගත වී ඇත. අගරු චෙක්පත් සාමාන්‍ය දෙයක් බවට පත වී ඇත. බොහෝ ව්‍යාපාරිකයන්ගේ නම් අසාධු ලේඛනයේ (CRIB) තිබෙන නිසා ඔවුන්ට වැඩි පොලියටවත් බැංකුවලින් අද ණය දෙන්නේ නැත. මෙය අද දේශීය ව්‍යවසායකයින් මුහුණ පා සිටින යථාර්ථය වේ. අප මෙම තත්ත්වය ඉතා ඉක්මනින් වෙනස් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපාර සංවර්ධන වැඩසටහන දැනටමත් සකස් කර අවසන් ය. ඒ යටතේ රටේ අනාගත ආර්ථික සංවර්ධන සඳහා රටේ කර්මාන්ත ක්‍රියාවලියට සහ පෞද්ගලික ව්‍යවසායකයන්ට විශාල කාර්ය භාරයක් පැවරෙනු ඇත. ආර්ථිකයේ පෙරගමන්කරුවන් විය යුත්තේ කර්මාන්ත අංශය බව පැහැදිලි ය.

ජනතාවගේ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම, නව කර්මාන්ත බිහි කිරීම, රැකියා උත්පාදනය හා රටට නව තාක්ෂණය හඳුන්වාදීම වැනි ව්‍යාපාරිකයන් විසින් කළ යුතු බොහෝ දේ ඇත. අපගේ ආර්ථික ප්‍රතිපත්තියට අනුව රට තුළ නිෂ්පාදනය කරන සෑම භාණ්ඩයක ම හා සපයන සෑම සේවාවක ම ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වීමට උත්සාහ කළ යුතු ය.

ඒ සඳහා අපේ රටේ සුවිශේෂ භූගෝලීය පිහිටීමෙන් ප්‍රයෝජන ගෙන දේශීය මෙන් ම ගෝලීය ප්‍රවණතා ද නිසි පරිදි හඳුනාගෙන ඒවා ව්‍යාපාරික අවස්ථා බවට හරවා ගන්නට අවශ්‍ය ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කෙරේ.

- ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබාදීම වැනි සහන ලබා දීම සඳහා බැංකු ක්ෂේත්‍රය සමඟ සාකච්ඡා කොට ව්‍යාපාරිකයන්ට ප්‍රායෝගික හා කඩිනම් විසඳුම් ලබා දීමට කටයුතු කෙරේ.
- නැවත බැංකු ණය ලබා ගැනීම බාධාවන ආකාරයට අසාධු ලේඛනයෙහි (CRIB) සිටින්නේ කෙටි කාල සීමාවක් සඳහා නම් එම ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා මහබැංකුවට උපදෙස් දෙනු ලැබේ.
- බිඳ වැටී ඇති ව්‍යාපාර නැවත නඟා සිටුවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සහන පොලී අනුපාතයක් යටතේ ලබාදීමට කටයුතු කෙරේ.
- අපනයනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික කොරිඩෝවල සහ කොළඹ, හම්බන්තොට නාවික සහ ගුවන් කේන්ද්‍ර ආශ්‍රිතව සියලු පළාත් ආවරණය වන පරිදි කර්මාන්තපුර, නිදහස් වෙළෙඳ කලාප සහ නිදහස් වරාය 50ක් පිහිටුවනු ලැබේ.
- දැනට තිබෙන නිදහස් වෙළෙඳ කලාප සහ කර්මාන්තපුර උපරිම කාර්යක්ෂමතාවකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නැංවීම ඇතුළු නවීකරණය නොපමා ව සිදු කෙරේ.
- නිදහස් වෙළෙඳ කලාප සහ කර්මාන්තපුරවල සිදුවිය යුතු කාර්යයන් නිවැරදි ව සහ පහසුවෙන් කර ගැනීමටත්, නොවිය යුතු දේවල් සිදුවීම වැළැක්වීමටත් අවශ්‍ය පැහැදිලි නීතිමය ප්‍රතිපාදන පාර්ලිමේන්තු පනතක් මඟින් සම්පාදනය කෙරේ.
- ආනයන අපනයන ක්‍රියාවලිය හිරිහැරයකින් තොර ව සහ කාල නාස්තිය වැළැක්වෙන පරිදි සහ කාර්යක්ෂම ව ඉටුකර ගැනීම සඳහා “තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්” ස්ථාපනය කෙරේ.
- අන්තර්ජාතික ව්‍යාපාර ප්‍රමුඛයන් (International Business Giants) ගේ ව්‍යාපාරික ආයතනවල ප්‍රධාන කාර්යාල කොළඹ සහ වරාය නගරය ආශ්‍රිත ව ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ.
- විදේශ ආයෝජකයන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ද සහාය ඇති ව අපගේ නව ආර්ථික සැලැස්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණ වැඩපිළිවෙළක් දියත් කෙරේ.
- ඛනිජ වැලි, ඩොලමයිට්, පොස්පේට්, මැණික් වැනි දැනට හඳුනාගෙන ඇති වටිනාකම එකතු කිරීමෙන් තොර ව අපනයනය කරන ඛනිජ සම්පත් එසේ අපනයනය කිරීම සීමා කොට වටිනාකම් එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබාගත හැකි නිෂ්පාදන බවට පත්කර අපනයනය කෙරේ.
- කපා ඔප දමන මැණික් අපනයනය වෙනුවට නිමකරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කෙරේ.
- දැනට භූගත ව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණ භාවිත ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනේ.
- මහා පරිමාණ දේශීය ආයෝජකයන්ට අධිතාක්ෂණික නිෂ්පාදන (High Technology Products) අලුතින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියලු ම පහසුකම් ලබා දෙනු ලැබේ.

- අපේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ දේශීය ව්‍යාපාරිකයන් ආරක්ෂා කොට ඔවුන්ව සවිබල ගැන්වීමට විශේෂ අවධානයක් යොමු කෙරේ.
- දේශීය ව්‍යාපාරිකයන්ට පහසුවෙන් ම කළ හැකි ව්‍යාපාර ක්ෂේත්‍රවලට විදේශිකයන්ට ඇතුළුවීමට අවසර දීම සීමා කරන්නට කටයුතු කරනු ලැබේ.
- නව ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය දීර්ඝකාලීන බදු පදනම යටතේ වන ඉඩම්, ණය පහසුකම්, ව්‍යාපාර උපදේශනය, තාක්ෂණික සහ යටිතල පහසුකම් ආදී සියල්ල ම පහසුවෙන් ලබාදෙන විශේෂ වැඩ පිළිවෙළක් අප ක්‍රියාත්මක කෙරේ.
- පාසල් මට්ටමේ සිටම ව්‍යවසායකයත්ව නැඹුරුවක් ඇති කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

## සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තය ඔස්සේ ඉහළ ම විදේශ විනිමය රට තුළට ගෙන ආ හැකි අපේ රටේ ආර්ථිකයේ වැදගත් කොටසකි. ඒ වාගේ ම පහසුවෙන් දියුණු කළ හැකි ක්ෂේත්‍රයකි. එම නිසා 2030 වසර වන විට මෙරටට වාර්ෂිකව පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය මිලියන 7 දක්වා ඉහළ යන ආකාරයේ සංචාරක ප්‍රවර්ධන වැඩසැලැස්මක් සකස් කෙරේ. ඒ යටතේ වාර්ෂික ව ඇමරිකානු ඩොලර් බිලියන් 10 ක් ජාතික ආර්ථිකයට එක් කිරීම අපගේ අරමුණ වේ. එම වර්ධනයේ ප්‍රතිලාභ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව ස්වයං රැකියාවක යෙදෙන්නාගේ සිට මහා පරිමාණ ව්‍යාපාරිකයා දක්වා විහිද යා යුතු ය. එමෙන් ම නිවසක නවාතැන් ගැනීමේ සිට තරු පහේ හෝටලයක නවාතැන් ගන්නා සංචාරකයා දක්වා ආකර්ෂණය කර ගන්නා ජනතා සහභාගිත්වය සහිත ව පරිසර හිතකාමී සහ සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක් ගොඩනැගීම අපගේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයේ අරමුණ වේ.

- සංචාරකයන් ශ්‍රී ලංකාව කෙරෙහි ආකර්ෂණය වන ස්වභාවික සෞන්දර්යයට අමතර ව සංචාරක ප්‍රවර්ධනය අරමුණු කරගත් නව ක්ෂේත්‍ර හඳුනාගත යුතු ය. විනෝදාස්වාදය පදනම් කරගත් උද්‍යාන (Theme Parks), ආගමික, සංස්කෘතික සහ ජාතික උරුමයන්, ත්‍රාසජනක ක්‍රීඩා, කෘෂිකාර්මික සහ වනාන්තර ආශ්‍රිත සංචාරක කර්මාන්තය, දේශීය ආයුර්වේදය ආදී ක්ෂේත්‍ර මුල් කර ගනිමින් සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයට අවශ්‍ය ආයෝජන පහසුකම් හා වෙනත් පහසුකම් සැපයීමට ප්‍රමුඛතාව දීමට කටයුතු කෙරේ.
- කොළඹ සහ හම්බන්තොට කේන්ද්‍ර කොට ගෙන ව්‍යාපාරික, උත්සව, ප්‍රදර්ශන, සමුළු සහ සම්මන්ත්‍රණ පදනම් කරගත් සංචාරකයන් ලංකාවට ගෙන්වා ගැනීමේ නව වැඩපිළිවෙළක් ඇතිකිරීමට සහ සංචාරක කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරිකයන්ට අවශ්‍ය පහසුකම් කඩිනමින් ලබාදීමට බලාපොරොත්තු වේ.
- කොළඹ සහ හම්බන්තොට ගුවන් තොටුපොළවල් තුළ ආගමන විගමන ක්‍රියාවලිය කාර්යක්ෂම කළ යුතු අතර අභ්‍යන්තර ගුවන් පර්යන්ත දෙකක් සකස් කළ යුතු ය. අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් නවීකරණය කර අභ්‍යන්තර ගුවන් සේවාවන් දියුණු කිරීම මගින් සංචාරකයන්ට බාධාවකින් තොර ව අභ්‍යන්තර ගමනාන්තයට පහසුවෙන් ළඟා විය හැකි ලෙස පහසුකම් පුළුල් කෙරේ.
- රටේ ප්‍රධාන සංචාරක නගර යාවෙන මාර්ග පද්ධති ආශ්‍රිත ව සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම, එකී මාර්ගවල සනීපාරක්ෂක පහසුකම්, අවන්හල්, මුදල් හුවමාරු මධ්‍යස්ථාන, වැනි සංචාරකයන්ට අවශ්‍ය සියලු පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ව ඉදි කිරීමට කටයුතු කෙරේ.
- සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමේ දී සිදුවන ප්‍රමාද සහ කොළඹට පැමිණීම වළක්වා ගැනීම සඳහා සංචාරක නගරවල ප්‍රාදේශීය මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු කෙරේ.
- සංචාරක ප්‍රදේශ, සංචාරක නගර, සංචාරක පාසැල් සහ සංචාරක හෝටල්, පාසල් ආරම්භ කිරීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දෙන අතර දැනට ඇති පාඨමාලාවලට අමතර ව සාමාන්‍ය පෙළ සුදුසුකම් රහිත, එහෙත් මෙම ක්ෂේත්‍රයේ රැකියා කරන සහ ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවන තරුණ තරුණියන්ට හැදෑරිය හැකි ආරම්භක ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දෙනු ලැබේ.
- අන්තර්ජාලය හරහා හෝටල් වෙන් කිරීම, ප්‍රවාහන පහසුකම්, මාර්ගෝපදේශකයින්, අභ්‍යන්තර ගුවන් ප්‍රවේශ පත්‍ර සහ ඇතුළුවීමේ ප්‍රවේශ පත්‍ර ලබාගත හැකිවන ආකාරයට මධ්‍යම අන්තර්ජාල මෘදුකාංග පද්ධතියක් (Single Booking Software System) සහ සියලු සංචාරක ස්ථාන සඳහා ස්වයංක්‍රීය ඇතුළුවීම දොරටු ක්‍රමයක් (Electronic Gates System) හඳුන්වා දෙනු ලැබේ.
- සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා නව සේවාවන් හඳුන්වා දීම, සාප්පු සංකීර්ණ ඉදි කිරීම, අභ්‍යන්තර ගුවන්සේවා හා අනෙකුත් ප්‍රවාහන සේවා දියුණු කිරීම, මෙන් ම සංචාරක ක්ෂේත්‍රය තුළ පුහුණු හා නුපුහුණු සේවා සපයන්නන්ගේ ප්‍රමාණය දශ ලක්ෂයක් දක්වා වැඩි කරන්නටත් කටයුතු කෙරේ.
- සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ලෝකයේ විවිධ රටවල පුළුල් ප්‍රචාරයක් ලබාදීම සඳහා උපාය මාර්ගික ප්‍රචාරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.
- දැනට සංචාරක හෝටල්වල ඇති කාමර ප්‍රමාණය දෙගුණයක් කරන්නට සිදුවන අතර වඩා ඉහළ ප්‍රමිතියේ සංචාරක හෝටල් ඉදි කිරීමට අවශ්‍ය සියලු දිරි ගැන්වීම් නොඅඩු ව ලබා දෙනු ලැබේ.
- සාම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කරගැනීමේ සංචාරක හෝටල් සහ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල ඉඩකඩ ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කෙරේ.
- හෝටල් ක්ෂේත්‍රයේ වැඩකරන සේවකයින්ගේ රැකියාව අඛණ්ඩ ව පවත්වාගෙන යාම සහ අනෙකුත් වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ට බලපාන කම්කරු නීති සංශෝධන කිරීමට කටයුතු කෙරේ.
- ගෘහාශ්‍රිත සහ ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කෙරේ.

# ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

- සංචාරකයන් අපහසුතාවට පත්වීම සහ සේවා සැපයීම්වල දී සිදුවන අවභාවිත වැළැක්වීමෙන් සංචාරකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සියලු ම සංචාරක මාර්ගෝපදේශකයින් සහ සංචාරක රියැදුරන් ලියාපදිංචි කර ඔවුනට අවශ්‍ය ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවක් සහ සහතික පත්‍රයක් ලබාදීමට කටයුතු කෙරේ.
- සංචාරක නගර ආශ්‍රිත සංචාරක පොලිස් සේවාව වැඩි දියුණු කෙරේ.

## ඇඟලුම් කර්මාන්තය

ඇඟලුම් කර්මාන්තය තවමත් අපේ රටේ සමස්ත අපනයන ප්‍රමාණයෙන් 43% ක් පමණ නියෝජනය කරන, අපනයන ආදායමට ඇමරිකානු ඩොලර් බිලියන 5ක් පමණ වාර්ෂික ව එක් කරන ප්‍රධානතම නිෂ්පාදන කර්මාන්තය වේ. එමෙන් ම රටේ දළ ජාතික නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් සපයන අතර රැකියා සැපයීමේ දී සහ ප්‍රාදේශීය සංවර්ධනයේ දී පුරෝගාමී මෙහෙවරක් ද ඉටු කෙරේ. ඒ සම්බන්ධයෙන් අප සතුටුවන අතර ම මෙම කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම රජයේ වගකීමක් ලෙස සලකනු ලැබේ.

- දැනටමත් ආයෝජන මණ්ඩලය සමඟ ඒකාබද්ධ ව එරාවුර් ප්‍රදේශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අක්කර 200 ක ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලුම් කර්මාන්ත පුරය නොපමා ව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියලු ම යටිතල පහසුකම් රජය මඟින් ලබා දෙනු ලැබේ.
- දේශීය සහ විදේශීය ආයෝජකයන්ට සියලු ආයෝජන පහසුකම් සහ යටිතල පහසුකම් සැපයෙන නිදහස් ඇඟලුම් කර්මාන්ත පුරයක් උතුරු පළාතේ ආරම්භ කෙරේ.
- අපගේ නව බදු ප්‍රතිපත්තිය යටතේ සැලසෙන බදු පහසුකම්වලට අමතර ව ඇඟලුම් සහ එවැනි විදේශ විනිමය උපයන කර්මාන්ත මත දැනට පනවා ඇති අසාධාරණ බදු පිළිබඳ සොයා බලා නොපමා ව අවශ්‍ය සංශෝධනය ගෙන එනු ලැබේ.

## ඉදිකිරීම් කර්මාන්තය

ඉදිකිරි ම් කර්මාන්තය අපේ අනාගත ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට විශාල දායකත්වයක් සැපයිය හැකි කර්මාන්තයක් ලෙස හඳුනාගෙන ඇත. දැනුම, අත්දැකීම් සහ තාක්ෂණ භාවිතය ඇසුරින් ලබාගෙන ඇති පරිණතභාවය නිසා දැනටමත් අප මෙම ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර තලයට ගොස් ඇත. ශ්‍රී ලංකාවට ආවේණික වන්නා වූ පරිසර හිතකාමී මානව හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් ඇසුරින් ජාත්‍යන්තරය ජය ගැනීමට අවශ්‍ය පරිසරය සැකසීම අපගේ අපේක්ෂාව වේ.

- ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ දී දැනට පවතින විවිධ අනුමැතීන් විවිධ ස්ථානවලින් ලබා ගැනීමට සිදුවීම අනවශ්‍ය ලෙස කටයුතු ප්‍රමාදවීමට හේතු වී ඇත. මේ බාධාකාරී තත්ත්වය දුරු කොට එක් ස්ථානයකින් හෝ අන්තර්ජාලය ඔස්සේ සියලු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් නොපමා ව ඇති කෙරේ.
- සියලු ම ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට ගතවන කාලය සති තුනක් දක්වා අඩුකර සියලු ම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූල ව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කෙරේ.
- සියලු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන ඇතිකිරීම අනිවාර්ය කෙරේ.
- පසුගිය වසර 5කට ආසන්න කාලය තුළ ඉදිකිරීම් කර්මාන්තය බරපතළ කඩා වැටීමකට ලක් ව ඇති නිසා වර්තමානයේ කොන්ත්‍රාත්කරුවන් මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය විසඳා ගැනීම සඳහා දැනට ලබාගෙන ඇති ණය ගෙවීමට සහන කාලයක් ලබා දෙනු ලැබේ.
- පවතින රජය විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රය මත පනවන ලද 300% ඉක්මවා ගිය සෘජු හා වක්‍ර බදු වෙනුවට 2014 පැවති බදු ක්‍රමය නැවත හඳුන්වා දෙනු දෙනු ලැබේ.
- තට්ටු නිවාස මත පනවා ඇති 15% වැට් බද්ද ඉවත් කෙරේ.
- රාජ්‍ය ඉදිකිරීම් සියල්ල දේශීය ඉදිකිරීම්කරුවන් සඳහා වෙන් කරනු ලැබේ.
- ඉහළ පෙළේ ඉදිකිරීම් සඳහා ඉල්ලා සිටින ලංසු බැඳුම්කර (Bid Bonds), කාර්ය සාධන ඇපකර (Performance Guarantees), අත්තිකාරම් මුදල් ඇපකර (Advance Payment Guarantees), ණය පහසුකම් (Line of Credit) ලබා ගැනීම වැනි කාර්යයන්හි දී ඉදිකිරීම්කරුවන් සහ ඉදිකිරීම් සමාගම් මුහුණ දී සිටින දුෂ්කරතා අවමකර ගැනීම සඳහා නව බැංකු ක්‍රමවේදයක් මහ බැංකුව හරහා හඳුන්වාදීමට කටයුතු යෙදේ.
- ඉදිකිරීම් කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දැනට පවතින බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම සඳහා කටයුතු කෙරේ.
- ඉදිකිරීම් කර්මාන්තය මුහුණ දී සිටින බරපතළ ගැටලුවක් වන්නේ කම්කරු ශ්‍රම ඌනතාවය වේ. ඒ සඳහා හැකිතාක් තාක්ෂණික විසඳුම් කරා යොමුවීමට ඔවුනට අවශ්‍ය ආයෝජන සහය ලබාදීමටත් කායික ශ්‍රමය වෙනුවට යන්ත්‍ර සූත්‍රවලින් වැඩකරන පුහුණු කම්කරුවන් බිහිකිරීම සඳහාත් ක්‍රියාමාර්ග ගනු ලැබේ. වැඩකරන ශ්‍රම බළකායට අවශ්‍ය ආරක්ෂාව, නිසි ගරුත්වය සහ ඉහළ වැටුපක් ලබාදීමට අවශ්‍ය පසුබිම ද නිර්මාණය කර දෙනු ලැබේ.
- විවිධ ක්ෂේත්‍රවලට අවශ්‍ය උසස් පුහුණුව සහිත ශිල්පීය ශ්‍රේණි සහ තාක්ෂණවේදීන් බිහිකිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.
- ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපදේශන පහසුවෙන් ලබා ගැනීම සඳහා වෘත්තීය ඉංජිනේරුවන් සහ උසස් තාත්ෂණවේදීන්ගෙන් සමන්විත උපදේශන සභාවක් පිහිටුවනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ දේශීය සලකුණ ජාත්‍යන්තර තලයේ සන්නාමයක් බවට පත්කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කර ගැනීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය සමගත් ඉංජිනේරු ආයතනය සමගත් විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සමගත් පහසුවෙන් කටයුතු කිරීමේ යන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබේ.

- ප්‍රධාන ඉදිකිරීම් සමාගම් සමග කටයුතු කරන උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසෙන නීතී පනත් සම්මත කර දේශීය සුළු සහ මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන්ගේ ආරක්ෂාව සලසනු ලැබේ.

## සීනි නිෂ්පාදන කර්මාන්තය

ලංකාවේ සීනි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා රට තුළ ම සීනි නිෂ්පාදනය කළ යුතු ය. එමඟින් සීනි ආනයනයට වැය වන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපට ඉතිරි කර ගත හැකි වේ.

- සීනි නිෂ්පාදනය සඳහා අවශ්‍ය උක් වගාකරන භූමි ප්‍රමාණය වැඩි කිරීමට පියවර ගන්නා අතර ඉහළ ඵලදායීතාවක් සහිත උක් වර්ග හඳුන්වා දෙනු ලැබේ.
- වසා දමා ඇති කන්තලේ ඇතුළු සියලු ම සීනි කර්මාන්තශාලා නොපමා ව ආරම්භ කිරීමට කටයුතු කරන අතර අවශ්‍යතාව පරිදි නව කර්මාන්ත ශාලා ඉදිකිරීමට පෞද්ගලික අංශයට අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දෙනු ලැබේ.
- උක් වගාව සඳහා අවශ්‍ය ජලය කාර්යක්ෂම ව භාවිත කිරීමට අවශ්‍ය වන තාක්ෂණික දැනුම ලබා දීමටත්, ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමටත් කටයුතු කෙරේ.

## සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත

- සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා විවිධ රාජ්‍ය ආයතන එක ම කාර්යය ඉටුකිරීම වෙනුවට එක් ආයතනයක් මගින් සියලු සේවා සැපයීමේ ක්‍රමවේදයක් සකස් කර එම සේවාවන් ලබාදීම කාර්යක්ෂම කෙරේ.
- අගය වැඩිකිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මෙම අංශයට ප්‍රමුඛතාව ලබාදෙන අතර අවශ්‍ය දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.
- වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිත ව පවතින අමුද්‍රව්‍ය ගැටලුවට පිළියමක් ලෙස වගා සමුපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දෙනු ලැබේ.
- දැව සහ ලී බඩු නිෂ්පාදකයන් මුහුණ දී සිටින අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අර්බුදයට විසඳුමක් ලෙස තීරු බදු රහිතව පොතු සහිත දැව කඳන් ආනයනයට අවසර දෙනු ලැබේ.
- වාත්තු සහ ලෝකුරු කර්මාන්ත වැනි සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත ව ඇති අමුද්‍රව්‍ය සහ වෙළෙඳපොළ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබේ.

## සක්‍රීය සමුපකාර ව්‍යාපාරයක්

ලෝකයේ විවිධ රටවල ආර්ථික මෙහෙයුමේ නිෂ්පාදන සහ බෙදාහැරීමේ යන්ත්‍රණයක් වන සමුපකාර ව්‍යාපාරය ලොව පුරාම පොදු ජන හිතකාමී ආර්ථික ක්‍රමයන්ගේ ද අගනා සොයා ගැනීමකි. ශ්‍රී ලංකාවේ පොදුජන හිතකාමී ආණ්ඩු පැවති සෑම අවස්ථාවක දී ම සමුපකාර ව්‍යාපාරය ඉතා ශක්තිමත් ව ක්‍රියාත්මක විය. එබැවින් අප ඉදිරිපත් කරන ජනතා කේන්ද්‍රීය ආර්ථික දැක්ම තුළ දේශීය සමුපකාර ව්‍යාපාරයට නිෂ්පාදන ක්‍රියාවලිය තුළදීත්, ගමේ ආර්ථික අවශ්‍යතා සපුරාලීමේදීත් මීටත් වඩා සහ පුළුල් විශාල කාර්යභාරයක් රට වෙනුවෙන් ඉටු කළ හැකි ය.

- කෘෂිකර්මාන්තය, කිරි නිෂ්පාදන කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ සුළු අපනයන භෝග වගාව, වැනි විවිධ ක්ෂේත්‍ර ආශ්‍රිත ව පුළුල්ව පැතිරුණු දියුණු සහ ශක්තිමත් නිෂ්පාදන සමුපකාර ක්‍රමයක් ආරම්භ කෙරේ.
- නිෂ්පාදන සමුපකාර ක්‍රමය මගින් තරුණ සහ කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා අපනයනය පදනම් කරගත් වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා දිරි ගන්වනු ලැබේ.
- සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ප්‍රාග්ධනය සහ වෙළෙඳපොළ හඳුන්වාදීමේ වගකීමත් මෙම නිෂ්පාදන සමුපකාරවලට පැවරේ.
- භාණ්ඩ සහ සේවා නිෂ්පාදන ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම සඳහා සියලු සමුපකාර සමිතිවල දායකත්වය ලබා ගනිමින් "සමුපකාර සංවර්ධන බැංකුවක්" ස්ථාපිත කිරීමට පියවර ගනු ලැබේ.
- නූතන මහා පරිමාණ අලෙවි ජාල සමඟ තරග කරමින් සහනදායී මිලට, තත්ත්වයෙන් උසස් භාණ්ඩ බෙදාහැරීම සඳහා දැනට රට පුරා ඇති සමුපකාර අලෙවිසැල් සම්පූර්ණයෙන් නවීකරණය කිරීමට රජයේ පූර්ණ අනුග්‍රහය ලබා දෙනු ලැබේ.
- තාක්ෂණික ලෝකයත් සමඟ ඉදිරියට යාම සඳහා පරිගණක දත්ත පද්ධතියක් ගොඩනැංවීම, තොරතුරු තාක්ෂණය හා අනෙකුත් නවීන තාක්ෂණික භාවිතයන් දිරි ගැන්වීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලැබේ.
- සමුපකාර සේවකයින්ගේ වැටුප් ක්‍රමය සංශෝධනය කොට වැටුප් ඉහළ නැංවීමටට කටයුතු කෙරේ.
- ඒ ඒ පළාත් සභාවල ඒකගත්වය මත සමුපකාර ප්‍රඥප්තිය සාධනීය ලෙස සංශෝධනය කර ව්‍යාපාර කටයුතුවලට අවශ්‍ය නිදහස ලබා දෙනු ලැබේ.
- දේශපාලනීකරණයට ලක්වීම නිසා සමුපකාර ව්‍යාපාරයට සිදුවන හානි වැළැක්වීම සඳහා සමුපකාරය සම්පූර්ණයෙන් ම දේශපාලනයෙන් නිදහස් කර ස්වාධීන කෙරේ.


57.1713
89.4702
32.427
94.5747
89.4702
68.5974
63.4931
35.4698
17.9512



# තාක්ෂණය මත පදනම්වන සමාජයක්

හයවන කොටස

# තාක්ෂණය මත පදනම්වන සමාජයක්

**21 වන සියවස හඳුන්වන්නේ දැනුම් කේන්ද්‍රීය ශත වර්ෂය ලෙස ය. කෘෂිකර්මය වේවා, කර්මාන්ත ක්ෂේත්‍රය වේවා, සේවා අංශය වේවා, අනාගතයේ දී තාක්ෂණය මත යැපෙන ආර්ථික අංශ බවට පත් වේ. 21 වන සියවසේ නැගී එන තාක්ෂණයන් සඳහා උපායමාර්ගිකව ආයෝජන කිරීමටත්, අපේ අධ්‍යාපනය ක්‍රමයට එක් කිරීමටත්, ආර්ථිකය සමග මුසු කිරීමටත් කටයුතු කළ යුතු ය. ඒ අනුව අපේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා විශාල සමාජ පරිවර්තනයක් සිදුකොට තාක්ෂණික නව්‍යකරණ සංස්කෘතියක් (Culture of Technological Inovation) අපි ගොඩනැගිය යුතු ය.**

- ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් (Global Innovative Hub)
- ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩු ක්‍රමයක් (Citizen Centric Digital Government)
- ඩිජිටල්කරණය වූ ලංකාවක් (Digitally Inclusive Sri Lanka)
- තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් (IT Entrepreneulhip)

### තාක්ෂණය මත පදනම්වන සමාජයක්

**(Smart Nation)**

21 වන සියවස හඳුන්වන්නේ දැනුම් කේන්ද්‍රීය ශත වර්ෂය ලෙස ය. කෘෂිකර්මය වේවා, කර්මාන්ත ක්ෂේත්‍රය වේවා, සේවා අංශය වේවා, අනාගතයේ දී තාක්ෂණය මත යැපෙන ආර්ථික අංශ බවට පත් වේ. විවිධ හේතු නිසා දෙවන ලෝක යුද්ධයෙන් පසුව ජපානය සහ දකුණු කොරියාව වැනි රටවල් ලැබූ තාක්ෂණික දියුණුව අපට අහිමි විය. එහෙත් 21 වන සියවසේ දී දැනුම සහ තාක්ෂණික නවෝත්පාදනය මඟින් ඇතිවන අවස්ථා අහිමි නොකර ගැනීමට අප වගබලාගත යුතු ය. 21 වන සියවසේ නැගී එන තාක්ෂණයන් සඳහා උපායමාර්ගිකව ආයෝජන කිරීමටත්, අපේ අධ්‍යාපනය ක්‍රමයට එක් කිරීමටත්, ආර්ථිකය සමග මුසු කිරීමටත් කටයුතු කළ යුතු ය. ඒ අනුව අපේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා විශාල සමාජ පරිවර්තනයක් සිදුකොට තාක්ෂණික නව්‍යකරණ සංස්කෘතියක් (Culture of Technological Innovation) අපි ගොඩනැගිය යුතු ය. මේ යටතේ,

### ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක්

**(Global Innovative Hub)**

අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග (IoT), කෘත්‍රිම බුද්ධිය (AI), ජෛව තාක්ෂණය (Biotechnology), රොබෝ තාක්ෂණය (Robotics), ඔග්මෙන්ටඩ් රියලිටි (Augmented Reality), ක්ලවුඩ් කම්පියුටින් (Cloud Computing), නැනෝතාක්ෂණය (Nanotechnology) සහ ත්‍රිමාන මුද්‍රණය (3D Printing) වැනි නවීන තාක්ෂණයන් භාවිතය උපරිම තලයට ගෙන ඒම හරහා ලංකාව ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් (Global Innovative Hub) බවට පත් කෙරේ.

### ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩු ක්‍රමයක්

**(Citizen Centric Digital Government)**

- මේ යටතේ රාජ්‍ය යාන්ත්‍රණයේ පවතින අකාර්යක්ෂමතාව, ප්‍රමාදය, තැනින් තැනට යාමට සිදුවීම ආදිය වළක්වා, සේවාලාභියා සේවා සපයන්නා ළඟට යනවා වෙනුවට අන්තර්ජාලය හරහා අදාළ අනුමැතීන් සහ අවශ්‍ය සේවා සපයන ක්‍රමවේදයක් (Transformation of Public Sector Service Delivery) ඉතා ඉක්මනින් හඳුන්වා දෙනු ලැබේ.
- නව ක්‍රමවේදය හරහා තාක්ෂණය සහ අන්තර්ජාල භාවිතයෙන් ජාතික හැඳුනුම්පත්, ගුවන්ගමන් බලපත්‍ර, උප්පැන්න සහතික, මරණ සහතික, රියදුරු බලපත්‍ර, රජයේ ඉඩම් ඔප්පු ඇතුළු ජනතා සේවාවන් කාර්යක්ෂමව සහ කඩිනමින් සිදු කරගත හැකි “ජනතා කේන්ද්‍රීය සේවා මධ්‍යස්ථාන” (Citizen Service Center) 09ක් පළාතට එක බැගින් බිහි කෙරේ.
- රථවාහන වැරදි සම්බන්ධයෙන් අයකරන දඩ මුදල් පහසුවෙන් ගෙවීම සඳහා ඩිජිටල් සහ ඉලෙක්ට්‍රොනික් ගෙවීම් ක්‍රමයක් (Digital and Electronic Payment System) හඳුන්වා දෙනු ලැබේ.
- දූෂණයෙන් තොර විනිවිදභාවයෙන් යුක්තව රාජ්‍ය අංශයේ සියලු මිලදී ගැනීම් සඳහා විද්‍යුත් ක්‍රමවේදයක් (E- Procument) හඳුන්වා දෙනු ලැබේ.

## ඩිජිටල්කරණය වූ ලංකාවක්

**(Digitally Inclusive Sri Lanka)**

- රටපුරා විහිදුණු අධිවේගී ෆයිබර් ඔප්ටික්ස් දත්ත හුවමාරු පද්ධතියක් (High Speed Optical Transmission System) සහ අධිවේගී ජංගම 5G බ්‍රෝඩ්බෑන්ඩ් ජාල පද්ධතියක් (5G Mobile Broadband System) ස්ථාපනය කෙරේ.
- ජල සහ විදුලි භාවිතය, මාර්ග තදබදය සහ ආපදා තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණික පාලක මධ්‍යස්ථාන සහිත ඩිජිටල් නගර (Digital Cities) ඇති කෙරේ.
- සියලු දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සඳහා ජංගම දුරකථන සහ ඩිජිටල් ගෙවීම් (Mobile and Digital Payment System) ක්‍රමයක් සඳහා අවශ්‍ය වන භෞතික සම්පත් සහ නීතිමය ප්‍රතිපාදන ඇති කෙරේ.
- අන්තර්ජාතික වෙළෙඳාම සහ මුදල් ගනුදෙනු සම්පූර්ණයෙන් විද්‍යුත් මාර්ගයෙන් සිදු කිරීමට (Cross-border E-Commerce and International E-Payment) අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කරන අතර ඒ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන නොපමාව සකස් කෙරේ.
- දත්ත ආරක්ෂණය (Data Protection) සයිබර් ආරක්ෂාව (Cyber Security) සහ බුද්ධිමය දේපොළ අයිතිය (Intellectual Property) තහවුරු කිරීම සඳහා අවශ්‍ය නව නීති සහ රෙගුලාසි සකස් කෙරේ.

## තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක්

**(IT Entrepreneurship)**

- Business Process Outsourcing (BPO) සහ Knowledge Process Outsourcing (KPO) සේවාවන් 2025 වනවිට ඇමරිකානු ඩොලර් බිලියන 3 ක අපනයන වටිනාකමක් සහිත සේවාවක් බවට පත්කිරීමට සැලසුම් කෙරේ. ඒ සඳහා අනුනගර ආශ්‍රිතව "තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන" සහ "BPO මධ්‍යස්ථාන" ඇති කෙරේ.
- රටේ දැනට සිටින මෘදුකාංග ඉංජිනේරුවන් ගේ (Software Engineers and Programmer) සංඛ්‍යාව 2025 වන විට ලක්ෂ 3ක් දක්වා වැඩි කිරීමට කටයුතු කෙරේ.
- විදේශ රටවලින් මෘදුකාංග (Software) ගෙන්වීම වෙනුවට මෘදුකාංග රට තුළ ම නිෂ්පාදනය කිරීමට දේශීය ඉංජිනේරුවන් සහ නිර්මාණකරුවන්ට අවශ්‍ය සියලු ම ආකාරයේ අනුග්‍රහය ලබා දෙනු ලැබේ.
- ජාත්‍යන්තර වෙළෙඳපොළට ගැළපෙන මෘදුකාංග සකස් කිරීමට ව්‍යවසායකයින්ට අවශ්‍ය සියලු දිරි ගැන්වීම් ලබා දෙනු ලැබේ.





# භෞතික අවකාශයේ නැවුම් පියවර

හත්වැනි කොටස

# භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය

***කොළඹ නගරය, වරාය සහ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කේන්ද්‍ර කරගත්, ඉන්දියානු සාගර කලාපයේ වානිජ සහ මුදල් කේන්ද්‍රස්ථානයත්, හම්බන්තොට වරාය සහ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මුල්කර ගන්නා ජාත්‍යන්තර කාර්මික සහ සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය ලෙසත්, ත්‍රිකුණාමල වරාය සහ ගුවන්තොටුපොළත්, කන්කසන්තුර වරාය සහ ගුවන්තොටුපොළත් කේන්ද්‍ර කර ගෙන රටේ සිව්කොණ යාවෙන "සී හැඩය ගන්නා" (C Shape) ආර්ථික කොරිඩෝ නමයක් අප නිර්මාණය කරන්නෙමු.***

## සිව්මහ වානිජ නගර

කොළඹ, හම්බන්තොට, යාපනය, ත්‍රිකුණාමලය යන සිව්මහ වානිජ නගරයන් වරාය සහ ගුවන්තොටුපොළ සහිත නගර නිසා ඒවා ආර්ථික කොරිඩෝ නමයෙහි ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සහසම්බන්ධීකරණ මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක කෙරේ.



## අලුත් කොළඹ - වෙළෙඳ සහ මූල්‍ය පුරවරය

දහසක් විරෝධතා මධ්‍යයේ අප ආරම්භ කරන ලද වරාය නගරය විරෝධතා දැක්වූ පාර්ශවයන් විසින් ම ගොඩනගමින් සිටිනු දැකීම අතිශයින් සතුටට කරුණකි. අපි එදා සැලසුම් කළ පරිදිම හුදු වානිජ කේන්ද්‍රය ලෙස සැලකුණු කොළඹ නගරය වරාය නගරයට එක්කොට ජාත්‍යන්තර වෙළෙඳ සහ මූල්‍ය පුරවරය බවට පත් කිරීමට කටයුතු කරන්නෙමු. අපි එය "අලුත් කොළඹ" ලෙස නම් කොට ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ මූලෝපායික මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක කරන්නෙමු. තවද එම නගරය ජාත්‍යන්තර මූල්‍ය කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය නීති සහ රෙගුලාසි කඩිනමින් හඳුන්වා දෙනු ලැබේ.

## පුනර්ජනනීය බලශක්තිය පෙරමුණට

ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමගම බලශක්තිය සඳහා ඇති ඉල්ලුම තවදුරටත් ඉහළ යනු ඇති අතර ඒ නිසා 2030 වන විට රටේ සමස්ත බලශක්ති අවශ්‍යතාවය උපරිමයෙන් පුනර්ජනීය ප්‍රභවයන්, ජල විදුලිය සහ  ස්වභාවික වායු භාවිතයෙන් පරිසර හිතකාමීව නිෂ්පාදනය කිරීමට අවශ්‍ය බල ශක්ති සැලසුම අපි සකස් කරන්නෙමු.

## ජල සම්පත

ජලය අප විසින් සුරැකිය යුතු වස්තුවක් බවට පත් වී තිබේ. කෘෂි කටයුතු සඳහා අධික රසායනික පොහොර සහ රසායන ද්‍රව්‍ය යෙදීම වැනි මිනිස් ක්‍රියාකරකම් නිසා ගංගා ඇළ දොළ සහ ස්වභාවික ජලමූලාශ්‍ර අපවිත්‍රවීමෙන් ජල සම්පත දූෂණය වී තිබේ. සෝදා පාලුව ඉහළයාම නිසා ගංවතුර වැනි තත්වයන් ද ඇති වී ඇත. මේ සියල්ල නිසා "සැමට ජලය" (Water for All) ව්‍යාපෘතිය අප හඳුන්වා දෙන්නේ සියලු ජල මූලාශ පවිත්‍ර කොට විධිමත් සැලැස්මක් යටතේ සියලු දෙනාටම පානීය ජලය සහ වාරි ජලය සපයා දීමට ය.




**දුම්රිය සේවා**

පවතින තත්ත්වයෙන් දුම්රිය සේවාව ගොඩගැනීම සඳහා තාවකාලිකව දුම්රිය සහ දුම්රිය මාර්ග වැඩි දියුණුව සහ නඩත්තු පිළිබඳ වගකීම රජය විසින් සිදුකර, කාර්යක්ෂම සහ සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාමේ වගකීම දුම්රිය දෙපාර්තමේන්තුවට පැවරෙන නව ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇත.





**සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්**

අපගේ ආණ්ඩු සමයේ රටේ මාර්ග පද්ධතිය ඉතාමත් ඉහළ මට්ටමින් සංවර්ධන කළ බව කරවුරුත් දන්නා කරුණකි. එහි අපේ අරමුණ වූයේ රටේ ජනතාවට වඩා පහසුවෙන් යාම්ඊම් කිරීමට අවකාශ සැලසීම ය. මෙවර අපේ සැලසුම එකී සියලු මාර්ග පද්ධතීන් අතර මනා සහසම්බන්ධතාවක් ඇති ආර්ථික කොරිඩෝවල ශක්‍යතාව ඉහළ නැංවීමයි.

**හම්බන්තොට වරාය**

හම්බන්තොට වරාය ජාත්‍යන්තර කාර්මික සහ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය කොට නෞකාවලට අවශ්‍ය ඉන්ධන, ආහාර, නඩත්තු සහ අනෙකුත් සේවා සැපයීම සඳහා දේශීය ව්‍යාපාරිකයන්ට අවශ්‍ය පහසුකම් සපයනු අතර හම්බන්තොට ආයෝජන කලාපයට අවශ්‍ය සියලු ම භෞතික සම්පත් සැපයීමට කටයුතු කෙරේ.



**ගුවන්තොටුපොළ සංවර්ධනය**

ජාත්‍යන්තර ගුවන් සමාගම් සමඟ සාකච්ඡා කර මත්තල ගුවන් තොටුපොළේ ගුවන් මෙහෙයුම් ආරම්භ කරන අතර මත්තල ගුවන්තොටුපොළේ සහය ගුවන් පථය (Taxi Way) සහ භාණ්ඩ පර්යන්තයක් ඉදිකිරීමට කටයුතු යොදනු ලැබේ.

**ආපදා කළමනාකරණය**

මානව ක්‍රියාකාරකම් නිසා ඇති වන ආපදා වළක්වා ගන්නා අතර ම ස්වභාවික ආපදා කල්තබා නිවැරදිව හඳුනාගෙන එයින් සිදුවෙන හානිය අවම කර ගැනීම රජයක වගකීමයි. එමෙන්ම කිසියම් ආපදාවක් සිදුවන විට එමගින් සිදුවන හානිය අවමකර ගැනීමටත් හානියටපත් වූවන් නගාසිටුවීටත් භෞතික දේවල් යළි ස්ථාපනය කිරීමටත් නොපමාව ක්‍රියාකළ යුතුය.

# භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය

## භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය

(New approach of National Spatial System)

ගම සහ නගරය පිළිබඳ වෙනසක් නැති, සැමට අවශ්‍ය සියලු පහසුකම්, සෑම තැන්හිම පවතින ආකාරයට අපේ රටේ භෞතික අවකාශය ප්‍රයෝජනයට ගත යුතු ය. ඒ සඳහා නව ප්‍රතිනාග රීකරණ (Deurbanization) වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය ය. එසේ ම රටේ සංවර්ධන ක්‍රියාවලියට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම සමාන දායකත්වයක් සැපයෙන ආකාරයට මෙම අවකාශය කාර්යක්ෂම සහ ඵලදායී ලෙස භාවිතයට ගත යුතු ය. සෞභාග්‍යමත් දේශයක් උදෙසා විශාල ඉදිරි පිම්මක් පැනීමට අවශ්‍ය වන ආකාරයට රටේ ආර්ථිකය කාර්යක්ෂම කිරීමට නම් අපි සහසම්බන්ධිත විසඳුමක් කරා යා යුතු වෙමු. දේශීය නිෂ්පාදකයාට පහසුවෙන් දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළට සම්බන්ධවීමටත් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයටත් එම සම්බන්ධතාව අත්‍යාවශ්‍යය. ඒ සඳහා ප්‍රධාන වරාය දෙක සහ ගුවන් කේන්ද්‍රස්ථාන දෙකට කඩිනමින් යා හැකි, සියලු අතරමැදි නගර සහ භෞතික ප්‍රදේශ අතර අන්තරසම්බන්ධතාවක් ඇති කෙරෙන “සී හැඩයේ ආර්ථික කොරිඩෝ ක්‍රමයක්” (C Shape Economic Corridor) හඳුන්වාදීම අපගේ සැලසුම වේ.

### A9 සමඟ C9 : සී හැඩයේ ආර්ථික කොරිඩෝ නමයක්

කොළඹ නගරය, වරාය සහ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කේන්ද්‍ර කරගත්, ඉන්දියානු සාගර කලාපයේ වානිජ සහ මුදල් කේන්ද්‍රස්ථානයත්, හම්බන්තොට වරාය සහ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මුල්කර ගන්නා ජාත්‍යන්තර කාර්මික සහ සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය ලෙසත්, ත්‍රිකුණාමල වරාය සහ ගුවන්තොටුපොළත්, කන්කසන්තුර වරාය සහ ගුවන්තොටුපොළත් කේන්ද්‍ර කර ගෙන රටේ සිව්කොණ යාවෙන “සී හැඩය ගන්නා” (C Shape) ආර්ථික කොරිඩෝ නමයක් අප නිර්මාණය කරන්නෙමු.

### නාගරික ප්‍රතිව්‍යුහගතකරණය

ශ්‍රී ලංකාවේ පවතින නාගරීකරණ ක්‍රියාවලිය තුළ ඇති අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතරත් පවතින පරතරය සහ විෂමතාවන් පිළිබඳ අපි ඉතා හොඳින් අවධානය යොමු කර ඇත්තෙමු. අපි යෝජනා කරන ඒකාබද්ධ භෞතික අවකාශ භාවිතය මඟින් අපේක්ෂා කරන්නේ මෙම අසම නාගරීකරණ ක්‍රියාවලිය වෙනුවට මුළු රටපුරා පැතිරුණු සී හැඩයේ ආර්ථික කොරිඩෝර් ක්‍රමයට උපරිම වශයෙන් දායක වෙමින් අපේ නගරවල පැරණි හැඩය වෙනුවට නව වටිනාකමක් එකතු කිරීමට ය.

### සිව්මහ වානිජ නගර

කොළඹ, හම්බන්තොට, යාපනය, ත්‍රිකුණාමලය යන සිව්මහ වානිජ නගරයන් වරාය සහ ගුවන්තොටුපොළ සහිත නගර නිසා ඒවා ආර්ථික කොරිඩෝ නමයෙහි ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සහසම්බන්ධීකරණය මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක කෙරේ.

### ජාතික නගර (National Cities)

මහනුවර, අනුරාධපුරය, ගම්පහ, රත්නපුර, ගාල්ල, බදුල්ල, මන්නාරම, මඩකළපුව සහ කුරුණෑගල යන නගර ඒවායේ ඓතිහාසික, ආර්ථික සහ සමාජීය වටිනාකමත්, සී කලාප සම්බන්ධීකරණයේ දී ඇති වටිනාකමත් සලකා ජාතික නගර සංකල්පය යටතේ සංවර්ධනය කෙරේ.

### සහසම්බන්ධිත නගර (Connecting Cities)

පුත්තලම, මීගමුව, පොතුවිල්, දඹුල්ල, මාතර, නුවරඑළිය සහ බුත්තල වැනි නගර, සිව්මහ වානිජ නගර, සහ ජාතික නගර හා බැඳුණු සී කලාපවල සහ සම්බන්ධතා නගර ලෙස ක්‍රියාත්මක කෙරේ.

### පොකුරු නගර (Cluster Cities)

අපි නිර්මාණය කරන සිව්මහ වානිජ නගර සහ ජාතික නගර ආශ්‍රිත ව තොරතුරු තාක්ෂණය, දැනුම, පර්යේෂණ, සංචාරක සහ සේවා සැපයුම් වැනි එක් එක් ක්ෂේත්‍රවලට ප්‍රමුඛතාව ලබාදෙන පොකුරු නගර පද්ධතියක් සුවපහසු ජීවන මධ්‍යස්ථාන ලෙස නිර්මාණය කරන්නෙමු.

### අලුත් කොළඹ - වෙළෙඳ සහ මූල්‍ය පුරවරය

දහසක් විරෝධතා මධ්‍යයේ අප ආරම්භ කරන ලද වරාය නගරය විරෝධතා දැක්වූ පාර්ශවයන් විසින් ම ගොඩනගමින් සිටිනු දැකීම අතිශයින් සතුටට කරුණකි. අපි එදා සැලසුම් කළ පරිදිම හුදු වානිජ කේන්ද්‍රය ලෙස සැලකුණු කොළඹ නගරය වරාය නගරයට එක්කොට ජාත්‍යන්තර වෙළෙඳ සහ මූල්‍ය පුරවරය බවට පත් කිරීමට කටයුතු කරන්නෙමු. අපි එය “අලුත් කොළඹ” ලෙස නම් කොට ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ මුලෝපායික මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක කරන්නෙමු. තවද, එම නගරය ජාත්‍යන්තර මූල්‍ය කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය නීති සහ රෙගුලාසි කඩිනමින් හඳුන්වා දෙනු ලැබේ.

- අලුත් කොළඹ නගරය ආශ්‍රිත උපනාගරික පද්ධතීන් හා යා කරමින් දැනට භාවිත කරන සාමාන්‍ය දුම්රිය පද්ධතිය මඟී හිතකාමී ආකාරයට වැඩි දියුණු කර, කොළඹ ආශ්‍රිත ව “නව නාගරික දුම්රිය පද්ධතියක්” (MRT) ස්ථාපනය කෙරේ. මෙම ආකාර දෙකෙන්ම දෛනිකව කොළඹ නගරයට ඇදී එන ජනතාවගේ සුවපහසුව සඳහා වටරවුම් සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතියක් (LRT) ගොඩනගනු ලැබේ.
- කොළඹ නගරය ආශ්‍රිත ව දිනපතා සහ නිතර පවතින අධික වාහන තදබදය 50% කින් අඩු කිරීම සඳහා තනි අතට දිවෙන වටරවුම් මාර්ග ධාවන (Radial and Circular) සැලැස්ම නොපමා ව දියත් කරන අතර ප්‍රධාන මංසන්ධිවල ඇති වන වාහන තදබදය අවම කිරීම සඳහා ප්‍රවේශ මාර්ග සඳහා කුඩා ගුවන් පාලම් පද්ධතියක් නිර්මාණය කිරීමට සහ සෑම ප්‍රධාන නගරකටම යාන්ත්‍රික සිරස් වාහන අංගන පද්ධතියක් එක් කරනු ලැබේ.

- අලුත් කොළඹ ආසියාවේ අලංකාරම නගරය බවට පත්කිරීම සඳහා උද්‍යාන, ජල උද්‍යාන, මාර්ග දෙපස හරිත මංතීරු, අඛණ්ඩ ව ක්‍රියාත්මක කොට අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රමවේදයක් සහිත පවිත්‍රතාව ප්‍රමුඛ හරිත පුරවරයක් බවට පත් කෙරේ. ඊට අමතරව නාගරික අපද්‍රව්‍ය එකතු කිරීම, මලාපද්‍රව්‍ය පිරිසිදු කිරීම, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සහ ජල ප්‍රතිචක්‍රීකරණය සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

**සුව පහසු ගමනක් - පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්**

සුවපහසුවෙන් ඉක්මනින් හා ආරක්ෂාකාරී ව තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සෑම පුරවැසියෙකුට ම ඇති අයිතියකි. නමුත් තවමත් ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහනය ආශ්‍රිතව බරපතළ ගැටළුකාරී තත්වයක් පවතී. ඊට හේතුව අප නිතරම භාවිතා කරන මහා මාර්ග සහ දුම්රිය මාර්ග පදනම් කරගත් ප්‍රවාහන පද්ධතියේ ඇති පසුගාමීත්වය සහ බිඳුණු අන්තර සම්බන්ධතාවයන් ය. එම නිසා ජනතාවට කාර්යක්ෂම, ඉහළ ප්‍රමිතියෙන් යුත් පරිසර හිතකාමී ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා නූතන ප්‍රවේශයක් අවශ්‍ය ය. එම වගකීම අපි භාර ගන්නෙමු.

**සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්**

අපගේ ආණ්ඩු සමයේ රටේ මාර්ග පද්ධතිය ඉතාමත් ඉහළ මට්ටමින් සංවර්ධන කළ බව කරවුරුත් දන්නා කරුණකි. එහි අපේ අරමුණ වූයේ රටේ ජනතාවට වඩා පහසුවෙන් යාම්ඊම් කිරීමට අවකාශ සැලසීම ය. මෙවර අපේ සැලසුම එකී සියලු මාර්ග පද්ධතීන් අතර මනා සහසම්බන්ධතාවක් ඇති ආර්ථික කොරිඩෝවල ශක්‍යතාව ඉහළ නැංවීමයි.

- කොළඹ - මහනුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු සහ කටුනායක අධිවේගී මාර්ගය වරාය නගරය දක්වා දීර්ඝ කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කරනු ඇත. එම මාර්ගයේ සිට කොට්ටාව, බත්තරමුල්ල හරහා පෑලියගොඩ දක්වා දිවෙන මාර්ග කටයුතු ද ඊට සමගාමීව ආරම්භ කෙරේ.
- උතුරු අධිවේගී මාර්ගයේ සහ රත්නපුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කරන අතර අඩි දහසක් උසින් රටපුරා දිවෙන සියලු අධිවේග මාර්ග සහ ප්‍රධාන මාර්ගවල ප්‍රවේශ සහිත වටරවුම් මාර්ගයක් ආරම්භ කිරීම සහ මහනුවර සිට නුවරඑළියට අධිවේගී මාර්ගයක් ඉදිකිරීම පිළිබඳ ශක්‍යතාව සලකා බැලේ.
- රටේ සියලු ප්‍රධාන මාර්ගවල සෑම කි. මී. 3-5 අතර දුරින් "ඉස්සර කිරීමේ මංතීරු" (Overtaking Lane) ස්ථාපනය කර එම මාර්ගවල තදබදය සහ වාහන අනතුරු සිදුවීම අඩු කිරීමට කටයුතු කෙරේ.
- පවතින රජය මගින් නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා අබලන් වී ඇති ප්‍රධාන මාර්ග පද්ධතිය මෙන්ම රටපුරා විහිදෙන සියලු මාර්ග සම්පූර්ණයෙන් ම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව නවීකරණය කරනු ලැබේ.
- ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ගවලට තදබදයෙන් තොර ව ඇතුළු විය හැකි ආකාරයට අතුරු මාර්ග කි.මී. 100,000 ක් සංවර්ධනය කරන අතර, අතුරු මාර්ගවලට පහසුවෙන් පිවිසිය හැකි ආකාරයට සියලු අභ්‍යන්තර සහ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග පද්ධතිය වැඩි දියුණු කෙරෙනු ඇත.

**මාර්ගස්ථ ප්‍රවාහන සේවා**

- පොදු සේවාවක් ලෙස ලාභ ඉපයීමෙන් තොරව පවත්වාගෙන යන මධ්‍යම ගමනාගමන මණ්ඩලය නූතනයට ගැළපෙන ආකාරයට නවීකරණය කර එහි නඩත්තුව සහ සේවකයින්ගේ සුභසිද්ධිය සඳහා ඉඩ සැලසෙන ආකාරයට ආදායම් ඉපයීම සඳහා බස් නැවතුම් පොළවල්, ඩිපෝ සහ වාණිජ වටිනාකමක් සහිත ඉඩම් භාවිත කර ප්‍රාදේශීය වාණිජ මධ්‍යස්ථාන සහ සේවා සැපයුම් මධ්‍යස්ථාන ඉදි කෙරේ.
- කොළඹ නගරයේ සිට සියලු නගර සම්බන්ධ කෙරෙන අති සුඛෝපභෝගී බස් රථ සේවාවක් හඳුන්වා දෙන අතර දෛනික කාර්යාලයීය ප්‍රවාහනයේදී ඇතිවන දුෂ්කරතා මගහැරීම සඳහා දුම්රිය ස්ථාන යා කෙරෙන පරිදි කොළඹ සහ බත්තරමුල්ල අතර සුඛෝපභෝගී අන්තර සම්බන්ධිත ප්‍රවාහන සැලැස්මක් ඇති කරනු ලැබේ. එහිම කොටසක් ලෙස වැල්ලවත්ත දුම්රිය ස්ථානය ආශ්‍රිතයේ සිට බත්තරමුල්ල දක්වා දිවෙන ජලමාර්ග ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීම සහ 2013 දී අප ආරම්භ කළ සංචාරක ජලමාර්ග ප්‍රවාහන සේවය ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කෙරේ.
- ගමනාගමන මණ්ඩලය සතු බස්රථ නිසි පරිදි නඩත්තු කිරීමටත් අවශ්‍ය බස්රථ මිලදී ගැනීම මගින් වැඩිපුර බස්රථ ප්‍රමාණයක් ධාවනය කිරීමටත් අවශ්‍ය කටයුතු අපි නොපමාව ආරම්භ කර ගමනාගමන මණ්ඩල සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් දීමනා පිළිබඳ ගැටලු ඉතා කෙටි කලක් තුළ විසඳීමට අවශ්‍ය පියවර ගැනේ.
- ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික බස් රථ ඒකාබද්ධව තරඟකාරීත්වයකින් තොරව සාධාරණව ආදායම් උපයා ගත හැකිවන ලෙස සහ සාමාන්‍ය ජනතාවට අපහසුතාවයක් ඇති නොවන ලෙස පොදු කාලසටහනක් යටතේ සෑම මාර්ගයකටම දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවාවක් ලබාදීමට කටයුතු කරනු ඇත. පරිසර හිතකාමී ප්‍රවාහන සේවාවක් ඇතිකිරීම වැනි ජාතික අවශ්‍යතාවලදී ඉහළ කාර්යක්ෂමතාවක් සහිත සූර්ය බලශක්ති සහ හයිබ්‍රිඩ් වාහන මිලදී ගන්නට සිදුවුවහොත් ඒ සඳහා අවශ්‍ය කරන බදු සහන, අඩු පොලී ණය පහසුකම් ආදිය ලබාදීමට ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇත.
- ඕනෑම බස් රථයක භාවිත කළ හැකි ඊ-ප්‍රවේශපත්‍ර ක්‍රමයක් (E- Ticketing System) ක්‍රමයක් අප හඳුන්වා දෙනු ලැබේ.
- මාර්ග තදබදය සහ අනතුරුවලට ප්‍රධාන හේතුවක් වී තිබෙන රියැදුරන්ගේ වගකීමෙන් තොර රිය ධාවනය වෙනුවට විනයගරුක රථ ධාවනයට යොමු කිරීම සඳහාත් මගී මිත්‍රශීලී පොදු ප්‍රවාහන සේවාවන් සැපයීමටත් මෙම අංශයේ සේවය කරන්නන්ගේ වෘත්තිය ට ගෞරවයක් ලබාදීම සඳහාත් ඔවුන්ගේ ආකල්ප හා හැසිරීමේ වෙනසක් ඇති කිරීම සඳහාත් අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරනු ඇත.

# භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය

- සෑම බස් රථයකටම දවසේ අපේක්ෂිත ආදායම විනයානුකූලව උපයා ගත හැකි ක්‍රමවේදයක් අප ස්ථාපිත කරන බැවින් රියැදුරන් සහ බස් හිමියන් නීතිය නිසිලෙස පිළිපදිනවා නම් නීතියත් ඔවුනට සාධාරණ විය යුතු ය. එම නිසා දැනට හඳුන්වා දී තිබෙන සමහර අසාධාරණ දඩ ගැසීම් ක්‍රම සහ අසාධාරණ බදු වර්ග ගැන යළි සොයා බලා සංශෝධනය කිරීමට පියවර ගනු ලැබේ.

### දුම්රිය සේවා

- පවතින තත්ත්වයෙන් දුම්රිය සේවාව ගොඩගැනීම සඳහා තාවකාලිකව දුම්රිය සහ දුම්රිය මාර්ග වැඩි දියුණුව සහ නඩත්තු පිළිබඳ වගකීම රජය විසින් දැරීමට සිදුවේ. ඉන් අනතුරුව කාර්යක්ෂම සහ සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාමේ වගකීම දුම්රිය දෙපාර්තමේන්තුවට පැවරෙන නව ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇත.
- පානදුර - කොළඹ - වේයන්ගොඩ, රාගම - කටුනායක - මීගමුව සහ මරදාන - හෝමාගම යන දුම්රිය සේවා සඳහා විදුලි දුම්රිය පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කර සාමාන්‍ය දුම්රිය සේවාවට අමතරව සුඛෝපභෝගී කාර්යාලීය දුම්රිය සේවයක් ආරම්භ කෙරේ.
- දුම්රිය සේවාව නවීකරණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද සහ ඩිජිටල්කරණය හඳුන්වා දෙමින් දුම්රිය ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සහ ආසන වෙන් කිරීම සඳහා ඔන්ලයින් සේවාවක් සහ ඊ-ප්‍රවේශපත්‍ර සහ ස්වංක්‍රීය ඇතුළුවීමේ-පිටවීමේ දොරටු ක්‍රමයක් ද හඳුන්වා දෙනු ලැබේ.
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය දුම්රිය එන්ජින් ආනයනය කිරීම සහ දුම්රිය තට්ටු දේශීයව ඉදිකිරීමේ ක්‍රමවේදයක් සකස් කරන අතර කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරේ යන වරායවලට දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කෙරෙනු ඇත.
- දුම්රිය ස්ථාන හා බැඳුණු ප්‍රධාන නගරවල ඇති දුම්රිය ඉඩම් භාවිතයට ගෙන සාප්පු සංකීර්ණ, මූල්‍ය සේවා, හෝටල්, කාර්යාල සිනමා ශාලා, විනෝද මධ්‍යස්ථාන සහ තට්ටු නිවාස ආදියෙන් සමන්විත වාණිජ මධ්‍යස්ථාන බවට පත්කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර දුම්රිය සේවාවේ ආදායම් ඉහළ නංවන වැඩපිළිවෙළක් සකස් කෙරේ.

## වරාය සහ ගුවන් සේවා

- කොළඹ - කටුනායක සහ හම්බන්තොට - මත්තල ගුවන් හා නාවික මගී සහ භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථාන දෙකක් ලෙස සංවර්ධනය කෙරෙනු ඇත.
- දේශීය සහ විදේශීය ආයෝජකයන්ට නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කිරීම සඳහා කොළඹ - කටුනායක සහ හම්බන්තොට - මත්තල කලාප දෙකෙහි නිදහස් ආයෝජන කලාප දෙකක් ආරම්භ කරන අතර මෙම කලාපවල ප්‍රමුඛතාව මධ්‍ය පරිමාණ දේශීය ව්‍යවසායකයින්ට ලබාදීමට කටයුතු කරනු ලැබේ.

### කොළඹ වරාය

- කොළඹ වරායේ ප්‍රතිඅපනයන බහාලුම් පර්යන්ත ප්‍රමාණය ඉහළ නංවන ජාත්‍යන්තර මගී පර්යන්තයක් අලුතින් ආරම්භ කර දැනට මෙහෙයුම් නොකරන නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් නොපමා ව ආරම්භ කර එහි ඉතිරි කොටස නොපමා ව ඉදිකරනු ඇත. බටහිර පර්යන්තයේ ඉදිකිරීමේ කටයුතු පෞද්ගලික ආයෝජන ද යොදා ගනිමින් ආරම්භ කරනු ලැබේ. නැගෙනහිර පර්යන්තය සහ SAGT අතර කොටසෙහි නව පර්යන්තයක් ඉදිකිරීමේ සඳහා ඇති ශක්‍යතාව අධ්‍යයනය කෙරේ.
- ප්‍රධාන මාර්ගවල බහාලු ප්‍රවාහනය නිසා ඇතිවන මාර්ග තදබදයත් එම තදබදය වැලැක්වීම සඳහා පනවා ඇති සීමාවන් නිසාත් බහාලු ප්‍රවාහනයට ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීමටත් දුම්රිය මාර්ග ආශ්‍රිත ව බහාලු මධ්‍යස්ථාන තුනක් පෑළියගොඩ, වේයන්ගොඩ සහ රත්මලානේ නොපමාව ස්ථාපනය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

### හම්බන්තොට වරාය

- හම්බන්තොට වරාය ගිවිසුම සංශෝධන කිරීමට චීන රජය සමඟ රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා නොපමාව ආරම්භ කිරීමට කටයුතු යොදනු ලැබේ.
- හම්බන්තොට වරාය ජාත්‍යන්තර කාර්මික සහ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය කොට නෞකාවලට අවශ්‍ය ඉන්ධන, ආහාර, නඩත්තු සහ අනෙකුත් සේවා සැපයීම සඳහා දේශීය ව්‍යාපාරිකයන්ට අවශ්‍ය පහසුකම් සපයනු ඇත.
- හම්බන්තොට ආයෝජන කලාපයට අවශ්‍ය සියලු ම භෞතික සම්පත් සැපයීමට කටයුතු කෙරේ.
- ගාල්ල, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමල වරායන් කලාපීය අවශ්‍යතාවන්ට සහ ජාතික ආර්ථික කොරිඩෝවලට ගැළපෙන ආකාරයට ප්‍රති සංවිධානය කෙරෙනු ඇත.

### ගුවන්තොටුපොළ සංවර්ධනය

- කටුනායක ගුවන් තොටුපොළේ දෙවන ගුවන් පථය සහ දෙවන මගී පර්යන්ත ගොඩනැගිල්ලේ කටයුතු නොපමා ව ආරම්භ කර අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය වර්ධනය කිරීම සඳහා දේශීය මගී පර්යන්තයන් අලුතින් ඉදිකිරීම ආරම්භ කෙරේ.
- ජාත්‍යන්තර ගුවන් සමාගම් සමඟ සාකච්ඡා කර මත්තල ගුවන් තොටුපොළේ ගුවන් මෙහෙයුම් ආරම්භ කරන අතර මත්තල ගුවන්තොටුපොළේ සහය ගුවන් පථය (Taxi Way) සහ භාණ්ඩ පර්යන්තයක් ඉදිකිරීමට කටයුතු යොදනු ලැබේ.
- සියලු අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය අරමුණු කරගෙන සංවර්ධනය කරන අතර නුවරඑළියට කුඩා ගුවන් තොටුපොළක් ඉදිකිරීමට කටයුතු කෙරේ.

## පුනර්ජනනීය බලශක්තිය පෙරමුණට

මේ වන විට සිදුවෙමින් පවතින දේශගුණික විපර්යාසය නිසා ගල් අඟුරු සහ ඛනිජ තෙල් වැනි පොසිල ඉන්ධන අතහැර මුළුමහත් ලෝකයම පුනර්ජනනීය බලශක්තිය වෙත මාරුවෙමින් තිබේ. ශ්‍රී ලංකාවේද අනාගත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමගම බලශක්තිය සඳහා ඇති ඉල්ලුම තවදුරටත් ඉහළ යනු ඇති අතර අප ද උදාකර ගත යුත්තේ අනාගත පරපුරට ප්‍රතිඵල භුක්ති විදිය හැකි තිරසාර සංවර්ධනයක් නිසා බලශක්ති ක්ෂේත්‍රය තුළ හැකිතාක් දුරට පුනර්ජීව බලශක්ති ප්‍රභවයන් භාවිතා කළ යුතුය. ඒ නිසා 2030 වන විට රටේ සමස්ත බලශක්ති අවශ්‍යතාවය උපරිමයෙන් පුනර්ජනීය ප්‍රභවයන්, ජල විදුලිය සහ  ස්වභාවික වායු භාවිතයෙන් පරිසර හිතකාමීව නිෂ්පාදනය කිරීමට අවශ්‍ය බල ශක්ති සැලසුම අපි සකස් කරන්නෙමු.

- ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව හා ස්වයංපෝෂිතත්වය අපගේ ප්‍රධානතම ප්‍රතිපත්තිමය සහ උපාය මාර්ගික අරමුණක් වන අතර ඒ සඳහා අප උපරිම වශයෙන් කැප වෙනු ඇත.
- ශ්‍රී ලංකාව ආශ්‍රිත මුහුදු කලාපයේ ඛනිජ තෙල් ගවේෂණය ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලු පියවර නොපමාව ගැනීමට අප කල්පනා කරන අතර දැනට හදුනාගෙන ඇති ස්වභාවික වායු නිධි රටේ ජනතාවගේ පරිභෝජනයට ගත හැකි ආකාරයේ වැඩපිළිවෙළක් වසර 3 තුළ දී ස්ථාපනය කෙරේ.
- වසර 40 කටත් වඩා පැරණි කොලොන්නාවේ තෙල් පිරිපහදුව කඩිනමින් නවීකරණය කර ධාරිතාව ඉහළ නැංවීමට කටයුතු කරන අතර ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගනු ලැබේ.
- දැනට පවතින සැලසුම අනුව 2020 දී බ්‍රෝඩ්ලන්ඩ් බලාගාරයත්, 2021 දී උමා ඔයත්, 2023 දී මොරගොල්ල බලාගාරයත්, 2024 දී තලපිටිගල සහ සීතාවක ගඟ බලාගාර යන ජලවිදුලි බලාගාර හරහා ඉදිරි සිව්වසර තුළදී මෙගාවොට් 230 ක පමණ විදුලිබල නිපදවනු ඇත.
- කැලණිතිස්ස බලාගාරය නොපමා ව ස්වභාවික ගෑස් ටර්බයින් ආශ්‍රිත බලාගාරයක් බවට පත් කිරීමටත් 2023 ට පෙර හම්බන්තොට සහ කෙරවලපිටියේ ද එවැනි බලාගාර 2 ක් ආරම්භ කිරීමට කටයුතු යොදන අතර පරිසර හිතකාමී ප්‍රතිපත්තිය යටතේ ඉදිරි සහ වසර තුළ කොළඹ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල ඉන්ධන ආශ්‍රිත බලශක්ති උත්පාදන බලාගාර ස්වභාවික ගෑස් (LNG) වලට මාරු කිරීම අපගේ සැලසුම වේ.
- බාධාවකින් තොරව විදුලිය ලබාදීම සඳහාත් පුනර්ජනනීය බලශක්තියට ඉහළ ඉඩකඩක් ලබාදීම සඳහාත් ලංකාවේ දැනට පවතින සාම්ප්‍රදායික විදුලි සම්ප්‍රේක්ෂණ පද්ධතිය වෙනුවට වඩාත් කාර්යක්ෂම සාම්ප්‍රේක්ෂණ පද්ධතියක් (Smart Grid) සහ බලාගාර කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට පියවර ගැනේ.

### පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට මාරුවීම

- 2021 ට පෙර මන්නාරම් දූපතෙහි මෙගාවොට් 100 ක මහා පරිමාණ සුළං බලාගාරය පද්ධතියක් රජය මගින් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වයෙන් මන්නාරම, පූනරින් සහ මොණරාගල වැනි ප්‍රදේශ ඇතුළු දිවයින පුරා විවිධ පරිමාණයේ සුළං බලශක්ති ව්‍යාපෘතියක් ආරම්භ කර ඉදිරි දශකය තුළ මෙගාවොට් 800 සූර්ය බලශක්තියක් රටේ බලශක්ති නිෂ්පාදනයට අලුතින් එක් කිරීමට සැලසුම් කෙරේ.
- ඉදිරි වසර 5 තුළ නිවාස කාර්යාල සහ කර්මාන්තශාලා වහලවල් මත සවිකරන සූර්ය කෝෂ මාර්ගයෙන් සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීමට වැඩි අවධානයක් යොමු කෙරේ. ඒ සඳහා වැයවන සම්පූර්ණ ආයෝජනයම සහන පොලී බැංකු ණය ක්‍රමයක් යටතේ ලබාදීමට කටයුතු කරන අතර, තවද එම බලශක්තිය තම පරිභෝජනයට යොදා ගැනීමෙන් පසුව ඉතිරිය ජාතික බලශක්ති ප්‍රවාහයට එක් කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ඇත.
- දැනට විවිධ හේතූන් මත සුළං හෝ සූර්ය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික ව්‍යවසායකයින්ට ඇති වී තිබෙන බාධා ඉවත්කොට ඒ සඳහා අවශ්‍ය සියලු දිරි ගැන්වීම් රජය මගින් ලබාදීමට කටයුතු කෙරේ.
- සෑම පළාතකම නාගරික අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්ති නිෂ්පාදන වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබේ.
- රටේ සියලු ගොඩනැගිලි ඉදිකිරීමේදී බලශක්ති නාස්තිය අවමවන ආකාරයට සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීතිරීති හඳුන්වා දෙනු ලැබේ.

# භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය

## ජල සම්පත

වර්තමානයේ සිදුවෙමින් පවතින ගෝලීය දේශගුණික වෙනස්කම් නිසා අතීතයේ මෙන් නිසි කලට වසින වැසි අපේක්ෂාවෙන් අනාගතය සඳහා අපේ ආර්ථිකය සැලසුම් කිරීමට නොහැකි ය. එම නිසා ජලය අප විසින් සුරැකිය යුතු වස්තුවක් බවට පත් වී තිබේ. කෘෂි කටයුතු සඳහා අධික රසායනික පොහොර සහ රසායන ද්‍රව්‍ය යෙදීම වැනි මිනිස් ක්‍රියාකරකම් නිසා ගංගා ඇළ දොළ සහ ස්වභාවික ජලමූලාශ්‍ර අපවිත්‍රවීමෙන් ජල සම්පත දූෂණය වී තිබේ. සෝදා පාලුව ඉහළයාම නිසා ගංවතුර වැනි තත්වයන් ද ඇති වී ඇත. මේ සියල්ල නිසා “සැමට ජලය” (Water for All) ව්‍යාපෘතිය අප හඳුන්වා දෙන්නේ සියලු ජල මූලාශ පවිත්‍ර කොට විධිමත් සැලැස්මක් යටතේ සියලු දෙනාටම පානීය ජලය සහ වාරි ජලය සපයා දීමට ය.

- ශ්‍රී ලංකාවේ පවතින සියලු ගංගා ඇළ දොළ සහ ජලපෝෂක ප්‍රදේශ පිරිසිදු කොට සංරක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන්, තරුණයන් ඇතුළු පුළුල් ජනතා සහභාගීත්වයෙන් වසරක වැඩසටහනක් ක්‍රියාත්මක කර අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ වගකීම ප්‍රදේශයේ පදිංචිකරුවන් සහ ප්‍රජා පොලිස් සේවය ඒකාබද්ධ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ඇත.
- ගංගා ද්‍රෝණි ඇළ ඉවුරු වැව් තාවුලු පිරිසිදු කොට වාරි ජලය සංරක්ෂණය කිරීමේ කඩිනම් වැඩපිළිවෙළක් ආරම්භ කරනු ලැබේ.
- වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් සහ ජලාශවල ධාරිතාව ඉහළ නැංවීමත් අලුතින් වැව් සහ ජලාශ පද්ධතියක් ගොඩනැගීමට පියවර ගන්නා අතර කෘෂිකර්මාන්තයේදී ජලය කාර්යක්ෂමව සහ අරපිරිමැසුම් භාවිතය සඳහා දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් හඳුන්වා දෙන අතර ඒ සඳහා අවශ්‍ය ආයෝජන සඳහා සහන පොලී ණය මුදලක් සහ බදු සහන ලබාදීමට පුමුඛතාව දක්වනු ලැබේ.
- කෘෂිකාර්මික බිම්වලින් ගංගා, ඇළදොළල වැව් සහ ජල මූලාශ්‍රවලට රසායනික ද්‍රව්‍ය හෝ මිනිසුන්ට ගහකොළට හෝ සතා සීපාවාට අහිතකර වෙනත් ද්‍රව්‍ය එක්වීම වැළැක්වීම සඳහා නව ක්‍රමවේදයක් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන අතර එම වැඩපිළිවෙල දැනට වකුගඩු සහ පිළිකා වැනි රෝග බහුලව පැතිරී ඇති ප්‍රදේශවලින් ආරම්භ කෙරේ.
- භූගත ජල ධාරිතාව ප්‍රමාණවත් නොවීම නිසා අභ්‍යන්තර පාංශු තට්ටුවල දැඩි වියළී යාමක් සිදුවී ඇත. එම නිසා පාංශුල ජල සහ තිරසාර පරිසර සංරක්ෂණ ක්‍රියා මාර්ගයක් ලෙස අපතේ යන වැසි ජලයෙන් භූගත ජල ධාරිතාව ඉහළ නැංවීම සඳහා අලුතින් ඉදිකරන සෑම නිවසකටම වැසි ජලය ගබඩා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කෙරෙනු ඇත. ඉදිරි වසර 5 තුළ එම වැඩසටහන සෑම නිවසකටම හඳුන්වාදීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයේ.
- අධික වර්ෂාවත් සමග කැලණි, කළු, ගිං සහ නිල්වලා ගංගා ආශ්‍රිත ව දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගංවතුර ගැටළුව නිසාත් වියළි කලාපයේ ජල හිඟය නිසාත් වාර්ෂිකව සිදුවන ජීවිත, දේපොළ, වගා හානි සහ අපතේ යන සළුළතා පැය ගණන නිසා වාර්ෂිකව බිලියන් ගණනක් මුදල් වැය කිරීමට සිදු වී තිබේ. එම මුදල වැයකර ගංවතුර පාලනය කිරීම සඳහාත්, ජල ඌන ප්‍රදේශවලට ගෙනයාම සඳහාත් ගබඩා කිරීම, පොම්ප කිරීම, නව ඇල මාර්ග සහ නල මාර්ග සහිත ක්‍රමවේදයක් පිළිබඳ වර්ෂයක් තුළ අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කිරීමට විෂය ප්‍රාමාණිකයින් ගෙන් සැඳුම්ලත් කමිටුවක් පත්කරන අතර එම වැඩසටහන 2025 ට පෙර ක්‍රියාත්මක කෙරේ.
- සැමට පිරිසිදු පානීය ජලය සැපයීම ඕනෑම රජයක වගකීම වන අතර ඒ සඳහා දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින පානීය ජල සැපයුම් ජලසම්පාදන මණ්ඩලයේ හා ප්‍රජාජල ව්‍යාපෘති වඩාත් පුළුල් කොට කාර්යක්ෂම කිරීමෙන් පැය 24 පුරාම රටේ සියලු නිවාස වලට පිරිසිදු පානීය ජල පහසුකම් ලබාදීම ඉදිරි වසර 3 ඇතුළත සම්පූර්ණ කරන අතර සෑම වාණිජ සහ කාර්මික ඉදිකිරීමකදීම නිවැරදි ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම සඳහා නව නීති ප්‍රතිපාදන ගෙන එනු ඇත.

## ආපදා කළමනාකරණය

මානව ක්‍රියාකාරකම් නිසා ඇති වන ආපදා වළක්වා ගන්නා අතර ම ස්වභාවික ආපදා කල්තබා නිවැරදිව හඳුනාගෙන එයින් සිදුවෙන හානිය අවම කර ගැනීම රජයක වගකීමයි. එමෙන්ම කිසියම් ආපදාවක් සිදුවන විට එමඟින් සිදුවන හානිය අවමකර ගැනීමටත් හානියටපත් වූවන් නගාසිටුවීටත් භෞතික දේවල් යළි ස්ථාපනය කිරීමටත් නොපමාව ක්‍රියාකළ යුතුය. ආපදා කළමනාකරණයේ හරය නම් එයයි. ඒත් අපේ රටේ පවතින නීතිරීති සහ ආයතනික ව්‍යුහයන් මෙම හරය සමග කොතෙක් දුරට ගැළපෙන්නේද යන්න ගැටලු සහගත බැවින් ඒ පිළිබඳව නිවැරදිව සොයා බලා පිළියම් යොදනු ඇත.

- දිවයිනේ දිස්ත්‍රික්ක බොහෝ ප්‍රමාණයක ප්‍රධානම ගැටළුවක් බවට පත් වී ඇති අලි මිනිස් ගැටුම මගින් ජනතාවට සිදුවෙන ජීවිත දේපොළ සහ වගා හානි නතර කිරීම සඳහා තිරසාර විසඳුමක් ලබා දෙනු ඇත. ඒ යටතේ;
  - කෙටිකාලීන විසඳුමක් ලෙස දැනට නවතා දමා ඇති අලි වැට ඉදි කිරීමේ ව්‍යාපෘතිය නොපමා ව ආරම්භ කරන අතර අලි ගම්වැදීම නවතා දැමීම සඳහා වඩාත් නවීන තාක්ෂණික ක්‍රමවේදයක් නොපමාව හඳුන්වා දෙනු ලැබේ.
  - වන සතුන් සංරක්ෂණය සඳහා වෙන්කර ඇති වනජීවී භූමි ප්‍රදේශයන් සහ එම සතුන්ගේ ජලය ආහාර හා ස්වභාවික පරිසරය ආරක්ෂා කොට අලි මංකඩවල්වල ඇති බාධා ඉවත් කර අලින්ට පහසුවෙන් යාම්ඊම් කිරීමේ පහසුව සලසනු ඇත.
  - වන සතුන් මගින් ගම්මාන වල වැසියන්ට සිදුවන හානි අවමකර ගැනීම සඳහා ක්‍රියාත්මක වන සාර්ථක වැඩසටහන් වලට රජයෙන් ආධාර සපයන අතර අලි ප්‍රහාරවලින් බිඳවැටී ඇති සියළුම නිවාස රජයේ වියදමෙන් ඉදිකර දෙන අතර මරණයට පත් වූ සහ ආබාධිතවූවන් සඳහා වන්දි ගෙවීමේ වැඩපිළිවෙල වඩාත් කාර්යක්ෂම කරනු ඇත.

- ආපදා කළමනාකරණය වඩා පහසු කිරීම සඳහා 47 අංක 35 දරණ ව්‍යසන කළමනාකරණ පනත සහ ඊට අනුශාංගික සියලු අණපනත් සංශෝධනය කරන අතර ආපදා තත්ත්වයන් පිළිබඳව ඉතාමත් නිවැරදිව පුරෝකථනය කිරීමට හැකිවන පරිදි නූතන තාක්ෂණික මෙවලම් සහ උපකරණවලින් යුතුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සම්පූර්ණ නවීකරණයකට ලක් කෙරෙනු ඇත.

- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට අවශ්‍ය පහසුකම් මෙන්ම අවශ්‍ය සම්පූර්ණ නීතිමය බලයත් ලබාදීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය ඒකාබද්ධකර “ආපදා කළමනාකරණ අධිකාරියක්” ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතට පත්කෙරේ.

- ආපදාවන්ට ලක් වූ ප්‍රදේශ, නිතර ආපදාවට ලක්වන සහ ආපදා අවදානම සහිත ප්‍රදේශ, පුද්ගලයින්, ගොඩනැගලි, ව්‍යාපාර සහ කෘෂි ඉඩම් ආදි සියලු තොරතුරු ඇතුළත් ‘ජාතික ආපදා දත්ත ගබඩාවක්’ගොඩනගනු ඇත.

- පවතින රජයේ වැරදි සහ නොසැලකිලිමත් කළමනාකරණය නිසා උමාඔය සහ වෙනත් එවැනි සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිත ව හානියට පත් වූ පුද්ගලයින්, නිවාස සහ වෙනත් දේපොළ, ඉඩම් හෝ වගා බිම්වලට සිදු වූ හානි නිවැරදිව තක්සේරු කර නොපමා ව වන්දි ගෙවීමට කටයුතු කෙරේ.

- නිතර ආපදාවන්ට භාජනය වන ප්‍රදේශවල ජනතාව එවැනි අවස්ථාවලදී රජයේ ගොඩනැගිලි සහ විහාරස්ථාන ආදියෙහි තාවකාලිකව රඳවා තැබීම් නිසා එම ආයතනවලටත් ආපදාවට ලක්වූවන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට සහ දරුවන්ට විඳීමට සිදුවන විවිධ දුෂ්කරතා අවම කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් යටතේ අවශ්‍ය පහසුකම් සහිත ව රැකවරණය ලබාදීමට හැකි ස්ථිරව ඉදිකරන ‘රැකවරණ මධ්‍යස්ථාන ක්‍රමයක්’ ස්ථාපිත කර ආපදා රහිත කාලවලදී ඒවා තාවකාලිකව කුලියට ලබාදීමෙන් ඒවායේ නඩත්තු සඳහා අවශ්‍ය වියදම උපයා ගැනීමේ ක්‍රමයක් සලසනු ඇත.





# තිරසාර පරිසර ප්‍රතිපත්තියක්

අටවන කොටස

# තිරසාර පරිසර ප්‍රතිපත්තියක්

***ජෛව ගෝලය කෘතිම වෙනස් කිරීමකට හෝ බලපෑමකට ලක් කිරීමෙන් පරිසරයේ සමබරතාවය බිඳවැටීම සැලකෙන්නේ පරිසර දූෂණයක් ලෙස ය. වර්තමානයේ සිදුවන බොහෝ මනුෂ්‍ය ක්‍රියාකාරකම් නිසා පරිසර පද්ධතියට සිදුවන විනාශය අති විශාල ය. එම නිසා අනාගත පරපුරට සුරක්ෂිත පරිසර පද්ධතියක් තුළ ජීවත්වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමේ වගකීම අපහට පැවරී තිබේ. තිරසාර පරිසර ප්‍රතිපත්තියක් යනු පරිසර සංරක්ෂණය පමණක් නොව සමබර වූ සමාජ, ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීම ය.***

### භූමිය

ශ්‍රී ලංකාවේ භූමිය භාවිතා කළ යුත්තේ ජනතාවගේ යහ පැවැත්ම සඳහා ය. මිනිසාට මෙන්ම අනෙක් සත්ත්වයින්ට භූමියට ඇති අයිතිය සුරක්ෂිත කරන භාරකාරයෙකු ලෙස රජය ක්‍රියා කළ යුතු ය. එලෙසටම තමන් වෙනුවෙන් හඬක් නැගිය නොහැකි කොට්ඨාශ, එනම් සත්ත්වයින් හා අනාගතයේ ඉපදීමට සිටින අනාගත පරම්පරාව සඳහා භූමිය ආරක්ෂා කරන භාරකාරයින් ලෙසට රජය ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා මූලිකවම ජාතික භෞතික සැලැස්මක් (National Physical Plan) යාවත්කාලීන කළ යුතු ය. පරිසර විද්‍යානුකූලව සකසන ලද කෘෂිකර්මය, සත්ව පාලනය හා වැවිලි කර්මාන්ත මගින් පරිසර විනාශය අවම කර ආර්ථික වාසි ලබාගත යුතු ය.

### කර්මාන්ත

කාර්මික ක්ෂේත්‍රයේ දැනට සිදුවන අමුද්‍රව්‍ය භාවිත කර භාණ්ඩ නිෂ්පාදනය කර අපද්‍රව්‍ය පරිසරයට බැහැර කරන රේඛීය ආර්ථික ක්‍රමය (Liner Economy) වෙනුවට එක් කර්මාන්තයක අපද්‍රව්‍ය, අනෙක් කර්මාන්තයන්හි අමුද්‍රව්‍ය ලෙස යොදාගත හැකි වෘත / චක්‍රීය ආර්ථික (Circular Economy) ක්‍රම වේදයක් ගොඩ නැගීමට පියවර ගනු ලැබේ. (Re-use, Re-cycle, Re-purpose). එමගින් පරිසර හිතකාමී කාර්මික කලාපී (Eco Industrial Zones) බිහි කොට හරිත ආර්ථිකයකට (Green Economy) මග විවෘත කෙරේ.

### කසල කළමනාකරණය

සෑම ආකාරයකම අපද්‍රව්‍ය මිනිසාගේ නිර්මාණයක් බව හඳුනා ගෙන අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම සඳහා ජනතාව පෙළඹැස්සීම අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ පළමු පියවර ලෙසට හඳුනා ගත යුතු ය. එහිදී අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම හා අපද්‍රව්‍ය නිශ්පාදනය කරන ප්‍රමාණය අවම කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම ක්‍රමෝපායන් යෙදිය යුතු අතර කුඩා කල සිටම තිරසාර පරිභෝජන සංකල්ප හඳුන්වා දීමට කටයුතු යොදනු ලැබේ.

### ජෛව විවිධත්වය

භූමි පරිභෝජන ප්‍රතිපත්ති හා ජල කළමණාකරන ප්‍රතිපත්ති වල තිරසාර බව තහවුරු කරන අතරතුරම ජාතික වන වැස්ම (Forest Cover) 30% දක්වා ඉහළ දැමීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ සඳහා යලි වන වගාවන් සිදු කිරීමට සුදුසු පරිසර නිසියාකාරව හඳුනා ගැනීමට නිශ්චිත ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### ජනාවාස හා නගර

ජනාවාස ඉදි කිරීමේදී මූලිකවම පරිසරයට අවම බාධාවක් සිදු වෙන ආකාරයට ස්ථාන තෝරා ගන්නා අතර දැනටමත් හඳුනාගෙන තිබෙන අවධානමට ලක්වී ඇති සංවේදී පරිසර කලාපවල කිසිදු ආකාරයක දැවැන්ත සංවර්ධනයක් සිදු නොකිරීමට පියවර ගැනේ.

### පාරිසරික අධ්‍යාපනය

වන සංරක්ෂණය ජල සංරක්ෂණය පාංශු සංරක්ෂණය වෙරල සංරක්ෂණය කසළ කළමනාකරණ බළශක්ති කළමනාකරණය ශබ්ද කළමනාකරණය වැනි පාරිසරික වගකීම් පිළිබඳ ජනතාවගේ දැනුවත් භාවය වර්ධනය කොට එහිලා ජනතා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කෙරේ.

## තිරසාර පරිසර ප්‍රතිපත්තියක්

ජෛව ගෝලය කෘතිම වෙනස් කිරීමකට හෝ බලපෑමකට ලක් කිරීමෙන් පරිසරයේ සමබරතාවය බිඳවැටීම සැලකෙන්නේ පරිසර දූෂණයක් ලෙස ය. වර්තමානයේ සිදුවන බොහෝ මනුෂ්‍ය ක්‍රියාකාරකම් නිසා පරිසර පද්ධතියට සිදුවන විනාශය අති විශාල ය. එම නිසා අනාගත පරපුරට සුරක්ෂිත පරිසර පද්ධතියක් තුළ ජීවත්වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමේ වගකීම අපහට පැවරී තිබේ. තිරසාර පරිසර ප්‍රතිපත්තියක් යනු පරිසර සංරක්ෂණය පමණක් නොව සමබර වූ සමාජ, ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීම ය.

පාරිසරික ප්‍රතිපත්ති මූලධර්ම හා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පහත ආකාරයට ස්ථාපනය කිරීම වැදගත් බව හඳුනාගෙන ඇත.

- රජය රටෙහි පවතින පරිසරය ආරක්ෂා කිරීමට සංරක්ෂණය කිරීමට හා ප්‍රතිෂ්ඨාපනය කිරීමට ක්‍රියා කෙරේ.
- රට සංවර්ධනය කිරීමේදී හුදු ආර්ථික සංවර්ධනය පමණක් නොව, තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු යෙදේ.
- පෞරාණික දේශීය සහ සාම්ප්‍රදායික දැනුම, නවීන විද්‍යාව හා තාක්ෂණය සමඟ ගළපා ගන්නා ආකාරය සහ භාවිතය නිරන්තරයෙන්ම ගවේෂණය කිරීමට කටයුතු යෙදේ.
- ජනතාවගේ යහපැවැත්තම, සෞඛ්‍යය, ආර්ථික සංවර්ධනය සහතික කිරීම සඳහා තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති හා බැඳුණු ක්‍රියාමාර්ග ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහය දක්වා සම්බන්ධීකරණය කෙරේ.
- දැනට රට තුළ පවතින සියලුම පාරිසරික ප්‍රතිපත්ති හා නීති රීති යාවත්කාලීන කෙරේ.

පහත සඳහන් එක් එක් ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති හා උපාය මාර්ග ඒ හා අනුරූප වන ආකාරයට වෙනස් විය යුතු වේ.

### භූමිය

- ශ්‍රී ලංකාවේ භූමිය භාවිතා කළ යුත්තේ ජනතාවගේ යහ පැවැත්ම සඳහා ය. මිනිසාට මෙන්ම අනෙක් සත්ත්වයින්ට භූමියට ඇති අයිතිය සුරක්ෂිත කරන භාරකාරයෙකු ලෙස රජය ක්‍රියා කළ යුතු ය. එලෙසටම තමන් වෙනුවෙන් හඬක් නැගිය නොහැකි කෝටිඨාශ, එනම් සත්ත්වයින් හා අනාගතයේ ඉපදීමට සිටින අනාගත පරම්පරාව සඳහා භූමිය ආරක්ෂා කරන භාරකාරයින් ලෙසට රජය ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා මූලිකවම ජාතික භෞතික සැලැස්මක් (National Physical Plan) යාවත්කාලීන කළ යුතු ය. පරිසර විද්‍යානුකූලව සකසන ලද කෘෂිකර්මය, සත්ව පාලනය හා වැවිලි කර්මාන්ත මගින් පරිසර විනාශය අවම කර ආර්ථික වාසි ලබාගත යුතු ය.
- සෝදාපාළුව, නායයාම් හා පස වියළීයාම වළක්වා ගැනීමේ පියවරක් ලෙස ඉහළ කඳුකරයේ වන ආවරණය නැවත ස්ථාපිත කිරීමට විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ. නායයාමේ ප්‍රදේශ වල නාය යාම පාලනය සඳහා අවශ්‍ය අධිතාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමට කටයුතු කෙරේ.
- වගුරුබිම් හා කඩොලාන පද්ධතීන් විනාශ කරන මානව ක්‍රියාකාරකම් පාලනය කර එම පද්ධතීන් සුරක්ෂිත කිරීමට නිසි පියවර ගනු ලැබේ.
- සෝදා පාළුව හෝ නිසරු වීම නිසා අතහැර දමා ඇති භූමි, කෘෂි වන වගාව ව්‍යාප්ත කිරීම සහ වන උද්‍යාන ඇති කිරීම සඳහා වෙනම වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ.

### කර්මාන්ත

කාර්මික ක්ෂේත්‍රයේ දැනට සිදුවන අමුද්‍රව්‍ය භාවිත කර භාණ්ඩ නිෂ්පාදනය කර අපද්‍රව්‍ය පරිසරයට බැහැර කරන රේඛීය ආර්ථික ක්‍රමය (Liner Economy) වෙනුවට එක් කර්මාන්තයක අපද්‍රව්‍ය, අනෙක් කර්මාන්තයන්හි අමුද්‍රව්‍ය ලෙස යොදාගත හැකි වෘත / චක්‍රීය ආර්ථික (Circular Economy) ක්‍රම වේදයක් ගොඩ නැගීමට පියවර ගනු ලැබේ. (Re-use, Re-cycle, Re-purpose). එමඟින් පරිසර හිතකාමී කාර්මික කලාප (Eco Industrial Zones) බිහි කොට හරිත ආර්ථිකයකට (Green Economy) මග විවෘත කෙරේ.

### කසල කළමනාකරණය

- සෑම ආකාරයකම අපද්‍රව්‍ය මිනිසාගේ නිර්මාණයක් බව හඳුනා ගෙන අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම සඳහා ජනතාව පෙළගැස්සීම අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ පළමු පියවර ලෙසට හඳුනා ගත යුතු ය. එහිදී අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම හා අපද්‍රව්‍ය නිශ්පාදනය කරන ප්‍රමාණය අවම කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම ක්‍රමෝපායන් යෙදිය යුතු අතර කුඩා කල සිටම තිරසාර පරිභෝජන සංකල්ප හඳුන්වා දීමට කටයුතු යොදනු ලැබේ.
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා දැනට ලංකාවට අයත් සහ ඒ අවට මුහුදු තීරයට සහ මුහුදු පත්ලට සිදු වී ඇති හානිය නිසා සාගර සම්පත්වලට සිදුවන විනාශය වළක්වා ගැනීම සඳහා සමුදුරු පවිත්‍රතා වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- කාර්මික සහ ගෘහස්ථ කැලිකසල වර්ගීකරණය කර බැහැර කිරීම අනිවාර්ය කරන අතර ඒ පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා පළාත් පාලන ආයතන සමග එක්ව පුළුල් ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගණ හා සනීපාරක්ෂක කසළ රඳවනයන් ස්ථාපනය කොට අක්‍රමවත් කසළ බැහැර කිරීම් වළක්වාලීමටත් කටයුතු සම්පාදනය කෙරේ.
- රෝහල් සහ කර්මාන්තශාලා අපද්‍රව්‍යල තාක්ෂණික සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරන අතර වගකීම් රහිත කසළ බැහැර කිරීම්වලට එරෙහි ව දැඩි පියවර ගනු ලැබේ.

# තිරසාර පරිසර ප්‍රතිපත්තියක්

## වායු ගෝලය

- කාබන් හා විෂ වායු වායුගෝලයට මුදාහැරීම පාලනය කිරීමට අවශ්‍ය නියාමන විධිවිධාන හඳුන්වා දෙන අතර ඒ සමඟම ස්වාභාවික වායු ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාලිය නැවත බලගැන්වීම සඳහා කර්මාන්ත ශාලා රැක් වගා තීරු, නාගරික රැක් ගොමු, මගදෙපස රුක් රෝපණය, තුරු උයන් හා ගෘහාශ්‍රිත කෘෂි වන වගා දිරිගැන්වීමට පියවර ගනු ලැබේ.
- විදුලිය නිෂ්පාදනය සඳහා පොසිල ඉන්ධනද භාවිතය සීමා කිරීම හරහා කාබන්හරණය (de-carbonization) සිදු කිරීම වේගවත් කර ඒ හරහා ප්‍රවාහනය කර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීමේදී කාබන්හරණය දිරිගන්වනු ලැබේ. එමෙන්ම කාබන් ශූන්‍ය (Net-Zero) රටක් ඇතිකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## ජෛව විවිධත්වය

- ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම එක් ආයතනයක් යටතට පැවරීමට කටයුතු යෙදේ.
- භූමි පරිභෝජන ප්‍රතිපත්ති හා ජල කළමණාකරන ප්‍රතිපත්ති වල තිරසාර බව තහවුරු කරන අතරතුරම ජාතික වන වැස්ම (Forest Cover) 30% දක්වා ඉහළ දැමීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ සඳහා යලි වන වගාවන් සිදු කිරීමට සුදුසු පරිසර නිසියාකාරව හඳුනා ගැනීමට නිශ්චිත ක්‍රියාමාර්ග ගනු ලැබේ.
- නාගරික සහ අර්ධ නාගරික වනෝද්‍යාන ඇතිකිරීම, අධිවේගී මහාමාර්ග දෙපස වනතීරු සංවර්ධනය කිරීම රාජ්‍ය සහ පෞද්ගලික ආයතන තුළ මෙන්ම කර්මාන්ත ශාලා පිහිටි ඉඩම් තුළ වන වගා කිරීම හරහා රටපුරා වන වගාව ප්‍රචලිත කිරීමට කටයුතු කෙරේ.
- ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම යනු එය හුදෙක් සංරක්ෂණය කිරීම පමණක් නොව නව්‍යකරණ ක්‍රමවේදයක් හරහා රටේ ආර්ථික ප්‍රගමනයට යොදා ගැනීම ය. ආහාර ඖෂධ සංචාරක, අධ්‍යාපනික හා සංස්කෘතිකමය අංග සඳහා ජෛව විවිධත්වය වඩා සැලසුම්ගත හා විධිමත් පාලනයක් යටතේ රටේ ආර්ථික ප්‍රගමනයට යොදා ගැනීමට කටයුතු යෙදේ.
- ස්වභාවික පරිසර පද්ධති සංරක්ෂණය කරන අතර හානියට ලක්වූ පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය කෙරේ.

## සමුද්‍රීය සම්පත්

නීලහරිත ආර්ථිකයක් මගින් සාගර සම්පත් ක්‍රමානුකූල තිරසාර ක්‍රමවේදයක් අනුව භාවිත කරනු ලැබේ. සමුද්‍ර විශ්ව විද්‍යාලය අන්තර්ජාතික මට්ටමට රැගෙන යායුතු අතර සාගර ගවේෂණය සඳහා ප්‍රමුඛස්ථානයක් ලබාදීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. දිවයිනේ හඳුනාගත් ප්‍රදේශ වල වේගයෙන් සිදුවන සමුද්‍ර ඛාදනය වැළැක්වීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## ජනාවාස හා නගර

- ජනාවාස ඉදි කිරීමේදී මූලිකවම පරිසරයට අවම බාධාවක් සිදු වෙන ආකාරයට ස්ථාන තෝරා ගන්නා අතර දැනටමත් හඳුනාගෙන තිබෙන අවධානමට ලක්වී ඇති සංවේදී පරිසර කලාපවල කිසිදු ආකාරයක දැවැන්ත සංවර්ධනයක් සිදු නොකිරීමට පියවර ගැනේ. එමෙන්ම දීර්ඝකාලීන සැලැස්මකට අනුව එක් එක් දිස්ත්‍රික්කය සඳහා උපාය මාර්ගික පාරිසරික විශ්ලේෂණයන් (SEA - Strategic Environmental Assessment) සිදු කර හැකිතාක් දුරට කලාප හඳුනාගෙන (Zoning) බෙදා වෙන්කරනු ලැබේ.
- එහිදී ඉඩම් හා බැඳුණු ආර්ථික සංකල්ප (Land Based Economy - සෑම අයෙකුටම බිම් අඟලක්) බන්ධනය කළ යුතු අතර ජනාවාස ඉදිකිරීම කළ යුතු වන්නේ අසල්වාසී මූලධර්ම (Neighborhood Principle) හා ඉහලට නැගෙන හරිත සංවර්ධනය (Vertical Green Development) යන සංකල්පය යටතේ වේ.
- මෙසේ ගොඩ නැගෙන ජනාවාසය හරිත මෙන්ම සුහුරු නගරයක් (Green and Smart City) විය යුතු අතර සියලුම යටිතල පහසුකම් හා සේවාවන් ඒකාබද්ධ කිරීම වැදගත් වේ. එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ඉදිකෙරෙන ගම්මාන ස්වාභාවික ව්‍යසනයන්ට ඔරොත්තුදෙන ගම්මාන (Disaster Resilient Villages) ලෙස සකස් කිරීමට කටයුතු යෙදේ.
- අක්‍රමවත් හා අනවසර වැලි ගොඩදැමීම නිසා සිදුවන බරපතල පාරිසරික හානිය අවම කිරීම සඳහා ගංගා හා භූගත වැලි ලබා ගතහැකි ස්ථාන හඳුන්වා දීමටත්, මුහුදු වැලි භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ඇති දුර්මත බැහැරකොට මුහුදු වැලි සෝදා භාවිතයට ගැනීමටත් නිසි වැඩපිළිවෙළක් සකස් කොට, ඊට තත්ත්ව සහතිකයක් නිකුත් කිරීමටත්, අදාල ආයතන ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණයක් ඇති කරනු ලැබේ.

## පාරිසරික අධ්‍යාපනය

- පංති කාමර තුල මෙන්ම, අත්දැකීම් පදනම් කරගත් විධිමත් හා අවිධිමත් පාරිසරික අධ්‍යාපනයක් මුල සිටම විෂය නිර්දේශයට එකතු කළ යුතු ය. පරිසර සංරක්ෂණය හරහා සිදුකෙරෙන ව්‍යවසායකත්ව පදනම් කරගත් ආර්ථික ව්‍යුහයන්ට (Eco Entrepreneurship) නොබියව ගමන් කිරීම සදහා ළමා හා තරුණ මනස හැඩගැසීම සදහා ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- වන සංරක්ෂණය, ජල සංරක්ෂණය, පාංශු සංරක්ෂණය, වෙරල සංරක්ෂණය, කසළ කළමනාකරණය, බළශක්ති කළමනාකරණය සහ ශබ්ද කළමනාකරණය වැනි පාරිසරික වගකීම් පිළිබඳ ජනතාවගේ දැනුවත් භාවය වර්ධනය කොට එහිලා ජනතා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කෙරේ.

- පාරිසරික නියාමනය පිළිබඳව දැනට පවතින සංකීර්ණතා දුරුකොට ඒ සඳහා සරල සහ පැහැදිලි කේන්ද්‍රිය යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබේ.




ගුණගරුක විනයගරුක
නීතිගරුක සමාජයක්

නමවන කොටස

# ගුණගරුක විනයගරුක නීතිගරුක සමාජයක්

***රටක සැබෑ සංවර්ධනය ඇති වන්නේ ආර්ථික සෞභාග්‍යය සමඟ අධ්‍යාත්මික සංවර්ධනයක් ද ඇති වන විටය. යම් පුද්ගයෙකු කොතරම් ධනධාන්‍ය, මිලමුදල් රැස්කළත් ඔහුගේ සිත පිරී ඇත්තේ බියෙන්, සැකෙන්, ඊර්ෂ්‍යාවෙන් සහ වෛරයෙන් නම් ඔහු සැබෑ ධනවතෙක් නොවේ. ඒ සඳහා ඔහුගේ සිත සතුටින් පිරී තිබිය යුතු ය. ගුණවත්කම්වලින් පොහොසත් විය යුතු ය. එකිනෙකා දෙස දයාවෙන් බලන, එකිනෙකාට ගරු කරන, එකිනෙකාට උදව් උපකාර කරන සමාජයක් බිහි වන්නේ එවිට ය. ඒ නිසා අපි පුරවැසියා ආර්ථික වශයෙන් පොහොසත් කරන අතර ම විනයගරුක ව හැසිරෙන, ගුණවත් පුද්ගලයෙකු බිහි කිරීම සඳහා නිබඳව කැප වෙන්නෙමු.***

## ආගම දහමට ප්‍රමුඛස්ථානය

සමාජයක් ගුණගරුක වන්නේ අධ්‍යාත්මික වශයෙන් පිරිපුන්, ආගමදහමට ළැදි පුරවැසියන් රටක බහුල වූ විට ය. ඒ සඳහා ශ්‍රී ලංකාව ගුණදහමින් පිරී රටක් බවට පත්ව ඇත්තේ චිරාත් කාලයක් තිස්සේ බුදුදහම ප්‍රමුඛස්ථානයේ තබා ගනිමින් හින්දු, කිතුනු සහ ඉස්ලාම් ආදී විවිධ ආගම් අදහන ජනතාව පවත්වාගෙන එන ආගමික සහජීවනය නිසා ය.

## ඉතිහාසය, පුරා විද්‍යාව සහ ජාතික උරුමයන්

රටක ඓතිහාසික උරුමය කියාපාන්නේ ඒ රටේ පෞඪත්වය සහ අනන්‍යතාවයයි. ඒවා සුරැකිව සංරක්ෂණය කොට අනාගත පරපුරට උරුම කරදීම සඳහා අප වෙත පැවරී අනුපයෙ වේ. අපි එම වගකීම ඉටු කිරීමට සපුරා බැඳී සිටින්නෙමු.

## නීතිය, සමාජ සාධාරණත්වය උදෙසා

නීතිය ශිෂ්ට සම්පන්න සමාජයක අත්තිවාරම වන අතර රටක නීතිය ක්‍රියාත්මක විය යුත්තේ ජනතාවගේ යහපත සඳහා ය. නීතියේ ආධිපත්‍යය යන සංකල්පයේ අරමුණ ශිෂ්ට සම්පන්න සමාජයක් ගොඩනැගීම වන හෙයින් කිසිදු විටක ප්‍රජාතන්ත්‍රවාදී රජය නීතියේ ආධිපත්‍යයට බලපෑම් නොකළ යුතු ය. එබැවින් අපගේ රජය නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමට සෑම විටම කැපවන අතර කිසිවෙකුටත් නීතියේ ආධිපත්‍යය අභියෝග කිරීමට ඉඩ නොතැබේ.

## පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක්

කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පවතින නිරෝගී ලක්ෂණයක් නම් අන්තර්ජාතික සම්මුතීන් විසින් පිළිගන්නා භාෂණයේ හා ප්‍රකාශනයේ ඇති නිදහස ය. ජනතාවට නිවැරදි දේශපාලන ආර්ථික සහ සමාජීය තීරණ ගැනීමට හැකි වන්නේ ඔවුන් නිවැරදි තොරතුරුවලින් හා දැනුමෙන් සන්නද්ධ වූ විට ය. ඒ සඳහා බාධා විරහිත ව තොරතුරු, දැනුම හා මතවාද සන්නිවේදනයට අවකාශ තිබිය යුතු බව අපි පිළිගන්නෙමු.

## සංස්කෘතිය, සාහිත්‍යය සහ කලාව

රටක්, සමාජයක් උසස් මට්ටමකට පත්වන්නේ එම රටේ පවතින සංස්කෘතිය නිසා ය. උසස් කලා කෘති සහ නිර්මාණ බිහි කරන ශිල්පීන් මෙන් ම රසඥතාව සහිත මිනිසුන් ද රටකට සම්පතකි. අපේ රට එවැනි උසස් සංස්කෘතියකට උරුමකම් කියන රටකි. අපගේ වගකීම එම සංස්කෘතිය හා කලා නිර්මාණ අනාගතයට රැගෙන යාමය.

## සමාජ ආරක්ෂණය සහ සුභසාධනය

සංවර්ධන ක්‍රියාවලියේ අතුරු ඵලයක් ලෙස ඇතිවන සමාජ අසමානතාව හැඳින්විය හැක්කේ පුද්ගල අනුබද්ධ ගැටලුවකට වඩා සමාජීය ගැටලුවක් ලෙසයි. ආර්ථික වශයෙන් රටක් කොතරම් සංවර්ධනයක් අත්පත් කර ගත්ත ද සමාජ අසමානතාව ඉහළ මට්ටමක පවතින්නේ නම් එහි අර්ථය එම රටේ විශාල පිරිසක් අසරණභාවයට සහ අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති බවය. රජයක වගකීම ඒ සියලු දෙනා ආරක්ෂා කිරීමයි.

## ගුණගරුක විනයගරුක සාධාරණ සමාජයක්

ආර්ථික වර්ධනයේ යහපත භෞතික සංවර්ධනය යි. එමඟින් පුද්ගලයාගේ, සමාජයේ හෝ රටේ ඇසිදිසි දියුණුව පෙන්නුම් කෙරේ. එහෙත් රටක සැබෑ සංවර්ධනය ඇති වන්නේ ආර්ථික සෞභාග්‍යය සමඟ අධ්‍යාත්මික සංවර්ධනයක් ද ඇති වන විටය. යම් පුද්ගයෙකු කොතරම් ධනධාන්‍ය, මිලමුදල් රැස්කළත් ඔහුගේ සිත පිරී ඇත්තේ බියෙන්, සැකෙන්, ඊර්ෂ්‍යාවෙන් සහ වෛරයෙන් නම් ඔහු සැබෑ ධනවතෙක් නොවේ. ඒ සඳහා ඔහුගේ සිත සතුටින් පිරී තිබිය යුතු ය. ගුණවත්කම්වලින් පොහොසත් විය යුතු ය. එකිනෙකා දෙස දයාවෙන් බලන, එකිනෙකාට ගරු කරන, එකිනෙකාට උදව් උපකාර කරන සමාජයක් බිහි වන්නේ එවිට ය. ඒ නිසා අපි පුරවැසියා ආර්ථික වශයෙන් පොහොසත් කරන අතර ම විනයගරුක ව හැසිරෙන, ගුණවත් පුද්ගලයෙකු බිහි කිරීම සඳහා නිබඳව කැප වෙන්නෙමු.

## ආගම දහමට ප්‍රමුඛස්ථානය

සමාජයක් ගුණගරුක වන්නේ අධ්‍යාත්මික වශයෙන් පිරිපුන්, ආගමදහමට ළැදි පුරවැසියන් රටක බහුල වූ විට ය. ඒ සඳහා ශ්‍රී ලංකාව ගුණදහමින් පිරි රටක් බවට පත්ව ඇත්තේ චිරාත් කාලයක් තිස්සේ බුදුදහම ප්‍රමුඛස්ථානයේ තබා ගනිමින් හින්දු, කිතුනු සහ ඉස්ලාම් ආදී විවිධ ආගම් අදහන ජනතාව පවත්වාගෙන එන ආගමික සහජීවනය නිසා ය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි වගන්තියේ සඳහන් වන ආකාරයට ම බුද්ධාගමට හිමි ප්‍රමුඛස්ථානය සහ බුද්ධ ශාසනය අප විසින් ආරක්ෂා කරනු ලැබේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අනෙකුත් වගන්තිවල සඳහන් වන ආකාරයට සියලු ආගම්වලට පිරිනැමෙන සියලු අයිතිවාසිකම් ආරක්ෂා කරදීමට රජයට පවරා ඇති වගකීම ද අපි නොපිරිහෙළා ඉටු කරන්නෙමු. සියලු ආගමික අන්තවාදයන්ට එරෙහි ව නොබියව පියවර ගන්නා අතර එමඟින් සෑම පුරවැසියෙකුට ම තමන්ගේ ආගම බියෙන් සැකයෙන් තොර ව ඇදහීමේ අයිතිය සහතික කෙරේ.
- දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන සහ නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා ශක්තිමත් දායක සභාවන් නොමැති සියලු විහාරස්ථාන සහ දසසිල් මාතා ආරාමවල ද සනීපාරක්ෂක පහසුකම්, ජලය, විදුලිය, ප්‍රවේශ මාර්ග වැනි සියලු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා "සසුන් උදාව" නමින් ජාතික වැඩසටහනක් ආරම්භ කෙරේ. ඒ යටතේ බුද්ධ ශාසන අරමුදල සහ මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් විහාරස්ථාන සහ දසසිල් මාතා ආරාමවල නඩත්තුව සහ සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා වැඩි දායකත්වයක් ලබාදීම සඳහා සක්‍රීය ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- ගමේ පන්සල භික්ෂූන් වහන්සේ සහ දායක සභාව කේන්ද්‍ර කරගත් සමාජ ආර්ථික සහ සාරධර්ම සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- තරුණ භික්ෂූන් වහන්සේගේ ඉංග්‍රීසි භාෂා දැනුම, පරිගණක සහ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා නව අධ්‍යාපන වැඩසටහනක් සකස් කරන අතර එම භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා මාසික අනුග්‍රාහක දායකත්ව ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- ඉතිහාසය පුරා මේ රටේ ආරක්ෂාව සහ සමාජ සුභ සිද්ධිය වෙනුවෙන් පෙනී සිටියේ භික්ෂූන් වහන්සේලාය. එම කාර්යය වෙනුවෙන් ශාසනයට තම දරුවන් භාරදුන් දෙමව්පියන් සියලු දෙනාට රාජ්‍ය ගෞරව දැක්වීම සඳහා "බුදුපුත් මාපිය හරසර" නමින් එම දෙමව්පියන් ඇගයීම සහ සහන සැලසීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- පිරිවෙන් අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ විශේෂ වැඩපිළිවෙළක් සකස් කොට එමඟින් පරිවේණාධිපති ස්වාමීන් වහන්සේගේ හා පිරිවෙන් සහ දහම් පාසල් ගුරුවරුන්ගේ නොවිසඳී ඇති පත්වීම්, වැටුප් සහ දීමනා පිළිබඳ ගැටලු නිරාකරණය කිරීමට පියවර ගැනේ.
- චිරාත්කාලයක් සාමකාමීව හා සහජීවනයෙන් ජීවත් වූ ශ්‍රී ලාංකේය සමාජය තුළ අන්තවාදයෙන් තොර සැබෑ දහම් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සෑම ආගමක ම ලියාපදිංචි දහම් පාසල්වල අඩුපාඩු සම්පූර්ණ කිරීමට පළාත් සභා සමඟ ඒකාබද්ධ වැඩසටනක් ආරම්භ කරනු ඇත.

## නීතිය, සමාජ සාධාරණත්වය උදෙසා

නීතිය ශිෂ්ට සම්පන්න සමාජයක අත්තිවාරම වන අතර රටක නීතිය ක්‍රියාත්මක විය යුත්තේ ජනතාවගේ යහපත සඳහා ය. නීතියේ ආධිපත්‍යය යන සංකල්පයේ අරමුණ ශිෂ්ට සම්පන්න සමාජයක් ගොඩනැඟීම වන හෙයින් කිසිදු විටක ප්‍රජාතන්ත්‍රවාදී රජය නීතියේ ආධිපත්‍යයට බලපෑම් නොකළ යුතු ය. එබැවින් අපගේ රජය නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමට සෑම විටම කැපවන අතර කිසිවෙකුටත් නීතියේ ආධිපත්‍යය අභියෝග කිරීමට ඉඩ නොතැබේ.

- පුරවැසියා මෙන්ම පාලකයා ද නීතියේ ආධිපත්‍යයට යටත් විය යුතු අතර එක රටක ක්‍රියාත්මක විය යුත්තේ එක නීතියක් පමණි. නීතිය සැමට සමාන විය යුතු අතර පුරවැසියා නීතියට මිස නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට හා පුද්ගලයන්ට බිය නොවන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන හා පුද්ගලයන් ද නීතියට යටත් වන පරිසරයක් නොපමා ව නිර්මාණය කෙරේ.
- යල් පැන ගිය නීති ක්‍රියාපටිපාටි හා අණ පනත් සංශෝධනය කොට අනාගතයට ගැළපෙන නීති පද්ධතියක් සකස් කරන අතර රටේ නීතිය ජාත්‍යන්තර නීතිය සමඟ මනාව ගැළපීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කරනු ලැබේ. .
- 2014 දී අපගේ රජය සැලසුම් කර තිබූ අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වර්ධනය කිරීමේ වැඩපිළිවෙළ වහාම ක්‍රියාත්මක කිරීම තුළින් සැලසෙන පහසුකම් මගින් අධිකරණ පද්ධතිය තුළ ඇති ප්‍රමාදවීම් වළක්වා ගැනීමට පියවර ගන්නා අතර සිවිල් ආරවුල් අධිකරණය දක්වා ගෙන නොගොස් විසඳා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීමට කටයුතු කරනු ඇත.
- නීතිය ක්‍රියාත්මක කිරීමේ පටිපාටි සහ යන්ත්‍රණය කාර්යක්ෂම කිරීම සඳහා අදාළ පුද්ගලයින්ට දේශීය හා විදේශීය පුහුණුව ලබාදීමට කටයුතු කරන අතර නීතිය ක්‍රියාත්මක කිරීමට සහාය වන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමට ද නොපමා ව කටයුතු කෙරේ.

# ගුණගරුක විනයගරුක නීතිගරුක සමාජයක්

- අධිකරණ පද්ධතිය සහ ඊට සම්බන්ධ ආයතනයක් අන්තර් සම්බන්ධීකරණය කරන ඩිජිටල් තාක්ෂණික අධිකරණ පද්ධතියක් ඇති කිරීමට පියවර ගැනේ.
- විනිශ්චයකාර තනතුරු සහ නීති ක්ෂේත්‍රයේ ඉහළ තනතුරු සඳහා පත්කිරීමේ දී සුදුසුකම්, ජ්‍යෙෂ්ඨත්වය සහ අත්දැකීම් මත පදනම් වී ක්‍රියාකරන පාරදෘෂ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ඇත.
- ජනාධිපති නීතිඥයන් පත්කිරීම සඳහා විනිවිදභාවයෙන් යුත් ඍජු ක්‍රමවේදයක් අගවිනිසුරු, නීතිපති, නීති විද්වතුන් සහ නීති සංගම්වල අදහස් විමසා බලා සකස් කරන අතර ඍජු අධිකරණ පද්ධතියක් ආශ්‍රිතව ම නීතිඥ වෘත්තිකයන්ගේ ගෞරවය ආරක්ෂා වන ආකාරයට රැකියාවේ යෙදීමට අවශ්‍ය පහසුකම් සපයනු ඇත.
- නූතන ලෝකයේ නීති වෘත්තිය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා අනුගමනය කරනු ලබන අඛණ්ඩ නීති අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අපගේ නීතිඥ වෘත්තිකයින්ට ලබාදීම සඳහා උසස් නීති අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.

## පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක්

කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පවතින නිරෝගී ලක්ෂණයක් නම් අන්තර්ජාතික සම්මුතීන් විසින් පිළිගන්නා භාෂණයේ හා ප්‍රකාශනයේ ඇති නිදහස ය. ජනතාවට නිවැරදි දේශපාලන ආර්ථික සහ සමාජීය තීරණ ගැනීමට හැකි වන්නේ ඔවුන් නිවැරදි තොරතුරුවලින් හා දැනුමෙන් සන්නද්ධ වූ විට ය. ඒ සඳහා බාධා විරහිත ව තොරතුරු, දැනුම හා මතවාද සන්නිවේදනයට අවකාශ තිබිය යුතු බව අපි පිළිගන්නෙමු.

- විසි එක්වැනි සියවසට ගැළපෙන සමාජයක් නිර්මාණය කරනු පිණිස භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස අප ඉහළින් ම පිළිගන්නා අතර ඒවා රැක ගැනීම පිණිස උපරිමයෙන් ක්‍රියා කෙරේ. ඒ සඳහා ජනමාධ්‍ය ආයතන හා එහි සේවයේ නියුතු වෘත්තීවේදීන්ගේ කාර්යභාරය සඳහා අවශ්‍ය නිවහල් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීම රජයේ වගකීම ලෙස සලකනු ඇත.
- ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සමකාලීන ගෝලීය වර්ධනය සමග ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රයට ඇති සබඳතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව මාධ්‍ය ප්‍රමිතිකරණය පිළිබඳව ඇති ජාතික හා අන්තර් ජාතික අණ පනත්, ජාතික හා අන්තර්ජාතික මාධ්‍ය ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වය සහ සමාජ සංස්කෘතික අනන්‍යතා යන ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානය යොමු කෙරේ.
- ජනමාධ්‍ය ප්‍රතිපත්ති සැලසුම්කරණයේ දී ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සංස්කෘතිය, සමාජය, පවුල හා මනුෂ්‍ය සබඳතා පිළිබඳ පිළිගත් සමාජ සංස්කෘතික වටිනාකම් හා සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයනු පිණිස අවබෝධාත්මක ව කටයුතු කෙරේ.
- ඉහළ වෘත්තීය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයින් බිහිකිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල රාජ්‍ය අනුග්‍රහය සහිත "ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක්" පිහිටුවනු ලැබේ.
- දැනට බෙහෙවින් ව්‍යාකූලව පවතින ජනමාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ පවතින ගැටලු හඳුනාගෙන ශාස්ත්‍රීය ප්‍රමිතීන් අනුව මෙම අධ්‍යාපන ක්ෂේත්‍රය අභිවර්ධනය කිරීම සඳහා විද්වත් කමිටුවක් එහි නිර්දේශ අනුව පූර්ණ ලෙස ප්‍රතිසංවිධානය කෙරේ. වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවීම සඳහා ඉඩ ප්‍රස්ථා වර්ධනය කෙරේ.
- පුවත්පත්, ගුවන්විදුලි සහ රූපවාහිනී මාධ්‍ය ආයතන ආරම්භ කිරීමේ දී එහි මූල්‍ය ආයෝජනයන් පිළිබඳ රජයේ අවධානය යොමු කෙරේ. එම ක්ෂේත්‍රයේ ඍජු විදේශ ආයෝජන රජයේ අධීක්ෂණයට ලක් කරන අතර එය නව නීති රීති මගින් නියාමනය කෙරේ.
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වාණිජ තරගකාරීත්වයේ පීඩනයෙන් තොර ව ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ආදර්ශ ඉදිරිපත් කිරීම සඳහා සරිලන සේ ක්‍රියාකරන ආයතන බවට පත්කර පාර්ලිමේන්තුවට වගකියන කොමිෂන් සභාවක් යටතට පමුණුවනු ඇත.
- පුවත්පත් මණ්ඩලය ව්‍යුහාත්මක ලෙස ප්‍රතිසංස්කරණය කර විද්‍යුත්, මුද්‍රිත සහ නව මාධ්‍ය ආවරණය වන පරිදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන පිළිබඳ විනිශ්චය ආයතනයක් ලෙස ද මාධ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස ද ප්‍රතිසංවිධානය කෙරේ.
- ජනමාධ්‍යවේදීන් සඳහා නාගරික නිවාස සංකීර්ණයක් ගොඩනැගීමට කටයුතු කෙරෙන අතර සහන වාහන ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ද ඇතුළුව මාධ්‍යවේදීන්ට පහසුකම් සලසා දීම උදෙසා පුළුල් පහසුකම් සහිත ව "ජනමාධ්‍ය ස්ථාගාර" (Press Clubs) ක්‍රමයක් පළාත්බද ව පිහිටුවනු ඇත.
- සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ දැනුම, අවබෝධය හා සන්නිවේදන උපක්‍රම සමාජගත කරනු පිණිස අවශ්‍ය පියවර ගනු ලැබේ.

## ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ජාතික උරුමයන්

රටක ඓතිහාසික උරුමය කියාපාන්නේ ඒ රටේ පෞඪත්වය සහ අනන්‍යතාවයයි. ඒවා සුරැකිව සංරක්ෂණය කොට අනාගත පරපුරට උරුම කරදීම සඳහා අප වෙත පැවරී ඇති වගකීමකි.. අපි එම වගකීම ඉටු කිරීමට සපුරා බැඳී සිටින්නෙමු.

- කිසිදු පූජනීය ස්ථානයක ඓතිහාසික උරුමයන්ට හෝ පුරාවිද්‍යාත්මක වටිනාකම්වලට හානි සිදු කිරීමට කිසිවෙකුටත් ඉඩ නොතබන අතර එවැනි සියලු සිද්ධස්ථාන ජාතික උරුමයන් සේ සලකා උපරිම ලෙස ආරක්ෂා කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය නීති අණ පනත් සංශෝධනය කර ඒ සඳහා පවතින ආයතනවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සම්බන්ධීකරණ වැඩසටහනක් ආරම්භ කෙරේ.

- සියලු ජන කණ්ඩායම් සහ ආගම්වලට අයත් පුරා විද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමක් ඇති සිද්ධස්ථාන සහ ජාතික උරුමයන් පිළිබඳ තොරතුරු ඇතුළත් "ඩිජිටල් පුරා විද්‍යා විශ්වකෝෂයක්" නිර්මාණකරන අතර මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කොට එය සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගත කෙරේ.

- ජාතික වටිනාකමක් සහිත ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් සඳහා අවශ්‍ය මූලික පහසුකම් එම ස්ථානවල ඇති පුරා විද්‍යාත්මක වටිනාකම්වලට හානි නොවන ආකාරයට සපයාදීම අනිවාර්ය කෙරේ.

- ජාතික උරුමයන් සහ පුරා විද්‍යාත්මක ස්ථාන පිළිබඳව වැරදි තොරතුරු සංචාරකයන් අතර ප්‍රචලිතවීම වැළැක්වීම සඳහා සංචාරක මඟපෙන්වන්නන්ට නිවැරදි දැනුම හා තොරතුරු ලබාදීමේ ක්‍රමවේදයක් ඇති කෙරේ.

## සංස්කෘතිය, සාහිත්‍යය සහ කලාව

රටක්, සමාජයක් උසස් මට්ටමකට පත්වන්නේ එම රටේ පවතින සංස්කෘතිය නිසා ය. උසස් කලා කෘති සහ නිර්මාණ බිහි කරන ශිල්පීන් මෙන් ම රසඥතාව සහිත මිනිසුන් ද රටකට සම්පතකි. අපේ රට එවැනි උසස් සංස්කෘතියකට උරුමකම් කියන රටකි. අපගේ වගකීම එම සංස්කෘතිය හා කලා නිර්මාණ අනාගතයට රැගෙන යාමය.

### සාහිත්‍ය ක්ෂේත්‍රය

- නිර්මාණ සාහිත්‍යයට ඇතුළත් නවකතා, කෙටිකතා සහ කාව්‍ය කෘති ඉහළ ප්‍රමිතියකින් යුතු ව පවත්වා ගෙන යාම සඳහා ග්‍රන්ථ නිර්මාණය, ප්‍රකාශනය සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

- ග්‍රන්ථ මුද්‍රණයට අනුබල දීම සඳහා අවශ්‍ය කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍ර ආදිය සඳහා බදු සහන ලබාදෙන අතර ලේඛක කර්තෘභාග නිසි ලෙස ගෙවීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් සකස් කෙරේ.

- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යටතේ පවතින ග්‍රන්ථ ප්‍රකාශනාධාර ව්‍යාපෘතියේ ධාරිතාව පුළුල් කිරීම සඳහා දැනට සපයන මූල්‍ය ප්‍රතිපාදන ඉහළ නංවනු ඇත. ළමා හා යෞවන සාහිත්‍ය කෘති නිර්මාණයට අවශ්‍ය පහසුකම් සපයන අතර විද්‍යුතීක ග්‍රන්ථ (E books) පරිශීලනය සඳහා වන අවකාශ පුළුල් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය සපයනු ඇත.

- සිංහල භාෂාවෙන් ප්‍රකාශිත විශිෂ්ට නිර්මාණ හා ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙමළ හා ඉංගීසි භාෂාවට පරිවර්තනය කිරීමටත්, දෙමළ හා ඉංගීසි භාෂාවෙන් ප්‍රකාශිත එබඳු ග්‍රන්ථ සිංහලයට පරිවර්තනය කිරීමටත් විශේෂ ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර රට තුළ ඇති සියලුම පුස්තකාල පද්ධතිය නවීන තාක්ෂණික පහසුකම් සහිත ප්‍රතිසංවිධානය කෙරේ.

### වේදිකා නාට්‍ය ක්ෂේත්‍රය

- වේදිකා නාට්‍ය පිටපත් රචනය, අධ්‍යක්ෂණය හා නිෂ්පාදනය සම්බන්ධ දැනුම හා පුහුණුව ලද හැකි අංග සම්පූර්ණ "නාට්‍ය නිකේතනයක්" අගනුවර ස්ථාපනය කෙරේ. එහි වේදිකා නාට්‍ය පුහුණුව සඳහා ඉඩ ප්‍රස්තා විධිමත් ක්‍රමවේදයක් යටතේ නිර්මාණ ශිල්පීන්ට නොමිලයේ ලබාදෙනු ඇත.

- සෑම දිස්ත්‍රික්කයක ම රංගකලා අධ්‍යයනාගාර, පුස්තකාල පහසුකම් සහ නවීන පහසුකම් වලින් යුත් රංග ශාලාවක් ස්ථාපනය කෙරේ.

- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පාසල පූර්ණ ලෙස ප්‍රතිසංවිධානය කෙරෙන අතර ඒ යටතේ දේශීය වේදිකා නාට්‍ය ඉතිහාසයෙහි විශිෂ්ට කෘති ප්‍රතිනිෂ්පාදනය සඳහා අවශ්‍ය මූල්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. වේදිකා නාට්‍ය දිවයින පුරා රඟදැක්වීමට නාට්‍ය සංවිධායකවරුන් දිරිගන්වන අතර ඒ සඳහා අවශ්‍ය බදු සහන සපයනු ඇත.

### සිනමා ක්ෂේත්‍රය

- දේශීය චිත්‍රපට කර්මාන්තය වර්තමානයේ මුහුණ පා සිටින අර්බුද හා ගැටළු අධ්‍යයනය කොට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා විශේෂ කාර්යසාධන ඒකකයක් ස්ථාපනය කෙරේ. චිත්‍රපට ප්‍රදර්ශනය සම්බන්ධ ව දැනට උද්ගත ව පවතින අර්බුදකාරී තත්ත්වය මුළුමනින් ම දුරු කොට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව හා ප්‍රදර්ශක මණ්ඩල අතර සාධනීය සම්මුතියක් හා ඒකඟතාවක් සහිත ව චිත්‍රපට ප්‍රදර්ශනය පිළිබඳ යාන්ත්‍රණය පූර්ණ ලෙස ප්‍රතිසංවිධානය කෙරේ.

- නිර්මාණාත්මක හා කලාත්මක ගුණයෙන් ඉහළ චිත්‍රපට නිෂ්පාදනය සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබාදෙන අතර උසස් හා ජාත්‍යන්තර මට්ටමේ චිත්‍රපට නිෂ්පාදන සඳහා නිෂ්පාදන වියදමෙන් 50% ක පොලී රහිත ණය මුදලක් ලබා දීමට කටයුතු කෙරේ. තරුණ සිනමාවේදීන්ගේ පළමු සිනමා නිර්මාණය සඳහා 80% ක පොලී රහිත ණය මුදලක් ලබා දෙනු ඇත.

- චිත්‍රපට නිෂ්පාදනයට අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ සහිත අංගසම්පූර්ණ රසායනාගාර පහසුකම් සහිත චිත්‍රාගාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරන අතර චිත්‍රපට කර්මාන්තයෙහි මුදල් ආයෝජනය කිරීමට පෞද්ගලික ව්‍යවසායකයින්ට අවශ්‍ය බදු සහන සපයනු ඇත.

- රට පුරා ඇති සියලු සිනමා ශාලා ඩිජිටල් තාක්ෂණික පහසුකම් සහිත සිනමා ශාලා බවට පත්කරන අතර, නගරාශ්‍රිත මහල් නිවාස සංකීර්ණ හා බහුකාර්ය වාණිජ මධ්‍යස්ථානවල කුඩා සිනමා ශාලා ඉදිකිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබේ.

- ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ප්‍රතිසංවර්ධනය කර චිත්‍රපට නිෂ්පාදනයට, දැන්වීම්, ප්‍රචාරක වැඩසටහන් සහ වාර්තා වැඩසටහන් නිෂ්පාදනයටත් සක්‍රීය ව දායක වන ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.

# ගුණගරුක විනයගරුක නීතිගරුක සමාජයක්

## සංගීත ක්ෂේත්‍රය

- ගීත හා සංගීත නිර්මාණ ක්ෂේත්‍රයේ කර්තෘභාග හිමිකාරත්වය සම්බන්ධ ව පවතින අර්බුදය විසඳීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යන්ත්‍රණයක් හඳුන්වා දෙන අතර ගීත හා සංගීත නිර්මාණ විකාශනයේ දී අදාළ නිර්මාණකරුවන්ගේ කතෘත්වය සඳහන් කිරීමත්, අදාළ කර්තෘභාග මාස 06 කට වරක් ගෙවීමත් අනිවාර්ය කෙරේ. දුරකථන සමාගම්වල වාණිජ ඉපයීම් සඳහා ගීත නිර්මාණ භාවිත කිරීමේ දී දැනට ගෙවන කර්තෘ භාගය 50% දක්වා ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
- සියලු නිර්මාණකරුවන්ගේ බුද්ධිමය දේපළ වාණිජ අරමුණු ඇති ව භාවිත කිරීමේ දී කර්තෘ හිමිකාරත්වය හා ප්‍රකාශන හිමිකාරත්වය පිළිබඳ ගෙවීම් නීතිගත කරන අතර, එම නීතිමය ප්‍රතිපාදන ඩිජිටල් මාධ්‍ය සම්බන්ධයෙන් ද අදාළ කෙරේ.
- ගීත හා සංගීත නිර්මාණ ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වන නවක නිර්මාණකරුවන්ට ස්වකීය නිර්මාණ කුසලතා වර්ධනය කරගැනීමත්, උසස් සංගීත රසාස්වාදයට ගෝචර වන සංධ්වන, සංගීත නාටක සහ ඔපෙරා ඇතුළු සම්භාව්‍ය ස්වකීය නිර්මාණ සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබේ. එවැනි නිර්මාණාත්මක හා කලාත්මක අගයෙන් ඉහළ නිර්මාණ බිහිකිරීම සඳහා අධ්‍යයනය හා පුහුණුව ලබාගත හැකි ආයතන ව්‍යුහයක් නිර්මාණය කෙරේ.
- ඉහළ තාක්ෂණික ප්‍රමිතියකින් යුතු නිර්මාණ බිහිකිරීම සඳහා අංග සම්පූර්ණ ශ්‍රව්‍ය දෘශ්‍ය මැදිරි හා ශබ්දාගාර ඉදි කිරීම සඳහා පෞද්ගලික අංශයට අවශ්‍ය බදුසහන ලබා දෙනු ලැබේ. සංගීත සන්දර්ශන සංවිධානය කිරීමේ දී දැනට අයකරන බදු සංශෝධනය කෙරේ.

## නර්තන ක්ෂේත්‍රය

- උඩරට, පහතරට සහ සබරගමු ආදි නර්තන සම්ප්‍රදායවලට අයත් පාරපම්පරික නර්තන ක්ෂේත්‍රයෙහි නිර්මාණ අඛණ්ඩ ව පවත්වගෙන යාමට අවශ්‍ය අනුග්‍රහ ලබාදෙන අතර පාරම්පරික නර්තන සම්ප්‍රදාය ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන සලසනු ඇත.
- පාරපම්පරික හා නූතන නර්තන ශිල්පි ශිල්පිනීන්ගේ වෘත්තිය ස්ථාවරභාවය ඇතිකිරීම සඳහා අවශ්‍ය අවස්ථා පුළුල් කිරීම සඳහා ඔවුන්ට දේශීය ව හා ජාත්‍යන්තර ව ස්වකීය නිර්මාණ ඉදිරිපත් කිරීමට ඇති ඉඩප්‍රස්තා සපයන අතර සංචාරක කර්මාන්තය සමග ඒකාබද්ධව ප්‍රාසාංගික ප්‍රදර්ශන අවකාශ පුළුල් කිරීමට ක්‍රියා කෙරේ.
- පාරම්පරික නර්තන කලාවට ආවේණික අනන්‍යතාව හා සෞන්දර්යය ආරක්ෂා කරගනිමින් නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා විද්‍යුත් මාධ්‍ය හා නවීන තාක්ෂණය සාධනීය හා ඵලදායක ලෙස යොදාගැනීමට අවස්ථා පුළුල් කරනු ඇත.

## චිත්‍ර හා මූර්ති නිර්මාණ ක්ෂේත්‍රය

- චිත්‍ර හා මූර්ති නිර්මාණ ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පීන්ට ස්වකීය නිර්මාණ ප්‍රදර්ශනය සඳහා අගනුවර අංගසම්පූර්ණ චිත්‍ර හා මූර්ති ප්‍රදර්ශන කලාගාරයක් සහ අදාළ පහසුකම් සහිත නිත්‍ය කලාගාර පද්ධතියක් දිස්ත්‍රික් මට්ටමින් ඉදිකෙරේ.
- චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට තම නිර්මාණ ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා සංචාරක ව්‍යාපාරය සමග ඒකාබද්ධ කෙරෙන සම්බන්ධීකරණ වැඩසටහනක් සම්පාදනය කෙරේ.
- චිත්‍ර හා මූර්ති ක්ෂේත්‍රයේ විශිෂ්ට නිර්මාණ සංරක්ෂණය සඳහා සංරක්ෂණාගාරයක් ස්ථාපනය කෙරේ.

## ශාන්තිකර්මවේදීන්

සංස්කෘතික අමාත්‍යාංශය යටතේ සාම්ප්‍රදායික බලි තොවිල් ශිල්පීන් ඇතුළු ශාන්තිකර්මවේදීන් ගේ ගැටලු සොයාබලා කටයුතු කිරීමට නියාමන ඒකකයක් ස්ථාපනය කෙරෙන අතර දේවාල ආශ්‍රිත සහ ශාන්තිකර්ම කටයුතු සඳහා අවශ්‍ය සමහර අමුද්‍රව්‍ය සහ උපකරණ ළඟ තබා ගැනීමට නීත්‍යානුකූල අවසර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කෙරේ.

## සමාජ ආරක්ෂණය සහ සුභසාධනය

සංවර්ධන ක්‍රියාවලියේ අතුරු ඵලයක් ලෙස ඇතිවන සමාජ අසමානතාව හැඳින්විය හැක්කේ පුද්ගල අනුබද්ධ ගැටලුවකට වඩා සමාජීය ගැටලුවක් ලෙසයි. ආර්ථික වශයෙන් රටක් කොතරම් සංවර්ධනයක් අත්පත් කර ගත්ත ද සමාජ අසමානතාව ඉහළ මට්ටමක පවතින්නේ නම් එහි අර්ථය එම රටේ විශාල පිරිසක් අසරණභාවයට සහ අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති බවය. රජයක වගකීම ඒ සියලු දෙනා ආරක්ෂා කිරීමයි.

## අඩු ආදායම්ලාභීන් වැඩි ආදායම්ලාභීන් බවට පත්කිරීමේ වැඩසටහන

සාපේක්ෂ වශයෙන් ඕනෑම රටක දුප්පත් යැයි සැලකෙන කොටසක් සිටින නමුත් සංවර්ධිත රටක සහ ඌන සංවර්ධිත රටක දුප්පත්කම එක හා සමාන නොවේ. එදිනෙදා ආහාරය සපයාගත නොහැකි වීම සහ කිසියම් රටක පවතින සාමාන්‍ය ජීවන මට්ටම පවත්වාගෙන යාමට නොහැකි වීම යන දෙකම සැලකෙන්නේ දුප්පත්කම ලෙසයි. දුගීකම සහ සමාජ අසමානතාව අවම කළ හැක්කේ අඩු ආදායම්ලාභීන්ට නව ආදායම් මාර්ග විවෘත කර ඔවුන් වැඩි ආදායම්ලාභීන් කළ විටයි.

- දේශපාලනික හේතු මත නවතා දැමූ ඉහළ ප්‍රතිඵල අත්පත් කරගත් දිවිනැගුම ව්‍යාපාරය නොපමා ව ක්‍රියාත්මක කොට අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂයක් තෝරාගෙන කෘෂිකර්මික, ධීවර, සත්ව පාලන ආශ්‍රිතව අගය එකතු කිරීමේ නිෂ්පාදන පොකුරු ගම්මාන සමුපකාර ක්‍රමයක් ඇති කර ඒ සඳහා අවශ්‍ය පුහුණුව, යටිතල පහසුකම්, අවශ්‍ය උපකරණ, සහ වෙළෙඳපොළ ද සපයා දෙනු ලැබේ.

- සමෘද්ධිලාභී පවුල්වල තරුණ තරුණියන් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහායොමු කර, නිපුණතා සපිරි ශ්‍රම බළකායක් බවට පත් කරන අතර ඔවුන් රජයේ සහ පෞද්ගලික අංශයේ සහ විදේශීය රටවල රැකියා සඳහාත් යොමු කිරීමේ වැඩසටහනක් නිර්මාණය කෙරේ.
- දැනට සමෘද්ධි අධිකාරියෙන් අඩු ආදායම්ලාභී පවුල්වලට ලබාදෙන සියලු සහනාධාර ඉහළ නැංවීමට කටයුතු කෙරේ.
- සියලු සමෘද්ධි බැංකු නවීන තාක්ෂණික ක්‍රමයට ප්‍රතිව්‍යුහගත කොට දෛනික කටයුතු ජංගම දුරකථනය හරහා සිදු කිරීමේ පහසුකම් සපයනවා.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධව පවතින වැටුප', දීමනා, උසස්වීම් සහ විශ්‍රාම වැටුප් පිළිබඳ ගැටලු විසඳීම සඳහා නොපමා ව කටයුතු කෙරේ.

### සමාජ ආරක්ෂණය

- දැනට විශ්‍රාම වැටුප් නොලබන සෑම සමාජ සාමාජිකයෙකුට ම ඇතුළත් විය හැකි නව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ වැඩිහිටි ප්‍රජාවේ සෞඛ්‍ය, ආගමික සහ වෙනත් කාලීන අවශ්‍යතා සඳහා ප්‍රතිලාභ ලැබෙන ජාතික දායකත්ව සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවනු ලැබේ.
- පිළිකා වකුගඩු වැනි මාරාන්තික රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන සියලු රෝගීන් සඳහා ලබා දෙන මාසික දීමනා ඉහළ නංවනු ලැබේ.
- කිසිදු ජීවන මාර්ගයක් නොමැති, වයස අවුරුදු 12 ට වඩා අඩු දරුවන් සිටින, ඒක මාපිය පවුල් සඳහා මාසික දීමනාවක් ලබා හඳුනවා දෙනු ඇත.

### අපරාධ පාලනය

- සියලු ආකාරයේ අපරාධ මර්නය සඳහා අවශ්‍ය නූතන තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දී පොලීසිය ශක්තිමත් කෙරේ.
- සියලු අපරාධ නඩු නොපමා ව නිමාකිරීම සඳහා අධිකරණ පද්ධතිය ප්‍රතිව්‍යුහගත කෙරේ.
- අපරාධකරුවන්ට සහාය දක්වන සියලු දේශපාලන මැදිහත්වීම් වැළැක්වීම සඳහා අවශ්‍ය නියාමන පද්ධතියක් ඇති කෙරේ.
- බන්ධනාගාරය තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දෙනු ලැබේ.
- සුළු වැරදිවලට සහ පළමුවරට සිරගත වන්නන් නැවත සමාජ ගත කිරීමට විශෝධනය කිරීම සඳහා නූතන විශෝධන ක්‍රමෝපායන් ගෙන් සමන්විත අංග සම්පූර්ණ විශෝධන මධ්‍යස්ථාන 2 ක් ආරම්භ කෙරේ.
- නැවත නැවත බන්ධනාගාර ගත වන පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහාත් විධිමත් වැඩපිළිවෙළක් සකස් කෙරේ.

### මාර්ග අනතුරු පාලනය

- සියලු මාර්ගවල පදිකයන් වෙනුවෙන් ප්‍රධාන මාර්ගයට ප්‍රවේශ නොවී ගමන් කිරීම සඳහා අවශ්‍ය පදික වේදිකා ඉදි කරන අතර පාර මාරුවීම නියමිත ස්ථානවලින් පමණක් සිදු කරන ක්‍රමවේදයක් ඇති කෙරේ.
- මාර්ග අනතුරු පාලනය කිරීම මුළුමනින් ම පාලනය කළ හැක්කේ රියදුරන්ගේ උපරිම සහයෝගය ඇතිව ය. ඒ සඳහා සියලු ප්‍රධාන සහ අතුරු මාර්ග CCTV කැමරා හරහා දැඩි ව සුපරීක්ෂණය කර දිගින් දිගට ම අනතුරුදායක සහ අපරීක්ෂාකාරී ලෙස රියපදවන්නන් හඳුනාගනු ලැබේ.
- රිය අනතුරු මගින් සිදුවන මරණ සහ සදාකාලික අබාධිතභාවයවට පත් වූවන් සදහා ප්‍රමාණවත් වන්දි මුදලක් නොපමා ව ලබාදීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා අවශ්‍ය නීති සංශෝධන් ගෙනෙනු ලැබේ.

### සතා සීපාවාට ද සෙනෙහස

- ජාතික සම්පතක් වන අලින් ඇතුළු සියලු වන සීපාවන් සහ කුරුල්ලන් ආදී අපේ ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා දැඩි ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.
- පසුගිය වසර පහ තුළ සහාසික ලෙස මරා දමන ලද අලි ඇතුන් පිළිබඳව නිසි පරීක්ෂණ කර අපරාධකරුවන්ට එරෙහි ව දැඩි නීතිමය පියවර ගනු ලැබේ.
- මහමඟ දමා යන ගෘහාශ්‍රිත සතුන්ට රැකවරණ සපයන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහාරජයේ අනුග්‍රහය ලබා දෙනු ලැබේ.
- සුරතල් සතුන්ට අවශ්‍ය බෙහෙත් සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා සහන මිල ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.
- සතා සීපාවන් කෙරෙහි කරුණාව දැක්වීම කුඩාකල සිට ම පුරුදු කිරීම සඳහා 'සත්ත්ව මිතුරු ළමා සමාජ' පිහිටුවනු ලැබේ.





# ගම සමඟ පිළිසඳර

**දහවන කොටස**

# ගම සමඟ පිළිසඳර

***අපේ ප්‍රතිපත්තිය ගොඩනැඟෙන්නේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනෙන් රැස්කරගත් ගම් 25,000 ක ජනතාවගේ අදහස් ඇසුරෙන්. ඒ නිසා රටේ සෑම ගමක ම ඇති අඩුපාඩු සහ අවශ්‍යතා අප ඔවුන්ගේ ම අදහස් ඇසුරෙන් හඳුනාගෙන තිබේ. ඒ අනුව රටේ තව නිවාස කොපමණ සංඛ්‍යාවකට විදුලිය අවශ්‍ය ද? පාරවල් කොපමණ සංඛ්‍යාවක් අලුත්වැඩියා කළ යුතු ද? පානීය ජලය නිවාස කොපමණකට අවශ්‍ය ද? යනාදී ප්‍රශ්න හා ප්‍රස්තුත අප හොඳින් අධ්‍යයනය කර අවබෝධ කොටගෙන තිබේ. ඒ නිසා වාර්ෂික අයවැයෙන් එකී අවශ්‍යතා සඳහා වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය දැනටමත් තීරණය කිරීම අපට ඉතා පහසු යි. ඒ ඇසුරෙන් අප ගම පහසුකම් සපිරි ජීවන මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ සැලැස්මක් සකස් කර තිබේ.***

### ගැමි ලියට රටේ සවිය

ගැමි ගොවියාගේ ඉරණම නුවරුන්ට බත සපයා, අතරමැදියන් පොහොසත් කර, බඩසයින් පෙළෙන්නෙක් බවට පත් වී තිබේ. විවිධ ආධාර බෙදමින්, ඔවුන් සදාකල් දුගීකමේ රේඛාවට පහළින් තබා ගෙන "වටිනා ඡන්දයක්" ලෙස පමණක් සැලකීම නිමා කළ යුතු යි. ඒ වෙනුවට ගැමි ගොවියා "පොහොසත් ගොවි ව්‍යාපාරිකයෙක්" බවට පත් කිරීම අපගේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයේ ප්‍රධාන පරමාර්ථය යි. එම කාර්යයේ දී ග්‍රාමීය කාන්තාවන්ගේ ශ්‍රමයට නිසි වටිනාකමක් ලබාදීම අත්‍යවශ්‍ය යි.

### ප්‍රාදේශීය සංවර්ධනය

ගම හුදෙකලාව සංවර්ධන කිරීම ඉටු නොවූ ඓතිහාසික සිහිනයක් පමණ යි. ගම සෘජු ව ම රජය සමඟ සම්බන්ධ කර සංවර්ධනය කිරීමට යාම ද අසාර්ථක වූ ව්‍යාපෘතියක්. ගම ජාත්‍යන්තර වෙළෙඳපොළ යා කරන ගෝලීය සැලැස්ම ද අපේක්ෂාවක් පමණ යි. ඒ වෙනුවට ගම පළමු ව යා කළ යුත්තේ "ප්‍රදේශය" සමඟ යි. නගරය "මෙගා ප්‍රදේශයක්" (Metropolitan Area) ලෙස ප්‍රතිනාගරීකරණය වෙමින් නගර සීමාවෙන් පහළට ව්‍යාප්ත වන විට ගම ප්‍රාදේශිකය දක්වා ප්‍රතිග්‍රාමීයකරණය හරහා ඉහළට ව්‍යාප්ත වන විට මුළු රට ම සංවර්ධනය වන්නේ තනි ප්‍රදේශයක් ලෙස යි.

## ගම සමඟ පිළිසඳර

අපේ ප්‍රතිපත්තිය ගොඩනැඟෙන්නේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනෙන් රැස්කරගත් ගම් 25,000 ක ජනතාවගේ අදහස් ඇසුරෙන්. ඒ නිසා රටේ සෑම ගමක ම ඇති අඩුපාඩු සහ අවශ්‍යතා අප ඔවුන්ගේ ම අදහස් ඇසුරෙන් හඳුනාගෙන තිබේ. ඒ අනුව රටේ තව නිවාස කොපමණ සංඛ්‍යාවකට විදුලිය අවශ්‍ය ද? පාරවල් කොපමණ සංඛ්‍යාවක් අලුත්වැඩියා කළ යුතු ද? පානීය ජලය නිවාස කොපමණකට අවශ්‍ය ද? යනාදී ප්‍රශ්න හා ප්‍රස්තුත අප හොඳින් අධ්‍යයනය කර අවබෝධ කොටගෙන තිබේ. ඒ නිසා වාර්ෂික අයවැයෙන් එකී අවශ්‍යතා සඳහාවෙන් කළ යුතු මුදල් ප්‍රමාණය දැනටමත් තීරණය කිරීම අපට ඉතා පහසු යි. ඒ ඇසුරෙන් අප ගම පහසුකම් සපිරි ජීවන මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ සැලැස්මක් සකස් කර තිබේ.

### ජනමූල මණ්ඩලය සහ ජනමූල මධ්‍යස්ථානය

- ගමේ පන්සලේ හාමුදුරුවෝ, අනෙකුත් ආගමික පූජකතුමන්ලා, දැන උගත් ජ්‍යේෂ්ඨ පුරවැසියන්, තරුණ ප්‍රජා නායකයින් සහ කාන්තා නියෝජනයෙන් සමන්විත ගමේ අඩුපාඩු සම්පූර්ණ කරගැනීම සම්බන්ධව සොයා බලන, ඒවා සම්පූර්ණ කර දීමේ රජයේ වැඩපිළිවෙළට මැදිහත් වන සහ අඩුපාඩු පෙන්වාදීමේ අයිතිය ඇති "ජනමූල මණ්ඩලයක්" අප සෑම ග්‍රාමසේවා වසමක් තුළ ම ස්ථාපනය කෙරේ. ඒ අනුව පාරදෘශ්‍යභාවයෙන් යුතු මූල්‍ය කළමනාකරණය අප ගමෙන් ආරම්භ කෙරේ.
- සෑම ග්‍රාමසේවා කොට්ඨාසයකට ම එක් "ජනමූල මධ්‍යස්ථානයක්" පිහිටුවනු ලැබේ. එය ජනමූල මණ්ඩලයේ රැස්වීම් ශාලාව, ග්‍රාමසේවක, සමෘද්ධි නියාමක, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර සහ පවුල් සෞඛ්‍ය සේවිකා ආදී ගමට සේවය කරන නිලධාරීන්ගේ කාර්යාල, ගමේ තරුණ තරුණියන්ගේ පහසුව සඳහා අන්තර්ජාල පහසුකම් සහිත සන්නිවේදන මධ්‍යස්ථානයක්, විද්‍යුත් පුස්තකාලයක් (E-Library) ළමා මධ්‍යස්ථානයක්, විද්‍යුත් ගුරු ශිෂ්‍ය කාමරයක් සහ තාක්ෂණික සේවා මධ්‍යස්ථානයක් මෙම ජනමූල මධ්‍යස්ථානයේ ස්ථාපනය කෙරේ.
- විදුලිය, පිරිසිදු පානීය ජලය, ප්‍රවේශ මාර්ග, වාරි ජල පහසුකම්, පෙරපාසල, මාතෘ සහ ළමා සායනය, ප්‍රජාශාලාව, ක්‍රීඩාපිටිය, කැළිකසළ කළමනාකරණය ආදියෙහි නඩත්තුව, කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ සුළු කර්මාන්ත ආදිය සඳහා අවශ්‍ය තාක්ෂණය, පර්යේෂණ සහ උපකාරක සේවා සැපයීම පිළිබඳ අධීක්ෂණය සහ පසුවිපරම ජනමූල මණ්ඩලයට පැවරේ.

### ගැමි ලියට රටේ සවිය

ගැමි ගොවියාගේ ඉරණම නුවරුන්ට බත සපයා, අතරමැදියන් පොහොසත් කර, බඩසයින් පෙළෙන්නෙක් බවට පත් වී තිබේ. විවිධ ආධාර බෙදමින්, ඔවුන් සදාකල් දුගීකමේ රේඛාවට පහළින් තබා ගෙන "වටිනා ඡන්දයක්" ලෙස පමණක් සැලකීම නිමා කළ

යුතු යි. ඒ වෙනුවට ගැමි ගොවියා "පොහොසත් ගොවි ව්‍යාපාරිකයෙක්" බවට පත් කිරීම අපගේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයේ ප්‍රධාන පරමාර්ථය යි. එම කාර්යයේ දී ග්‍රාමීය කාන්තාවන්ගේ ශ්‍රමයට නිසි වටිනාකමක් ලබාදීම අත්‍යවශ්‍ය යි.

- හඳුන්වා දෙනු ලබන නිශ්චිත වෙළෙඳපොළක් සඳහා ඒ ඒ ප්‍රදේශයට ආවේණික අත්යන්ත්‍ර රෙදි, ඇඟලුම්, බීරලු, රේන්ද, වේවැල්, පන්, මැටි, කොහු ලණු, කරවල සහ ජාඩි වැනි ධීවර නිෂ්පාදන ආදී සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ඉදිරිපත් වීමට කැමති ග්‍රාමීය කාන්තා ව්‍යවසායිකාවන් සඳහා රාජ්‍ය අනුග්‍රහය සහ අධීක්ෂණය යටතේ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කෙරේ.
- පහසුවෙන් උපයාගත හැකි අතිරේක ආදායම් මාර්ගයක් පවුලකට තිබීම පවුලේ වියදම පියවා ගැනීම සඳහා සුදුසු ම ක්‍රමයයි. විශේෂයෙන්ම රැකියාවක නොයෙදෙන ගෘහණියන්ට හෝ පවුලේ වෙනත් සාමාජිකයින්ට ගෙවත්තේ ඇති අපතේ යන වැල, වරකා, කොස් ඇට, බිලිං, අඹ, ලොවි ආදී ඵල වර්ග, අතිරේක භෝග වර්ග සහ පොල්කටු ආදී ඉවත දමන ද්‍රව්‍ය, අතිරික්ත වටිනාකම් එකතු කළ නිෂ්පාදන ලෙස හෝ එවැනි නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා අමුද්‍රව්‍ය ලෙස ලබාදීමේ පහසු ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ. ඒ සඳහා නිවසට ම ගොස් එකී අතිරේක භෝග සහ අතිරික්ත නිෂ්පාදන එකතු කිරීම සඳහා වෙන ම ක්‍රමවේදයක් සහ තොරතුරු හුවමාරුකර ගැනීමේ සන්නිවේදන මෘදුකාංගයක් (Mobile App) හඳුන්වා දෙනු ලැබේ.
- සමහර බැංකු තමන්ට නිත්‍යානුකූල අයිතියක් පවා නොතිබිය දී සහ ඇතැම් මූල්‍ය ආයතන පසුගිය කාලය පුරා කිසිදු නියාමනයකින් තොර ව රට පුරා ප්‍රචලිත කළ ගිනි පොලිකරුවන්ටත් වඩා පීඩාකාරී ලෙස ලබාදුන් විවිධ ක්ෂුද්‍ර ණය වැඩසටහන් නිසා ග්‍රාමීය කාන්තාවන් ලක්ෂ ගණනක් පීඩනයකට පත් වී ඇත. එවැනි කාන්තාවන්ට කඩිනමින් සහන සැලසීම සඳහා අසාධාරණ ලෙස ලබාදී ඇති ක්ෂුද්‍ර ණය කපා හැරේ.

## ප්‍රාදේශීය සංවර්ධනය

ගම හුදෙකලාව සංවර්ධන කිරීම ඉටු නොවූ ඓතිහාසික සිහිනයක් පමණ යි. ගම සෘජු ව ම රජය සමඟ සම්බන්ධ කර සංවර්ධනය කිරීමට යාම ද අසාර්ථක වූ ව්‍යාපෘතියක්. ගම ජාත්‍යන්තර වෙළෙඳපොළ යා කරන ගෝලීය සැලැස්ම ද අපේක්ෂාවක් පමණ යි. ඒ වෙනුවට ගම පළමු ව යා කළ යුත්තේ "ප්‍රදේශය" සමඟ යි. නගරය "මෙගා ප්‍රදේශයක්" (Metropolitan Area) ලෙස ප්‍රතිනාගරීකරණය වෙමින් නගර සීමාවෙන් පහළට ව්‍යාප්ත වන විට ගම ප්‍රාදේශිකය දක්වා ප්‍රතිග්‍රාමීයකරණය හරහා ඉහළට ව්‍යාප්ත වන විට මුළු රට ම සංවර්ධනය වන්නේ තනි ප්‍රදේශයක් ලෙස යි.

- භූගෝලීය, ජනගහනමය සහ පරිපාලනමය හේතු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල අළුතින් සීමා නිර්ණය කිරීම සඳහා පූර්ණ බලතල සහිත කමිටුවක් පත් කෙරේ.
- ප්‍රාදේශීය සභාව, නගර සභාව හෝ මහ නගර සභාව යන සීමා තුළ ක්‍රියාත්මක කළ යුතු නිශ්චිත ප්‍රාදේශීය සංවර්ධන සැලැසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වැඩි බලතල පළාත් පාලන ආයතනවලට ලබාදීමට කටයුතු කෙරේ.
- ගමේ සහ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදවන අරමුදල් ප්‍රමාදයකින් තොර ව අදාළ අමාත්‍යාංශ හරහා සෘජු ව ම පළාත් පාලන ආයතන වෙත යොමු කෙරේ.
- පළාත් පාලන ආයතන ජනමූල මණ්ඩලයේ සහයෝගය ඇති ව නිශ්චිත කාල රාමුව තුළ, පාරදෘශ්‍යභාවයෙන් හා උපරිම ඵලදායීතාවක් සහිත ව තම බල ප්‍රදේශයට අයත් සෑම ග්‍රාමසේවා කොට්ඨාශයක ම සංවර්ධන කටයුතු සම්පූර්ණ කළ යුතු වේ.
- මෙම සැලැස්මේ ප්‍රතිඵලය ලෙස 2025 වන විට හුදෙකලා ගම්මාන වෙනුවට දියුණු, සියලු පහසුකම්වලින් පිරුණු ප්‍රදේශ බිහි කෙරේ.

## දමිළ මුස්ලිම් සහෝදරත්වය

අපි කිසිවිටකත් උතුරේ සහෝදර දමිළ ජනතාවට එරෙහි යුද්ධයක් කළේ නැත. අපගේ අරමුණ වූයේ තිස් වසරක් තිස්සේ ත්‍රස්තවාදයෙන් බැට කෑ ජනතාව නිදහස් කර ගැනීම සඳහා මානුෂික මෙහෙයුමක් දියත් කිරීම පමණි. එයත් දැන් අතීතයට අයිති දෙයක් පමණක් වුවත් ඒ සම්බන්ධයෙන් ඇති අපගේ වගකීම සහ වගවීම අප කිසිසේත් සුළු කොට සලකන්නේ නැත. මානුෂීය මෙහෙයුමේ දී සිදු වී ඇති වැරදි අඩුපාඩු සකස් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා අතරම දැන් අපට අවශ්‍ය වන්නේ වියලුණු රළු පොළොවේ දූවිලි මතින් නැගී සිටින, බියෙන් සැකෙන් තොරව සුව පහසුවෙන් ජීවත් විය හැකි සමෘද්ධිමත් ප්‍රදේශයක් ලෙස උතුරු සහ නැගෙනහිර පළාත් නගා සිටු වීමයි.

යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්ක හැරුණු විට 2014 ට පෙර දුගීකමේ රේඛාවෙන් ඉහළ සිටි කිලිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික්ක ද මේ වන විට එම සීමාවෙන් පහළට වැටී තිබේ. එයින් පෙනී යන්නේ 2015 දී මෙම පළාතේ ජනතාවගේ ඡන්දය ලබාගැනීම සඳහා දේශපාලන සාකච්ඡාවට ලබාදුන් ඉහළ ස්ථානය පසුගිය කාලයේ ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීම කෙරෙහි ලබා දී නොමැති බව ය. අපේ ප්‍රතිපත්තිය අනෙක් සෑම ප්‍රදේශයක් හා සම ව මෙම පළාතේ ජනතාව ද ආර්ථික සංවර්ධනය අතින් ඉහළට ම ඔසවා තැබීම ය.

- උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාවගේ ජීවනෝපාය මාර්ග සහ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සවිබල ගැන්වීමට "පුනර්ජීවන අරමුදලක්" ආරම්භ කෙරේ. ඒ යටතේ;
    - යුද්ධයෙන් පීඩාවට පත් උතුරු හා නැගෙනහිර පවුල් සඳහා නිවාස ලබා දීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රම නිසා පීඩාවට පත්ව සිටින උතුරු හා නැගෙනහිර පවුල්වල කාන්තාවන් සඳහා රජයේ මැදිහත් වීමෙන් විවිධ ව්‍යවසායන් සඳහා සහන ණය සහ කෘෂි කාර්මික ණය ලබාදීම,
    - පුනරුත්ථාපනය කරනු ලැබූ උතුරු හා නැගෙනහිර පළාත්වල තරුණ තරුණියන්ට තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ආයෝජන ලබාදීම සහ දැනට ආරම්භ කර ඇති මානුෂීය මෙහෙයුමේදී විපතට පත් වූ පවුල් සඳහා ලබාදෙන වන්දි මුදල වැඩි කර ලබාදීම,

# ගම සමඟ පිළිසඳර

- මෙම පළාත්වල තරුණ තරුණියන්ට රැකියා ලබාදීම සඳහා අප විසින් ආරම්භ කරන ආර්ථික සංවර්ධන කලාපවල හෝ වෙනත් ස්ථානවල මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ප්‍රාග්ධන ආයෝජන සැපයීම සහ
- තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණු හෝ වෘත්තීයවේදී අධ්‍යාපනය ලැබීම සඳහා රැකියාවක් කරන විට ගෙවිය හැකි ණය මුදල් ලබාදීමට කටයුතු කිරීම.

- උතුරු සහ නැගෙනහිර රජය සතු අත්පත් කරගෙන ඇති පෞද්ගලික ඉඩම් ඒවායේ අයිතිකරුවන්ට නිදහස් කරන අතර මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ කෘෂි වගාවන් සඳහා රජයේ ඉඩම් බදු පදනම යටතේ ලබාදීම සහ ගොවීන්ට වගා කටයුතු කිරීම සඳහා බලපත්‍ර ඉඩම් ලබා දෙනු ලැබේ.
- උතුරු හා නැගෙනහිර පළාත්වල රජයේ රැකියාවල පුරප්පාඩු පිරවීමේදී හැකිතාක් එම පළාත්වල තරුණ තරුණියන්ට ප්‍රමුඛතාව ලබා දෙන අතරම මෙම පළාත්වල සේවය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගැනීමේදී දෙමළ භාෂා දැනුම සලකා බලනු ලැබේ.
- මෙම දෙපළාතේ සෑම දිස්ත්‍රික්කයකම දේශීය ව්‍යවසායකයින් කෘෂිකාර්මික නිෂ්පාදනවලට අගය එකතු කිරීමට මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආර්ථික කලාප පිහිටුවනු ඇත.
- උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත්වන තරුණ තරුණියන්ගේ ගැටලු හඳුනාගෙන ඔවුන්ගේ අනාගත අභිලාෂයන් සපුරාලීම සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන, වෘත්තීයවේදී අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික විද්‍යායතන, තොරතුරු තාක්ෂණික සහ කෘෂි පර්යේෂණ ආදිය ආරම්භ කර ඔවුනට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා ගැනීමේ අවස්ථා බහුල කරනු ලැබේ.
- නර්තන, නාට්‍ය සහ ප්‍රසංග පැවැත්වීම, එම අංශවල පුහුණුවීම් සහ ඉගැන්වීම් සඳහා පහසුකම් සලසන නවීන පහසුකම්වලින් යුත් "නෙළුම් පොකුණක" යාපනයේ ඉදි කරන අතර ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගනයක් සහ උසස් මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩා පිට්ටනියක් මෙම දෙපළාතට ලබාදීමට කටයුතු කෙරේ.

## වතු ආශ්‍රිත ප්‍රජාව

තේ කර්මාන්තය පදනම් කරගත් දමිළ වතු ප්‍රජාව අප සලකන්නේ සමාන අයිතිවාසිකම් භුක්ති විඳින අපගේ පුරවැසි සමූහයක් ලෙස ය. අපට ඔවුන් කෙරෙහි ඇත්තේ ඡන්ද වටිනාකමට එහා ගිය සහෝදර බැඳීමක්. එම නිසා අප ගොඩනඟන සමෘද්ධිමත් දේශය තුළ ඔවුන් සැම දෙනාට ම සතුටින් ජීවත්විය හැකි ආර්ථිකයක්, උසස් තත්ත්වයේ නිවාස, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් සහිත සුව පහසු ජීවිතයක් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා සහ ඉල්ලීම් වලට ගැළපෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ.

- වතු කම්කරු දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කෙරේ.
- වැටුපට අමතර ව සෑම පවුලකට ම අමතර ආදායමක් ලබා ගැනීම සඳහා වතුවල දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දේශීය සහ විදේශීය ඉල්ලුමක් ඇති පිච්ච මල් සහ වෙනත් මල් වර්ග, කාබනික එළවළු සහ පළතුරු වගා කිරීමේ වැඩපිළිවෙළක් සහ දේශගුණයට ගැළපෙන අතිරේක භෝග වගාවන් ව්‍යාප්ත කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබේ.
- වතු ජනතාව ජීවත්වන ප්‍රදේශවල දැනට අඩුවක් ව පවතින උසස් පෙළ විද්‍යා සහ වාණිජ විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් උසස් පෙළ උගන්වන සෑම පාසලකටම ලබා දෙන අතර සෑම පාසලකටම අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලබා දෙන අතර පසුගිය කාලය තුළ අවිධිමත් ලෙස බඳවාගෙන ඇති ගුරු සහායකවරුන්ගේ ගැටලුව සඳහා ස්ථිර විසඳුමක් ලබා දෙනු ඇත.
- වගා භූමි ආරක්ෂා වන පරිදි දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පවතින වතු ප්‍රජාවගේ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා දැනට ජීවත්වන වතු ආශ්‍රිත අඩු තට්ටු ප්‍රමාණයකින් යුත් නිවාස යෝජනා ක්‍රමයක් රජයේ සහ වතු හිමියන්ගේ දායකත්වය සහිත ව හඳුන්වා දෙනු ලැබේ. මෙම නිවාස යෝජනා ක්‍රමය තුළ අංග සම්පූර්ණ සෞඛ්‍ය මධ්‍යස්ථානල පෙර පාසල් සහ ප්‍රජා ශාලා ඇතුළු පහසුකම් ද ස්ථාපිත කර සෑම වතු කම්කරු පවුලකට ම අංග සම්පූර්ණ නිවසක් ලබා දෙනු ඇත.
- ගර්භිණී මව්වරුන්ගේ සහ ළදරුවන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය කිරීම සඳහා ගම්මාන සහ වතු මට්ටමෙන් 'නව පෝෂණ ආධාර වැඩසටහනක්' ක්‍රියාත්මක කරන අතර වතු රෝහල්වලට අවශ්‍ය සියලුම භෞතික සහ මානව සම්පත් ලබා දී සෞඛ්‍ය පහසුකම් වර්ධනය කෙරේ.
- කෘෂිකාර්මික පර්යේෂණ ඥානය සහ නූතන තාක්ෂණික භාවිතයන් තරුණ තරුණියන්ට ලබාදීම සඳහා කෘෂිකාර්මික විද්‍යාලයක් ආරම්භ කරන අතර, අංග සම්පූර්ණ දෙමළ මාධ්‍ය ගුරු විද්‍යාලයක් දිස්ත්‍රික්කය තුළ ස්ථාපනය කරනු ලැබේ. වතු ක්ෂේත්‍රයේ තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීයවේදී අධ්‍යාපනය ලබාදීම සඳහා විවෘත විශ්වවිද්‍යාල ශාඛාවක් හැටන් හි දැනටමත් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ ස්ථාපනය කිරීමට ද කටයුතු කෙරේ.
- මෙම ප්‍රදේශවල දැනට වසා දමා ඇති කර්මාන්ත ශාලා නැවත ආරම්භ කිරීමට ඇති හැකියාව සොයා බලන අතර වතු ක්ෂේත්‍රය ම ආවරණය වන පරිදි නව කර්මාන්ත කලාපයක් ආරම්භ කරනු ඇත.
- රජයට අයත් වතු වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නැවත වගාකිරීමට සහ පොහොර යෙදවුම්වලට අවශ්‍ය ප්‍රාග්ධනය සපයා නිසි කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන අතර මෙම වතු වල ඇති ඉපැරණි වතු බංගලා සහ අත්හැර දමන ලද තේ කර්මාන්තශාලා ආකර්ෂණීය සංචාරක බංගලා බවට පත් කිරීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබේ.

# සටහන්

# සටහන්

භීතියෙන් තොර, සාමයේ හා
සමඟියේ අරුණැල්ලෙන් පිරී
හෙට දවසක් පිළිබඳ බලාපොරොත්තුවෙන්
පෙළෙන ලක් මව,

සමාජ ආර්ථික සංවර්ධනයේ හා
සෞභාග්‍යයේ හෙට දවසක්
පිළිබඳ පැතුම් දල්වාගත් ලක් මව,

ප්‍රගතිය කරා පිය නඟන
සවිමත් දූ දරු පරපුරක
ප්‍රබෝධමත් අනාගතයක් පිළිබඳ
බලාපොරොත්තුවේ නොඉවසිල්ලෙන්
පෙළන ලක් මව,

එකී සුවහස් අපේක්ෂාවන් එකට කැටිකර ගත්
නායකත්ව ප්‍රසූතිය වෙනුවෙන් වන
විළි රුදාවෙන් පෙලෙන ලක් මව,
නොවැම්බර් 16 වන දින එකී නායකත්ව පුතණුවන්
නිසැකවම දැයට දායාද කිරීමට නියමිත ය.

ඔබ ඉල්ලන රට නිමවන්නේ එකී නියමුවා ය.
ඔව්! නිසැකවම
ඒ ඔබ ඉල්ලන නූතන ශ්‍රී ලංකාව ම ය.

සාර්ථක දැක්මක්
වැඩ කරන රටක්

GET IT ON Google Play
Download on the App Store

ගෝඨාභය රාජපක්ෂ
கோட்டாபய ராஜபக்ஷ
Gotabaya Rajapaksa
X